මළගිය ඇත්තෝ

亡き人

WWW.EXPRESSLANKA.TK 1

මළගිය ඇත්තෝ

එදිරිවීර සරච්චන්ද්‍ර

WWW.EXPRESSLANKA.TK 2



1

මා මේ වෘත්තාන්තය ලියන්ට පටන් ගත්තේ, එහි කියවෙන දේ සිදු වී අවුරුද්දක් පමණ ගත වූ පසුය. මේ කථනය, කිසියම් කෙළවරකට පමුණුවා අවසන් කළ යුතුය. එහෙත් සිදු වූ දේ නම් එවැනි කෙළවරකට පැමිණ නැත. ඇතැම් විට, කවදා හරි, මෙහි දෙවෙනි කොටස ලියන්ට මට ඉඩ ලැබෙන්ට පුළුවන. එහෙත් අනාගතයෙහි , කිය යුතු දෙයක් සිදු වේ දැයි මම නොදනිමි. නොරිකො මළා ය කියා මට මේ කථාව අවසන් කරන්ට තිබුණි. එවිට මෙය, කරුණා රසයෙන් පිරි නිබන්ධයක් යැයි ඔබ කියනු නිසැකය. එහෙත් නොරිකො තවමත් ජීවත් ව සිටියි. මම ද ජීවිතයේ අග්ගිස්සෙහි ඒ මේ අත වැනෙමින් සිටිමි. කථාවක් නම්, පිරිපුන් රටාවකින් යුතුව ගොතා හමාර කළ හැකි ය. එහෙත් ජීවිතය, වියා හමාර කළ නොහැකි ව, එතැනින් මෙතැනින් එල්ලෙන පත් ඉරුවලින් හැඩි වූ, මූල්ලකට දමා තිබෙන පැදුරු කෑල්ලකට සමානය. මිනිසුන් මරණය පතන

විගසින්, ඔවුන් වෙත මරණය නොපැමිණේ. ඔවුහු දීර්ඝ කාලයක් දුක් විඳිමින් ජීවත් වෙති.

මා දඹදිව කලායතනයක සිතුවම් අඳිමින් සිටින දවස්වල, එහි වූ ප්‍රසිද්ධ කලාකරුවෝ මා ප්‍රන්ස සිත්තරුවන් අනුගමනය කරන බවක් කීහ. කුඩා කල සිට මහණ වී පන්සලක විසූ මට, ප්‍රන්ස සිත්තරුවන්ගේ කලාව හැදෑරීමට අවස්ථාවක් ලැබුණු බව මතක නැත. පිකාසෝ වැනි ප්‍රසිද්ධ ශිල්පීන්ගේ සිතුවම් මා කවදාවත් දැක නැතැයි කිව නොහැකිය. එහෙත් පිකාසෝගේ හෝ වෙන කිසි ප්‍රන්ස සිත්තරුවෙකුගේ හෝ සිතුවම් ගැන මගේ සිත විශේෂයෙන් ඇදී ගියේ නැති බව නම් මම දනිමි. එහෙයින්, භාරතීය කලාකරුවන් කී විවේචනය අසා මම පුදුම වීමි. අනතුරුව මම නේපාලය හා භූතානයට ද තිබ්බතයට ද ගොස් ඒ රටවල තිබෙන තාන්ත්‍රික චිත්‍ර කලාව මැනවින් පුහුණු කෙළෙමි. මා ආපසු ලක්දිවට අවුත් මෙහි දී ප්‍රදර්ශනයක් පැවැත්වූ කළ විවේචකයන් කීවේ, මට ම හිමි වූ ශෛලියක් මා තාම සොයාගෙන නැත කියාය.

යුද්ධය පැවති කාලයෙහි, බ්‍රිතාන්‍ය හමුදාවට බැඳී ලක්දිවට පැමිණි සමහර කලාකරුවෝ ද කලා රසිකයෝද මගේ සිතුවම් දැක ඒවා ගැන උනන්දු වූහ. මා ඇඳි සිතුවම් වඩාත් ම අලෙවි වූයේ ඒ දවස්වලය. යුද්ධ හමුදාවේ නායකයෙකු වූ කැප්ටන් ඇඩැම්ස්, එංගලන්තයට ඇවිත් මගේ සිතුවම් ප්‍රදර්ශනය කරන මෙන් මට ආරාධනා කෙළේය. මේ විදේශික රසිකයන්ගේ පැසසුම්වලින් ධෛර්ය ලත් මම, යුද්ධය අවසන් වූ විගස ම, සිතුවම් විකිණීමෙන් ලැබූ ස්වල්ප මුදල ද රැගෙන , නැව් නැඟ එංගලන්තයට ගියෙමි. තෙමසකින් පමණ මම, ඇඩැම්ස් මහතාගේ ආධාරයද ලැබ, ලන්ඩන් නුවර ප්‍රදර්ශනයක් පැවැත්වීමි. එහි දී ද විචාරකයන් කීවේ, මගේ සමහර සිතුවම් කෙරෙහි බල පා ඇත්තේ ප්‍රන්ස චිත්‍ර සම්ප්‍රදාය බව ය. මා ප්‍රන්ස සිතුවම් දැක නැති බව ඔවුන්ට ද පුවත් පත් වාර්තාකරුවන්ටද කී නමුත්, ඔවුන් එය වඩා සිතට ගත්තේ නැති බව මට පෙනිණි. ඔවුන් එසේ කියන්ට ඇත්තේ, මා ඇඳි සිතුවම් අතරත් ප්‍රන්ස සිතුවම් අතරත් කිසියම් සමාන කමක් දුටු නිසා විය යුතු ය. එහෙත් බල පෑමක් ඇති වූයේ කෙසේ දැයි මට පැහැදිලි ව නොතේරේ.

විචාරකයන් කුමක් කීවත්, එංගලන්තයෙහිදී නොයෙක් කලාරසිකයෝ මගේ සිතුවම් දැක උද්‍යෝගීමත් වූහ. වරින් වර කිසිවෙක් මා හමුවන්ට අවුත්, සිතුවමක් දෙකක් මිල දී ගනියි. මා යද්දී ගෙන ගිය සිතුවම් ද එහිදී ඇඳි සිතුවම් ද විකිණීමෙන් මට අවුරුද්දක් පමණ එංගලන්තයෙහි යැපෙන්ට පුළුවන් විය.

මගේ සිතුවම් වඩාත් ම පසසනු ලැබුයේ ඔස්ත්‍රියාවෙහි දීය. ඔස්ත්‍රියානු කලාරසිකයෙක් එංගලන්තයෙහි දී මගේ සිතුවම් දැක,

වියෙනාවට ගොස් ප්‍රදර්ශනයක් පැවැත්වීමට මට ආරාධනා කෙළේ ය. ගමන් ගාස්තුවත් අන් සියලු වියදමත් ඔහු විසින් ම දරන ලදී. වියෙනාවෙහි දී මා පැවැත්වූ ප්‍රදර්ශනය ඉතාමත් සාර්ථක වූ බව මට කිව හැකිය. මගේ සිතුවම් බොහෝ ගණනක් විකුණුණා පමණක් නොව, විචාරකයන්ගෙන් මට බොහෝ ප්‍රශංසා ද ලැබුණේය.

එහෙත්, පුවත් පත්වල පළ වූ විවේචන හා ඡායාරූප මා ආඩම්බරයෙන් මගේ යහළුවන්ට පෙන්වන නමුත්, ඒ ප්‍රදර්ශනය ගැන වුව ද මම වැඩි සතුටකට නොපැමිණියෙමි. 'විචාරකයන් කීවේ, මගේ චිත්‍ර, බෞද්ධ ධ්‍යාන මාර්ගයේ ප්‍රතිඵල යි කියා ය. මම මෙය විශ්වාස නොකරමි. එංගලන්තයට ගොස් හය මසකට පමණ පසු මා සිවුරු හැර ගිහියෙකු වශයෙන් විසූ නමුත්, ඕස්ත්‍රියාවේ පැවැත්වුණු ප්‍රදර්ශනය සඳහා මට නැවත සිවුරු හැඳගෙන පෙනී සිටින්ට විය. එසේ කළහොත් ප්‍රදර්ශනයට කිසියම් විශේෂත්වයක් ඇති වන බව මගේ ඕස්ත්‍රියානු මිතුරා කී හෙයිනි, මා ඒ අවස්ථාව සඳහා සිවුරු පැළඳ ගත්තේ. එහෙත් ඒ ක්‍රියාව මගේ සිතට විරුද්ධ විය. මගේ සිතුවම් වල කිසියම් නෛසර්ගික වටිනාකමක් තිබේ නම් ඒවා අගය කළ යුත්තේ ඒ සඳහාය. මෙවැනි බාහිර අලංකරණ අනවශ්‍යය යි මට හැඟුණි. මගේ සිතුවම් බෞද්ධ ධ්‍යාන මාර්ගයක ප්‍රතිඵල නොවන බව ද මම දනිමි. කලාකරුවාගේ ධ්‍යානය ආගමික ධ්‍යානයට වෙනස් එකක් යයි මම සිතමි. කෙසේ වෙතත් මම ඔවුන් කියන විදියේ ධ්‍යානයක් වැඩූ කෙනෙක් නො වෙමි.

සිවුරු හැරියායින් පසු, හුදු චිත්‍ර කරුවෙකු වශයෙන් මගේ රටේ මට ජීවිකාවක් සපයා ගත නොහැකි බව මම දැන සිටියෙමි. එහෙත් එංගලන්තයෙහි ද මට සෑම ද ම ජීවත් විය නොහැක. තනි කාමරයක් තුළට වී ලන්ඩනයේ ගත කළ ජීවිතයද මට එපා විය. එහෙයින් දෑවුරුද්දක් පමණ එංගලන්තයෙහි වාසය කොට මම ආපසු සිය රට බලා පිටත් වීමි.

සිය රටෙහි සියල්ල ම සිදු වූයේ මා බලාපොරොත්තු වූ විදියට ය. මේ සමාජයෙහි මට තැනක් ලබාගැනීමට උගහට කරුණක් විය. මා මහන වී සිටිද්දී ද මගේ සිතුවම් ඇඳීම ඇතැමුන් විසින් ගරහන ලද බව මට නොයෙක් විට දැනගන්ට ලැබිණි. අප රට උගතුන්ගේ සැලකිල්ලට භාජන වූයේ මා අඳින සිතුවම් හොඳ ද නැද්ද යන ප්‍රශ්නය නොව මා මහණ දම් පුරණන්නෙකු ද නැද්ද යන්නය. මෙහිදී මට සිතුවම් ඇඳීමට සුදුසු ඉඩ කඩ හෝ එවැනි කටයුත්තකට වුවමනා කරන මානසික වාතාවරණය හෝ ලබා ගත නොහැකි විය. මා ඇඳි සිතුවම් අලෙවි වුණේ ද කලාතුරකිනි. එහෙයින් මා සතු වූ මුදල් ද ඉක්මනින් පිරිහෙන්ට විය. මුදලට වඩා ඉක්මනින් පිරිහුණේ මගේ කලාවය.

මේ කරුණු සලකා ය මා වැඩි කල් මෙහි නොසිට ජපානයට යන්ට සැරසුණේ. උකියො- එ- එනම් ලී කැටයම් - සිතුවම් කීපයක් මම පළමු

WWW.EXPRESSLANKA.TK 5

වරට එංගලන්තයේදී දුටුවෙමි. ඒවා කෙරෙහි මගේ සිතෙහි මහත් ආසාවක් එවේලෙහි හට ගත්තේය. දක්ෂ සිත්තරුවන් එතරම් විශාල සංඛ්‍යාවක් සිටින ජපානය වැනි රටක මට අනාගතයක් ඇති වේ ය යි මම නොසිතුවෙමි. මට ම හිමි වූ ශෛලියක් සොයා ගැනීමේ ප්‍රයත්නයද මම අත් හැරියෙමි. ස්වල්ප කාලයක් වෙන ම මාධ්‍යයකින් අත්හද බැලිය යුතු ය යන අදහසිනි, මා ජපානයට යන්ට සිතුවේ.

ඒ රටට පැමිණි මට වහා ම හැඟුණේ, බැලූ බැලූ අත විවිධ වර්ණයෙන් දැස පිනවන වෙන රටක් මා දැක නැති බවය. ගිනි පෙට්ටිය, තේ කෝප්පය වැනි තමා පාවිච්චි කරන සෑම කුඩා දෙයකට ම අපූරු හැඩයක් දමා, විචිත්‍ර වර්ණයක් කවා සෞන්දර්යයෙන් වට වී ජීවත් වීම ජපනුන් අගය කරන පරමාර්ථයක් බව මට පෙනුණි. සෞන්දර්යයෙන් යුත් පරිසරයක විසීම සිතැහි සමථ කිරීමෙහි ලා කෙතරම් උපයෝගී වන්නක් ද? කඩයකට සාප්පුවකට ගිය ද බොජුන් හලකට අවන් හලකට ගිය ද සිරුවට නිර්මාණය කරන ලද කිසියම් සෞන්දර්යකින් ඉන්ද්‍රියෝ පිබිදෙති. යන්ත්‍රයේ උපකාරයෙන් කෙරෙන නීරස ජීවිතයට වුව ද ඔවුහු රසයක් ඇතුළත් කරති. පැහැපත් වර්ණයන් කවා වාහනයේ බීරැණි ගතිය පහ කර දමති. සිත් පිත් නැති යන්ත්‍රය තුළ ඔවුහු මනුෂ්‍ය හෘදයක් තැන්පත් කරති. කෙතරම් යන්ත්‍ර පාවිච්චි කළත්, තමා ගනුදෙනු කරන්නේ මැෂින් සමග නොව මනුෂ්‍යයන් සමගය යන හැඟීම කෙනෙකුට ඇතිවේ.

ජපානයේ පාරම්පරික ශිෂ්ටාචාරයේ බර තාම උසුලා ගෙනයන්නේ ස්ත්‍රීන් ය යි මට හැඟී ගියේය. පැරණි කවීන් කියූ පරිදි, සියුමැලි යනගි[1] අත්ත මෙන් නැවී ඔවුහු කෙතරම් ලාලිත්‍යයකින් ඒ බර උසුලත් ද? ඔවුන් කතා බහ කරන ලීලාවෙහි, තේ කෝප්පයක්, බත් බඳුනක් අතට ගන්නා සැටියෙහි, මේ ශිෂ්ටාචාරය පිළිබිඹු වී පෙනේ. ඒ මේ අත තල්ලු කරමින් නගින බහින සෙනහ අස්සේ නොකැළඹී තම කටයුතු කරන, බටහිර ඇඳුමෙන් සැරසී ගත් බස් සේවිකාවගේ ද, යන එන්නන් පිළිගනිමින් ඔවුන්ට ස්තුති කරමින් කඩයෙහි බඩු විකුණන වෙළෙන්දියගේ ද, ගෙදර දෙර බලාගන්නා ගෘහිණියගේ ද නා නා වර්ණ කුරුවලින් අලංකාර කරන ලද උස් කොන්ඩයකින් හා පිටෙහි වැහූ විශාල සමනළයෙකුගේ හැඩයට බඳින ලද ඇඟ බඳනින් ද සැරසී අමුත්තන්ට සංග්‍රහ කරන ගේෂා ස්ත්‍රියගේද සෑම ඉරියව්වක ම පාරම්පරික අභ්‍යාසයක ලකුණු කැපී පෙනෙයි. සෑම ඉරියව්වක ම පරමාර්ථය අක්ෂිගෝචර හැඩයක් මවා පෑම ය.

මා දවස් කීපයක් ම ගත කෙළේ, කුල්මත් වූ සිතකින් යුතුව, හුදෙක් වටා පිටාවේ මවා තබන ලද සෞන්දර්යය විඳ විඳ නිදැල්ලේ ඇවිදිමිනි. මම කබුකි ශාලාවට පිවිසියෙමි. නෝ නාට්‍ය බැලීමි. ගේෂා නැටුම්

1. ඉංග්‍රීසියෙන් "විලෝ"යි කියන ගස් වර්ගය

WWW.EXPRESSLANKA.TK 6

නැරඹුයෙමි. විසිතුරු පරිසරයකින් යුතුව සාදන ලද කෝපි ශාලාවල, අඩ එළියෙහි වාඩිවී සෙසු අය මෙන් මම ද පැය ගණන් සංගීතයට කන් දෙමින් පසු වූයෙමි. එහි වැයෙන බටහිර ශාස්ත්‍රීය සංගීතයෙන් මා වැඩි ආස්වාදයක් නොලැබූ නමුත්, සිතට සෙත් දෙන එවැනි වාතාවරණයක, කෝපි උගුර උගුර බොමින් කාලය ගත කිරීමෙන් මම මහත් විවේක සුවයක් වින්දෙමි. කවර අතක බැලුවමත් මගේ සිත ප්‍රීති ප්‍රමෝදයෙන් ඉල්පෙයි. රැඟුම් ශාලාවල වටාපිටාවෙන් ද රංග භූමිවල අලංකාරයෙන් ද නළුවන්ගේ ඖදාර්යයෙන්ද සේවය කරන අයගේ ආචාර ශීලයෙන්ද මම නිතර ම උදම් වෙමි. කබුකි බැලීමෙන් තරම් තියුණු රසාස්වාදයක් මා කොතනක වත් ලබා නැතැයි මම සිතමි. තිරය ඉවත් කිරීමට ඔන්න මෙන්න කියා ලී පතුරු දෙකක් එකට ගැසීමේ හඬ ඇසෙත් ම මගේ සිත ද රැස්ව සිටින්නවුන්ගේ මෙන් නො ඉවසිල්ලෙන් සැලෙයි. තිරය ඉවත් වන විට විස්මයෙන් හුස්ම අදින හඬක් ශාලාවෙහි පැතිරේ. නොදැනුවත් ව මා කෙරෙන් ද එවැනි හඬක් පිට වේ. මොහොතකින් අපි ශත වර්ෂ ගණනාවක් ඔබ්බට ගමන් කරමු. නළුවන් නටන කල, පුරාතන භාරතීය රංග භූමියෙහි දුෂ්යන්ත රජු අශ්ව රථයෙන් යන්ට ඇත්තේ මෙසේ ය යි මට සිතේ. බඹරෙකුගේ පීඩා ලැබූ ශකුන්තලා තම වෙහස දක්වන්ට ඇත්තේ මෙසේය.

ෂිබුයා සිට වඩා නුදුරින් පිහිටි ඕකුසාවා නමැති පෙදෙසෙහි මට ලාබෙට කාමරයක් ලැබිණි. එහි කොටස් දෙකක් විය. එක් කොටසක්, තතමි[1] පැදුරු ගසා වසන ලද පොළොවකින් යුත්, ජපන් පිළිවෙළේ කාමරයක් විය. මා රෑට නිදා ගත්තේ එහි පොළොව මත පුළුන් මෙට්ටයක් එලාගෙන ය. උදේට, බිත්ති රාක්කය ඇතුළට කොට්ට මෙට්ට ආදිය තල්ලු කොට, පසෙකින් තැබූ කුඩා මේසය ද වාඩි වෙන කුසිම ද ගෙන, මම ඒ කාමරයෙහි ම වැඩ කරමි. ඉර එළිය ඒ කාමරය තුළට මැනවින් පිවිසුණු හෙයින්, මගේ වැඩට එය පහසු විය. අල්ලපු කාමරයේ පොළොව සාද තිබුණේ පැදුරු නැති ව තනිකර ලෑලිවලිනි. එහි බටහිර පිළිවෙළේ මේසයක් හා පුටු දෙකක්ද විය. ඒ ළඟින් ම වතුර පයිප්පයද ගෑස් ලිප ද විය. මා කෑම කෑවේ එහිය.

මම උකියො - ඒ ශිල්පියෙකු වෙත ගොස් සිතුවමක් මුද්‍රණය කිරීම සඳහා එය ලෑල්ලෙහි කපන සැටි ද පසු ව වෙන වෙන ලෑලිවල එහි කොටස් කපා සායම් කරන සැටි ද පළමුවෙන් පුරුදු කෙළෙමි. උකියො ඒ ශෛලියෙන් සිතුවම් ඇඳීමට පෙර ඒ ශෛලිය හැඩ ගැසීමට හේතු වූ කැටයම් ශිල්පය පිළිබඳ ප්‍රත්‍යක්ෂ දැනුමක් මා තුළ තිබුණොත් මැනවැයි මම සිතුවෙමි. ලී කැටයම් කපා සිතුවම් අච්චු ගැසීමේ කලාව හොඳින් පුහුණු වීමට සාමාන්‍යයෙන් බොහෝ කාලයක් ගත වන නමුදු, හය හත් මසකින් මම සෑහෙන ප්‍රමාණයක කෞශල්‍යයක් ලබා ගත්තෙමි. මට ඉගැන්වූ

1. පත් වර්ගයකින් සාදන, පොළොව වසන පැදුරු.

ශිල්පියා, අත්කම් පිළිබඳ ව මා දැක්වූ දක්ෂකම ගැන මවිත වූ විලාසයක් දැක්වී ය. ඔහු කීවේ, මේ අතින් මා ජපනුන්ට ද වඩා දක්ෂ ය කියා ය. මම ඔහුගේ වචනය විශ්වාස නොකෙළෙමි. ජපනුන්ගේ අත්කම් පිළිබඳ දක්ෂතාව මුළු ලෝකයෙහි ම ප්‍රසිද්ධ හෙයින් මම ඔවුන් පැරදවූයෙමි යි ඇදහීම උගහට ය. එහෙත් මගේ අධික උනන්දු ව නිසාත්, මා බොහෝ වේලා ඔහුගේ චිත්‍රාගාරයෙහි වැඩ කළ නිසාත්, ඔහු වෙත පැමිණෙන වෙන ගෝලයින්ට වඩා ඉක්මනින් මා සෑහෙන ප්‍රමාණයක හුරු බුහුටි කමක් ලබා ගන්ට ඇතැයි මම සිතමි.

උකියො- එ ශෛලිය මට තරමක් දුර ට අවබෝධ වූ පසු මම ශිල්පියා වෙත යාම නතර කෙළෙමි. මම කාමරයෙහි සිට, සිතුවම් අඳින්ට වෑයම් කෙළෙමි. මට ඉගැන්වූ ශිල්පියා, මා අඳින සිතුවම් ලීයෙක කපා මුද්‍රණය කර දෙන බව කීවේය. එහෙත් ඔහු වෙත ගෙන අව්වු ගස්වා ගැනීමට තරම් වූ සිතුවමක් මට ඇඳගත නොහැකි විය. මා ඇඳි සිතියම් හුදු අනුකරණ ලෙස ය මට පෙනුණේ. මා තරමක දක්ෂතාවක් ඇති ශිල්පියෙක් වෙතත්, නිර්මාණ, ශක්තිය ඇති කලාකරුවෙක් නොවනු ඇතැයි මට නොයෙක් වර සිතිණි.

වදෙන් පොරෙන් මම කාමරයෙහි නතර වී සිතුවමක් දෙකක් ඇන්දෙමි. ඒවා පිට ගෙන ගොස් පෙන්වීමට ලජ්ජා වූ හෙයින්, මම ම කැටයම් කර අව්වු ගැසීමි. මගේ හිතට හරි යන වර්ණය ලැබෙන තෙක් මම එක එක සිතුවමක පිටපත් දහයක් දෙළහක් සෑදුවෙමි. මෙයින් මම, සිතුවම් ඇඳී මෙහි මෙන්, කැපීමෙහි ද සායම් කිරීමෙහි ද අභ්‍යාසයක් ලබා ගන්ට තැත් කෙළෙමි.

පැරණි උකියො- එ චිත්‍ර කාලව පැන නැංගේ තෝකියෝ නගරයෙහි එදිනෙද ජීවිතය සිතුවම් කරන්ට තැත් කල කලාකාරයින් අතින් ය. මේ මාධ්‍යයෙන් වර්තමාන ජීවිතය නිරූපණය කළ නොහැකි දැයි මම කල්පනා කෙළෙමි. එන්ට එන්ට ම, මට කාමරය තුළට වී නිවිහැනහිල්ලේ සිතුවම් ඇඳීමට සිතක් පහළ නොවීය. මගේ නිර්මාණ ශක්තිය හීන වත් ම මගේ නොසන්සුන් ගතියක් අධික වන්ට විය. නිර්මාණයට වුවමනා කරන්නා වූ චිත්තෛකාග්‍රතාව කෙමෙන් මා කෙරෙන් ගිලිහී යන්ට විය. උකියො-එ සිත්තරුවන් මෙන් මා ද පොදු ජීවිතයෙහි ගැලී සිටිය යුතුය. මගේ ආත්ම විශ්වාසය අඩු වූයේ, නිර්මාණයට තුඩු දුන් කිසිවක් මා පරිසරයෙන් උකහා නොගත් හෙයිනැයි මම සිතුවෙමි. ප්‍රථමයෙන් මා අවට වූ ජීවිතය අවබෝධ කර ගත යුතුය. ඒ ජීවිතයේ හෘදය ස්පන්දනය මට හාත්පසින් ඇසේ. එහි ආශ්වාස ප්‍රාශ්වාසය මගේ ඇහට දැනේ.

මා ලන්ඩන් නුවර සිටිය දී කාමරයෙන් දුව ගොස් විදිවලට වැදුණේ, හාත්පසින් නැහ ආ මිදුමින් මගේ පපුව තෙරපෙන්නා සේ මට දැනුණු

WWW.EXPRESSLANKA.TK 8

හෙයිනි. නැතහොත් මා එළියට ගියේ සතර දෙසින් මගේ දෑස වට කළ දුඹුළුවන් බිත්තිවලින් නිදහස් වී නිල්වන් අහස දෙස බැලීමට ය. එහෙත් මට අහසෙහි නිල් පැහැයක් පෙනුණේ කලාතුරකිනි. මා ඇවිද්දේ මීදුමෙන් හා අඟුරුවලින් කිලිටිවූ වීදිවලය. එහෙත් මේ රටෙහි එළියට බසින මා වහා පිවිසෙන්නේ නොයෙක් වර්ණයෙන් හා විසිතුරු හැඩයෙන් බබළන පහන් කූඩුවලින් ද තොරණින් හා උඩු වියනින් ද අලංකාර කරන ලද වේ මහකට ය. නියොන් එළියෙන් එළි වී, මොහොතින් නිවී ගොස් නැවත වෙන වර්ණයකින් මතු වන චීන අකුරු දැන්වීම් හාත්පසින් බැබළේ. වැහි වැටීමට පෙර අහසෙහි වලාකුළු අස්සේ ඒ පැත්තෙන් මේ පැත්තට බඩ ගා දුවන විදුලි රේඛා සේ, අහසෙහි නොයෙක් ආකාරයේ රූ සටහන් අඳිමින් නියොන් එළි ඔබමොබ දුවයි. දෙපසෙහි වයිවාරන්න බඩුවලින් සරසන ලද සල්පිල්වලින් නිරන්තරයෙන් "ඉරෂායිමසෙ"[1] "සුමිමසෙන්"[2] "දෝමො අරිගතො"[3] , යනා ආදි ආචාර පාඨ නිකුත් වේ. ඉඳහිට මා පසු කර යන බොජුන් හලක නැතහොත් අවන්හලක ගී ගායනයේ ද අත් තාල දීමේ ද හඬ මගේ කනට ගොදුරු වේ.

රෑ මැදියම් වන තුරු මම වීදි ඔස්සේ ඇවිදිමි. එහෙත් මා ඇවිදින්නේ මේ සමාජයේ පිට පවුර වටේ යයි මට සිතේ. වාසල් දොරින් පිවිසුණ ද ඇතුළෙහි වන දේ බලාගෙන සිටීම මිස, ඊට සහභාගි වීමට නොහැකිය. කඩයකට හෝ බොජුන් හලකට හෝ අවන් හලකට පිවිසීමට මා කුලැටි ය. මා පිවිසි මොහොතෙහි එහි ඇති වන වෙනස මට වහා දැනෙයි. වෙළඳ සැලකට ගියහොත් තරුණ වෙළෙන්දියෝ බිරාන්ත වී මා දෙස බලති. ඔවුන් මෙසේ බලා සිටින්නේ නිමේෂ මාත්‍රයකි. එහෙත් මට එය දැනෙන්නේ පැයක් හමාරක් ලෙස ය. ඉක්බිති ව ධෛර්යමත් තරුණියක්, අනික් වෙළෙන්දන් දෙස ඇස් කොනින් බලා, මා වෙතට ඇවිත්, සාමාන්‍යයෙන් අමුත්තන්ට ආචාර කරන" ඉරෂායිමසෙ" යන්නෙන් මට ආචාර කරයි. එතනින් මෙතනින් අහුලා ගත් ජපන් වචන දෙකක් තුනක් මා ව්‍යවහාර කළ විට, සියල්ලක් නැවත ප්‍රකෘති බවට පැමිණේ.

එහෙත් බොජුන් හලකට හෝ අවන් හලකට හෝ, වසා තිබෙන දොර පසකට තල්ලු කර ඇතුල් වීමට නම් මීට වඩා ධෛර්යක් වුවමනා ය. කෙසේ හෝ සිතට දිරි නංවා මා පිවිසි හැම විටක ම, ඇතුළෙහි පැවති ඔමරි කතා හා කොක්හඩ වහා නැවතේ. මේ නිශ්චලතාව පවතින්නේ තත්පරයකට පමණි. අහර බුදින්නන්ගේ ද මධු පානය කරන්නන්ගේ ද මුහුණුවල පෙනුම වෙනස් වන්නේ අල්ප මාත්‍රයකි. එහෙත් මුළු ලෝකය ම හදිසියේ නැවතුණා

1. කෙනෙකු පිළිගැනීමට කියන වචනය.
2. 'සමා වෙන්න.'
3. 'බොහොම ස්තුතියි'

WWW.EXPRESSLANKA.TK 9

සේ මට දැනේ. නොපමා ව. සිනා මුහුණින් යුතු වූ සේවිකාවක් අවුදින්, උණු දියෙහි පොහා මිරිකා දමන ලදඅත් පිස්නක් මා ඉදිරියෙහි තබයි. මොහොතක් නැවතුණු ලෝකය නැවත ගමන් කරන්ට පටන් ගනියි.

එතකුදු වුවත්, මා තල්ලු කර විවෘත කෙළේ බාහිර දෙරක් මිස ජීවිතයේ දෙර නොවන බව නොබෝ වේලාවකින් මට පසක් වේ. ඔවුන් කන බොන දේ මොනවා දැයි මට නොතේරේ. එහි අපූරු රසයක් තිබෙන්ට පුළුවන. එය විඳින්ට මට සිත් වේ. විසිතුරු හැඩහුරුකමින් යුතු ලස්සණ කුඩා බඳුන්වල දමා එය කෝටුවලින් අහුලා බුදින්නු ලබන ආකාරය සිත් ගන්නා සුලුය. එහි නියම රසය විඳින්නට නම් ඒ පිළිවෙලින් ම කෑ යුතු ය යි මට සිතේ. මම ඒවායේ නම් නොදනිමි. මා ඉදිරියෙහි තබන ලද මේනු පත මට කියවිය නොහැකිය. ලී පුවරුවල ලියා ඉස්සරහ බිත්තියෙහි එල්ලා තිබෙන කෑම බීමවල නම් හා මිල මට අන්ධර දෙමළ ය. කෝටු පාවිච්චි කිරීමට මගේ ඇඟිලි පුරුදු වී නැත. අවසානයෙහි මා ඉල්ලන්නේ, නීරස වුවද මා හොඳින් දන්නා බටර ටෝස් හා බැදපු බිත්තර නැතහොත් හොත් දෝග්ය. මා මෙය කන්නේ ගැරුප්පුවෙන් ය.

නොරිකො සිටි අවන් හලට මා පිවිසුණේ, පැය දෙකක් පමණ වීදිවල ඇවිද, පාළුව මගහැර ගත නොහැකි ව, පිපාසය නිවා ගැනීමට කිසිවක් බී ආපසු ගෙදර යා යුතු ය යි සිතූ එක් රැයක ය. මම ඒ අවන් හල පසු කර ඔබ මොබ දෙතුන් වරක් ගියෙමි. අසල තවත් අවන් හල් කීපයක් තිබිණි. ඒවායේ ඇති වුණු සිනා හඬ මට පිටතට ඇසිණි. මා ඇතුල් වුවහොත් ඒ සියල්ල නවතින සැටි මට කල්පනා විය. ඇතැම් අවන් හල්වල නාම පුවරු ඉංගිරිසියෙන් ලියා තිබුණි. ඒවායේ ඉංගිරිසි කතා බහ දන්නා සේවිකාවන් ඇතැයි මම සිතුවෙමි. මම ඔවුන් හඳුනමි. පාරම්පරික ව ජපන් ස්ත්‍රීන් ඇබ්බැහි කළආචාර ශීලය ඔවුන් තුළ ද දක්නට ලැබෙන නමුත්, දැන් ඔවුන් ඒ ආචාර ශීලය වෙළඳ බඩුවකට හරවාගෙන ය. එය, මතු පිට පෙනෙන ඔපයක් පමණි. අමෙරිකානු හේවායන් රවටා මුදල් ගසා කෑමට පුරුදු වූ ඔවුන්ගේ යටි හෘදය අනුකම්පා රහිත ය. ඔවුහු මූණිච්චාවට නොයෙකුත් දේ කියා ඔබ ලවා වියදම් කරවති. ඔබේ ඇස් ලොකුය. නහය උසය. ඔබ කොයි තරම් දැකුම්කලු පුද්ගලයෙක් ද! ඔබේ වයස කීය ද? තිස් අටයි? හැබෑවකට විසි පහකට වඩා ය කියන්න බෑ නේ. සෙයිලොන් (ලංකාව) බොහොම හොඳ රට. සෙයිලොන් කෝචාවලට (ලංකාවේ තේවලට) මම හරි කැමතියි. ඔබ ජපන් බසින් වචනයක් දෙකක් කතා කළොත්, ඔබට "නිප්පොන් භාෂා පරමේශ්වර" යන විරුදාවලිය ලැබේ. ජපානය ගැන කවරෙකු වුවද දන්නා කරුණක් ඔබ සඳහන් කළහොත්, ඔබ පණ්ඩිතයෙක් වන්නෙහි ය. ඔබ ළඟ තිබෙන බීර වීදුරුව හිස් වනවිට ඔවුහු එය පුරවති. ඔබ එය හිස් කොට, නැවත පිරෙන තුරු, නොදනුවත් වම බලා සිටින්නෙහි. ය. ඔවුන්ගේ සිනා හඬ ඔබ කනට වැටෙන්නේ රිදී කිංකිනිවල හඬක් මෙනි. ඔවුන්ගේ හීන් ඇස්වල කටාක්ෂ නිරීක්ෂණයෙන් ඔබට, උතමරොගේ

WWW.EXPRESSLANKA.TK 10

සිතුවමක ස්ත්‍රී රූපයක් සිහි වේ. ඔවුන් ඔබගේ සාක්කු අත පත ගා හිස් කරන්නේ නැත. ඒ කටයුත්ත ඔවුහු ඔබ ලවා ම කරවති.

මිදෙරි නම් අවන් හලට මා පිවිසියේ එයින් කට හඬවල් හෝ ගී හඬවල් නිකුත් නුවූ හෙයිනි. එය තෝරා ගැනීමට තවත් හේතුවක් තිබිණි. මධු පාන වර්ගයන්ගේ මිල ලියා, අකුරු හා ඉලක්කම් පමණක් එළි කරන ලද කළු පැහැති වීදුරු පුවරුවක් මිදොරිය ඉදිරියෙහි වී ය. විදේශිකයන් සඳහා තිබෙන අවන් හල්වල බීමවලට වඩා මිදෙරියෙහි බීමවල මිල අඩුවී ය. නියමම මිල දැනගෙන පිවිසීමෙන්, මට එදා වියදම් කළ හැක්කේ කීයක්ද කියා කලින් තීරණය කරන්ට ඉඩ ලැබේ.

මා පළමුවෙන් අවන් හලටඇතුල් වූයේ "එාත්" කියා යි නොරිකො පසු දිනක මා සමග කීවාය. ඒ කෙසේ දැයි මා ඇසූවිට, හුළඟක් මෙන් යයි ඈ විස්තර කළාය . මා දෙතුන් වරක් ඒ විදියේ ඔබ මොබ ඇවිද, හදිසියේ තීරණය කර ඇතුල් වන්ට ඇත්තේ ඒ ලෙසින් විය හැකිය. එහෙත් මා ඇතුල් වූ විට කිසි කෙනෙකු බිරාන්ත වී බැලුවේ නැත. මිදෙරිය කුඩා අවන් හලක් විය. අර්ධ කවයක ආකාරයෙන් සාද තිබුණු කවුන්ටරය වටා උස් බංකු මත දහ දෙළොස් දෙනෙකුට වඩා වාඩි වී සිටියේ නැත. සාමාන්‍ය අමුත්තෙකු පිවිසුණ කලක මෙන් නොරිකො මට "ඉරෂායිමසෙ" යි ආචාර කොට සිරිත් පරිදි උණු බඳුනක තබන ලද අත් පිස්න මා ඉදිරියෙහි තබා වෙන පාන්කඩයකින් කවුන්ටරය පිස දැම්මාය. මා බීමක් ඉල්ලීමට, පෙර මා ගාව සිටි කෙනෙක් මා සමග කථා කරන්ට පටන් ගත්තේය. ඔහු ලංකාව හා ඉන්දියාව පිලිබඳ දෙශපාලන තොරතුරු හොඳින් දැන සිටියේය. ඔහු තෝකියෝ විශ්ව විද්‍යාලයෙහි නීති ශාස්ත්‍රය ඉගැන්වූ තරුණ ආචාර්යවරයෙකු බව මට පසුව දැනගන්ට ලැබිණ.

එදා නොරිකො කහ පාටට හුරු කිමොනොවක් ඇඳ සිටි බවක් මට මතක ය. ඈ ලස්සණ තරුණියක් ය යි එවේලෙහි මට හැඟුණේ නැත. එහෙත් ඇයගේ කිසියම් සීදේවි පෙනුමක් තිබුණු බව මට හැඟුණි. ඇගේ තොල්වල සායම් ගා තිබුණේ නැත. උඩු අතට පීරා තිබුණු ඇගේ කොන්ඩෙ ඉන තෙක් පිටි පසට වැටිණි. සාමාන්‍ය ජපන් ස්ත්‍රීන්ට නැති මේ කේශ කල්‍යාණය ඇගේ විශේෂ අංගයක් බව මට වහා පෙනුණි. ඈ තම කුඩා දෑස මා වෙත හෙළා, අවංක සිනාවක් පහල කලාය. අප සියලු දෙනා ම සමග කතා බහ කරමින්, විහිළු තහළු දෙඩමින්, එක් එක්කෙනා ඉල්ලූ බීම වර්ග සාදමින්, රට කජු ආදිය සමග ඔවුන් ඉදිරියෙහි ඒවා තබමින් ඈ ඉතා හුරුබුහුටි ලෙස සිය කටයුතු ඉටු කලා ය. ඒ අවන් හලෙහි වැඩ කිරීමට ඇය හැරුණු විට තවත් ස්ත්‍රියක් ද සිටියාය. නොරිකොගේ දෑස හා නහය කුඩා විය. ඇගේ මුහුණ වටකුරු විය. එහෙත් අනිත් ස්ත්‍රියගේ පෙනුම හාත්පසින් වෙනස් විය. උස නහයකින් හා ලොකු ඇස් දෙකකින් ද යුතු වූඇය යුරෝපා ස්ත්‍රියකට සමාන වූවාය. ඇට අවුරුදු හතළිස් පහකට වඩා වයස ඇතැයි මම සිතුවෙමි.

එද මා වැඩි වේලාවක් ඒ අවන් හලෙහි සිටියේ නැත. එහෙත් සෑම ද ම සවස් වන විට මගේ දෙපා ඉබේ ම ඇදී ගියේ ඒ දෙසට ය. ඊට ඉස්සර මා අවන් හලකට ගිය හැම විටක වාගේ එයින් පිට වන්නේ මහත් නිදහසක් ලැබූ ලෙසකිනි. අවන් හල් සේවිකාවන්ගේ පිටත්තර පෙනෙන ආචාර ශීලයට යටින් ටික ටික මතුවන අවිනීතකම් මගේ සිත කලකිරවයි. මගේ සිතට හිරිකිතක් ඇති කරවන කිසියම් ඉරියව්වක් හෝ රළු ස්වරයක් හෝ බොරු චාටුවක් හෝ තද ගතියක් හෝ නොබෝ වේලාවකින් අනාවරණය වේ. මම වහා එතනින් පලා ගොස් නැවත ඒ පැත්තට වත් නොයමි.

එහෙත් මිදෙරි අවන් හල සෙසු තැන්වලට වෙනස් විය. උදේ සිට සවස් වන තුරු කාමරයෙහි ඇතුළට වී වැඩ කරමින් සිටි මට එහි ගොස් කතා බහ කරමින් පැයක් හමාරක් ගත කිරීම සිතට මහත් සුවයක් ගෙන දෙන්නක් විය.

"අපට අලුත් යාළුවෙක් හම්බ වුණා," යි කියමින් වැඩිමාල් ස්ත්‍රිය දෙවෙනි ද මා අනිත් අයට හඳුන්වා දුන්නාය.

නොරිකො, සෙසු අමුත්තන් සමග සතුටු සාමිචි දෙඩන අතර මා, දෙසට හැරී ද වචනයක් දෙකක් කියයි. ඈට සියලු දෙනා ම ආමන්ත්‍රණය කෙළේ "නො·චං" කියා ය. මේ, "නොරිකො චං " යන්නෙහි කෙටි කිරීමක් යයි මට සිතුණි. සාමාන්‍යයෙන් වැඩිහිටියන්ගේ නමේ අගට යොදන්නේ "සං" කියාය. "චං" යි අමතන්නේ කුඩා අයට පමණි. ඇතැම් විට හුරතලේට ද කුළුපග කමට ද කෙනෙකුට "චං" කියා ආමන්ත්‍රණය කළ හැකැයි මම කල්පනා කෙළෙමි. නොරිකොට අවුරුදු විස්සකට වඩා විය නොහැකැයි මට හැඟුණි. මා ජපන් බස දැනගෙන සිටීම තමාට පහසුවක් සේ සැලකුවා මිස, ඒ ගැන ඈ අමුතු පුදුමයක් නොදැක්වූවාය. ඇය වෙන ස්ත්‍රීන් මෙන් "ඔබ හොඳ නිහොංගො[1] කතා කරනවා නේ" යි මැසිවිලි හඬකින් මට කීවේ නැත. ඒ අවන් හලට බොහෝ අය නිතර නිතර එන්ට පුරුදු වූයේ නොරිකොගේ මිතුරු ලීලාව නිසා යයි මට සිතිණි.ඇය සියලු ම අමුත්තන් හැසුරුවේ ලා බාල තරුණියක මෙන් නොව,මිනිස් චරිතය ගැන අත් දැකීමක් ලැබූ වැඩිහිටි ස්ත්‍රියක මෙන් ය. වරක් මැදි වියෙහි මිනිසෙක්, මඳක් මත් වී "නොරිකො ලස්සණ යි" යි කියනු මට ඇසිණි. ඈ තැන්පත් ලීලාවකින් ඔහුට ස්තුති කළාය. ඔහු ඊ වන තුරු බොමින් , කීප විටක් ඈට මෙවැනි ඇවිටිලි බස් දෙඩුවේය. බොහෝ වේලා ඔහු ඇසි පිය නොහෙළා ඇය දෙස බලාගත් වන ම සිටියේ ය.

"නො·චංගෙ මූණ නොබලා මට දවසක් වත් ඉන්න බෑ" යි ඔහු කීවේය. නොරිකො, තමාට පුරුදු විනීත බවෙන් නොතොරව ම, "දැන් ඔකුසං[2] බලාගෙන ඉන්නවා ඇති. වැඩිය පමා වෙන්නෙ නැතිව යන්න. මා දිහා බලන්න ඕන නම් ආයෙමත් හෙට එන්න බැරිය?" යි කීවාය.

1. ජපන් බස.
2. භාර්‍යාව.

WWW.EXPRESSLANKA.TK 12

ඔහු වහා මෙල්ල වී, තමා ගත් බීමවලට ගෙවා, යන්ට ගියේය.

අප කබුකි ගැන කතාවට වැටුනේ කෙසේ දැයි මට හොඳට මතක නැත. ගේෂා ස්ත්‍රීන් හෝ යොෂිවරා[1] අබිසාරිකාවන් මෙන්, වර්තමාන අවන් හල් ස්ත්‍රීන් ද නොයෙකුත් දේ ගැන කතා බහ කිරීමෙහි දක්ෂ වුවද ඔවුන් කබුකි වැනි කලාවක් කෙරෙහි උනන්දුවක් දක්වන්නේ කලාතුරකිනි. තොරිකො ද මා සමග කතා බහ කිරීමට මාතෘකාවක් කෙසේ හෝ සොයාගත යුතු නිසා කබුකි ගැන සඳහන් කලා දැයි මා තුල අල්ප මාත්‍රයක සැකයක් ඇති විය. ඇ කුමක් නිසා හදිසියෙන් එවැනි කතාවක් ඇද ගත්තා ද? ඇ කීප දෙනෙකු සමග බොහෝ වේලාවක් කිසියම් දෙයක් ගැන යුහුසුලු ව දොඩමින් සිටියාය. ඔවුන් දෙඩුවේ කුමක් ගැන දැයි මට මැනවින් තේරුණේ නැත. ළඟක දී පවත්වන ලද රැඟුමක් ගැන විය යුතු යයි මට යන්තම් සිතිණි. ඔවුන් දොඩන අතර මගේ සිතට තනි බවක් පිවිසියේය. මා ඒ සමාජයෙන් පිටත්තර කෙනෙකු ය යන හැඟීම නැවත මට ඇති විය. මම නිශ්ශබ්ද ව හෙමිහිට මී විත උගුර උගුර හිස් කරමින් සිටියෙමි. ඇ මගේ සිත ඉවකින් දැනගෙන මෙන් මා දෙසට හැරුණා ය.

"මම කබුකිවලට හරී-ඊ කැමතියි," යි ඇ තම හිස කරකවා දෑස පියා ගෙන කීවාය.

කබුකි නාට්‍යයන් අතර මා බොහෝ සේ ප්‍රිය කරන "කංජිංචො" ඇ දැක තිබේ දැයි මම ඇසුවෙමි.

"ඔව්, මම දැකල තියෙනවා, අවුරුදු දෙකකට ඉස්සර, කබුකි-සා සාලාවෙ. මේ ළඟදිත් ආයෙමත් දැක්කා," යි ඇ පිළිතුරු දුන්නාය.

මා පළමු වරට කබුකි රංග ශාලාවකට ඇතුල් වූ දිනයෙහි, වාසනාවකට මෙන් එහි රඟ දක්වනු ලැබුයේ "කංජිචො" ය. එද එන්නොසුකෙ ඉචිකාවා නම් නළුවා, බෙංකෙයිගේ චරිතය නියම වීර රසයකින් යුතු ව, නිරූපණය කල සැටි ද, ඔහු හනමිචියට[2] පැමිණි විට රැස් ව සිටි පිරිස අමුතු ස්වරයක් ආරූඪ කර ගෙන "ඔමොදකයා"[3] කියා කෑ ගැසූ සැටි ද අත් පොළොසන් දෙමින් තම සතුට ප්‍රකාශ කළසැටි ද මට හොඳින් මතකය.

"ළඟදී දැක්කේ කොහේදි ද?"

"මේජි- සා සාලාවෙ. කිචියෙමොන් කන්ඩායමයි නැටුවේ. කොෂිරො නම් ආයෙත් අහන්න ඕන නෑ- බෙංකෙයි හැටියට ඉතා ම ලස්සණට නැටුව. නුමුත් තොගෂි හැටියට ආපු කන්‍යා නම් මගේ හිතට ඇල්ලුවෙ නෑ."

1. තෝකියෝහි පිහිටි එදෙ අවධියෙහි සිට අභිසාරිකාවන් විසූ පෙදෙසක්.
2. "හනමිචි" යනු "මල් මග" යන තේරුම ඇති වචනයකි. වේදිකාවේ සිට ප්‍රෙක්ෂාගාරය දෙසට තෙරා එන මේ අතිරේක රංග භූමිට ඒ නම ව්‍යවහාර කරනු ලැබේ.
3. නළුවන්ගේ ආරූඪ නම් හැරුණු විට නළු ගෝත්‍ර නම් ද තිබේ. කිසියම් නළු පරම්පරාවකට අයිති නළුවෙකු හඳුන්වන්නේ මේ ගෝත්‍ර නාමයෙනි. නළුවකු හොඳින් රඟ පෑ විට, ප්‍රෙක්ෂකයන් ඔහුගේ ගෝත්‍ර නම කියා කෑ ගැසීම සිරිතකි. මේ ඔහුට කරන ප්‍රශංසාවක් ලෙස සලකනු ලැබේ.

WWW.EXPRESSLANKA.TK 13

"එ වුණත් කනයා මොරිතා ප්‍රසිද්ධ නළුවෙක්. " මම කීවෙමි.

"ඒක හැබෑ තමයි. තොගෂ් හැටියට කැපෙන්නෙ නැත කියලයි මම කිව්වෙ. කබුකි-සා සාලාවෙ දි නැටුවෙ දංජිරො ඉචිකවා, එන්නොසුකෙගෙ පුතා"

"බෙංකෙයි හැටියට වැඩිය ම ප්‍රසිද්ධ කොෂිරො නේද? මං නම් තාම එයා ව දැකල නෑ."

"ඔව්, කොෂිරොගෙ තාත්තා තමයි ඉස්සර හිටන් ම බෙංකෙයි හැටියට නටල ප්‍රසිද්ධ වුණේ"

"මට නම් ඔය විශේෂය කියන්න බෑ දැක්කත්. එන්නොසුකෙ නටපු හැටි ඉතාම අගෙයි කියලයි මට හිතුණෙ." යි මම කීවෙමි.

"එයාවත් බලන්න ඉඩක් ලැබුණොත්. එතකොට අපට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්," යි ඈ සිනා සෙමින් කීවාය.

අමුත්තෙකු පැමිණි හෙයින් නොරිකො මගෙන් සමාව ඉල්වා ඔහුට බීමක් පිළියෙළ කරන්නට පටන් ගත්තාය. ඇය එය අවසන් කොට මා සිටි තැනට නැවත ආ විට මම කතාව ආයෙමත් ආරම්භ කෙළෙමි.

"ලබන මාසෙ කිකුගොරො කන්ඩායම නටනව කබුකි සාලාවෙ" යි මම කීවෙමි.

"හැබෑවට? මම කිකුගොරො කන්ඩායම දැකල නෑ. එබිසොයි, ෂෝරොකුයි, කොෂිරොයි සහෝදරයො නේ. දන්නවද?"

"ඔව්, මම දන්නවා. කොෂිරො කිචියෙමොන් කන්ඩායමෙ," මම පිළිතුරු දුන්නෙමි.

"හැම දෙයක් ම දන්නව, අපටත් වඩා හොඳට," යි ඈ සතුටින් සිනාසී කීවාය. "ඇයි, කොෂිරො බැඳල ඉන්නේ කිචියෙමොන්ගෙ දුව"

"හැබෑවට? ඒ තරම් හොඳට මං දැනගෙන හිටියෙ නෑ - ඔය පවුල්වල විත්ති එහෙම" යි මම ද විහිළුවට මෙන් කීවෙමි.

"මේ මාස දෙක තුනේ සලාක පත් ගන්න අමාරුයි නෙ," යි ආවට ගියාට මෙන් කියමින් ඈ පළමුවෙන් කථා කරමින් සිටි අය සමග නැවත කථාවට වැටුනාය.

මඳ වේලාවකට පසු නොරිකො මගේ ඇසූ ප්‍රශ්නයට මම තිගැස්සුණෙමි. මම එබන්දක් බලාපොරොත්තු නුවුයෙමි.

"දවසක් යමු ද කබුකි බලන්න" යි හදිසියෙන් ඇගේ මුවින් පිට විය. අතික් අයට ඒ ප්‍රශ්නය ඇසෙන්නට ඇතැයි මට මඳක් ලජ්ජා පහළ විය. මා තුළහට ගත් ක්ෂණික කෝලය අවබෝධ කරගෙන මෙන් ඈ සෙසු අමුත්තන් දෙස හැරී,

"කබුකි ගැන හැම විස්තරයක්ම දන්නව," යි කීවාය.

අනතුරුව ඈ, අප දෙදෙනා අතර වූ කථාව ඔවුන්ට කියා දුන්නාය. ඔවුන් මා දෙස බැලුවේ විස්මය පත් වූ විලාසයක් තම මුහුණුවලට ඇරුඩ කරගෙනය.

WWW.EXPRESSLANKA.TK 14

නොරිකො ඇසූ ප්‍රශ්නය ගැන මම පසු ව හොඳින් කල්පනා කෙලෙමි. අවන් හලට පැමිණි සියලු ම අමුත්තන් සමග ප්‍රිය සල්ලාපයෙහි යෙදීම ඇගේ රාජකාරිය වූ හෙයින්,ඇය මා සතුටු කරන්ට එසේ කියන්ට ඇතැයි මම සිතුවෙමි. එහෙත් ඇත්ත වශයෙන් ඈ මා සමග කබුකි බලන්ට යන්ට අකැමැති නැත්නම්, මා මේ අවස්ථාව අත් හැරිය නොයුතුය. කබුකි නාට්‍යයන්හි නියම ආස්වාදය ලබන කෙනෙකු සමඟ රහ හලකට යෑම, විදේශිකයෙකු වශයෙන් තනි ව ම ගොස්, ඉංග්‍රීසි වැඩ සටහන කියවමින් රඟුමේ රස විඳින්ට තැත් කිරීමට වඩා වටිනා අත්දැකීමක් යයි මම විශ්වාස කෙලෙමි. තම සංස්කෘතියෙන් ම තමන්ට උරුම වූ ලැදිකම ඇති ප්‍රෙක්ෂකයන්, නළුවන් හතම්චිය දිගේ සාලාව හරහා රංග භූමියට පිවිසෙන විට, "එන කල් බලාගෙන හිටියා," යි කෑ ගසමින් ඔවුන්ට ආචාර කරන්නේද රඟුම්වල උත්සන්න අවස්ථාවන්හි ඔවුන්ගේ ගෝත්‍ර නාම හඬ නගා කියන්නේ ද ළෙහි හට ගත් සහජ උණුසුමකිනි. විදේශිකයෙකුට, නාරඹන්නන්ගේ මෙවැනි හැසිරීම් බලා ඒ ගැන මවිත වනු විනා, නියම රසයක් විඳිය නොහැකිය. කබුකි ගැන දෙඩන විට නොරිකොගේ මුහුණෙහි ඇති වූ ආලෝකය, තමා විඳි අපූරු ආස්වාදය සිහි කිරීමෙන් ඈ තුල නිතැතින් හටගත් ප්‍රබෝධයේ ලකුණක් බව මට වැටහිණි.

ඉන් පසු දවස් කීපයක් ම එවැනි කතාවකට ඇය ඇදගන්ට මා නොයෙක් වර සිතූ නමුත්, ඊට ඉඩක් නො ලැබුණි. අවන්හලට පැමිණි නොයෙක් තරුණයන් සමඟ නොරිකො කුළු පග කමින් දෙඩූ සැටි දුටු මම වඩාත් කුලැටි වීමි. මා ඒ සමාගමට අයිති නැති බව මට වඩ වඩා අවබෝධ විය. මා නොරිකො දැන ගත්තේ අද ඊයේ ය. එහෙත් මේ අය බොහෝ කල් සිට ඇය හඳුනනවා ඇත. ඔවුන් කතා කරන බස මට තේරෙන්නේ යන්තමිනි. ඔවුන් සඳහන් කරන්නේ තම තමන්ගේ අත්දැකීම් ගැන ය. නොරිකොට ද එවැනි අත්දැකීම් තිබෙන්ට ඇත. මා ඒ සියල්ලෙන්ම පිට ය.

සෙස්සන් සේ නොරිකො සමග මට කුළුපග විය නොහැකි බව කල්පනා වුණු විට, මගේ සිත කනස්සලු වූ නමුත්, අන් අතකින් නම් මට ඒ අවන් හලෙහි දී පාළුවක් නොදැනිණි. එහි පැමිණි අය මා සමග නොයෙක් දේ දෙඩති. මට සුරාවෙන් සංග්‍රහ කරති. තරමක් මත් වූ විට ඔවුහු, තම සහජ කෝලයෙන් මදක් මිදී, ඉතා සුහද වෙති. ඔවුන් නිතර ම අසන්නේ ජපානය ගැන මගේ හැඟීම කෙසේ ද කියා ය. මා ජපානයට කැමති බව කී විට, ඔවුහු අවංක ව සතුටු වෙති. ජපානය, වෙනත් පෙරදිග රටවල් සමග නැවත මිතුරුකම් පවත්වා ගත යුතු යයි ඔවුහු පවසති. යුද්ධය ගැන ඔවුන් දොඩන්නේ, ලජ්ජාවකින් හා පශ්චාත්තාපයකින් ද යුතු වය.

"යුද්ධ නම් එපා කරපු දෙයක්. යුද්ධ භයානකයි. යුද්ධ අපට හොඳට ම අප්‍රියයි. ඒවා තවත් ඕන නෑ," යි ඔවුන් කියන්නේ මුළු හෘදයෙන් මය.

"ජපානය වෙන පෙරදිග රටවලට වඩා දියුණුයි," යි මා කී විට,

"ඒ වුණත් අපි යුද්ධයෙන් පරාද වුණා නේ," යි ඔවුහු චින්තා පරවශ ව කියති.

WWW.EXPRESSLANKA.TK 15

"ජපානය යුද්ධයෙන් පරාද වුණාට මොකොද, පෙරදිග රටවල් ජපානය නිසා නිදහස ලැබුව නේ ද?" යි තම ආත්ම ගෞරවය රැක ගැනීමට මෙන් කෙනෙක් කියයි.

නොරිකො සමග කබුකි ගැන නැවත දෙඩීමට මට ඉඩක් ලැබුණේ සති කීපයකට පසු ව ය. මා මසකින් දෙකකින් තෝකියෝ හැර, කියෝතෝවට යන්ට සිතා ගෙන සිටි දවස්වලය, ඒ අවස්ථාව එළඹුණේ. මා අත තිබුණු මුදල් ඉක්මනින් අවසන් වේගන යන බව මට පෙනුණි. මම හතර පස් දෙනෙකුට ඉංග්‍රීසි උගන්වා, ස්වල්ප ආදායමක් ලද්දෙමි. ඒ හැර දෙතුන් පළක, කතාවල් පැවැත්වීමට මට ආරාධනා ලැබිණි. ඒ තැන්වලදී මා කතා කෙළේ මහායාන බුද්ධාගම හා එයින් කලාවන්ට ලැබුණු රුකුල ගැන ය.

තිබ්බතයෙහිදී ද නේපාලයෙහි දී ද මහායානය අවබෝධ කර ගැනීමට අවස්ථා ලැබුණු මට, එය කෙරෙහි තිතැතින්ම ඇල්මක් ඇති විය. ස්ථවිරවාද රටකින් පැමිණි මවැන්නෙකු මහායානය ගැන ප්‍රසංසාත්මක ව කතා කරනු ඇසූ ජපනු මා කෙරෙහි පැහැදුණහ. සාමාන්‍ය ලාංකිකයන්ගෙන් ඔවුන්ට නිතර ම අසන්ට ලැබුණේ ජපානයෙහි බුද්ධගාමක් නැත යන මතය ය. කථාවක් පැවැත්වීමට මා කැඳවනු ලැබූ සැම අවස්ථාවකදී ම මට සිරිතක් වශයෙන් සුළු මුදලක් ගෙවන ලදී.

මේ කෙසේ වෙතත් තෝකියෝවෙහි දී මට වියදම් අධික විය. කිසි විටක සිතට සැනසීමක්ද නොලැබිණි. සිතෙහි හට ගත් නොසන්සුන් කම නිසා, පැය ගණන් අරමුණක් නැති ව ඇවිද මම වෙහෙසට පත් වීමි. පාළුව නැති කර ගැනීමට නොවරද ම සවසට අවන් හලකට යාම නිසා, මුදල් අපතේ වියදම් විය. මිදෙරිය සොයා ගත් ද සිට මේ වියදම මට පාලනය කරන්නට හැකි වූ නමුදු, එහි නිතර නිතර යාමට මම පසු ව දී මඳක් කුලැටි වීමි. එහෙයින් මම වෙන අවන් හල්වලට පිවිසියෙමි.

එද මා මිදෙරියට ගියේ මඳක් රෑ වී ය. එහෙත් තවමත් කීප දෙනෙක් එහි සිටියහ. දෙසතියකට පමණ පසු මා දැකීමෙන් සතුටට පත් වූ විලාසයක් දැක් වූ නොරිකොගේ මුවින්, අඛණ්ඩ වාග් ධාරාවක් මා දෙසට ගලා ආවේය. මට ඒ සියල්ලක් නොතේරුණු නමුත් පසු ගිය සිකුරාද මා එන තුරු තමා බලාගෙන සිටි බවක් ඈ පැවසුවා යයි මට හැඟුණි. ඊට පෙර දවසක මට බීර දී සංග්‍රහ කල හිරොකවා සං ස්වල්ප වේලාවකට ඉස්සර ඇවිත් ගිය බව ඈ කීවාය. ඔහු මා ගැන ඇසුවේ ලු. මා සිකුරාද දවස්වල සිරිතක් වශයෙන් එහි එන බවක් ඇදහිමට ඈට කවර හේතු තිබුණේ දැයි මට තේරුම් ගත නොහැකි විය. මා එවැනි නියමිත දවසක එහි ගිය බවක් මට මතක තිබුණේ නැත. නොරිකො මා මෙසේ පිළිගත් වේලේ, අසළ සිටි තරුණ යුවලක් සිනා මුහුණින් යුතුව කුළුපග ලෙස මා දෙස බැලූහ. අවන් හලේ වැඩ කළ වැඩිමාල් ස්ත්‍රිය මා සෙස්සන්ට හඳුන්වා දුන්නාය.

"මේ දෙවෙන්දෙරා සං, අපේ අලුත් යාළුවෙක්." යි ඈ කීවාය.

WWW.EXPRESSLANKA.TK 16

එදා මිදෙරියට පැමිණි සියලු දෙනාගේ ම සැලකිල්ලට මම ලක් වීමි. මගෙන් අසන ලද නොයෙකුත් ප්‍රශ්න නිසා මට එක් අවස්ථාවක දී ලජ්ජා ඇති විය.

"දෙවෙන්දෙරා සං මෝන විදියෙ කෑම ද කන්නේ?" යි නොරිකො ඇසුවා ය.

"මම ජපානයෙ කෑමට තමයි කැමති."

"ජපානයෙ කොයි කෑමත් කනවද?"

"ඔව්, මම දැන් හැම විදියේ ම කෑම කනව."

"දෙවෙන්දෙරා සං සුකියකි, තෙම්පුරා ආදියට කැමතිද?" යි කෙනෙක් ඇසීය.

"ඔව්, මම කැමතියි. නමුත් ඒවා අලුත් කෑම වර්ග නේද? මේජි අවධියෙන් මෙහා හදපුවා. නියම ජපන් කෑම නෙවෙ," යි මම පිළිතුරු දුනිමි.

සියලු දෙනාම පැහැදුණු විලාසයකින් මා දෙස බැලූහ.

"අපට වඩා හොඳට දන්නවා නේ ජපානය ගැන."

"මොන කෑම ජාතිවලදට වැඩිය ම කැමති?" යි තවත් කෙනෙක් ප්‍රශ්න කෙළේය.

"මම වැඩිය ම කැමති සුෂිවලටයි, සෂිමිවලටයි."

"ඔවුහු වඩාත් මවිත වූහ.

" හැබැවට ම? පිට රට අය ඒව කන්නේ නෑ නේද සාමාන්‍යයෙන්?"

"නෑ තමයි. ඒත් පුරුදු වුණාම කැමති වෙන්න ඕන."

"වෙන රටවලත් මාළු කනව ද උයන්නේ නැතුව?"

"නෑ මං හිතන්නේ ජපානයේ විතරයි."

"චීනයෙත් සමහර පළාත්වල කනව නේද?"

"මං හරියට දන්නේ නෑ. මං චීනයට ගොහින් නෑ."

අවන් හල මදක් හිස් වනතුරු මම වීදුරුවක් තොල් ගසමින් එහි සිටියෙමි එහෙත් ඉක්මනින් හිස් වන හැඩක් නොපෙනිණ. ඊ බෝ වෙත් ම අමුත්තන් අඩු වනු වෙනුවට, තව තවත් අය පැමිණියහ. සියලු දෙනාට ම නොරිකො ආචාර කෙලේ බොහෝ කලක සිට හඳුනා ගෙන සිටි අය නැවත මුණ ගැසුණු විටක මෙනි.

මා ළඟ සිටි අය තම තමන් අතර දෙඩන්ට පටන් ගත් කළ, මම නොරිකොට කතා කෙළෙමි.

"මේ මාසෙ නටන කබුකි කවද ද බලන්න යන්නෙ?"

"කවද හරි යමු." යි කියමින් ඈ අමුත්තෙකු ඉල්ලූ බීමක් මිශ්‍ර කරන්ට පටන් ගත්තාය.

එදා "කබුකි බලන්ට යමු" යි ඈ කිවේ, තමා ඇත්තෙන් ම යාමට අදහස් කළ නිසා නොව, හුදෙක් පිළිසඳර දෙඩීම සඳහා යිමට නැවත සිතිණි.

WWW.EXPRESSLANKA.TK 17

"නොංචං ඉක්මනට විවාහ වෙන්න යන වගත් අපට ආරංචි යි. ඒ හැබෑද?" යි කෙනෙක් ඇසුවේය.

"නෑ. කවුද කිව්වෙ? එහෙම කල්පනාවක් නෑ දැන් ම" යි ඈ නොපැකිළ පිළිතුරු දුන්නාය.

"නොංචං අවුරුදු දහයක් හිටියොත් මං නොංචං එක්ක විවාහ වෙනවා." නොරිකො කෝප වූ විලාසයක් ආරූඪ කරගෙන ඔහු දෙස බැලුවාය.

"මම ලබන අවුරුද්දේ පාස් වෙල, අමෙරිකාවට යනවා. ගිහිල්ල අවුරුදු දහයකින් ආපහු එනවා. නොංචං ඉන්නව ද එතකල්?"

"අවුරුදු දහයක් වෙන කොට මම නාකි ගෑනියෙක් වෙවි." ඈ නැවත සිනා සෙමින් කීවාය.

"එහෙනම් එන්න මාත් එක්ක අමෙරිකාවට"

"ඇත්තෙන් ම අමෙරිකාව හොඳ රටක් වුණත්. මම වැඩිය කැමතියි ඉන්දියාවට යන්න. මම කැමතියි ඉන්දියාවෙ නැටුම් ඉගෙන ගන්න. මෙහෙම මෙහෙම බෙල්ල නටවන්න" යි ඈ මා දෙස බලමින්, භාරතීය නිළියක මෙන් බෙල්ල නටවන්නට තැත් කළාය.

"නොරිකො සං ඉන්දියාවෙ නැටුම් දැකල තියෙනව ද?" යි මම ඇසීමි.

"ඔව් මං සැරයක් දැක්ක, සාරාබායි නිළිය."

ඈ කවුන්ටරය පිටිපසින් එළියට ඇවිත්, මා හා වෙනත් කෙනෙකු අතර වූ හිස් බංකුවක් මත වාඩි වූවාය.

"ඔනේසං,[1] තනියම පුළුවන් ද?" ඈ වැඩිමාල් සේවිකාවගෙන් ඇසුවාය.

"පුළුවන්, පුළුවන්, නොංචං ඔහොම ඉන්න."

"නොරිකො සංට ජපන් නැටුම් පුළුවන්ද?" යි මම ඇසීමි.

"ටිකක් පුළුවන්. ඉස්කෝලෙ යන දවස්වල ඉගෙන ගත්තා."

"මම උගන්වන්නම් දෙවෙන්දෙරා සංට ලේසි නැටුමක් දෙකක්. ඉතා ම හොඳ තැග්ග නේ, යන කොට ගෙනියන්න," යි හදිසියෙන් හටගත් උනන්දුවකින් මෙන් ඈ කීවාය.

"බොරු නේ ද මාත් එක්ක කබුකි බලන්න යනවයි කිව්වෙ?" යි මම ඇසීමි.

"නෑ බොරු නෙවේ." යි කියමින් ඈ තම දින පොත ඔඩොක්කුවෙන් ගත්තාය.

"මෙන්න මේ දවස්වලින් ඕන දවසක් හොඳයි. කා මොකු දෙ-තේරෙනවයි?"

"අඟහරුවාද, බ්‍රහස්පතින්ද, සෙනසුරාද නෙ?"

"නොදන්න දෙයක්නෑ. හැබැයි හැන්දෑවට බෑ. මම මෙහාට එන්න ඕන හය හමාරට."

---

1. 'අක්කා' යන තේරුම ඇති වචනයකි. වැඩිමාල් අයට මෙසේ ආමන්ත්‍රණය කිරීම සිරිතකි.

WWW.EXPRESSLANKA.TK 18

"එහෙනම් සෙනසුරාද යමු"

මෙතෙක් වේලා මුල්ලක වාඩි වී, වැඩි කතාවක් බහක් නැතිව සිසිවක් බොමින් සිටි තරුණ පෙනුමකින් යුත් කෙනෙක්, ඇවිත් මා ළඟින් වාඩි වී ය.

"මගෙ නම නොගුචි," කියා ඔහු මට අත දුන්නේය.

ඔහු අපේ කතාවට බාධා කරනවාට මම වඩා කැමති නොවීමි.

"ප්‍රසිද්ධ නොගුචිගෙ නෑයො ද? යෝනෙ නොගුචි කියන කවියා? එයාගෙ පුතා, ඉසමු නොගුචි - ප්‍රතිමා ශිල්පියා?"

"මං ....වෙනයි....මට මුකුත් කරන්න බෑ...වසෙද විශ්ව විද්‍යාලයේ අවුරුදු තුනයි. ....ඉගෙන....ගන්නත් බෑ."

"වසෙද විශ්ව විද්‍යාලයට යන්නෙ ඉහල පෙළේ අය නේද?" යි මම ඇසීමි. "බොහොම හොඳ තැන"

ඔහු සිනාසුණේය.

"ඒ වුණත් මට මුකුත් කරන්න බෑ. බොන්න. විතරයි පුළුවන්..." ඔහු මට බීමක් පිරිනැමුවේය. අසතුටින් වුව ද මම එය පිළිගත්තෙමි.

"මම දැක්කා දෙවෙන්දෙරා සං මෙහාට එනවා දෙතුන් දවසක්. මම දැන්...අවුරුද්දක් විතර වෙනවා...මෙහාට එන්න පටන්ගෙන."

"මම මාසයක් වත් නෑ"

"එද හිටියෙ තෝකියො විශ්ව විද්‍යාලයේ ආචාර්‍ය කෙනෙක්. එයා හොඳට දන්නව ඉන්දියාව, ලංකාව ගැන. මම මුකුත් දන්නේ නෑ. මම මෝඩයෙක් ඒත් දැන් නම් පොත් කියවනව, දෙවෙන්දෙරා සං හම්බවුනායින් පස්සෙ"

ඔහු ඇස් දෙක බාගෙට පියාගෙන ය, දෙඩුවේ.

"නොංචං, තව බීර, දෙවෙන්දෙර සංට" යි ඔහු කීවේය.

"ඔය ඇති නොගුචි සං. පැයදෙකක් තුනක් අතන ඉඳගෙන බිව්වා නෙ?" හෙට විද්‍යාලයට යන්නෙ කොහොමද?" යි නොරිකො කීවාය.

"කමක් නෑ, තවත් එක වීදුරුවයි, දෙවෙන්දෙරා සං හම්බ වුණ සන්තෝසෙට,"

"නොංචං හොඳ කෙල්ල. මම නොංචංට ආදරෙයි." යි ඔහු නොරිකොට ඇසෙන සේ මා දෙස හැරී කීවේය.

අවන් හලින් අන්තිමට පිට වී ගියේ අප දෙදෙනාය. නොගුචි සුරා මතින් වැනුණේය.

"නොගුචි සං පරෙස්සමින් යන්න. ඕ-යසුමි නසයි." [1]යි නොරිකො දෙර ගාවට විත්, එය හරිමින් කීවාය.

1. "සුවසේ නිද ගන්න" යන තේරුම් ඇති ආචාර පාඨයකි.

WWW.EXPRESSLANKA.TK 19

2

එදා කබුකි බලා ආපසු යන විට, දවසක තම ගෙදරට එන මෙන් නොරිකො මට ආරාධනා කළාය.

"ඔතෝසං[1] බලාගෙන ඉන්නවා, දෙවෙන්දෙරා සං හම්බ වෙන්න," යි ඈ කීවාය.

"තාත්ත කොහොම ද මං ගැන දන්නෙ?" මම පුදුම වී ඇසීමි.

"ඇයි දන්නෙ නැත්තෙ? මං දෙවෙන්දෙරා සං ගැන ඔක්කෝම කියල තියෙනවා. තාත්තට කියන්නේ නැතුව මට යන්න පුළුවන් ද මෙහෙම?"

"මම එහෙම එන එක හොඳ ද, මාව අඳුනන්නෙත් නැති කොට?" යි මම ඇසීමි.

"ඒකට කමක් නෑ. තාත්තත් එක විදියක සිත්තරුවෙක්, දෙවෙන්දෙරා සං වගේ ම. දෙවෙන්දෙරා සං එක්ක කතා කරන්න කැමතියි කිව්ව."

"තාත්ත කැටයම් චිත්‍ර අඳිනවද?" යි මම උනන්දු වී ඇසුවෙමි.

"කැටයම් චිත්‍ර අඳින්නේ නෑ. නුමුත් කිමොනොවල ලාංඡන අඳිනව. ඒ කාලෙ තාත්තා කබුකි නළුවන්ගෙ කිමොනොවලත් ලාංඡන ඇඳල දෙනව. එන්න වෙලාවක හැබැයි ගෙදර කිලුටුයි......."

1. "පියා" යන්නට ගෞරවාර්ථ වචනයයි.

WWW.EXPRESSLANKA.TK

"ඒක වෙන්න බෑ. ජපන් ගෙවල් කොහොමටත් පිරිසිදුයි." යි මම කීවෙමි.

"ඒ වුණත් අපේ ගේ දැක්කම පුදුම වේවි. අමුතුවෙන් ම අපිරිසිදු"යි ඈ සිනාසී කීවාය.

තම නිවස පිහිටි තැන ඈ මට රූ සටහනක් ඇඳ විස්තර කර දුන්නාය.

"පුළුවන් නම් ලබන බදාදා හවසට එන්න. මම බදාදා යන්නෙ නෑ අවන් හලේ වැඩට."

ඊළඟ බදාදා, ඈ කී පරිදි මම ෂිබුයා සිට විදුලි රියෙහි නැඟ, සංගෙජයා මං සන්දිය තෙක් ගියෙමි. සංගෙංජයාවෙන් බැස, වකබයෂි පැත්තට යන පාර ඔස්සේ ස්වල්ප දුරක් ඇවිදගෙන යන විට, කිසිවෙක් මට ආමන්ත්‍රණය කෙළේය.

"දෙවෙන්දෙරා සං ද? මම බලා හිටිය එන කල්. මම හිදෙජි. නොරිකොගෙ අයියා," යි කියා ඔහු නැමී මට ආචාර කෙළේය.

ඔවුන් විසුවේ, කුඩා වතු කෑල්ලකින් වට වූ ගේ පොඩ්ඩක ය. තමා ආණ්ඩුවෙන් මුදල් ණයට ගෙන, ගේ සෑදූ සැටි, යන ගමන් හිදෙජි මා සමඟ කීවේය.

"මේකෙ හුඟක් හරිය හැදුවෙ මම තනියම. වැඩි වියදමක් ගියෙ නෑ." අපේ අඩි ශබ්දය ඇසී නොරිකො විත් ඉස්සරහ දොර හැරියාය.

"පාර සොයා ගන්න අමාරු වුණා ද?" යි ඈ සිනා සෙමින් ඇසුවාය.

"නෑ, මම මෙතනට වෙන කල් වරද්දන්නෙ නැතුව ආවා. නොම්බරේ අහගෙන එන්න තිබුණා කොහොමටත්," යි මම කීවෙමි.

"ජපානයේ, ලිපිනය විතරක් බලලා ගෙයක් සොයාගන්න බොහොම අමාරුයි. වකබයෂි-චො කියන්නෙ මේ හරියටයි. ඒ වුණත් දෙසිය විසිපහ දරන තවත් ගෙවල් තියෙනව වකබයෂි- චොවල," යි හිදෙජි කීවේය.

මා සපත්තු ගලවා ගෙට නැඟ ඇතුල් වූ විට, නොරිකො සපත්තු කුට්ටම ගෙන, ගෙයින් පිට වන විට එය පයෙහි ලා ගැනීමට පහසු වන විදියට හරවා පඩිය උඩ තබා, මා ගෙතුළට කැඳවාගෙන ගියා ය.

"අපේ ගේ ඉඩක් නෑ දෙවෙන්දෙරා සංට හරියට සංග්‍රහ කරන්න."

"නෑ. මේ තියෙන ඉඩ මදෑයි? මං ඒ හැටි විශාල මිනිහෙක් නෙමෙනේ." යි කියමින් පහත් මේසයක් ගාව පැදුරු බිම තබා තිබුණු කුසිම මත වාඩි වීමි. ඉක්බිති ඈ පසඟ පිහිටුවා මට ආචාර කළාය.

"අපි බොහොම සන්තෝෂයි ආවට."

නොරිකො කලින් කීවාක් මෙන්, ඒ කාමරය සාමාන්‍ය ජපන් ගෙවල් මෙන් දැකුම්කළු නොවීය. වෙන බොහෝ ගෙවල්වල මෙන්, බිත්තියෙහි එල්ලන ලද සිතුවම් පට වත්, මල් බඳුන වත් එහි නොපෙනිණි. එද මට

සංග්‍රහ කිරීම සඳහා, නිදන කාමරයක් අස් පස් කර විශේෂයෙන් පිළිවෙළ කරන ලද බව මට තේරුණේය.

"දෙවෙන්දෙරා සංට හීතල ඇති නේ ද?" යි අසමින් හිදෙජී අඟුරු කබලක් දෑතින් ඔසවාගෙන විත් මා ළඟ තැබුවේය.

"තාත්ත එළියට ගිහිල්ල. ඉක්මනට ඒවි." යි කියමින් නොරිකො ගෙතුලට ගියාය.

හිදෙජී මා සමග කතා කෙලේ ඉංග්‍රීසියෙන් වුව ද ඔහුගේ මුවින් වචන පිට වූයේ මහත් ආයාසයකින් බව මට පෙනුණි. බොහෝ විට ඔහුගේ උච්චාරණය තේරුම් ගැනීමට ද මට අපහසු විය. ඔහුට කන් දී ගෙන සිටීම ද ඔහු කී දේ වටහා ගැනීම ද මටත් මහත් වෙහෙසක් ගෙන දුන් ක්‍රියා විය.

"හිදෙජී සං වැඩ කරන තැන හුහක්දුර ද?" යි මම ඇසුයෙමි.

"මේ දවස්වල මම ගෙදරමයි ඉන්නෙ," යි ඔහු කෙටියෙන් පිළිතුරු දුන්නේය. මා වැඩි විස්තරයක් ඇසුවේ නැත. ජපන් අකුරු පහසු කිරීමේ ප්‍රශ්නය ගැන අපි සාකච්ඡා කෙළෙමු. චීන අකුරු අත හැර දැම්මොත්. පිට රැටියන්ට ජපන් බස ඉගෙනීමට මහත් රුකුලක් වන බව මම කීවෙමි. චීන අකුරු පාවිච්චි නොකළොත්, ලියන ලද වාසගමේ තේරුම වටහා ගැනීම අපහසු යයි ඔහු තර්ක කෙළේ ය. එක ශබ්දයට නොයෙකුත් තේරුම් තිබෙන හෙයින්, ඒ ඒ තේරුම ගෙන දෙස වෙන වෙන චීන අකුරු පාවිච්චි කල යුතු බව ඔහු ඇඳහුවේ ය.

අප සාකච්ඡා කරන අතර, මගේ මුළු සැලකිල්ල ඔහුගේ වාදය කෙරෙහි නොරැඳිණි. අපේ සමාගමට නොරිකො නොඑන්නේ මන්දැයි මම කල්පනා කළෙමි. අකුරු පිළිබඳ ප්‍රශ්නය ගැන මගේ උනන්දුවක් තිබුණු නමුත්, එවේලෙහි දිගට දුරටජ් ගැන වාද කරන්ට මට සිතක් නොවී ය. මා ඔහු කී දේට කන්දී ගෙන සිටින විලාසයක් දැක් වූ නමුත්,වරින් වර ඔහුගේ කතාව කන්දෙස්කිරියාවක් සේ මට දැනිණ.

නොරිකොගේ කට හඬ ඇසීමෙන් මගේ සිත සංසුන් වීය.

"ඔතෝසං ඇවිල්ල නේද?" යි කියමින් ඈ කාමරයට විත්, මිදුලට හැරෙන දොර පසකට තල්ලු කොට, පිටත බැලුවාය.

"ඔතෝසං එන්න ඇතුළට. ඇයි මිදුලෙ ඉන්නෙ? දෙවෙන්දෙරා සං ඇවිත් ඉන්නවා.....ඔතෝසං හරි ලැජ්ජාකාරයා," යි ඈ මා දෙසට හැරී කීවාය.

නොරිකොගේ පියා, මිටි, මදක් තරබාරු පුරුෂයෙක් විය. කළු පැහැයට හුරු කිමොනොවක් ඇඳ සිටි ඔහු, තම ලී සෙරෙප්පු කුට්ටම එළියෙහිතබා, ඇතුල් වී, පැදුර මත දන ගසා වාඩි වී, නැමී මට ආචාර කෙලේය.

"එද නොරිකො කබුකි බලන්න එක්ක ගියාට බොහොම ස්තුතියි," යි ඔහු කීවේය.

WWW.EXPRESSLANKA.TK 22

"මොනව ද දෙවෙන්දෙරා සං ට කෑමට හැදුවෙ?" යි ඔහු නොරිකොගෙන් ඇසීය.

"දෙවෙන්දෙරාසං ජපන් කෑමට කැමති හන්ද සුෂි හැදුවා."

"මම ගිහිල්ල කිරි ගේන්න ද?"

"එපා, සකෙ[1] තියෙනවා. දෙවෙන්දෙරා සං සකෙවලට කැමති නේ, කිරිවලට වඩා?" යි නොරිකො මගෙන් ඇසුවාය.

"ඔව්, ඇත්තෙන් ම මම නම් නැමති සකෙවලට තමයි. නොරිකො සං වැඩ කරන අවන් හලේ සකෙ නෑ නේ?"

"දෙවෙන්දෙරා සං හරියට ජපන්කාරයෙක් වගේ මයි." යි ඇගේ පියා මදහසින් යුතුව කීවේය.

නොරිකො උණු කරන ලද සකෙ බඳුන ගෙනැවිත්, මේසය ගාව දන ගසා වාඩි වී, ඉතා සීරුවට බඳුන අතින් අල්ලා අපේ කුඩා සකසුකිවලට[2] වත් කල සැටි මගේ සිතෙහි මැනවින් ඇඳී තිබේ. ඇ බොන්නේ නැද්දැයි මා ඇසූවිට,

"ඉතා ම පොඩ්ඩක් ගන්නම්," යි කියා සකසුකියක් අතින් ගෙන මා දෙසට දිගු කළාය. මා එය පිරවූ විට ඇ එය මේසය මත තබා, නැවත දෑතින් ගෙන, තොලෙහි තබා රස බලන්නාක් මෙන්, උගුර උගුර බීවාය. ඇ ගෙට ගොස් අපේ කෑම රැගෙන ආ සැටි ද මට අමතක නොවේ. ඇ දන ගසා දොර පලුව පසෙකට තල්ලු කර හැර, එහා පැත්තේ බිම තැබූ කෑම බඳුන රැගෙන මෙහා පැත්තෙහි තබා, නැවත දොරපලුව තල්ලුකර වසා බඳුන අතට ගෙන ආවේ කිසියම් චතාවතක් පුරන්නා සේ ය. මේ සියල්ල ම ඇය කෙළේ උත්පත්තියෙන් ලැබූ ඇබ්බැහිකමකින් මෙනැයි මට සිතිණි. අවන් හලෙහිදී මට හමුවූ නොරිකො ද ගෙදර සිටි නොරිකො ද කෙතරම් වෙනස් වූ දෙදෙනෙක් දැයි මම කල්පනා කෙළෙමි.

චියෙකො ගෙතුළසිට පැමිණියේ, අප කමින් සිටි අතරය. ඇ හින්දැරි, උස, දැකුම්කලු ස්ත්‍රියක් වූවාය.

"මේ මගේ භාර්‍යාව, චියෙකො," යි හිදෙජී ඇය මට හඳුන්වා දුන්නේය. ඇ මාසහයක පමණ කුඩා ළදරුවෙකු අතෙහි නළවමින් ඇවිත් අප ළඟ වාඩි වූවාය.

"සමාවෙන්න, අද කෑමට අමුතුවෙන් මුකුත් හදන්න බැරි වුණා" යි ඇ මට කීවාය.

ඇ කතා කෙළේ සාමාන්‍ය ස්ත්‍රීන්ගේ හඬට වඩා මන්ද්‍ර ස්වරයකිනි.

"නොරිකො නිතර ම කියනවා, දෙවෙන්දෙරා සං කොයි තරම් කරුණාවන්ත ද කියල. අනේක වාරයක් ස්තුතියි."

---

1. බත්වලින් සාදන මධු වර්ගයක්.
2. සකෙ බොන, ඉතා කුඩා, මිටි නැති බඳුන් වර්ගයක්.

WWW.EXPRESSLANKA.TK 23

කෑම කෑවායින් පසු, නොරිකො, තම පියා කිමොනොවල අඳින රූ සටහන් මුද්‍රණය කර තිබුණු පැරණි පොතක් මට පෙන්නුවාය.

"ඔතෝසං, මේවා විස්තර කරල දෙන්න දෙවෙන්දෙරා සංට," යි ඈ තම පියාට කීවාය.

ජපානයේ හැම පවුලකට ම විශේෂ ලාංඡනයක් තිබෙන බව ද, උත්සව අවස්ථාවලදී ඒ ඒ අය තම පවුලට අයිති ලාංඡනය දමන ලද කිමොනො අඳින බව ද නකාජිමා සං මට විස්තර කර දුන්නේය. කබුකි නළුවන්ගේ නළු ගෝත්‍රයට අයිති ලාංඡනවල රූ සටහන් ද පොතෙහි තිබිණි.

"මේ තමයි කිකුගොරෝ ලාංඡනය. මේක එන්නොසුකෙ ලාංඡනය. මේක කිචියෙමොන් නළු ගෝත්‍රයට අයිතියි."

සමහර මෝස්තර සතුන්ගේ රූපවලින් ද සමහර ඒවා කුරුල්ලන්ගේ රූපවලින්ද වෙනත් ඒවා මල්වල හැඩහුරුකමට ද නිර්මාණය කර තිබුණි. අපේ නෙළුම් මල් මෝස්තරවලට බෙහෙවින් සමාන මෝස්තර ද ඒ ලාංඡන අතර විය.

තමා පියාගේ රාජකාරිය ගැන නොරිකො ඉතා උනන්දුවෙන් කතා කළාය. නකාජිමා සං වැඩිය කිසිවක් දෙඩුවේ නැත. තම ශිල්පය ගැන සඳහන්කිරීමට ඔහු ලැජ්ජා වූ බවක් මට පෙනිණි.

"තාත්ත සීත කාලෙටත් උෂ්ණ කාලෙටත් එක වගේ ම හිබචිය[1] ගාව ඉඳගෙන මොන්[2] ඇඳල තමයි අසනීප වුනේ. තමාත් වැඩිය සනීපයක් නෑ."

"කොහොම ද කිමොනොවලට මේ ලාංඡන දමන්නේ?" හරි ම සියුම් වැඩක් නේ?" යි මම ඇසීමි.

"ඉස්සෙල්ල මෝස්තරේ කඩදාසියක ඇඳල ඒකෙ ම කපන්න ඕන. ඊට පස්සෙ ඒ කඩදාසි මෝස්තරේ කිමොනො රෙද්ද උඩ තියල. ගලේ සායම් උරච්චි කරල, තෙලිකුරෙන් කිමොනොවෙ අඳින්න ඕන. සායම් කරන ගමන්, හිබචිය උණුහුමින් කිමොනො රෙද්ද නිතර වේලන්න ඕන. නැත්නම් ඔක්කොම බොඳ වෙනවා."

නොරිකො එය විස්තර කළ අතර, නකාජිමා සං නැගිට ගොස්, තමා පාවිච්චි කරන ආයුධ ගෙනැවිත් මට පෙන්නුවේය. තමා කඩදාසියක කැපූ ඉතා සියුම් මෝස්තරයක් ද ඔහු මට තෑගි කෙළේය.

"ඕක පරෙස්සමෙන් තියාගන්න. හරි වටින දෙයක්," යි නොරිකො මට කීවාය.

මා රෑ වී ආපසු යන විට හිදෙජි හා චියෙකො ද නොරිකො ද මා සමග මහ පාර තෙක් ඇවිදගෙන විත් මා විදුලි රිය පොළ ගාවට ඇරලූහ.

---

1. ගිනි කබල ලොකු මැටි බඳුනකට වැලි දමා, ඒ මත ගිනි අඟුරු තැබීමෙන් මෙය පිළියෙළ කරනු ලබයි.
2. ලාංඡනවලට කියන නම ය.

WWW.EXPRESSLANKA.TK 24

"දෙවෙන්දෙරා සංට පාලු ඇති ජපානයේ නේද?" යි යන ගමන් චියෙකො ඇසුවාය. "කැම එහෙම තනියම පිහගන්නවද?"

"නෑ, මට උයන්න කම්මැලියි. මම නිතරම පාන් කනව. ඉඳල හිටල කඩේකට යනවා."

"නොරිකොට පුළුවන් නෙ දවාලට මොනව හරි හදල දෙන්න. දවාලට වැඩක් නෑ නෙ?"

චියෙකො එසේ කීවේ කවර අදහසකින් දැයි දැන ගැනීමට මට ඇගේ මුහුණ දෙස බැලීමි. හිදෙජි නිශ්ශබ්ද විය.

"මම ගිහිල්ල කරදර කරන්න හොඳ නෑ. නිතර ම වැඩ. සිතුවම් අඳිනවා," යි නොරිකො නොපමා ව කීවාය.

"දවසක් මම ලංකාවේ කරි හදන්නම්. ඔක්කොම එක්ක එන්න මං ඉන්න තැනට," යි මම කීවෙමි.

WWW.EXPRESSLANKA.TK 25

3

මුඑ නකාජිමා පවුලට ම කෑමට මා ආරාධනා කළ නමුත් එද පැමිණියේ හිදෙජි හා නොරිකො පමණි. ළදරුවා බලාගැනීමට තිබෙන නිසා චියෙකොට පැමිණීම නොහැකි වූ බව ඔවුහු කීහ.

"නකාජිමා සං එන්නේ නැද්දැ" මම ඇසීමි.

"තත්තා ලැජ්ජයි. යන්නේ නෑ කොහේවත්," යි නොරිකො කීවාය.

මා හඳුනාගත් ලාංකික ශිෂ්‍යයෙකුගෙන් මට ලැබුණු ලංකාවේ තේ වත්කර මම ඔවුන්ට දුන්නෙමි.

"අයිය නම් හරි කැමැතියි ලංකාවෙ තේවලට" යි නොරිකො කීවාය.

"ඇයි නොරිකො සං කැමති නැද්ද?" යි මම ඇසීමි.

"මම අකමැති නෑ. ඒ වුණත් මම වැඩිය ම කැමති ජපන් තේවලටයි" යි ඈ පිළිතුරු දුන්නාය.

"ජපන් තේ තිත්ත නේ," යි මම කීවෙමි.

"තිත්ත වුණාට රහ හොඳයි. ජපන් කැවිලි බොහොම පැණි රහ නේ?" ඒව කල තේ බොන කොට හොඳ ගණනයි."

"ලංකාවේ තේ බොන්න අපට වැඩිය ඉඩ ලැබෙන්නේ නැ. තේකෝප්පයක් යෙං පනහක්[1] විතර වෙනවා." යි හිදෙජි කීවේ ය.

තේ බී අවසන් වූ පසු, නොරිකො කෝප්ප තුන පයිප්පය ගාවට ගෙන ගොස් සේදුවා ය. උදේ කෑමෙන් පසු නොසෝද එසේ ම තිබුණු වෙනත් බඳුන් ද ඇ සෝද, මේසය පිස දමා, කෑම කන තැන පිරිසිදු කළාය.

මම කුකුල් මස් ගෙනැවිත් කරියක් සෑදුවෙමි. බොහො කාලයක් තනිකර ජීවිතයක් ගත කළ මම, මනා සේ කෑම පිසීමට පුරුදු වී සිටියෙමි. ශාන්ති නිකේතනයෙහි වාසය කළ දවස්වල, එහි කෑම මට අප්‍රිය වූ හෙයින්, මම කුඩා ගෙයක් වෙන ම කුළියට ගෙන, පොල්, මිරිස් ආදිය මිලයට ගෙන, සිංහල කෑම පිස කෑවෙමි. කෑම පිසීමට කාලය ගත වන නමුත්, මම එයින් විනෝදයක් ලැබුවෙමි. ස්ත්‍රීන්ට වඩා හොඳට පිරිමින්ට කෑම පිසිය හැකැයි මට නොයෙක් වර සිතිණි. එහෙත් අප්‍රිය කටයුත්ත වූයේ හැළි වළං සේදීම ය. දවසට දෙතුන් වරක් හැළි වළං සෝද එපා වූ විට, ඉන්දියාවෙහි දී වුව ද මම බොජුන් හලකට ගොස් කමි. නැතහොත්, හැළි වළං ආදිය වඩා පාවිච්චි කරන්ට සිදු නොවන විදියේ, පාන් හෝ එවැනි කෑමක් කා වේලාව පිරිමසා ගතිමි.

ජපානයට ආවායින් පසු මා සිංහල කෑම පිසූ පළමු වතාව විය. ඒ සිරිතක් වශයෙන් මා කාමරයෙහි කෑවේ උදේ අහර පමණි. උදේට මම පාන් කෑල්ලක් කර කරගෙන, තම්බපු බිත්තරයක් සමග කමි. අනතුරු ව මම පළතුරු අනුභව කරමි. හැම පැය බාගයකට වරක් ම තේ කෝප්පයක් සාදගෙන බිවූ හෙයින්, මට හවස් වන තුරු බඩ ගිනි නොදැනුණි. සවස මම බැහැර ගොස්, සොබා[2] වර්ගයක් හෝ ලාබෙට ගත හැකි එවැනි කෑම ජාතියක් අනුභව කරමි. රෑ වන තුරු ඇවිද ආපසු කාමරයට ගිය විට, මම නැවත තේ කෝප්පයක් බීලාය, නිද ගන්නේ.

කරියක් සෑදීමට වුවමනා කරන තුනපහ වර්ග ජපානයෙහි ගත නොහැකි හෙයින්. මා පිසූ කරියෙහි නියම සිංහල රසය නොවීය. මා එය සෑදුවේ, කඩේ සාමාන්‍යයෙන් විකිණීමට තිබෙන "ඉන්දෙ කරේ" යි කියන තුනපහ වර්ගය පාවිච්චි කිරීමෙන් ය. එයින් ලැබෙන්නේ ඉන්දියාවේ කරියෙහි රසය මිස, ලංකාවේ කරියෙහි රසය නොවේ. සිංහල කරියෙහි රසය මඳක් වුවද ලබා ගැනීම සඳහා කඩවල විකුණන්ට තිබෙන "තෝහරෂි" යන මිරිස් කුඩු ගෙන ඒවා යහමින් දැමුවෙමි. පොල් කිරි වෙනුවට එළ කිරි පාවිච්චි කෙලෙමි.

මා ඉතා ඕනෑකමින් කෑම පිසූ නමුත්, ස්වල්පයක් වත් කෑවේ හිදෙජි පමණි. නොරිකො නම් යන්තම් කට ගෑවා විතරයි. ඇගේ දෑසෙහි කඳුළු පිරිණි. ඇ වහා වතුර බී, මා ගෙනැවිත් තබා තිබුණු රාබු අච්චාරු සමඟ නිකම් බත් කෑවාය.

---

1. යෙං පනහක් සත හැට පහ පමණ වේ.

2. යව පිටියෙන් සාදන ලද, චීන නූඩල්වලට සමාන, කෑම වර්ගයක්. මෙහි නොයෙක් විශේෂ තිබේ. චීන සොබා වර්ග ද ජපන් සොබා වර්ග ද ජපනුන්ගේ එදිනෙද ආහාරයට බෙහෙවින් ඇතුළත් වේ.

WWW.EXPRESSLANKA.TK 27

එදිනට පසු නොරිකො මා බලන්ට නොයෙක් වර ආවාය. ඔකුසාවා සිට මිදෙරි අවන් හලට පයින් ගමන් කළහොත් විනාඩි විස්සකට වඩා ගත වන්නේ නැත. බොහෝ දිනවල නොරිකො දවල් එකොළහට පමණ ඇවිත්, කාමරය අස් පස් කොට, මට කෑම පිස දී, සවස් වන තුරු මා සමඟ කතා බහ කරමින් සිට, පසුව අවන් හලට යයි. ඇය පිටත් වී යන්නේ ඉතා අකැමැත්තෙනි.

"එතන තව කොච්චර කල් වැඩ කරන්න වේවි ද දන්නේ නෑ. මට දැන් එපා වෙලා."

"ඇයි ඉතින් යන්නේ හැම ද ම?" යි මම ඇසීමි.

"නොගිහින් කොහොමද ? අයියට රස්සාව නැති වෙලා දැනට හාර මාසයක් විතර වෙනවා. මාස් පතා ඉන්ෂුවරන්ස් මුදල් හම්බ වුනාට ගෙදර වියදමට මදි."

"තාත්ත වැඩ කරන්නෙ නැද්ද?"

"තාත්තට දැන් ඒ හැටි වැඩ හම්බ වෙන්නේ නෑ. යුද්දෙන් පස්සේ වැඩ නැති වෙලා ගියා. දැන් කවුද ඒ තරම් කිමොනො අඳින්නේ? අපි යොක් සුයාවල ඉන්දැද්දී රජ පවුලෙ කිමොනොවල ලාංඡන දමන්නත් කැඳවන්නේ තාත්තවයි."

නොරිකො දිනපතා එන්ට වූවාය. එහි අමුත්තක් ඇතැයි ඇට වත් මට වත් නොහැඟුණි එය අප විසින් සිතා මතා පිළියෙළ කරන ලද්දක් නොවී ය. මා උදේ නැගිට වැඩ කරන්ට පටන් ගන්නේ ඈ එන බලාපොරොත්තුවෙන් ය. වෙන ද මෙන්, ලොව දෙස බැලීමට අකමැත්තෙන්, දෑස පියා ගෙන, ඇඳෙහි ගුලි වී, දවල් වන තෙක් ම නොසිටිමි. පැය කීපයකින් නොරිකො මගේ ඇස් හමුවෙහි සිටී යි යන බලාපොරොත්තුව මා අවදි කරවා වැඩ ට පොළඹවයි."ඔහයො ගොසයිමසු"[1]යි කියන ඇගේ හීන් උස කට හඬ දෙර ගාව ඇසෙන තුරු, අභ්‍යන්තරයෙහි උද වූ කිසියම් අලුත් උනන්දුවක්, සෑම ද ම උදෑසන මා සිත වෙළාගෙන තුබූ කණස්සල්ල පහකොට එහි බැබළෙමින් හට ගන්ට විය. පෙර පරිදි මා තවත් දවසකට අවදි වූයේ කවර හෙයින් දැයි සිතාගෙන නොවේ, මා ඇඳෙන් නැගිටින්නේ

නොරිකො පැමිණි වේලේ සිට මොහොතක් නිකම් නොසිටි. ඈ කොස්සක් හා අශ්ව වලිගයක් වැනි බුරුසුවක් මිලයට ගෙනැවිත්, දිනපතා කාමරයේ ජනෙල් හැර, සෑම තැන ම දූලි ගසා සුද්ද කරයි. ඇය තම ගවුමට උඩින් සුදු ඒප්‍රනයක් ඇඳ, සුදු පාන්කඩයකින් හිස ඔතාගෙන, කාමරයෙහි කඩිසර ලෙස වැඩ කල සැටි මම ඇතැම් විට, මගේ වැඩ නවත්වා බලාගෙන සිටිමි.

"දෙවෙන්දෙරා සංට වැඩ නැද්දැ?"යි ඈ එවැනි අවස්ථාවලදී මා දෙසට නොහැරී ම අසයි. මට ලජ්ජා සිතී, මම නැවත වැඩ ආරම්භ කරමි.

බොජුන් හල්වල ජපන් කෑම කෑමට මට වැඩිය ඉඩක් නොලැබුණේ ඒවායේ නම් ගම් මා දැන සිටියේ නැති නිසාය. නොරිකො දිනෙන් දින

1. උදයට පළමු වරට කෙනෙකු හමු වූ විට ආචාර කරන පරිදි ය.

පිස දුන් නොයෙක් විදියේ අලුත් කෑම වර්ග කෑ මම ඒවායේ විවිධත්වය ගැන පුදුම වීමි. මා වැඩ කරමින් සිටින අතර ඈ කාමරය සුද්ද කර, කෑම පිස, සියල්ල මේසය මත තබා මා කෑමට කැඳවයි. ඇය මට දවල් කෑම සිරිතක් වශයෙන් පිස දෙන්ට පටන් ගෙන දෙතුන් දවසකට පසු මම කඩ විදියට ගොස්, කිරිගරුඬින් සාදන ලද්දක් වැනි, සුදු පාට ඔප මට්ටම් ඇති හඹි[1] කෝප්පු කට්ටලයක් මිලයට ගෙනැවිත් ඇය සඳහා වෙන් කර තැබුවෙමි. හඹි කෝප්පු මේසය මත තැබීම සඳහා, පිහන් මැටියෙන් සාදන ලද කුඩා මාළුවන් දෙදෙනෙකු ඈ ගෙදරින් ගෙනාවාය. මා තනියම කෑම කෑ දවස්වල මගේ මේසය නොසේදූ බඳුන්වලින් ද එතන මෙතන දමන ලද කිලුටු රෙදි කැබලි හා කඩදාසිවලින්ද හැඩි වී තිබුණි. නොරිකො ඒ වැඩ කටයුතු බාර ගත් ද සිට, කාමරයේ සෙසු තැන් මෙන් කෑම මේසය ද දැකුම්කලු විය. ඈ මගෙන් සල්ලි ඉල්ලාගෙන, අපූරු හැඩයකින් යුත් තේ පෝච්චියක් ද පිස්න කඩ තබන උණ බඳුන් දෙකක් ද ගෙනාවාය. මේ සියල්ලෙන් සැරසුණු මේසය ගාව වාඩි වී, උණු වතුරෙන් පොහා මිරිකන ලද පිස්න කඩෙන් අත පිස, පිහන් මැටි මාළුවන් මත තබා තිබුණු හඹි කෝප්පු දෙක ගෙන මා කෑමට ලෑස්ති වූයේ, සිතෙහි හටගත් සමාධියකට බඳු හැඟීමකින් යුතු වය. මා වාඩි වූ පසු නොරිකො මගේ කෝප්පයට කොළ පාට ජපන් තේ වත්කර, මගේ බොකු බත් බඳුන බතින් පුරවා මගේ අතට දෙයි. මේසය මත වෙන ම තබා තිබෙන මාළු, අච්චාරු වර්ග හා වෙනත් ව්‍යංජන සමග මා බත් කෑම ආරම්භ කළායින් පසු වය, ඈ තම බඳුන පුරවා ගන්නේ. නිතර ම කෑම රස ද නැද්ද යනු දැන ගැනීමට මෙන් ඈ මඳ වේලාවක් නොකා බලා සිටින්නා සේ මට දැනෙයි.

"කෑම රසයි, " යි මා කී විට, ඇගේ මුහුණ අමුතු ආලෝකයකින් පැහැපත් වනු මට පෙනේ.

"මොනවයින් ද මේව හදල තියෙන්නේ? මේ මොනවද?" යන ආදී වශයෙන් මම ඇයගෙන් කෑම වර්ග ගැන විස්තර අසමි.

"මේව වසන්ත කාලයේ කන සොබා වර්ගයක්. අද උණුහුම් දවසක් නිසා මම හැදුවා. මේ මාළු තියෙන්නේ සීත කාලෙ විතරයි. මේව ගන්නෙ මුදෙන්. අරන් වේලල ලුණු දල කනව,"යන ආදි වශයෙන් ඈ සියල්ල මට කියා දෙයි.

කෑම කෑවායින් පසු මම නැවත සිතියම් ඇඳීම් ආරම්භ කරමි. නොරිකො පිහන් කෝප්ප සෝද වනා, මා ළඟ වාඩි වී, මා ලීයෙහි කැටයම් කපන සැටි හෝ එහි සායම තවරා කඩදාසියෙහි අච්චු ලන සැටි හෝ ඉතා උනන්දු වෙන් බලා සිටියි. මා හිස ඔසවා ඇය දෙස බැලුවහොත් ,

"කරන්න වැඩ. මා දිහා බලන්න එපා," යි ඈ මා වළක්වයි.

"කවුරු හරි කැටයම් චිත්‍ර අච්චු ගහනව දැකල තියෙනවා?"ද

"නෑ. ඒ වුණත්, මම තාත්තට ලාංඡන අඳින්න උදවු කරනවා එකත් මට මතක් වෙනවා."

"තාත්තට උදවු කළා?"

WWW.EXPRESSLANKA.TK 29

"ඔව්, තාත්තට සමහර විට ගෙනත් දෙනව, ලාංඡන දපු කිමොනො, පරණ ලාංඡන මකාල අමුතුවෙන් අඳින්න. මම තමයි පරණ ලාංඡන හූරල, ලාංඡන දමන තැන සුද්ධ කරල දෙන්නෙ. ලාංඡන තිබුන තැන ඉරිලනම්, වෙන ම රෙදි කෑල්ලක ලාංඡනය ඇඳල, අත්ඩයක් වගේ කිමොනොවට නූලෙන් අල්ලන්න ඕන. ඒක හරි සීරුවට කරන් ඕන වැඩක්. නූල් කොපෙනේන්න මහන්න ඕන. දිදුලයක් පාවිච්චි කරන්නත් බෑ. දිදුලයකින් මැහුවොත්, හිල් ලොකුවට පෙනෙනවා"

"අක්කා නැද්ද ඒ විදියෙ වැඩ කෙළේ?"

"අම්මා මැරුණට පස්සේ අක්ක තමයි සුෂි කඩේ වැඩ කෙරුවෙ. යොත්සුයාවල ඉන්දැද්දී අම්ම සුෂි කඩයක් පටන් ගත්ත. හරියට මිනිස්සු එන්න පටන් ගත්ත. අම්මා හරි දක්සයි සුෂි හදන්න. අම්මගෙ පරම්පරාව ම සුෂි කාරයො"

දවල් තුන හෝ හතර වන විට, මගෙන් ඉංග්‍රීසි ඉගෙන ගන්නා ශිෂ්‍යයෝ ද හිෂ්‍යාවෝද පැමිණෙති. සතියකට තෙවරක් මම ෂිබුයාහි පිහිටි විදුහලකට ගොස්, සවස පැය දෙකක් ඉංගිරිසි උගන්වමි. ශිෂ්‍ය ශිෂ්‍යාවන් එන දවස්වල, නොරිකො කලින් යයි.

දිනක්යෑමට පෙර නොරිකො, තම අත් බෑගය අතට ගෙන, "මම හෙට හිටන් එන්නේ නෑ," යි කීවාය.

ඈ කියූ වචනවල අර්ථය වහා ම මගේ සිතට පිවිසුණේ නැත. කවද නමුත් ඇගේ පැමිණීම නවතින්ට පුළුවන් බව මට ඒ වචන ඇසෙ තෙක් කල්පනා නොවීය. ඈ මා බලන්ට දිනපතා එන්ට පටන් ගෙන දෙසතියකට වඩා ගෙවුණේ නැත. ඒ ස්වල්ප කාලය තුළ දී මගේ සිතෙහි වූ සන්සුන්කම ද මගේ ජීවිතයෙහි වූ සම්පූර්ණත්වය ද මා සලකන්ට පටන් ගත්තේ මගේ උරුමයක් ලෙස ය. එය කවද නුමුත් වෙනස් වන බව වත් මට කල්පනා නොවීය.

"ඇයි එහෙම කියන්නේ?" යි මම ඇසුවෙමි.

"මොකටද හැම ද ම ඇවිල්ල? දෙවෙන්දෙරා සං යනව යි කිව්වත් නෙ කියොතෝවට?"

තෝකියෝ අත් හැර යාමට මා තුළ වූ අදහස ඈට කී බවක් මට මතක නොතිබුණි. ඇතැම් විට අවන් හලෙහි දී මා එය සඳහන් කරන්ට ඇත. එහෙත් නොරිකො, මා බලන්ට එන්ට පටන් ගත් ද සිට මම ඒ ගැන නොසිතුවෙමි. අනාගතය ගැන නොසිතා, ග්‍රහණයෙන් කෙමෙන් ගිලිහී යන වර්තමානය පමණක් අල්වාගන්ට තැත් කරමින් මම ජීවත් විමි.

"මගේ එහෙම අදහසක් තිබුණ තමයි. ඒත් දැන් ම යන්නෙ නෑ. මං දැන් චිත්‍ර අඳින්න පටන් ගත්ත හන්ද තව ටික දවසක් නවතිනව."

"ඒ වුනත් හැම ද ම එන එක හොඳ නෑ. අහල පහල මිනිස්සු මොකක් හරි හිතාවි."

"ඇයි හදිසියෙන් ම ඔහොම එකක් කල්පනා කෙලේ?" යි මම ඇසීමි.

"හැම ද ම ගෑනු කෙනෙක් එන කොට, කවුරු වුණත් හිතාවි මොකොද කියල. අන්න වැඩකට එනව නම් කමක් නෑ. අර ඉංගිරිසි ඉගෙන ගන්න එන ගෑනු ළමයි වගේ," යි ඈ කිවාය.

WWW.EXPRESSLANKA.TK 30

"එහෙනම් නොරිකො සං ඉංගිරිසි ඉගෙන ගන්න ," යි මම සිනාසෙමින් කීවෙමි.

"මාව බාර ගන්නවද උගන්නන්න? දෙවෙන්දෙරා සංගෙ අනික් ගෝලයින්ට තරම් මට මොළේ නෑ."

"ඇයි එහෙම කියන්නේ? ඉගෙන ගෙන බලන්න එපා ය."

"එහෙනම් මං හෙට හිටන් එන්නේ ඉංගිරිසි ඉගෙන ගන්නයි. දෙවෙන්දෙරා සං මගේ ගුරුවරයා නිසා, මං ඒ වෙනුවට ගේ අස් පස් කරල කෑම ටික හදල දෙනවා. එහෙම හොඳ නේ?"

පසු ද නොරිකො පැමිණියේ, තමා කිසියම් දෙයක් ගෙන එන විට නිතර පාවිච්චි කළ ලොකු ලේන්සුවෙහි ඉංගිරිසි කියවීම් පොත් දෙකකුත් ඔතාගෙන ය.

"මීට ඉස්සරත් මම වැයම් කලා ඉංගිරිසි ඉගෙන ගන්න," යි ඈ පොත් දෙක මට පෙන්නමින්, මඳ සිනාවකින් යුතු ව කීවාය. "ඒත් තාම බැරි වුනා මුකුත් ඉගෙන ගන්න."

නොරිකොගේ ඉංගිරිසි පාඩම පටන් ගන්නා ලද්දේ දවල් කෑමෙන් පසු වය. ඈ ඕනෑ ම වාසගමක් කියවූ නමුත්, තේරුම මැනවින් නොදත් බව මට පෙනිණි. සමහර වචන ඇට කිසි සේත් උච්චාරණය කළ නොහැකි විය. "ර"කාරය ශබ්ද කරන්ට ඈ බොහෝ වැයම් කළා ය. එහෙත් නිතර ම කටින් පිට වූයේ "ල" කාරයේ හඬ ම ය. කිසියි වචනයක් කීප වරක් කියා උච්චාරණය කරන්ට වැයම් කරන ඈ හදිසියෙන් තම දුර්වලකම ගැන කලකිරී පොත බිම තබයි. මෙසේ කිසි දිනක වත් පාඩම පැය බාගයකට වඩා දිග නොවී ය. ඇතැම් විටක, පාඩමෙහි එන වාසගම්, තමාට ඇසෙන සේ ශබ්ද නගා කියවන මෙන් ඈ මගෙන් ඉල්ලයි. මා එසේ කල විට ඈ මහත් කනස්සල්ලට පත් වේ.

"මට කවදවත් ඉගෙන ගන්න පුළුවන් වෙන්නේ නෑ. මගේ මොළේ හොඳ නෑ," යි ඈ කියයි.

තමා වැඩ කරන වේලාවට ඇඳි ඒප්‍රනයත්, හිසෙහි ඔතාගත් පාන්කඩයත් සමග ම පොත් දෙක ද ඈ බිත්ති රාක්කයෙහි පසෙක තැන්පත් කොට තැබුවා ය. ස්වල්ප දිනයකට පසු ඈ ජපන්-ඉංගිරිසි ශබ්ද කෝෂයක්ද ගෙනැවිත්, මා කියන විස්තරයක් නොතෙරුණු විට එහි බලා අවබෝධ කර ගත්තාය. ඒ ශබ්ද කෝෂය අප දෙදෙනාගේ කතා බහට ද නොයෙක් වර උපකාර විය. ඈ එය ද තමාගේ අනිත් බඩු සමග තැබුවාය.

ඉංගිරිසි පාඩම ගැන මා නිතර නොරිකොට මතක් කළ නමුත්, එය කිරීමට ඇට සැම ද ම සිතක් නොවීය.

"අද දෙවෙන්දරා සං චිත්‍ර අඳින්න. පාඩම් කරන්න මට කම්මැලි," යි ඈ කියයි.

මා නොදැනුවත් ව ම මගේ මුහුණ පුළුටුවේ.

"සෙන්සෙයි[1] මාත් එක්ක තරහ ද? මම අනිත් ගෝලයෝ තරම් හොඳනෑ නේ?" යි ඈ අසයි.

---

1. ගුරුවරයා.

WWW.EXPRESSLANKA.TK 31

සෑම ද ම කාමරය තුළට වී දවස ගත කිරීමට වඩා, ඉඳහිට බැහැර යාමට ඈ කැමැති වන්ට පුළුවනැයි මට සිතුණි.

"අද දවල් කෑම උයන්නෙ නැතුව අපි එළියට ගිහිල්ල කමු," යි ඈ පැමිණි වේලේ මම යෝජනා කෙළෙමි.

"මොකොට ද? මං මේ අඩුවැඩියත් ගෙනාව" යි ඈ තම ලේන්සුව ලිහා, එහි වූ නොයෙකුත් වර්ගයේ වේලපු මාළු, මුද්‍රු පෙඳ ආදිය පෙන්නුවාය.

"මම විශේෂ කෑමක් හදන්නයි. අද ලැස්ති වෙලා ආවෙ."

"ඕවා හෙටට තියන්න. අද යමු එළියට. හැම ද ම කෑම උයල කම්මැලිත් ඇති"

"නෑ. මට කෑම උයල කම්මැලි හිතෙන්නේ නෑ. මම වෙන කිසි දේකට නෑ ඒ තරම් ආසා"

"එහෙනම් හෙට යමු ද?" මම ඇසීමි.

"ඒක ගැන හිතන්න බැරි ය හෙට," යි ඈ සිනාසෙමින් කීවාය.

එහෙත් දවල් කෑමට තමා සමග බැහැර යාමට ඈ මට කිසි දිනක අවස්ථාවක් නුදුන්නාය. නිතර ම ඈ කිසිවක් කියා එය කල් දැමුවා ය. මම ද ඈට පෙරැත්ත කරන්ට අකමැති වීමි.

දිනක් හදිසියෙන් හොඳට ඉර පායා, අමුතු උණුසුමක් ඇති විය. ඒ හේමන්ත සෘතුවේ අවසාන දවස් විය. කෑම කෑවායින් පසු, බැහැර යාමට මම නැවත ඈට ආරාධනා කෙළෙමි.

"අද එළියට ගිහිල්ල කඩ වීදිය දිගේ ඇවිදල, සංගීතය අහන්න යමු. කෝපි හලකට, " යි මම කීවෙමි.

"දෙවෙන්දෙරා සං වැඩ කරන්න. හැන්දෑවට ඇවිදිනවා මදැයි?" යි ඈ පිළිතුරු වශයෙන්කීවාය.

"මේ වගේ පායන දවසක කාමරය ඇතුළට වෙලා ඉන්න හොඳ ද?" යි මම ඇසුවෙමි.

"හැබැවට අව්ව පායනවා නේද? එහෙනම් හොඳයි අද ඇඳුම් හෝදන්න. මෙහෙම දවසක් ලැබෙන්නේ කලාතුරකින්," යි කියමින් ඈ නැගිට්ටාය.

මම ඇය ලවා ඇඳුම් සෝදවා ගැනීමට අකමැති වීමි.

"රෙදි අපුල්ලන මිනිහ අද ඒවි. මම එයාට දීල හෝදව ගන්නම්"

"නෑ. මොකට ද වියදම් කරන්නේ? මම මේ නිකම් ඉන්න ගැනි-මට පුළුවන් හෝදල දෙන්න."

ඈ මගේ කිලුටු වූ කමිස, බැනියම්, ලේන්සු හා මේස් ආදිය එකතු කර, පයිප්පය ගාව සිට සෝදා, පසු ව එළියට ගොස් වැලේ වැනුවාය.

"මතක ඇතුව හැන්දෑවට ගන්න," යි අවසන් වූ විට ඈ කීවාය.

මෙසේ මා ආරාධනා කළ සෑම වතාවක ම ඈ මග හැරියේ මා අතින් මුදල් වියදම් වන නිසා ද නැතහොත් වෙන කාරණාවක් නිසා දැයි මට තේරුම් ගැනීම අපහසු විය. ඈට ප්‍රතික්ෂේප කළ නොහැකි ද අන්දමට

WWW.EXPRESSLANKA.TK 32

කාරුණ්‍ය සලසා ගත යුතු ය යි සිතූ මම, ඊ ළඟ ඉරිදා වැඩක් තිබේදැයි දිනක් ඇසුවෙමි.

"නෑ මොකුත් නෑ. මම උදේට ඇඳුම් හෝදල, කොහාට හරි ගිහිල්ල කොන්ඩෙ හැඩ දම්මල, හවසට මිදෙරියට යනව. එච්චරයි." ඈ පිළිතුරු දුන්නාය.

ඉරිදා උදේ පවත්වන කබුකි රැඟුමට මම සලාක පත් දෙකක් ගෙන පසුදා මා සමග කබුකි බැලීමට එන මෙන් ඇට ආරාධනා කෙළෙමි.

"ආ, ඒකටයි ඇහුවෙ මට වැඩක් තියෙනවද කියල?" යි ඈ සිනාසෙමින් ඇසුවාය. "කබුකි බලන්න නම් මම කොයි වේලාවටත් කැමතියි."

ඈ කබුකි සාලාව ඉදිරියෙහි ඉරිදා උදේ එකොළහට මා හමු වන්ට පොරොන්දු වූවාය. පෙර වතාවට වඩා ඈ ගමන ගැන සැලකිල්ලක් දැක්වූ බව ඇය හමු වූ විට මට පෙනිණි. ඈ එදා රතු කිමොනොවක් ඇඳ සිටියාය. ඈ මට හමු වූ පළමු වතාවෙහි ද කිමොනොවක් ඇඳ සිටි බව මට සිහි විය. ඈ කෑම පෙට්ටි දෙකක් ද ලේන්සුවෙහි ඔතාගෙන ගෙනාවාය. මා නොරිකො සමග වාඩි වී, කබුකි නරඹා, විවේක වේලාවෙහි සෙසු අය මෙන් අපේ කෑම එළියට ගෙන හෂි කෝටුවලින් කා නැවත හිස් පෙට්ටි ලේන්සුවෙහි බැඳ ගැනීම සඳහා ඇගේ අතෙහි තැබූ කල මට දැනුණේ එවේලෙහි නම් මා නියම කබුකි රසිකයන්ගේ සංඛ්‍යාවට වැටුණු කෙනෙකු ලෙස ය.

රැඟුම අවසන් වූයේ හවස හතරට ය. අවන් හලට යාමට තව වේලා තිබුණු නිසා මමනොරිකො සමග කෝපි හලකට යන්ට සිතා ගත්තෙමි. ෂිම්බෂිවල පිහිටි "යේ ලයි ෂ්‍යෑං" මා තරමක් හොඳින් දන්නා කෝපි හලක් විය. එහි නිතර විදේශිකයන් පැමිණි හෙයින්, එහි යාමට මගේ කෝලයක් නොවීය. පිට බිත්තිය විශාල මකර රූපවලින් සරසා තිබුණු එය, චීන ආකාරයට සාදන ලද ගොඩනැගිල්ලක් විය. එහි ඇතුළත ද සරසා තිබුණේ නොයෙකුත් චීන මකර රූප, ප්‍රතිමා, පහන් ආදී විසිතුරු බඩුවලිනි. පහළ තට්ටුව සිට තෙවැනි තට්ටුව දක්වා හීන් සැරෙන් උඩට පහළට ගමන් කරන වටකුරු වේදිකාවක් ශාලාවෙහි මැද විය. ඒ වේදිකාවෙහි වාඩි වී සිටි සංගීත කණ්ඩායම, තේ කෝපි බොමින් පසු වන අමුත්තන් සඳහා නිතර වැයූහ., ගැයූහ.

මඳඑළියෙන් යුත් ශාලාවේ කොනක පිහිටි මේසයක් ගාවින් අපි වාඩි වීමු. මවිත වූ මුහුණකින් යුතුව නොරිකො අවට බැලුවාය.

"ඇයි මාව මෙහෙම තැන්වලට එක්ක එන්නෙ?" යි ඈ ඇසුවාය.

"මොකෝ ද එහෙම ප්‍රශ්න අහන්නේ ?"

"මෙහෙම තැන් ඉහළ පෙලේ අයටත්, විදේශිකයින්ටත් මිස, අපට කැපෙන්නේ නෑ. මගේ ඇඳුමත් හොඳ මදි මෙහෙම තැන්වලට එන්න."

චීනඇඳුමකින් සැරසුණු ඉතා ප්‍රියංකර විලාසයක් දැරූ සේවිකාවක් අප ඉදිරියෙහි වූ මේසය මත වතුර වීදුරු දෙකකුත්, ගිනි පෙට්ටියකුත්

WWW.EXPRESSLANKA.TK 33

තැබුවාය. නොරිකො වහා ගිනි පෙට්ටිය අතට ගෙන බැලුවාය. එහි එක් පැත්තක "යේ ලයි ෂ්‍යෑං" කෝපි හලේ සිතුවමක් විය. අනික් පැත්තේ උතමරොගේ[1] සිතුවමක මුද්‍රණයක් විය. ඒ කෝපි හලට මා ඊට ඉහත ගිය අවස්ථාවකදී මට දුන්නේ වෙනස් හැඩයක ගිනි පෙට්ටියක් බව මට සිහිවිය.

"මේක හරි අමුතුයි නේද?" යි ඇ ඇසුවාය.

"කොතනක් හම්බ වෙන්නේ අමුතු අමුතු විදියේ ගිනි පෙට්ටි නේ," යි මම කීවෙමි.

"යන කොට මේක මට දෙනවද?"

"ඇයි යන කොට? දැන් ම අරන් තියාගන්න. මගේ සාක්කුවෙ තියෙනවා දෙකක් තුනක් ම. ගෙදරත් ඇති ගොඩක්."

"ඔව්, මං දැක්ක ලාච්චුවක දල තියෙනව. දැනගන්න පුළුවන් යන යන තැන් ඔක්කොම- කෝපි සාලා, අවන් හල්, බොජුන් හල් එහෙම," යි ඇ සිනාසෙමින් කීවාය. ඇ ගිනි පෙට්ටිය තම බෑගයෙහි දමා ගනිත් ම සේවිකාවු වහා ගොස් තවත් එකක් ගෙනැවිත් අපේ මේසය මත තැබුවාය. එහි අපි පැය එකහමාරක් පමණ සංගීතයට කන් දීගෙන කෝපි උගුර උගුර බොමින් පසු කෙළෙමු. අප තම තමන්ගේ සිත් සතන්හි කිමිදී සිටියා මිස, කිසිවක් කතා බහ කෙළේ නැත. එබඳු වේලාවන්හි ස්වල්ප මොහොතක් වුවද මා සිතින් ස්පර්ශ කරන සුවය, යෝගීන් කියන, අන්‍ය වේදායනන්ගෙන් කිලිටි නුවූ නිර්මල ආස්වාදයට සමාන යයි මට සිතේ. හදිසියෙන්, "ඕකතා සං ගැන හොඳට දන්නවද?" යි නොරිකො ඇසුවාය.

ඕකතා සං යි කීවේ, මා කුලියට ගෙන සිටි ගේ අයිතිකරුවා ය. ඔහු විසුවේ, මා විසූ ගෙට ම ඇදා තිබුණු ඊට ම අයිති වෙන කොටසකය. ඔහු සාමාන්‍ය ජපනුන්ට වඩා උස, අවුරුදු තිහක් තිස් දෙකක් පමණ වයසැති කෙනෙක් විය.

"මං මුකුත් දන්නේ නෑ එයා ගැන. දෙතුන් සැරේකට වැඩිය හම්බ වෙලත් නෑ. හොඳ මනුස්සයෙක් වගෙයි පෙනෙන්නේ. මට ආචාර කරනවා නිතර ම, යන එන කොට, ඇයි ඇහුවෙ?"

"මටත් දෙතුන් වරක් මුණ ගැහිල තියෙනවා. ඉස්සෙල්ල දවසෙ මාව නවත්තල එක එක ප්‍රශ්න ඇහුව. මොකො ද දෙවෙන්දෙරා සං හම්බ වෙන්න එන්නේ, කොහොම අඳුනන්නෙ, කින්ද මන්ද කියල. මං එයාට කැමති නෑ"

"මං කිව්වා ඉංගිරිසි ඉගෙන ගන්න එනවයි කියල," යි ඇ සිනාසෙමින් කීවාය.

"ඉතින් මොක ද වෙන්නෙ එහෙම ඇහුවට? ඒකට එයාට අකමැති වෙන්න ඕන යැ?"

ඒ ආරංචිය ඇසීමෙන් මගේ සිත වහා නොසන්සුන් විය. නොරිකො ඔහුට අකමැති යි කීම මට මඳ සතුටක් ගෙන දුන්නේය. එහෙත් මා ඇගේ

1. උතමරො යනු අතීතයෙහි විසූ ප්‍රසිද්ධ සිත්තරුවෙකි.

WWW.EXPRESSLANKA.TK 34

කීම මුළුමනින්ම ඇදහුයේ නැත. එය නොඅදහන්ට මම වඩා කැමති වීමි. ඇගේ සිත තව දුරට පිරික්සීමට ය, මා ඉහත කියන ලද ප්‍රශ්න ඇසුවේ.

"දෙතුන් සැරයක් හම්බ වුණයි කිව්වෙ?" යි ඈ නිහඬ ව සිටි නිසා මම යළිත් ඇසීමි.

"දෙතුන් සැරයක්කිව්වට, හරියට ම නම් දෙසැරයයි. අනික් සැරේ, මං හවස යන කොට, මට අඬ ගැහුව, තේ බොන්න යන්න."

"ඉතින් ගියා ද?"

"නෑ. මං වෙලාවක් නැතෙයි කියල ගියා."

මා නොරිකො සමඟ මිබුයා විදුලි රිය පළට ගොස් ඇය ඇරලා, ඕකුසාවාවට ගියෙමි. කාමරයට පිවිසීමට පෙර, ඕකතා සං හමුවීමට මට සිත් විය. ඔහු ගැන මා තුළ පෙර නුවූ උනන්දුවක් එද හට ගත්තේය. ගිය මාසයේ ගෑස් බිල ගැන ඔහු ගෙන් ඇසීමට මෙන් මම ඔහුගේ ගෙට පිවිසියෙමි. ඔහු කෑම කමින් සිටියේ ය.

"එන්න දෙවෙන්දෙරා සං. එන්න," ඔහු මට ඇතුළට අඬ ගසා, තමා කෑම කමින් සිටි තැන වාඩි වීමට කුසිමක් දමා දුන්නේය.

"දෙවෙන්දෙරා සං කෑම ටිකක් කන්න. යකි සොබා[1] තියෙනවා."

"එපා. මට දැන් බඩ ගිනි නෑ. මං කත්තේ තව හුඟක් පහු වෙලා."

"එහෙනම් මං දෙන්නං හොඳ ජපන් කැවිලි වර්ගයක්. දෙරායකි කාල තියෙනවද?"

සේවිකාවක් විත්, දෙරායකි කැවුමක් හා තේ කෝප්පයක් ද මා ළඟ තැබුවාය.

ඕකතා සං තමා ගැන නොයෙකුත් විත්ති මා සමග කීවේය. තමා යුද්ධ කාලයෙහිදී කොරියාවේ සිටි සැටි ද, ආපසු එන විට, තම ගේ නොපිලිස්සී තිබුණු හෙයින්, එහි කාමර කුලියට දී, තම දෙමවුපියන් සමග ඒ කොටසෙහි විසූ බව ද ඔහු විස්තර කෙළේය. හැරමිටියකුත් අතින් ගෙන ඉඳහිට ඇවිදින්ට යන, කන්නාඩි කුට්ටමකුත් දමාගත් මහලු පුරුෂයා ඔහුගේ පියා වන්නට ඇතැයි මම සිතුවෙමි. දිනක් ඔහු මා දැක, නැවතී, දෑස හොඳින් නොපෙනෙන කෙනෙකු සේ ඉතා ඕනෑ කමින් මා දෙස බැලූ සැටි මතක් විය. තමා ට අසාබුවල බොජුන් හලක් තිබෙන බව ද ඕකතා සං මා සමග කීවේය.

ඔහු කතා කරන අතර මම මැනවින් ඔහු පරීක්ෂා කෙළෙමි පොදු ජපන් පිරිමින් හා සංසන්දනය කළ විට ඔහු දැකුම්කලු හුරු බුහුටි පුද්ගලයෙක් යි මට හැඟුණි. ඔහු කතා කල ඉංගිරිසි නිවැරදි නුවූව ද ඔහු කියන දේ තේරුම් ගැනීම අපහසු නොවීය. වෙන බොහෝ අය සමග කතා කරන විට මෙන්, යම් යම් දේ ජපන් බසින් ද තේරුම් කර දීමට මට සිදු නොවීය.

---

1. තෙලෙන් බැද සාදන ලද සොබා වර්ගයක්.

4

හෝ මන්ත සෘතුව වෙන දට කලින් අවසන් වූවා සේ විය. දකුණු සුළඟ මෙන් උණුසුම් සුලඟක් හමන්ට පටන් ගති. අනතුරු ව ගත වූ දෙසතියක් පමණ කාලය, ස්වල්ප හිරිහැර හැරුණු විට, මා පසු කළ ඉතාමත් ප්‍රීති සහගත අවධිය යි මම සිතමි. නොරිකො සහ මම, වෙන ද මෙන් ගෙයි තුළට වී නොසිට, තෝකියෝ නගරයෙහි නොයෙක් නොයෙක් පෙදෙස්වල සංචාරය කෙළෙමු. ඒ මට අපූරු අත්දැකීමක් විය. ජපානය පිළිබඳ අවුරුද්දක් තුළ දී නොලත් අත්දැකීමක් ඒ ස්වල්ප කාලයෙහිදී මම ලබා ගත්තෙමි.

මා විසූ තැනට විත්, මා සමඟ එකට බැහැර යාමට නොරිකො අකමැති වූ හෙයින්, අපි පිට දී හමු වී දවස කෙලවර වූ කල පිට දී ම වෙන් වීමු. ඕකතා සං හා වෙනත් අසල් වැසියන් කිසිවක් සැක කරාවිය යන බයට ඈ කටයුතු එලෙස පිලියෙළ කළා යයි මා සිතූ නමුත්, මම ඇගෙන් ඒ ගැන ප්‍රශ්න නොකෙළෙමි. අපි කඩ වීදි දිගේ ඇවිදිමින්, වීදුරු පලු අස්සෙන් පෙනෙන විසිතුරු බඩු දෙස බලා ඒවායේ මිල ගැන කතා

බස් කෙළෙමු. වසන්ත සෘතුව ලංවී ගෙන එන හෙයින්, කඩදාසි සකුරා මල් දම්වලින් සරසා තිබුණු වෙළඳ හල්වලට පිවිසියෙමු. මා ලාබ කුරක් හෝ අරුංගල් කුට්ටමක් හෝ මිලයට ගෙන ඇට තෑගි කරන්ට යන විට ඇ විස්මයෙන් හා ලැජ්ජාවෙන් මා දෙස බලයි.

"මේක මට හොඳ වැඩියි" යි කියා ඇ ය ප්‍රතික්ෂේප කරන්ට තැත් කරයි.

සැණෙකින් මගේ මුහුණ අඳුරු වන බව දකින ඇ එය පිළිගෙන, වහා තම කොන්ඩෙහි ලා ගෙන හිස මා දෙසට හරවා පෙන්වයි. නැතහොත් තමා ගෙන සිටි අරුංගල් කුට්ටම ගලවා, අලුත් කුට්ටම ලා ගෙන, බෑගයෙන් කුඩා කැඩපත ගෙන මුහුණ පිරික්සා මහත් ප්‍රමෝදයකින් හා කෘතඥතාවකින් මා දෙස බලයි.

"තාත්තට පෙන්නන්න ඕන, දෙවෙන්දෙරා සං දුන්නයි කියල."

මෙයින් මම මඳක් දෙමිනස් වෙමි. ඇ නැවත මගෙන් දුරු වූවා සේ මට දැනෙයි.

අඳුරු වැටෙන විට, ගින්සා, ෂිම්බෂි හා අවට පෙදෙස්වල තියොන් එළියෙන් බැබළෙන්ට පටන් ගන්නා චීන හා ජපන් අකුරු ඇ මට කියවා දෙයි. ඊ ළඟ දිනයෙහි ඇ මට ඒ අකුරු නැවත පෙන්වා, කියවිය හැකි දැයි අසයි. එහෙත් මට ඒවා මතක තබා ගත නොහැකිය. මම මතක තබා ගන්ට වෑයමක් ද නොකරමි. ඒවා නොතේරුණු තරමට වඩාත් ලස්සණ යයි මට සිතේ. ඒවා කියවන්ට දන්නා නොරිකො මා සමග සිටිද්දී මා කුමට ද වෙහෙස වන්නේ?

එහෙත් ගින්සා වීදියෙහි ඇවිදීමට වඩා මා කැමති වූයේ අසකුසා යාමට ය.. දවාලට හෝ වේවා රෑට හෝ වේවා, අසකුසා නිතර ම එක උත්සව විලාසයකින් අලංකෘත ව ඇත. උඩු වියනින් යුතු සංක්‍රමණවල එල්ලා තිබෙන විශාල පහන් කූඩු සතියක් පාසා වෙනස් කරනු ලැබේ. එහි ඇවිදින විට, ඇසට ගොදුරු නොවන වර්ණයක් මෙලොව නැතැයි මට සිතේ.

නොරිකො, අසකුසා පෙදෙස හොඳින් දැන සිටියාය.

"මම තාත්තත් එක්ක නිතර ම ඇවිදිනව අසකුසාවල. දෙවෙන්දෙරා සං වගේ ම තාත්තත් කැමතියි අසකුසාවලට," යි ඇ කීවාය.

අපි එහි ය. පළමු වතාවෙහි ඇ මා නන්නොත්[1] පන්සලට කැඳවාගෙන ගියාය. ඇ කන්නොන් දෙවියන්ගේ රූපය ඉදිරියෙහි මඳ වේලාවක් ඇදිලි බැඳගෙන සිට, අනතුරු ව යෙං දහයක කාසියක් පිං පෙට්ටියට විසි කළාය.

"අපෙ අම්ම කන්නොන් දෙවියන් ඇදහුව. ඒ නිසා මට දෙපැත්තෙන් ම තියෙනවා සම්බන්ධකම් අසකුසා එක්ක."

මේ දෙවෙනි වැකිය කියමින් ඇ සිනාසුණාය.

---

1. ජපානයේ දෙවියෙකු වශයෙන් අදහනු ලබන අවලොකිතෙශ්වර බොධිසත්වයෝ.

අප ඇවිදින අතර ඈ මට නොයෙක් දේ පෙන්වූවාය.

"අර තියෙන්න ප්‍රසිද්ධ කැවිලි කඩයක්."

"මෙතන සූකියකිවලට ප්‍රසිද්ධයි ඉස්සර හිටන් ම."

"මේ පැත්තෙන් තමයි., යොෂිවරා[1] පෙදෙසට යන්නෙ. තව ටිකක් ඈතට ගියාම තියෙනවා ප්‍රසිද්ධ නොරි[2] හලක්."

සුරාවෙන් මත් වූ කලක් මෙන් මගේ සිත බමයි. පාන්කඩයකට උරා ගන්නා සුවඳ තෙලක් සේ, මගේ මුළු සරුවාංගය තුල ම ප්‍රීති සුඛය පැතිරෙයි. ඇය නොයෙක් දෙස අත දිගු කරමින් පෙන්වන දේවල් මගේ දෑස ඉදිරියෙන් නැටවේ. ඇගේ වචන කනට වැටෙන්නේ සිහිනයකින් ඇසෙන හඬවල් මෙනි.

හදිසියේ ඈ මා අතින් ඇද වෙන දෙසකට හරවයි.

"අන්න යනව ගේෂා ස්ත්‍රියක්. බලන්න හොඳට"

උස් ලී සෙරෙප්පු කුට්ටමක් පයෙහි ලා ගත්, නා නා වර්ණ කුරු ගසා සරසන ලද විශාල මුඩි කොණ්ඩයකින් යුත්, සායමින් සුදු කරන ලද මුහුණක් ඇති ස්ත්‍රියක් විදියේ එගොඩ සිට මෙගොඩට ගොස්, අතුරු පාරක් ඔස්සේ ගමන් කරයි.

"මේ පැත්තෙ තියෙන්නෙ ඔක්කොම සුෂි හල් තමයි. අපි යමු ද සුෂි කන්න. එතන ම හද හද බෙදන තැනකට? තාත්තත් එක්ක මම ගොහින් තියෙන තැනක් පෙන්නන්නම්."

සුෂි හලක කෑම අනුභව කිරීමෙන් මා ලබන්නෙ කිසි කලක නොලත් විරූ ආස්වාදයකි. ඒ ආස්වාදය මා කොතෙක් වින්ද ද කිසි විටක තිත්ත නොවේ. සුෂි හලකට ගිය හැම විට ම එය අලුත් අත්දැකීමක් සේ මට දැනේ. සුදු ඇඳුමකින් හා සුදු හිස් වැස්කමකින් ද සැරසුණු සුෂි හල් සේවකයන්, එන එන අමුත්තන්ට ලොකු හඬකින් ආචාර කරමින්, කිරි බත් කැලිවල හැඩහුරුකම ඇති බත් ගුලි අතින් සාද, ඒ මත වසබී[3] තවරා, මාළුපෙත්තකින් වසා, කවුන්ටරය වටා වාඩි වී සිටින අමුත්තන් ඉදිරියෙහි තබන සැටි කොතෙක් බලාගෙන සිටි ය ද එපා නොවේ. ඒ සේවකයන්ගේ ඇඟිලි යන්ත්‍ර මෙන් ක්‍රියා කරයි. ඔවුහු කලාකරුවෝ වෙති. කවුන්ටරයට ඇවිත්, මේස ගාව වාඩි වී බුදින්නන් සඳහා ඔවුන් රතු පැහැයෙන් ද කළු පැයෙන් ද සායම් කරන ලද වටකුරු නැතහොත් හතරැස් ලී බඳුන්වල සුෂි තබා සරසන්නේ වර්ණ සංකලනයෙන් රටාවක් නිර්මාණය කරන සිත්තරුවන් ලෙසිනි.

නොයෙක් වර්ගයේ සුෂිවල නම් ගම් ද, බොජුන් හලකට ගොස් ඒවා ඉල්ලන සැටි ද, නොරිකො මට ඉතා උනන්දුවෙන් කියා දෙයි. එහෙයින් ඈ සමග සුෂි හලකට පිවිසෙන විට, මා අමුත්තෙකු යයි මට නොදැනේ. අප ඇතුල් වන විගස ම, දෙතුන් දෙනකු මඳ විස්මයෙන් අප දෙස බලන

---

1. එදෝ අවධියෙහි සිට, අභිසාරිකාවන් විසූ පෙදෙස. මෙය කබුකි නාට්‍යයන්හි එදෝ සාහිත්‍යයෙහි ද නිතර සඳහන් වේ.
2. බත් සමග කන, වේලන ලද මුහුදු පෙඳ වර්ගයක්.
3. රාබු වර්ගයකින් සාදන ලද අච්චාරු විශේෂයකි. එහි රස අබවල රසයට සමානය

බව සැබැය. එහෙත් නොරිකො මා සමග සිටින හෙයින්, මම චකිත නොවෙමි. මා තුල අමුතු විදියක ආත්ම විශ්වාසයක් හට ගනී. මම සෙස්සන් මෙන්, හුරු පුරුදු විලාසයෙන් වාඩි වී, නොරිකො කියා දුන් පරිදි, "අකගයි" හෝ "තොරිගයි" හෝ "මගුරො" කියා සුෂි ඉල්ලමි. එවිට සෙස්සො කරබා ගනිති. ඇතැමෙකු තමා ළඟ වාඩි වී සිටින තැනැත්තාගේ කනට කොඳුරා කිසිවක් කියනු මට පෙනේ. ඇතැම් සේවකෙයක් මා ගැන ප්‍රශ්නයක් දෙකක් නොරිකොගෙන් අසයි. එහෙත් ඔවුන් වැඩි වේලාවක් මා ගැන අමුතු සැලකිල්ලක් නොදක්වති. නොබෝ වේලාවකින් මම ද සෙසු අමුත්තන්ගේ ගණයට වැටෙමි.

මේ හැම තැනකදී ම අපට නොමිලයේ ලැබෙන අපූරු අපූරු ආකාරයේ ගිනිපෙට්ටි, නොරිකො නොවරදවා තම බෑගයෙහි දමා ගනියි.

"මොකොට ද ඕව එකතු කරන්නේ?" යි මම සිනාසෙමින් ඇසුවෙමි.

"සිහි වෙන්න," යි ඈ කෙටියෙන් පිළිතුරු දුන්නාය.

ඇය සිහිවෙන්ට මා කුමක් ද එකතු කරන්නේ? මා ඇය වෙනුවෙන් එබඳු සුළු දෙයක් වත් නොකරන බව ඈ දනී. මට ස්වල්පයක් ලජ්ජා සිතුණි.

දවසට දෙවේලක් ම පිටින් කෑම ගැනීම වියදම් සහිත වූ බැවින්, බොහෝ දිනවල නොරිකො මා විසූ ගෙට විත්, සිරිත් පරිදි ආහාර පිස, අප දෙදෙනා කෑවායින් පසු, ආපසු ගෙදර යන්නො සේ නික්ම මා එන තුරු කොතනක හෝ බලාගෙන සිටියි. මා සමග එකට පිටත් ව යන්ට ඈ අකමැති වූයේ අහල පහල අය කිසිවක් සැක කරාවි ය යන බියෙන් යයි මම සිතුවෙමි. එහෙත් මම කිසිවක් නොඇසුවෙමි. පිට දී හමු වීමට අපි තිප්පොලක් සොයා ගතිමු. එය ෂිබුයාහි පිහිටි, එක් කුඩා කෝපිහලක් විය. ෂිබුයා මංසන්දියේ සිට සංගෙංජයා දෙසට යන විට, දකුණු පසට හැරෙන පටු අතුරු පාරක් තිබේ. පාර පිහිටියේ සුළු කඳු බෑවුමක ය. කෝපි හල එහි මුදුනෙහි විය. ස්විට්සර්ලන්තයේ ඇතැම් නගරවල දක්නට ලැබෙන ජර්මන් ගෙයකට සමාන ගොඩනැගිල්ලක් වූ ඒ කෝපි හල, "ලා පූජේ" යන ප්‍රන්ස නමින් හඳුන්වනු ලැබීය. එය නිතර සෙනගගෙන් පිරී නැත. සංගීතය ද වැයුණේ සිහින් ලෙස ය. කිසිවෙකුගේ කුතුහල බැල්මට හසු නොවී, පසෙක පිහිටි මේසයක් ගාව වාඩි වී, නිවී සැනසිල්ලේ කතා බහ කිරීමට අපට පුළුවන් විය. එහි දී හමු වී තීරණය කරගෙන ය, අපි ඊගාවට යන දිහාවක යන්නේ.

එදා මා ඕකතා සං බලන්ට ගිය ද සිට ඔහු මගේ කාමරයට නිතර නිතර එන්ට පටන් ගත්තේය. ඔහු හැම විට පාහේ ආවේ නොරිකො ද විත් සිටින වේලාව ට ය. සමහර දවසක ඔහු තම කැමරාව ද රැගෙන විත් අපේ පින්තූර ගනියි. වෙන ද ඔහු මගේ ලියුම් සේවකයෙකු අත එවයි. එහෙත් මෑතක දී සිට ඔහු තමා ම ඒවා ගෙන එයි. ඔහු සිරිතක් වශයෙන් මෙසේ එන බව දැනගත් ද සිට නොරිකො, ගෙට ගොඩ නැගුණු විගස ම තම ඉංගිරිසි පොත් දෙකත්, ශබ්ද කෝෂයත් බිත්ති රාක්කයෙන් ගෙන, මේසය මත දිග හැර තබයි. ඈ මෙසේ කළ පළමු වතාවෙහි, මා දෙස බලා සිනාසුණාය. කරුණ තේරුම් ගත් මම, කිසිවක් නොදෙඩුවෙමි.

WWW.EXPRESSLANKA.TK 39

ඕකතා සංගේ පැමිණීම ඇතැම් අවස්ථාවක දී අපට හිරිහැරයක් විය. ඔහු විත් බොහෝ වේලා කතා කරමින් සිටී, නැතහොත් තමාගේ ඡායාරූප පොත ගෙනැවිත් අතීතය ගැන නොයෙක් දේ විස්තර කරයි. තමා විවාහ කරගන්ට සිටි ප්‍රියාවගේ ඡායාරූපය ඔහු දිනක් පෙන්නුවේය. ඈ හදිසි ගුවන් අනතුරකින් මළ බව ඔහු කීවේය. ඕකතා සංගේ පැමිණීම අප පිළියෙළ කර ගත් වැඩ කටයුතුවලට බාධාවක් වූ නමුත්, නොරිකො ඔහුගේ ඡායාරූප බලමින්, ඔහු කී කතාවලට කන් දෙමින් ඔහු සමග දෙඩුවේ මහත් උනන්දුවකින් යයි මට ඇතැම් විටක සිතිණි. ඔවුන්ගේ දෙබස ද වැඩි හරියක් මට නොතේරුණි. නොරිකො මෙලෙස ඔහු සමඟ දෙඩුවේ ගෙදරකට ආ අමුත්තෙකුට දැක්විය යුතු ආචාර ශීලය නිසා ද නැතහොත් ඔහුගේ කතාවට ඇගේ සිත ඇත්තෙන් ම ඇදී ගිය නිසා දැයි මම කල්පනා කෙළෙමි.

එහෙත් නියමිත වේලාවකට කොයිබ හරි යාමට තීරණය කරගෙන සිටි වතාවක ඕකතා සං පැමිණ සිටියොහාත් නොරිකො ගෙදර යන්නා සේ කල් කියා නික්ම ගොස්, ඕකතා සං මග හැරවීමට මට අවස්ථාව සලසා දෙයි. එය ද නිතර පහසු නොවන කාරියකි. මා යන්ට සැරසෙන විට, බැරක් යනවා දැයි ඔහු අසයි. මා ෂිබුයාවට යනවා ය කිව්වොත්, තමාට ද ඒ පැත්තේ වැඩක් තිබෙන බව කියා ඔහු මා සමග යන්ට සැරසෙයි. නොරිකො මා එන තුරු ෂිබුයාහි බලා සිටී නම්, ඔහුට එ බව දැනගන්ට ලැබෙන හෙයින්, වෙනත් බොරුවක් කියා ඔහු මග හරින්ට සිදු වේ. වරක් මෙවැනි අකරතැබ්බයකට හසු වූ මම, ඔහු සමග ෂිබුයා දක්වා ගොස්, නොරිකො මා එන තුරු බලා සිටි කෝපි හලට යා නොහැකි , කන්දවල පිහිටි ලංකා තානාපති කාර්‍යාලයෙහි කළ යුතු හදිසි වැඩක් සිහි වූ බව කියා ඔහු මග හරින්ට තැත් කෙළෙමි. එවිට, තමා ද ලංකා තානාපති කාර්‍යාලයෙහි සිටින අය හඳුනා ගැනීමට කැමති බව කියා ඔහු මා සමග එන්ට තැත් කෙලේය. තමා ලංකාවට බඩු වගයක් යවන්ට අදහස් කරන බව ඔහු කීවේය. එහෙයින් ඔහු සමග එහි ද යන්ට සිදු විය. ආපසු ෂිබුයාවට යන විට, නියමිත වේලාවට වඩා පැයක් පමණ පමා විය. නොරිකො මහත් තැවුලකට පත් වී සිටියාය.

මෙවැනි බාධා ඉදහිට පැමිණිය ද අපි ඒ දිනවල බෙහෙවින් විනෝද වීමු. නොරිකො ද තමාට ඇති වූ අලුත් අත්දැකීම් ගැන සඳහන් කරමින් තම සතුට ප්‍රකාශ කළාය. අපි විදුලි කෝච්චියෙහි නැගී, ඉනොකෂිරා උයනට ගොස්, එහි දී ඔරු පැද්දෙමු. මා කිසි දිනයක හබලක් අතට ගෙන නැත. එහෙත් ඈ මනා පල පුරුද්දකින් ඒ මේ අත යන වෙනත් ඔරු අතර, අපේ ඔරුව දක්ෂ ලෙස පැදගෙන කියාය. ඔරුවල සිටි තරුණයෝ ද තරුණියෝ ද සිනා මුහුණින් යුතු ව අප දෙස බලමින් අප ගැන දෙඩූහ. මේ, අප දෙදෙනා වැනි යුවලක් දුර්ලභ දර්ශනයක් වූ නිසා යි මම සිතුවෙමි. ඉනොකෂිරා උයනෙහි පිහිටි, අකුතගාවා[1] පැන දිවි නසා ගත් ඇළ කානුව

---

1. මෑත කාලයෙහි විසූ ප්‍රසිද්ධ ගත්කරුවෙක් 'රෂොමොන්' චිත්‍රපටියට ආශ්‍රය වූ කතා වස්තුව ඔහුගේ නිර්මාණයකි.

WWW.EXPRESSLANKA.TK 40

ද නොරිකො මට පෙන්වූවාය. එය, වේගයෙන් දුවන, අපිරිසිදු දිය දහරක් විය.

"ඇයි සිය දිවි සනා ගන්නඕන නම්, මීට වඩා ලස්සණ තැනක් හොයා ගන්න බැරි වුණේ? පූජි කන්ද මීට වඩා නරක ය?"යි මම විහිළුවට කීවෙමි.

කෙසේ හෝ වැඩි කාලයක් නොගොස් මට තෝකියෝ නුවර අත් හැර යන්ට සිදු වන හෙයින්, ඒ ටික දවස්වල නොරිකො සමග ගොස් නොයෙක් විදියේ ආස්වාද විඳිය යුතු යයි මම සිතුවෙමි. දිනක්, බටහිර ශෛලියේ නැටුම් සන්දර්ශන පැවැත්වෙන "තකරාසූකා" නෘත්‍ය ශාලාවට ඇය සමග යන්ට මම තීරණය කර ගතිමි. එද ඈ අවන් හලට නොයන දවසක් බව මා දැනගෙන සිටි හෙයින්, ඈ පැමිණි වේලේ මම ඇට ඒ බව කීවෙමි.

"අද නම් යන්න බෑ," යි ඈ මඳක් දුර්මුඛ ව කීවාය.

මා අතින් මුදල් වියදම් වන හෙයින්, ඈ රැගුම් හල් ආදියට වඩා යන්ට කැමති නැත. බොජුන් හල් හා කෝපි හල් අතර ද ඈ සොයා යන්නේ ලාබ තැන්වලට ය. එහෙත් පෙරැත්ත කළොත් ඈ එන බව මම දනිමි.

"ඇයි අද බැරි? මට ටික දවසයි තියෙන්නේ. මම ඉක්කමනින් යන්න ඕන කියෝතෝ වලට."

ඈ දුක්මුසු බැල්මක් මා දෙස හෙළුවාය.

"මම අද පොරොන්දුවක් වුණා."

"කොහේ යන්න ද?"

"ඕකතා සං'ට පොරොන්දු වුණා එයත් එක්ක කෑම කන්න යන්න."

මගේ සිතෙහි හටගත් වේදනාව සඟවා ගන්ට මම තැත් කෙළෙමි. එය ස්වාභාවික සිද්ධියක් ලෙස මා සැලකිය යුතුය. ඈ කිසිවෙකු සමග කෑමට යන්ට සතුටු නම්, ඇගේ නිදහසට බාධා කරන්ට මට ඇති බලය කුමක්ද? ඈ මා සමග කුළු පග වුව ද මට බැඳී නැත.

මගේ සිතෙහි නොයෙක් විදියේ සැක සංකා හට ගන්ට පටන් ගති. සොහොන් පළක හැසිරෙන හොල්මන් මෙන්, ඒවා විකාර වෙස් පාමින් ඔබ මොබ දුවන්ට විය. ඔවුන් දෙදෙනා නොයෙක් වර හමු වන්ට ඇත. මා සමග බැහැර නොයන දිනවල ඈ ඔහු සමග යන්ට ඇත. තමා හා ඔහු අතර වූ සම්බන්ධය ඈ මෙතෙක් දවස් මගෙන් වසංගගෙන තිබේ. එක් අතකින් එය මැනවැයි මම කල්පනා කෙළෙමි. මම විදේශිකයෙක් වීමි. ඔහු ස්වජාතීය කෙනෙකි. ඈ මගේ සමාගම ප්‍රිය කල ද ඇගේ ජීවිතයට මට සම්පූර්ණයෙන් පිවිසිය නොහැකිය. අපෙන් එකෙකුගේ ගැඹුරුම හැඟුම් අනෙකාට පැවසීමට අපට පුළුවන් කමක් නැත. නොපැකිළි කතා බහ කළ හැකි කෙනෙකු සමඟ ඈ ඉඳහිට වුව ද ආශ්‍රය කරන්නට කැමති වීම පුදුමයක් නොවන බව මට පෙනුණි.

"ඔව්, හොඳයි යන එක. මම අද ඇතුලෙ ඉඳන් වැඩ ටිකක් කරන්න ඕන."

WWW.EXPRESSLANKA.TK 41

"දෙතුන් සැරයක් ම බෑ කියල ඔය අන්තිමට බැරි තැන දියි පිලිගත්තේ. මම වැඩි වෙලා ඉන්නෙ නෑ. ඉක්මනට කෑම කාල ගෙදර යනවා."

"ඔය හැටි අකමැති නම්, බැරිය කියන්න තිබුණා නෙ."

"කොහොමද බැරිය කියන්නේ? එයා එතකොට අපි ගැන මොකක්වත් හිතාවි. එයා හෙට යනවලු සුමාන දෙකකට නිවාඩු පිට. ඊට ඉස්සෙල්ල දවසක් මාත් එක්ක ගිහිල්ල කෑම කන්න කැමතියි කිව්ව."

"නෑ. කොහොමටත් එයාව දැන ඇඳින ගන්න එක හොඳයි. එයා නරක මිනිහෙක් නොවේ."

"අද විතරයි නේ. එයා ගියායින් පස්සෙ අපට පුළුවන් ඕන දිහාවකයන්න."

"ඇයි ඉතින් එයා පස්සෙ හම්බ වෙන්න බැරිය? එයා ආපහු එනව නෙ?"

"මට එයාව තවත් හම්බ වෙන්න ඕන නෑ." යි ඈ ස්ථිර ස්වරයකින් කීවාය.

ඔහු කෙරෙහි ඇගේ පැහැදීමක් ඇතැයි සිතීමට කිසිදු කරුණක් නොපෙනුණු නමුත්, අනාගතයෙහි හෝ එබඳු පැහැදීමක් ඇති විය හැකි ය යන සිතුවිල්ල මම තරයේ වැළඳ ගතිමි. මා ඔවුන්ගේ සම්බන්ධයට රුකුල් දිය යුතු යයි මම සිතුවෙමි. එවිට, ඇගේ වාසනාව සඳහා මම පරිත්‍යාගයක් කළ කෙනෙක් වන්නෙමි. එයින් මට සැනසීමක් ලැබිය හැකිය. මම උතුම් ගුණයෙන් යුත් පෙම්වතෙක් වන්නෙමි.

නොරිකො ඕකතා සං හමු වීමට පොරොන්දු වූ ස්ථානය අසලට මම ඇය සමග ගියෙමි. මට ඇගෙන් ප්‍රශ්න අසන්ට සිතුණි.

"තාත්තට කියනවද අද ගිය ගමන ගැන?"

"මං කියලයි තියෙන්නේ. " යි ඈ පිළිතුරු දුන්නාය.

වෙන කෙනෙකු සමග ගොස් මා සමග ගිය ලෙසක් අඟවන්ට එපා යයි කියන්ට මට සිතුණි. එහෙත් එබඳු නපුරු සිතුවිලි ප්‍රකාශ කිරීම යුතු නැත. තමා යන ගමනින් කිසිම විනෝදයක් ලබන්ට බලාපොරොත්තු වන බවක ලකුණු ඇගේ මුහුණෙහි නම් පෙනෙන්ට තිබුණේ නැත.

"අද හවස කොහේ ද යන්නෙ? ගෙදර යනව ද?" යි ඈ ඇසුවාය.

"නෑ. ගෙදර ගිහිල්ල මොනව කරන්න ද? මං ඔහේ ඇවිදිනව. සයෝනරා," යි කියා මම ගියෙමි.

එද සවස මා විඳි චිත්ත පීඩාව ඊර්ෂ්‍යාව වන්නට ඇතැයි මම සිතමි. එහෙත් ඊර්ෂ්‍යාවක් දැයි මට සැකයක් ද සිතේ. ඊර්ෂ්‍යා වන්ට හේතුවක් නොතිබුණු බව මට හොඳින් පැහැදිලි විය. මට නොරිකො විශ්වාස කළහැකි විය. ඕකතා සං කෙරෙහි ඇගේ අල්ප මාත්‍රයක වත් කැමැත්තක් තිබුණේ නම් ඈ එය මගෙන් වසං කරන්නේ නැත. ඕකතා සං කෙරෙහි ද මගේ කිසිදු ක්‍රෝධයක් නොවීය. එහෙත් මගේ සිත මහත් වේදනාවකින් පෙළුණේ ය. එය මා ආරූඪ කර කරගත් වේදනාවක් යයි මට වරක් සිතිණි. නොරිකො

WWW.EXPRESSLANKA.TK 42

තම සිත යටින් ඕකතා සං ට කැමති යයි තහවුරු කිරීමට තිබෙන තර්ක දෙස පමණක් බලා, ඔහු කෙරෙහි ඇගේ පැහැදීමක් නැතැයි සිතීමට තිබෙන වඩා බලවත් තර්ක මම නොසැලකුවෙමි. එහෙත් ආරූඪ කර ගත් වේදනාවක් නම් එතරම් දරුණු විය හැක්කේ කෙසේ ද?

මුළු තෝකියෝ නගරය ම මා විසින් කඩදසියෙන් සාදන ලද සෙල්ලම් ගෙයක් සේ එක වර බිඳ වැටුණි. දැන් මට පෙනෝනේ, යන එන රථ වාහනවලද මිනිසුන්ගේ ද ඡායා පමණි. ඒවා නිශ්ශබ්ද ව මා ඇස් ඉදිරියෙහි ඔබ මොබ සැලෙයි. ගී හඬක් වත් මගේ කනට නො වැටෙයි. සේවිකාවෝ රූකඩ මෙන් මගේ මේසය මත බීර වීදුරු ගෙනැවිත් තබති. ඔවුහු මට ආචාර නොකරති. ඔවුන්ගේ මුහුණුවල සිනාවක් නැත. බීර වීදුරු හිස් වන විට, තවත් වීදුරු එතනට එයි. කොයිබ ගියත් එක වාගේ ය. සෑම දෙයක් ම යන්ත්‍රාකාරයෙන්, සිනාසෙමින්, හිස වනමින්, තොල් සලමින්, නිහඬ ව ක්‍රියා කරයි.

මා තරම්පු පේළිය දිගේ බොජුන් හලකින් බහින විට, හැරෙන තැන, හදිසියෙන්, විශාල කන්නාඩියක* පිළිබිඹු වී තිබෙන මගේ ඡායාව මම දුටිමි. මම ගල් ගැසී ඒ දෙස මොහොතක් බලාගෙන සිටියෙමි. මා කවුද? මා මේ කොහේද ඉන්නේ? සැබවින් ම තෝකියෝ වට ආවෙම්ද? මා තනි වූයේ ඒ හෙයින් නොවේ ද? මා ගැන මට අනුකම්පා සිතිණි. මගේ ඇසෙහි කඳුළු පිරිණි. මම මේ විශාල ලෝකයෙහි, කාත් කවුරුත් නැති, මං මුළාවූ පුද්ගලයෙක් වෙමි. මෙහි සිටින සියල්ලෝම අමුත්තෝ ය. ඔවුහු විදේශිකයෝ ය. ඔවුන් හා මා අතර ඇති නෑකම කුමක් ද?

පසු ද මා අවදි වූයේ බෝහෝ උදෑසනින් ය. මගේ හිසේ තදබල කැක්කුමක් විය. පවුව වේගයෙන් ගැහෙන බව මට දැනුණි. මා නැගිට, ඇඳගෙන, එළියට ගොස්, බ්‍රොවරින් පෙති කීපයක් ගෙනැවිත් ඒපා ගිල වතුර වීදුරුවක් බී, නැවත මෙට්ටෙහි හාන්සි වීමි. මගේ හිස කැක්කුම දරන්නට බැරි තරම් අධික විය. මම නිඳ ගන්නට වෑයම් කෙලෙමි. පපුවේ ගැහීම අඩු වන තුරු ඇස් දෙක පියාගෙන සිටියෙමි. ක්‍රමයෙන් හෘදය ස්පන්දනය අඩු විය. අභ්‍යන්තරය 'සන්සුන් විය.

මා ඒවර අවදි වන විට දහයට පමණ ඇත. තේ කෝප්පයක් වක්කර ගෙන බී, මම හාන්සි වී පොතක් බැලුවෙමි. එකොලහට පමණ නොරිකෝ එන විට මා සිටියේ එලෙසම ය. ඇ පැමිණි විට මම නැගිට, එතෙක් වසා තිබුණු දෙර හැරියෙමි. මා දෙස බැලූ ඇගේ මුහුණ වහා මැලවිණි. මම මුහුණ කට සෝද්‍ද ගතිමි. ඇ කතාවක් බහක් නැති ව මගේ කොට්ට මෙට්ට බිත්ති රාක්කයට තල්ලු කර, කාමර දෙක අස්පස් කරන්ට පටන් ගත්තාය. මම මේසය ළඟ බිම වාඩි වී පොත බැලීමි. නොරිකෝ වතුර උණු කර තේ වත්කර, කෝප්ප දෙකකුත් සමග ගෙනැවිත් මේසය මත තැබුවාය.

"ඊයෙ ඕකතා සං මාව ගෙනිච්ච මේසොං ෂිදෝ කියන ප්‍රන්ස බොජුන් හලට," යි ඇ පසු ගිය සවස වූ දේ විස්තර කරන්ට පටන් ගත්තාය.

WWW.EXPRESSLANKA.TK 43

ඒ ගැන වැඩි උනන්දුවක් නොදක්වා "ආ, එහෙම ද?" මම ඇසීමි.

"කෑම නම් බොහොම රසවත්, ඒත් මම වැඩිය කෑවෙ නෑ."

"ඒක හොඳ නෑ නෙ. එයා මොනව හිතුව ද?"

"මං කිව්ව මට වැඩිය සනීප නෑ කියල."

"ඊට පස්සේ කොහේද ගියේ?"

"එයා අඩ ගැහුවා චිත්‍ර පටියක් බලන්න යන්න. ඒ වුණත් මං බැරිය කියල ගෙදර ගියා. හත හමාර වෙන කොට මම ගෙදර."

"අනිත් දවසෙ යන් බැරිය, මම ගියායින් පස්සෙ. එයා ඒවිනෙ ඉක්මනට."

"එයාව හම්බ වෙන්නෙ නෑ කිව්ව නෙ තවත්."

"ඇයි ඒ?"

"මම එයාට කැමති නෑ"

"ඒක හොඳය? මොකක් ද එයාගේ වැරුද්ද?"

"වැරැද්දක් තිබුණත් නැතත්, කෙනෙකුට කැමති නැත්නම් මම එයාත් එක්ක එහේ මෙහේ යන්නේ නෑ."

මම අවඥාවෙන් සිනාසීමි. කැමති නැති නිසා ද ඔය ගියේ යි මට අසන්නට සිතිනි.

"එයා අර බඳින්න හිටපු එක්කෙනාගේ පින්තූරෙ ආයෙමත් පෙන්නුව.මං එයා වගේ යි කිව්ව. මාව බඳින්න කැමතියි කිව්ව."

මම කිසිත් නොදෙඩුවෙමි.

"මම කිව්ව මම දැනට ම බඳින්න පොරොන්දු වෙලා ය කියල. මං බඳින්න ඉන්න එක්කෙනා කියුබාවල ඉන්නවයි කිව්ව. මගේ පපුවෙ අමාරුවක් තියෙන නිසා, විවාහය දෑ වුරුද්දකට කල් දාල තියෙනවා යි කිව්වා."

"මොක ද ඔය හැටි බොරු කිව්වෙ?" මම ඇසීමි.

"සම්පූර්ණයෙන් බොරු නෙවේ. ටිකක් ඇත්ත."

"එහෙනම් නොරිකො සං බඳින්න පොරොන්දු වෙලා ද ඉන්නෙ?"

"නෑ එහෙමත් නෑ. මොනව හරි කියල එයාගෙන් බේරෙන්නත් එපාය?"

ඈ අනාවරණය කළ කරුණුවලින් මගේ සිත සතුටින් ඉපිල ගියේ නැත. අල්ප මාත්‍රයක දෙමිනසක් එහි පිවිසිණි. පසුගිය ද සිට මගේ සිතෙහි හටගත් වේදනාවෙන් මා එක්තරා විදියක රසයක් ද විඳි බව එවේලෙහි මට පසක් විය. දැන් මා හා තරඟ කරන්ට කෙනෙක් නැත. මගේ ප්‍රේමය උරගා බලා, එය සත්‍යයක් දැයි වටහා ගැනීමට ඉඩක් නැත. නොරිකො ඉදිරියෙහි පරිත්‍යාගයක් කොට, ඇගේ අනුකම්පාව දිනා ගත නොහැකිය.

WWW.EXPRESSLANKA.TK 44

5

මා නොරිකො වෙනුවෙන් පරිත්‍යාගයක් කොට එයින් අස්වැසුමක් ලබන්ට සිතුවේ, වෙන විදියක ජයග්‍රහණයක් මට අත් වේ යයි මා බලාපොරොත්තු නුවූ නිසා වන්ට ඇත. කුමක් කළත්, ඈ මගෙන් දුරස්ථ බව මට පසක් විය. ඈ අයිති ඒ සමාජයට ය. ඇගේ වාසනාව ඒ ජීවිතයෙහි ම රදා පවතී. කුමට ද මා මිරිඟුවක් දෙසට දුවන්නේ? සැබෑ තතු වටහා ගැනීම ඊට වඩා නොමැනවි ද? මා ඉන්ද දී ම ඇගේ වාසනාවට කරුණක් සැලසුණොත් මට ඒ දුක තරයේ වැළඳගෙන, එයින් සැනසිය නොහැකි ද?

ඒ කෙසේ වෙතත්, ඕකතා සං නොසිටීමෙන් ඇති වූ නිදහස මගේ සිතට ක්‍රමයෙන් දැනෙන්ට විය. එහෙත් මම වහා ම නොරිකොට බුරුලක් නොපෙන්වීමි. එද මා විදි වේදනවාට පළිගැනීමේ චේතනාවක් මගේ යටි සිතෙහි තිබෙන්ට ඇත. ඈ ඕකතා සං සමඟ ප්‍රිය සල්ලාපයෙහි යෙදී සිටින අතර මම වියරු වැටුණෙකු මෙන් තෝකියෝ නගරයෙහි වීදියෙන් වීදියට අවන් හලින් අවන් හලට ඇවිද්දෙමි. පසු ද උදේ මම තියුණු හිස රුදවකින් පෙළුණෙමි. මේ සියල්ල මගේ සිතෙහි පැහී පැහී තිබුණි. ඈ ඒ සවස කවර ප්‍රමාණයක වුව ද විනෝදයක් නොලැබුවා යි මම සිතන්ට අකමැති වීමි.

වරක් දෙවරක්, ඒ ගැන ඇනුම් පදයක් කියන්ට මට සිතුණි. එහෙත් හැම වර ම මම මගේ අදහස මැඩ ගතිමි. අවසාන දවස්වල, ඒ ගැන අමතක

කොට, ඇය සමග තැන් තැන්වල ගොස් සන්තෝසයෙන් කාලය ගෙවිය යුතු යයි මම සිතුවෙමි. සැබෑ තතු සැලකුවොත්, ඈ ඕකතා සං ප්‍රතික්ෂේප කළ බව පැහැදිලිව නොපෙනේ ද? ඒ ස්වල්ප කාලය තුළදී වුවද මා හා තරහ කරන්ට කෙනෙකු නැතිබව සත්‍යයක් නොවේද? තාවකාලික වශයෙන් මම ඒ මායාව වැළඳ ගත නොයුතු ද?

ඕකතා සං ගිය ද සිට නොරිකො මා සමග ගෙයින් එකට පිට වී යාමට වුවද අකමැත්තක් නොදැක්වූවාය. එහෙත් එබඳු අවස්ථාවලට ඉඩ නොතැබීමට මම තැත් කළෙමි. මා ඇගේ අනාගතය ගැන සිතිය යුතු ය. එය, මා හා සමග ඇට ගත කරන්ට වන අනාගතයක් නොවේ.

මා නොරිකො සමග යන එන විට, මිනිසුන් අප දෙස අමුතු සැලකිල්ලකින් බලන්ට පටන් ගත්තේ මෑතක දීද, නැතහොත් මට මුල දී නොපෙනුණේ ද? කොතනකට ගියත් නොබෝ වේලාවකින් අප බොහෝ දෙනෙකුගේ දෘෂ්ටියට ගොදුරු වන බව මට දැනෙන්ට විය. අප කිසිවක් ගැන කතා බහ කරමින් සිටියොත් ඔවුහු නොපැකිලීම ඊට කන් දී ගෙන සිටිති. ඇතමුන් උනුන් අතර අප ගැන කිසිවක් දෙඩන බව මට පෙනේ. එහෙත් මා තනිව ම ගිය අවස්ථාවල දි මෙන් මට ලජ්ජාවක් නොසිතේ. ඔවුන් අප දෙස බලන්නේ විස්මයකින් නොව හුදු කුතුහලයකින් යයි මට සිතුණි. එය ස්වාභාවික කුතුහලයක් යයි මම කල්පනා කෙළෙමි. එහෙයින් ඒ ගැන මා තුළ චකිතයක් නොවීය. සැබවින් ම මම ඒ ගැන මඳක් ආඩම්බර වීමි. මම නොරිකො දෙස බලා, ඈ රූපවත් කාන්තාවක් බව නිශ්චය කර ගතිමි. වෙන පිරිමින් සමග යන බොහෝ ස්ත්‍රීන්ට වඩා ඇගේ පෙනුම විනීත ය. සාමාන්‍යයෙන් විදේශිකයන් සමග යන තරුණියන්ට ද වඩා නොරිකො වෙනස් ය. ඔවුහු අධික ලෙස තොල් වල සායම් තවරා ගෙන, ඇස් බැමි කළු කරගෙන, විච්චූරණ ඇඳුම් මෝස්තර පැළඳ සිටිති. නොරිකො චාන් ලෙස අඳියි. ඈ අඳින පාට එකට කැපේ. ඈ තොල් රතු කර ගන්නේ යන්තමිනි.

මිනිසුන් අප ගැන දැක්වූ මේ අමුතු සැලකිල්ල නිසා නොරිකොට ඇතැම් විටක ලජ්ජා සිතිණි දැයි මම ඉඳහිට සැක කෙළෙමි. වරෙක ඈ, මා නොහඳුනන්නා සේ මා ඉදිරියෙන් ගමන් කරයි. එවිට මම ඇය පසු පස්සේ යමි. මා හඬ නඟා කතා කරන විට හීන් සැරෙන් දෙඩන මෙන් ඈ මට කියයි. මං සන්දියකින් එගොඩ වන විට, මා ඇගේ අත අල්ලන්ට තැත් කලහොත් ඈ වහා මගේ අත පසෙකට තල්ලු කරයි. එහෙත් ඈ මා සමග යන්ට ලජ්ජා යයි නිශ්චය වශයෙන් තීරණය කිරීමට කරුණු නො තිබිණි.

නොබෝ දවසකින් අප ගත කළ ජීවිතය කෙළවර වන බව මම දතිමි. එහෙත් ඒ දැනුම මම සිත යට සඟවා ගතිමි. මම කිසි විටක ඒ සත්‍යයට මුහුණ පා නොබැලුවෙමි. අප ගත කෙලේ සැබෑ ජීවිතයක් නොව සිහිනයකි. ඒ සිහිනයෙන් අවදි වන්ට අපට කවද නමුත් සිදු වේ.

දවස් කීපයක් ම නොකැඩී පැවති හොඳ කාළ ගුණය හදිසියෙන් මාරු විය. වැස්ස වසින්ට පටන් ගෙන, සීත දවස් නැවත ආවේ ය. එහෙත්

WWW.EXPRESSLANKA.TK 46

මේ වර මාර්තු මස වෙන අවුරුදුවලට වඩා උණුසුම් වූ නිසා දෝ වෙන දා වඩා කලින් සකුරා මල් තැන් තැන් වල පිපෙන්ට පටන් ගෙන තිබෙන බව පුවත් පත් වල සඳහන් විණි. හදිසියෙන්ඇති වූ අකල් වරුසාව නිසා, පිපීගෙන ආ සකුරා මල් ඉක්මනින් මැල වේ යයි මිනිසුන් තුළ බියක් ඇති විය.

ඊළඟ ද නොරිකොගේ නිවාඩු දිනය වූ හෙයින්, සකුරා බලන්ට යමු දැයි මම ඇගෙන් ඇසීමි.

"මේ වැස්සේ?" යි ඈ පුදුම වී ඇසුවාය.

"ටිකක් වත් පෑව්වොත් යමු. හෙට බැලුවෙ නැත්නම් මේ අවුරුද්දෙ ආයෙමත් සකුරා බලන්න හම්බ වෙන්නෙ නෑ."

"කොහාට ද යන්නේ?"

"කමකුරා පැත්තට යමු."

"සකුරා බලන්න නම්, ඒ තරම් දුර යන්න ඕන ය? උයෙනො උද්‍යානෙ නැත්නම් කෝජිමච්වල පුළුවන් නෙ."

"ඒ වුණත් මම කැමතියි කමකුරාවලට යන්න-නගරයෙන් පිට."

"හෙට ටිකක් උදෑසනින් එන්න," යි නොරිකො යන විට මම කීවෙමි.

ඈ උදේ දහයට පමණ ආවාය. එතෙක් වේලා තදින් වරුසාව වැස්සේය.

"අද යන්න බෑ නේ?" යි ඈ ඇසුවේ ඒ ගැන සතුටින් මෙනි.

"තව පොඩ්ඩකින් පායාවි. කොහොම හරි යමු."

එද අප්‍රෙල් මස පළමුවෙනි ද විය. උදේ සිට, වසන්තයෙහි මෙන් නොව, හේමන්තයෙහි මෙන් අධික සීතල ගතියක් පැවතිණි. හැකි තාක් ලොම් කබායවල් ආදිය ඇඳගෙන සිටි නමුත්, මම සීතලෙන් ගැහුණෙමි. හිනි කබලෙන් කාමරය උණුහුම් කර ගත නොහැකි විය. එළියට බැස, වැස්සෙහි වුව ද ඇවිදීමෙන් සීතල මග හැර ගත හැකැයි මට සිතිණි.

අපි හිබචිය ගාව බිම වාඩි වී කතා කරමින් සිටියෙමු. තමා ගෙන ආ ගීතිකා පොතකින් සින්දු තෝරා නොරිකො ගයන්ට වූවාය. හිබචිය මත තබන ලද කේතලය කටින් නිකුත් වූ හුමාලය නිසා ගෙය මදක් උණුසුම් විය. නොරිකො වරින් වර තේ පෝච්චියට උණු වතුර වක්කර තේ සෑදුවාය. තේ බීමෙන් සීතල ගතිය මදක් පහ විය.

"දැන් ඉතින් යමු," යි ජනේලයෙන් එළියට බලා මම කීවෙමි." දැන් වැස්සත් ටිකක් නැවතිල."

"ආයිමත් වහීවි. අපි මෙහේ ඉඳිමු. මොකොට ද එළියට ගිහිල්ල නොමෙන්නේ මේ සීතලේ?" යි නොරිකො කීවාය.

මම මදක් නොඉවසිලිමත් වීමි.

"මාත් එක්ක විතරයි කොහෙවත් යන්න අකමැති."

"ඇගේ මුහුණ වහා මැලවිණි. මට තවත් ඇණුම්පද කියන්ට සිතුණි.

“නොරිකො සංගෙ පෙම්වතා අඩ ගැහුව නම්, යනව නේද? මං අඩගැහුවම තමයි ඔක්කොම”

මගේ වචන යුක්ති සහගත නොවීය. ඇය ළඟක දී මා සමග කොයිබ යන්ට වුවත් බැරි ය කීවේ නැත. මුල දී අදි මදි කළත්, සුළු පෙරැත්තකින් ඇය කැමැති කරවා ගැනීම අපහසු නොවීය.

ඈ තම මුහුණ වසාගෙන නිහඬ ව සිටියාය. මම ද ඊට පසු කිසිවක් නො දෙඩුවෙමි. ඈ ඉකි බිඳිමින් හඬන බව ඇගේ සිරුරේ ගැස්මෙන් මට තේරුණේ ය. කිසිවක් කර කියා ගත නොහැකි ව මම කොපමණ වේලාවක් එලෙස ම සිටියෙම් දැයි නොදනිමි. නොදැනුවත් ව මගේ අතින් පාපයක් සිදු වූවා සේ මගේ සිත පසුතැවිල්ලෙන් පිරිණි. නොරිකො ගේ සිත රිදුණේ කවර හෙයින් දැයි මට වටහා ගත නොහැකි විය.

“හොඳයි, අපි එළියට යන්නේ නෑ. කෑම ටිකක් හදන්න. අපි කඩේට ගිහිල්ල මොනව හරිගෙනෙමු.” යි මම යෝජනා කෙළෙමි.

මා නොරිකොගේ දෑත මුහුණින් ඉවත් කර දමන්ට ඇද්ද නමුත්, ඈ “එපා, එපා,” කියා මා වැළැක්වූවාය.

නොබෝ වේලාවකින් ඈ නැඟිට ,බේසමට උණු වතුර වක්කර, මුහුණ සෝද ගත්තාය. ඒවේලේ මා ජනේලයෙන් පිටත බලනවිට, හදිසියෙන් හිම වැටෙන්ට පටන් ගෙන තිබෙන බව දැක මම පුදුම වීමි. අප්‍රේල් පළමු වෙනි ද හිම ඇත්තෙන්ම දුර්ලභ ය. මල් වරුසාවක් වහින කලක් මෙන්, කිරි පාට හිම කැබලි වාතයෙහි පාවෙමින් පොළොවෙහි විසිරිණි. පොළොව මෙන් ම ගෙවල පියසි ද කෙමෙන් සුදු පාට වී ගෙන ආවේය.

කඩදසි කුඩය යටට වී අපිදෙදෙනා කඩ වීදියට ගියෙමු. අපි ස්වල්ප වේලාවක් පචිංකො[1] සෙල්ලම් කර, පසු ව කඩේට ගොස් මාළු ගත්තෙමු. එන ගමන් මම කුඩා සකෙ බෝතලයක් ද ගතිමි.

“අද සීතල හන්ද නොරිකො සං සකෙ පොඩ්ඩක් බොන්න ඕන.” යි මම කීවෙමි.

“නෑ මං බොන්නේ නෑ. දෙවෙන්දෙරා සං බොන්න, ඒකට කමක් නෑ.”

අපූරු හැඩයක් නිසා මා සිත ගත් සකෙ තොක්කුරියක්[2] හා සකදුකි කුට්ටමක් ද ලාබෙට ලැබී මා ගෙදර ගෙනැවිත් තබා තිබුණි. නොරිකො තොක්කුරිය පුරවා, එය උණු වතුර කේතලය තුළතබා රත් කොට, අප කෑම කමින් සිටි අතර, වරින් වර මගේ සකදුකියට වැක්කෙරුවාය.

“එක උගුරක් බොන්න, හිතේ තරහක් නැති බව පෙන්නන්න,” යි මම අයැදියෙමි.

---

1. තෝකියෝ නගරයෙහි බෙහෙවින් කෙරෙන ක්‍රීඩාවකි. 'හිට් එ පින්' නම් ක්‍රීඩාවට සමාන ය. හැම වීදියක වාගේ පචිංකො ක්‍රීඩා හලක් තිබේ.
2. සකෙ දැමීමට තිබෙන ජෝගු වෙසෙසක්. 'සකදුකි' කියන්නේ සකෙ බොන කුඩා කෝප්ප වර්ගයකට ය.

WWW.EXPRESSLANKA.TK 48

ඈ සකසුකියක් අතට ගෙන මා දෙසට දිගු කළාය. මම එහි සකෙ ස්වල්පයක් වැක්කෙරුවෙමි. ඈ එය වහා හිස් කර,

"ආ, රසයි" කියා, සකසුකිය මගේ අතෙහි තබා එය පිරෙව්වාය.

තව ටිකකට පසු, නොරිකො, මා බිම තැබූ සකසුකිය නැවත තම අතට ගෙන මා දෙසට දිගු කලාය. මම කතාවක් බහක් නැති ව සකෙ වැක්කෙරුවෙමි.

"මගේ ඔළුව කැරකෙනව" යි ඈ හිස බඳගෙන කීවාය.

"මොනව ? දිදුලයක් විතර ඇති සකසුකියෙන් දෙකක් බීල.?"

"මං කොහොමද ගෙදර යන්නේ? තාත්ත මං ගැන මොනව හිතාවිද? මං එන්න එන්න නරක් වෙනවා."

"බය වෙන්න එපා. මුකුත් වෙන්නේ නෑ. මං තව පොඩ්ඩකින් කෝපි ටිකක් හදලා දෙන්නම්. එතකොට හරි යාවි."

"මං ගෙදරින් පිට දි කවදවත් සකෙ බීල නෑ."

"මගේ වැරැද්ද. දැන් ඉතින් හිතට ගන්න එපා. මම නේ පෙරැත්ත කෙරුවෙ.

කෑම කා පසු ඈ යන්ට සැරසුණාය. පැයක් පමන පැවතුණු හිම පාතනය එවේලේ වරුසාවකට පෙරලී තිබුණි. මම ඇය තක්සියකින් ගෙදර පිටත් කෙළෙමි.

තෙදිනක් පමණ නොරිකො නැවිත් සිටියාය. ඇට ගෙදර අය බැණ වදින්ට ඇතැයි මම සිතුවෙමි. එහෙයින් මට එහි ගොස් ඇය බැලීම ද කළ නොහැක්කක් විය. දින චරියාවකට මෙන් ඇගේ පැමිණීමට පුරුදු වී සිටි මම මං මුළා වූවෙකු සේ ඔබ මොබ ඇවිද්දෙමි. ස්ත්‍රීන් ළඟින් ඇසුරු කරන්ට කරන්ට, ඔවුන්ගේ කිසියම් ඇද කුදයක් මට පෙනේ. එහෙයින්, මුල දී කිසියම් ස්ත්‍රියක කෙරෙහි මගේ සිත ඇදී ගිය ද නොබෝ දවසකින් මගේ සිත ඇය කෙරෙහි උදසීන වේ. නොරිකො සම්බන්ධයෙන් ද මට එසේ වුවහොත් මැනවැයි මම ඇතැම් විටක පැතුවෙමි. එහෙත් කරුණු වෙනස් බව මට පෙනිණි. මතු අනාගතය ගැන මගේ කනස්සල්ල අධික විය. මේ ප්‍රේමය ශෝකයෙන් මිස අන් කවර අයුරකින් කෙළවර විය හැකි ද?

නොබෝ දවසකින් මගේ දෙපා යළිත් මිදෙරි අවන් හල දෙසට ඇදී ගියේය. ඈ නොපැමිනියේ මගේ වරද නිසා යි මම මට ම කියා ගත්තෙමි. මම නොමනා දේ කියා ඇගේ සිත රිදෙව්වෙමි. මා ඇයට සකෙ බොන්ට අනුබල දීම ද වරදක් බව මට පෙනුණි. මා ඇය හමු වී ඇයගෙන් සමාව ගැඳිය යුතු ය.

නොරිකො මට ආචාර කෙලේ කලකට පසු පැමිණි අමුත්තෙකුට ආචාර කරන්නාක් මෙනි. මා ගියේ හවස හයට පමණ නිසා කිසිවෙකු ඇවිත් සිටියේ නැත. ඈ එතෙක් මා බලන්ට නාවේ කුමක් හෙයින් දැයි මම ඇසුවෙමි. ඈ සිනාසී "හෙට එනව" යි කීවාය. ඒතරම් පහසුවෙන් ඇගේ මුවින් එවැනි වචනයක්පිට වේ යයි නොසිතූ නිසා දෝ මම පුදුම වීමි.

WWW.EXPRESSLANKA.TK 49

පසු ද හමු වූ විට, නොරිකො සං මගෙන් සමාව අයැදුවේ මම එද සිදු වූ දේ ගැන සඳහන් කිරීමට කුලැටිව ඉඩක් ලැබෙන තුරු වෙන වෙන දේ ගැන කතා කරමින් සිටියෙමි.

"එද වෙච්ච දේට සමා වෙන්න. මම මෝඩයෙක් වගේ හැසුරුණා" යි ඈ කීවාය.

"ඇයි හදිසියෙන් ම අඬන්න පටන් ගත්ත? මම විහිළුවට නෙ කිව්වෙ."

"ඔව්. මම දන්නවා. නමුත්...මට ළඟ දී සිද්ද වෙච්ච දුකක් ගැන සිහි වෙලයි ඇඬුණෙ."

"සමා වෙන්න. මීට පස්සෙ එහෙම විහිළු කරන්නේ නෑ."

"ඒකට කමක් නෑ. මං කියන්නම් එහෙනම්. මට පෙම්වතෙක් දැන් නෑ. ඒ වුණත් හිටිය. අපි බොහොම ඇහැලි වුණා. එයා හුඟක් සංගීතය ප්‍රියා කළා. අපි දෙන්න, දෙවෙන්දෙරා සං එක්ක වගේ, නොයෙක් කෝපි හල්වලට ගිහිල්ල සංගීතය අහනව. දෙවෙන්දෙරා සංට දවසක් මං පෙන්නුව, මතකද දන්නේ නෑ. ෂිබුයාවල දී ශාස්ත්‍රීය සංගීතය වාදනය කරන කෝපි හලක්. එතනට යමු ද කියා දෙවෙන්දෙරා සං ඇහුව ම මම යන්න කැමති වුණේ නෑ. එතනට තමයි අපි නිතර ම ගියෙ. "

"කෝ එයා දැන්?"

"දැන් එයා කියුෂුවල. හදිසියෙන් ම එයා, මගේ හොඳ ම මිතුරිය එක්ක විවාහ වුනා. මම හීනෙකින් වත් නොහිතපු දෙයක්."

"මහ පුදුම මනුස්සයෙක් නෙ."

"මගේ ම වැරැද්ද. එයා මගෙන් ඇහුව එයා බඳින්න කැමති ද කියල. මං ඒකට ක වර ම පිලිතුරක් දුන්නේ නෑ. දෙතුන් දවසකින් එයා, මගේ යෙහෙළියත් එක්ක විවාහ වෙන්න පොරොන්දු වුණා."

"එයා ඇත්තෙන් ම නොරිකො සං ට ආදරයෙන් හිටිය නම් එහෙම කරන්නේ නෑ."

"නුමුත් මම නම් තාම එයාට විතරයි ආදරේ. වෙන කිසි ම කෙනෙකුට ඒ වගේ ආදරේ නෑ."

සතියකට පෙර වූ හදිසි හිම පාතයෙන් පසු යලිත් උණුසුම් ගතියක් ඇති වී තිබුණි. හිම නිසා සකුරා මල් මැල වී ගිය බව නොයෙක් දෙනා කියනු මට ඇසිණි. එහෙත් යළු සකුරා හෙවත් පෙති දෙකේ සකුරා කීප තැනක පිපී තිබෙන බව සැල විය. දෙවෙනි වරට පිපෙන යළු සකුරා, පළමුවෙන් පිබිදෙන මල තරම් දැකුම්කලු නැත. මිනිසුන්ගේ සිරිත ද පළමු සකුරා බැලීමට යාම මිස, යළු සකුරා බලන්ට යාම නොවේ. එහෙත් මේ අවුරුද්දේහි නොරිකො සමග යළු සකුරා වුව ද බලන්නට ගිය හැකි නම් යෙහෙකැයි මට සිතුණි. මම කෙලින් ම ඇයගෙන් එය ඇසීමට මැලි වීමි.

"දැන් යළු සකුරා පිපිලා ඇති නේ ද?"

WWW.EXPRESSLANKA.TK 50

"දන්නෙ නෑ. මං දැක්කේ නෑ කෝහේවත්."

ප්‍රීති වූ අවස්ථාවන්හි නොරිකොගේ මුහුණ තරම් පැහැපත් මුහුණක් මා දැක නැති තරම් ය. ඒ වගේ ම දුකෙන් පෙළුණු විට ඇගේ මුහුණ තරම් මලානික මුහුණක් ද මා දැක නැත. ඈ දුක සැප දෙකෙහිම එක සමාන හිබුණු ආස්වාදයක් විඳින්නී යයි මට සිතිණි.

"දෙවෙන්දෙරා සං වරද්දල තේරුම් ගන්න එපා. කොයි දේ වුණත් දැනගෙන හිටිය ම වැඩිය හොඳ නේ," යි ඈ මා දෙස නොබලමින් කීවාය.

"එදා මම සකුරා බලන්න යන්න අකමැති වීමට හේතුවක් තියෙනව. මම කැමතියි දෙවෙන්දෙරා සං එක්ක කොහේ වුණත් යන්න. ඒ වුණත් මම ඉඳල හිටල ලැජ්ජයි. ඒ නිසා ඒ නිසා මං වැඩි කැමතියි දෙවෙන්දෙරා සං එක්ක මේ ගේ ඇතුලෙ ඉන්න. මම ජපන් ගෑනියෙක්. අපි එහේ මෙහේ යන කොට මිනිස්සු මා ගැන නරක දේ හිතනව. මිනිස්සු දන්නේ නෑ නෙ අපි ගැන."

"එහෙම දෙයක් මට දැන ගන්න ලැබුණෙ නෑ. මිනිස්සු අපි දිහා බලනව තමයි. ඒ ගොල්ල අපි ගැන දෙඩනවත් ඇති. ඕක පුදුමයක් නෙවෙ නේ. ඒ වුණත් නරකක් දෙඩනවයි කියල මං හිතන්නේ නෑ."

"ඇයි නැත්තේ? දෙවෙන්දෙරා සංට බාසාව තේරෙන්නේ නෑ නේ. ඒ ගොල්ලො කියන ඒව ඇහෙන්නේ නෑ. මම නොයෙක් වර අහල තියෙනව."

"මොනවද කියන්නේ?"

"නරක වචන කියනව. දෙවෙන්දෙරා සං දන්නෙ නෑ ඒ වචන."

"ඒ වුණත් කියන්න. කෝක වුණත් දැනගෙන හිටියම හොඳ ය. කියල නේ දැන් කිව්වෙ."

"එදා මතක ද අපි ඉනොකෂිරා උයනට ගිය වේලෙ, අපි හිටිය නේද අර තමගවා ජෝසු කියන ඇළ කානුව ගාව? දසයි ඔසමු දිවි නසා ගත්ත තැන? ඒක බලාල යන කොට මතක ඇද්ද දන්නෙ නෑ පිටිපස්සේ බිම වාඩි වෙලා හිටියා තරුන ජෝඩුවක්. ඒ ගොල්ලො හිනා වෙවී මට පං පං කිව්ව. පං පං කියන්නේ, යුද්ද කාලෙ, හේවායන් එක්ක නරකට හැසුරුණු ගෑනුන්ටයි. මට හරියට දුක හිතුණ ඒක අහල."

"එහෙම වල් මිනිස්සු කොහෙත් ඉන්නව. ඒව ගැන ඔය තරම් ම හිතල පුළුවන්ද?"

"එදා අපි මේජි උයනෙ ඇවිද ඇවිද ඉන්න කොටත්, බයිසිකල්වලින් ගිය තරුණයො වගයක් මට කොලොප්පම් කළා. අපි කොහේ ගියත් මිනිස්සු අපේ දිහා බලාල කසු කුසු ගානව. ඒ ගොල්ල දෙඩන්නේ මොනවද කියල මට දැන් තේරෙනවා. දෙවෙන්දෙරා සං එක්ක සාප්පුවකට ගිහිල්ල බඩුවක් ගත්තත්, සේවිකාවෝ වැඩිය හොඳට කතා කරන්නේ නෑ. ඒ ගොල්ල හිතනවා ඇති මමත්, පිට රට කෙනෙක් අල්ලාගෙන ජීවිකාව රැක ගන්නවයි කියල."

WWW.EXPRESSLANKA.TK 51

"එහෙනම් මාත් එක්ක මීට පස්සේ කොහේවත් යන්නේ නැතෙයි කියල ද කියන්නේ.?"

"මම එහෙම කිව්වෙ නෑ නෙ. ඒ වුණත් අපි වැඩිය ම එළියට නොගිහින් මෙහේ ඉඳිමු. මම කැමතියි දෙවෙන්දෙරා සං වැඩ කරනවා බලා ඉන්න. තාත්තට වගේ උදවු කරන්න පුළුවන්. මමත් ඉගෙන ගත්තොත්." මම සිනා සීමි.

"තව කොච්චර කල්ද? සති දෙකකින් තුනකින් මම කියෝතොවට යනව."

මා කියෝතෝ යෑම දිනෙන් දින ම කල් දමමින් සිටි නමුත්, එහි ගොස් විසීමට කටයුතු පිලියෙළ කර තිබුණි. තවත් පමා නොවී පිටත් විය යුතු යයි මම එද තීරණය කෙලෙමි.

"ඇයි කියෝතො යන්නෙ?" යි නොරිකො මුදු හඬකින් ඇසුවාය.

"මම කිව්වෙ මීට ඉස්සර, යන බව. "

"මෙච්චර ඉක්මනින් යන වගක් කිව්වෙ නෑ නේ."

"එහේ කටයුතු පිලියෙළ වුණාම මම යන්නයි හිටියෙ. මට එහේ කාමරයක් ලැබුණ පන්සලක."

"කියෝතො ගිහිල්ල ආයෙමත් එනව නේ.?"

"මං ආයෙමත් එන්න බලාපොරොත්තුවක් නෑ. එහෙන් කියුෂු ගිහිල්ල එහෙම්ම ගම රට යන්නයි කල්පනා ව."

නොරිකො නිහඬ ව සිටියාය. අර මලානික පෙනුම නැවතඇගේ මුහුණට ආරූඪ විය.

"මං කියපු කතාව හින්ද නෙවේ හදිසියෙන් කියෝතො යන්න හිතුවෙ නෙ?"

"නෑ. කොහොමටත් මං මේ මාසෙ අග හරියෙ යන්න අදහස් කරගෙන හිටියෙ. ඒත් හරියටම දැනගත්තෙ ගිය සුමානෙ."

WWW.EXPRESSLANKA.TK 52



6

කියෝතො දුම්රිය, තෝකියෝ ඉස්ටේසමින් පිටත් වන්නේ රෑ නවයට පමණය. මා යන දවසෙහි දවාලට නොරිකොලාගේ ගෙදරට ගොස් එහි සවස් ජාමය ගත කරන්ට මට සිතිණි. මා එසේ අදහස් කෙළේ ඇය සමග ඒ අවසාන පැය ස්වල්පය ගත කිරීමට වෙන විදියක් නුවූ හෙයිනි.

"එන්න. තාත්තත් බොහොම සන්තෝස වේවි ආයෙමත් දෙවෙන්දෙරා සං බලන්න. දෙවෙන්දෙරා සංට හරි කැමති පාටයි තාත්ත. නිතරම දෙවෙන්දෙරා සං ගැන කියනව. හුඟක් දවස්වල අපි දෙන්නා නිදාගන්න ගිහිල්ල රෑ දෙගොඩ හරිය වෙන කල් දෙවෙන්දෙරා සං ගැන කතා කර කර ඉන්නවා."

"තාත්තත් එක්ක ඔක්කොම කියනව ද, අපි අතර සිද්ද වෙන දේවල්?"

"ඔව්, ඔක්කොම විස්තර කරල කියනව, අපි යන තැන් ගැනයි. දවස ගත කරන හැටි ගැනයි...."

"සකෙ බිව්ව වගත් කිව්වද?"

"නෑ, ඒක කිව්වෙ නෑ.," යි ඈ ලජ්ජාවෙන් පැවසුවාය.

"මං ආවට නොරිකො සං ගෙදර ඉන්නේ නෑ නෙ?"

"එදට මං යන්නෙ නෑ වැඩට."

මා පිටත් වීමට දෙතුන් දවසකට පෙර නොරිකො ඇවිත්, මගේ ඇඳුම් පැලඳුම් හා පොත් පත් සියල්ල ම ද අස් පස් කර පෙට්ටිවලට දමා, කිලුටු ඇඳුම් සෝදා, කාමරය සුද්ද කලාය. මා අඳිමින් සිටි චිත්‍රය, පිටත් ව යාමට පෙර අවසන් කිරීමට මම අදහස් කෙලෙමි. මා වැඩ කරමින් සිටින අතර නොරිකො හදිසියෙන් මා ළඟට විත්, දන ගසා වාඩි වූවාය.

"යන්න එපා, දෙවෙන්දෙරා සං," යි ඇ මගේ මුහුණ දෙස දුක්බර බැල්මක් හෙලමින් කීවාය.

මගේ සිරුර තුළ ගින්නක් හට ගෙන, හිස දක්වා ඇවිලීගෙන එන්නා සේ මට දැනිණි.මම එයින් මුළුමනින් ම දැවී ගියෙමි.

"කොහොම ද නොගොහින්? මං ඉඳල පලක් නෑනේ. තව කොච්චර කල් මෙහෙම තියෙයි ද? අපට හැම ද ම බෑනේ මේ විදියට. කවදා හරි වෙන් වෙන්න වෙනව. දැන් වෙන් වෙන එක වඩා ලේසි නැද්ද?"

ඇ නැමී, තම මුහුණ මේසය මත තබා ගත්තාය.

"යනව නම්, දෙවෙන්දෙරා සංගෙ සිරුරෙ සුවඳ- මේ ඇඳුම් වල සුවඳ තියල යන්න," යි මඳ වේලාවකට පසු ඇ කීවාය.

ලහි ලහියේ ග්‍රහණයෙන් ගිලිහී යන සැපතක් ලුහු බැඳ යාමේ දී මා රැස් කළ දුක්ඛ සමුදය විස ගොර සැපිත්තියක මෙන් හිස ඔසවා මා දෙස බැලීය. ඒ දුක්ඛ සමුදය මගේ අනාගත දායාදය වන බව මම දැනගත්තෙමි.

නොරිකොගේ සොහොයුරිය, මොමොකො, මට පළමුවරට මුණ ගැසුණේ ඒ දවස්වලය. මගේ පොත් හා වෙනත් බඩු සියල්ලක් ම මා ගාව තිබුණු සූට් කේස් පෙට්ටි දෙක තුළට ඇහිරිය නොහැකි විය. මා හය මාසයක් පමණ කාලය තුළ දී නොදැනුවත් ව ම එකතු කළ නොයෙකුත් සුන්බුන්- කාමරයට වුවමනා කරන අඩු වැඩිය, විසිතුරු බඩු, පුවත් පත්, ඡායාරූප, නොමිලයේ ලැබෙන ජපානය පිලිබඳ පොත් පිංචි ආදිය- දමා යාමට ද මට නොසිතේ, පෙට්ටිවලට අඩුක්කු කිරීමට ද ඉඩ නැත. නොරිකො හැකි තාක් බඩු සූට් කේස් දෙක තුළ අහුරා තිබුණි. ඉතිරි ව තුබූ බඩු අලුත් සූට් කේස් පෙට්ටියකට ප්‍රමාණවත් නොවීය. මේ හේතුව නිසාත්, අමතර වියදම නිසාත්, අලුත් සූට් කේස් පෙට්ටියක් මිල දී ගැනීමට මම අදි මදි කරමින් සිටියෙමි. ඉතිරි බඩු ටික ලේන්සුවක ගැට ගසා ගෙන යා යුතු යයි නොරිකො යෝජනා කළාය. ලොකු ලේන්සුවල බඩු බාහිරාදිය බැඳ ගෙන යාම ජපනුන්ගේ සිරිතක් වුව ද ඊට මා නුපුරුදු හෙයින් මම ප්‍රිය නොකෙළෙමි.

මොමොකො පැමිණියේ මේ ප්‍රශ්නය විසඳා ගත නොහැකි තත්වයක තිබුණු වේලාවක බව මට මතකය. මා කිසියම් කටයුත්තක් සඳහා බැහැර ගොස් ආපසු පැමිණි විට, තම සොහොයුරිය මා බලන්ට ස්වල්ප වේලාවකින් එනවායි අල්ලපු ගෙදරට ටෙලිපෝන් කර දැන්වූ බව නොරිකො කීවාය. මම මේ ගැන මඳක් පුදුම වීමි.

"දෙවෙන්දෙරාසං හම්බ වෙලා මොකක් හරි තෑග්ගක් දෙන්න ඕන ය කියල අක්ක කිව්ව."

"මොකොට ද තෑගි? ඇරත් ඕව දන්න ඉඩකුත් නෑ නෙවැ?" යි මම කීවෙමි.

"මම කිව්ව, දෙනව නම් ඉඩ කඩ ගන්නෙ නැති සැහැල්ලු බඩුවක් දෙන්නෙයි කියල," යි නොරිකො කීවාය.

ගෙන යාමට තවත් අඩු වැඩිය එකතු වීම මට හිරිහැරයක් සේ දැනිණි. මගේ අසතුට නොරිකොට පෙනෙන්ට ඇත.

"දැන් ආවම අපි සාප්පු යමු. එතකොට දෙවෙන්දෙරා සං කැමති දෙයක් තෝරා ගන්න පුළුවන්. මම කිව්ව එහෙම හොඳය කියල. මගේන් ඇහුව දෙවෙන්දෙරා සං කැමති මොනවට ද කියල."

කිමොනොවක් ඇඳගෙන ආ මොමොකො නොරිකොට වඩා මිටි කුඩා ස්ත්‍රියක් වූවාය. නොරිකො මෙන් ඇ ජීවිතය ගැන ගාම්භීර ලෙස කල්පනා කරන කෙනෙකැයි මට නොසිතුණි. මා ගැන නොරිකො කී කවර දේකට වුවද ඈ බක බක ගා සිනාසුණාය. මා වචනයක් දෙකක් කතා කළ විට ද ඈ එලෙසම සිනා සුණාය. ඈ සිනාසුනු විට මුළු මුහුණ ම රැලි ගැසී ඇස කුඩා වී එම රැලි අස්සේ සැඟවුණි. මගේ ජපන් උච්චාරණයට ඈ ඔච්චම් කරනවා දැයි මට සිතී මඳ ලජ්ජාවක් ද මා තුළ පහළ විය.

මගේ බඩු පෙට්ටිවල ඇහිරීම ප්‍රශ්ණයක් වී තිබෙන බව මම මොමොකොට කීවෙමි. එය ද ඈට හාස්‍ය ජනක කරුණක් විය. එහෙත් ඈ වහා ම මගේ බඩු නැවත අස් පසු කරන්ට වූවා ය. පෙට්ටිවල තිබුණු බඩු සියල්ල ම ඈ එළියට ගෙන, වෙන පිළිවෙළකට අඩුක්කු කරන්ට පටන් ගත්තාය. ඕනෑවට වඩා ඉඩ ගත් සමහර බඩු ඈ රෙදි පිළිවල ඔතා නොයෙක් අහු මුළුවල එබුවාය. මගේ සියලුම අඩුවැඩිය සූට් කේස් දෙකෙහි අහුරා ය, ඈ අවසන් කෙළේ.

අනතුරු ව අපි තිදෙනා සාප්පු ගියෙමු. තෑග්ගට ලැබුණක් වුව ද තවත් වැඩිපුර බඩුවක් අතේ ගෙන යන්ට සිදු වීම ගැන මම සතුටු නොවීමි. එහෙත් මොමොකොගේ ඉල්ලීම ඉටු කළයුතු හෙයින් මම පුළු තෑග්ගක් තෝරුවෙමි. එය, උණ බටවලින් වියා සාදන ලද බත්දේසියක් විය. මා එය තෝරුවේ එබඳු බඩුවකින් මට වැඩක් වන නිසා නොව, එය අපූරු දක්ෂකමකින් සාදන ලද්දක් ලෙස මට පෙනුණු නිසා ය. එය ගෙන යාමට ද පහසු විය.

අප ආපසු යන්ට සැරසුණු විට, මට හා නොරිකොට තමා සමග යොත්සුයාවට එන මෙන් මොමොකො ආරාධනා කළාය.

"කිමිකො දෙවෙන්දෙරා සං බලන්න ආසාවෙන් ඉන්නවා." යි ඈ කීවාය.

"හැබැවට, කිමිකො චංට දැන් කොහොම ද? මට අහන්නත් බැරි වුණා" යි නොරිකො තම සොහොයුරියගෙන් ඇසුවාය.

"දෙතුන් දවසකට උඩ දී ආයිමත් හොඳට ම අමාරු වුණා. උණත් ගත්ත. දැන් ටිකක් පහසුයි." යි මොමොකො පිළිතුරු දුන්නාය.

WWW.EXPRESSLANKA.TK 55

"කිම්කොට නිතර ම ඇදුම හැදෙනව. වැඩිය ම ග්‍රීෂ්ම සෘතුවෙ අමාරු වෙනව," යි නොරිකො මට කියා දුන්නාය.

කිම්කො යි කීවේ මොමොකොගේ දුවට ය. යුද්ධයෙහි දී මොමොකොගේ සැමියා මැරුනු බව ද ඈ තම දහතුන් හැවිරිදි දියණිය සමග යොත්සුයා වෙහි පිහිටි, ස්වාමියාගේ දෙමවුපියන්ගේ ගෙයි විසූ බව ද නොරිකොගෙන් මට කලින් දැන ගන්ට ලැබුණි.

වාසය සඳහා යොත්සුයාව ඉතා සිත්කලු පෙදෙසකි. තෝකියෝවේ වෙන පළාත් මෙන් එය අධික ලෙස ජනාකීර්ණ නැත. දෙපසෙහි වැවුණු විශාල ගස්වලින් යුතු එහි වීදි පළල් ය. කඩ සාප්පු හා බොජුන් හල් වඩාත් නොතිබුණු හෙයින් තෝකියෝ නගරයෙහි කලාතුරකින් දකින්ට ලැබෙන නිස්කලංක ගතියක් මුළු වටාපිටාවෙහි ම පැතිරෙයි. මහ පාර අයිනේ එක් පසෙකින්, රජ මාලිගාවේ පිට පවුර මඳක් දුරට ඇදෙයි. එහි දිය අහල දැන් බොහෝ තැන්වල සිඳී ගොස් ය. දිය තිබුණු සමහර තැන්වල තරුණ යෝද තරුණියෝ ද ඔරු පදිති. පවුර දැන් දැකුම්කලු සක්මන් බිමකට පත් වී තිබේ. එහි දිගට ම මත් සූ[1] ගස් වැවී තිබෙන හෙයින් ඊට ව්‍යවහාර කරන්නේ "මත්සු පවුර" යන අර්ථයෙන් යුත්"මත්සු දෙතෙයි" යන නමය.

"යුද්දෙට ඉස්සර අපි හිටියෙ මෙහේ," යි යන ගමන් නොරිකො කීවාය.

"ඇයි ඉතින් මෙහෙන් ගියේ? මේක හොඳ පළාතක් නෙ වාසය කරන්න," යි මම ඇසුවෙමි.

නොරිකො සිනාසුනාය.

"අපේ ගෙවල් ඔක්කොම පිළිස්සුණා යුද්දෙ දි,"යි ඈ කෙටියෙන් පිළිතුරු දුන්නාය.

නොරිකොලාගේ වාසස්ථානයෙහි නුවූ ඔපයක් හා සරු සාර බවක් මොමොකො විසූ ගෙහි පෙනෙන්ට තිබුණි. ගෙයි ඉදිරිපස පිහිටි ලී තොරණේ දෙර පලුව පසෙකට තල්ලු කරත් ම සීනු හඬක් නැඟුණි. ඇතුලෙහි වූ අලුත් තතමි පැදුරු ද බඩු මුට්ටු ආදිය ද ගෙහිමියන් අග හිඟ කමක් නැති ව විසූ බව පළ කෙළේය.

කිම්කොගේ උණ බැස තිබුනු හෙයින් ඈ ස්වල්ප වේලාවක් එළියට විත් මා සමග කතා කළාය. ඈ තම ඇල්බම් පොත ගෙනැවිත් එහි මගේ අත්සන ලියන මෙන් ඉල්ලුවාය. මගේ සිතුවම් දකින්ට කැමතියි ඈ කීවාය. ජපානයට ආ පසු මා එකක් වත් අවසන් නොකල බව මම කීවෙමි. තමා කියවන නොයෙකුත් නවකතා ගැන ද බලන චිත්‍රපටි ගැන ද ඈ මා සමග කීවාය.

---

1. ඉංගිරිසියෙන් 'පයින්' යි කියන ගස් වර්ගය.

"දොවෙන්දෙරා සං, "තෝජුරෝගේ ආලය" කියන මුද්‍රා නැටුම දැකල තියෙනව ද?" යි කිමිකො ඇසුවාය.

නොරිකොගේ මුවින් සිනාවක් පහළ වූයේ කුමක් හෙයින් දැයි මට නො තේරිණි.

"මම දන්නව කිමිකො සං ඒකට කැමති මොකොද කියල," යි ඈ කීවාය.

කිමිකො ලජ්ජාවෙන් ඇඹරෙන්ට වූවාය.

"ඔබසං[1] බොරු දෙඩවන්න එපා," යි ඈ කීවාය.

"මං කියන්න ද දෙවෙන්දෙරා සංට?" යි කිමිකොට වද දීමට මෙන් නොරිකො පටන් ගත්තාය.

"තෝජුරෝගේ ආලය කියන කතාව දැන් තකරසුකා සාලාවෙ පෙන්වනව. ඒකෙ තෝජුරො හැටියට එන්නේ සොංජකු. සොංජකුට හරි කැමතියි කිමිකො. ඒක තමයි දැක්ක ද කියල ඇහුවෙ."

"මං දැක්ක තෙලෙවියෙන්[2] මං ගියේ නෑ තකරසුකා සාලාවට," යි කිමිකො කීවාය.

"ගෙනල්ල පෙන්නන්න දෙවෙන්දෙරා සංට, සොංජකුගේ පින්තූරෙ," යි නොරිකො කීවාය.

මොමොකො සුෂි සාද ගෙනැවිත් දුන්නාය. වරක් සොබා කෑ හෙයින් නැවත කිසිවක් කෑ නොහැකි බව මම කීවෙමි.

"විශේෂයෙන් ම හැදුවෙ දෙවෙන්දෙරා සංටයි. එකක් වත් කෑවෙ නැත්නම් අක්කගෙ හිත නරක් වේවි." යි නොරිකො කීවාය.

මම අමාරුවෙන් සුෂි පෙත්තක් කා තේ බීවෙමි. මහලු යුවල සාලයට විත් මට ආචාර කොට මා සමග ස්වල්ප වේලාවක් කතා කරමින් සිටියහ. ඔවුන් මගෙන් නොයෙක් ප්‍රශ්ණ ඇසූ නමුත්, ඔවුන් ව්‍යවහාර කළ බස මට වඩාත් තේරුණේ නැත. බොහෝ ප්‍රශ්නවලට නොරිකො මා වෙනුනේ උත්තර දුන්නාය.

යොත්සුයා සිට ෂිබුයා දක්වා නොරිකො සමග මම ගියෙමි. ඈ බොහෝ වේලා කිසි කතාවක් බහක් නැති ව බර කල්පනාවකින් මෙන් සිටියාය. අප දෙදෙනා එකට යන අන්තිම ගමන එය යි මට සිතුණි.

"මොකක් ද ඔය කිමිකො සං කියන නාට්‍යයේ කතාව?" යි කනස්සලු බව මග හැරවීම සඳහා මම ඇසුවෙමි.

"ඒක ගැන තමයි මාත් කල්පනා කර කර හිටියෙ," යි නොරිකො කීවාය.

"ඒක අපූරු කතාවක්. ඒත් කනගාටුයි. දෙවෙන්දෙරා සංට ඉඩක් ලැබුණොත් ජපානයෙන් යන්න ඉස්සර කවද හරි බලන්න. හොඳ ප්‍රසිද්ධ නාට්‍යයක්-කිකුචි කං කියන නාට්‍යකරුවෙකුගෙ."

---

1. නැන්ද හෝ පුංචි අම්මා.
2. තෙලෙවිෂන් යන්ත්‍රය.

WWW.EXPRESSLANKA.TK 57

"ජපන් කතාවල් ඔක්කොම එක වගේ කනගාටුයි, නේද?" යි මම ඇසීමි.

"මේක, තෝජුරෝ කියන ප්‍රසිද්ධ නළුවෙක් ගැන යි. එහෙම නළුවෙක් හිටියා, නුමුත් කතාව හැබෑද බොරුද කියල මම දන්නේ නෑ. දවසක් එයාට, අමුතු විදියක චරිතයක් නිරූපණය කරන්න සිද්ධවුණා, චිකමත්සුගෙ නාට්‍යයක. විවාහ වුණු ස්ත්‍රියකට ආලය කරන තරුණයෙකුගෙ චරිතයක්. ඒ වගේ අත්දැකීමක් එයාට නොතිබුණු නිසා, එයා කල්පනා කලා කොහොම ද කියල ඒ චරිතය නිරූපණය කරන්නෙ. ඊට සමාන අත්දැකීමක් කොහොම හරි ලබා ගැනීම අවශ්‍ය නිසා, එයා තමා දන්නා විවාහ වෙච්ච ස්ත්‍රියක් හොයා ගෙන ගිහිල්ල, බොරුවට ඈට ආලය පෑවා,ඇගේ හැසිරීම බලාල, ඒ අනුව තම රඟ පෑම සකස් කර ගන්න. ඒ ස්ත්‍රිය හැබවින් ම විශ්වාස කලා. තෝජුරෝ තමාට ආලය කරනවයි කියල. නාට්‍යය රඟ දක්වන දවසෙ, ඒ ස්ත්‍රිය, තෝජුරෝ සමග වචනයක් කතා කිරීම සඳහා, වේදිකාවේ පිටිපසින්, නාට්‍ය ශාලාවට පිවිසුණා. තෝජුරෝ තම නැටුම පුරුදු වුණේ බොරුවට ස්ත්‍රියකට ආලය කිරීමෙන් බව අනිත් නළුවන්ට ආරංචි වෙලා තිබුණා. මේ ස්ත්‍රියටත් ඒ ආරංචිය දැනගන්න ලැබුන අනිත් නළුවන්ගෙන්. ඇගේ හිත කොයි තරම් රිදුණා ද කිව්වොත්, ඈ එතන දී ම දිවි නසා ගත්ත."

ඒ පුදුම පුවත අසා මගේ සිතෙහි නොසන්සුන් ගතියක් හට ගැනුණි. මා ගැන ම සැකයක් මා තුළ ඇති විය. මා ද කරන්නේ අමුතු අත්දැකීමක් ලබා ගැනීමට තැතක් දැයි මම මගෙන් ම ප්‍රශ්න කර ගතිමි. මුල සිට ම මගේ ප්‍රාර්ථනාව වූයේ මා අවට වූ ජීවිතයේ පතුළට කිමිද එයින් ආස්වාදයක් ලබාගෙන චිත්‍ර ඇඳීම නොවේ ද? මෙය සැබෑවක් නම් මා කරන්නේ ඉතා ආත්මාර්ථකාමී ක්‍රියාවක් බව මට පෙනුණි. මා නොරිකොගෙන් වෙන් වීමට කර ගත් තීරණය මැනැවැයි මට වැටහුණි.

නොරිකොගේ සිත තුළ කෙබඳු අදහස් ක්‍රියා කරන්ට ඇත්දැයි මම නොදනිමි. ඈ ඒ පුවත ගැන නැවත නැවත සිහි කෙළේ තමා තුළ කිසියම් සැයක් උපන් නිසා ද?

කියෝතෝවට පිටත් ව යන දවසේ දවල් කාලයෙහි මම සංගෙංජයාවට ගියෙමි. එවේලෙහි ගෙදර සිටියේ නොරිකො සහ චියෙකො පමණි.

"බොහොම සන්තෝසයි ආවට," යි මා බැහැ දැකීමට ගෙපිළිට ආ චියෙකො කීවාය.

මා කැඳවාගෙන යන ලද්දේ එදා ගිය කාමරයට නොව, ඊට වඩා මඳක් ලොකු, එළිය ඇති පිරිසිදු කාමරයකට යයි මට හැඟුණි. එහි මැද පහත් වටකුරු මේසයක් ද බිම තබන ලද කුසිමක් ද විය.

"අද තාත්තගෙ කාමරය හැදුව දෙවෙන්දෙරා සංට," යි නොරිකො කීවාය.

ඒ ග්‍රීෂ්ම ඍතුව ආරම්භ වූ දවස් හෙයින්, ලංකාවටත් වඩා රස්නෙ යයි මට දැනුණි. මම ලොම් කබාය ගලවා පැදුරු පොළොව මත තැබුවෙමි. නොරිකො යමින් එමින්, කැවිලි පෙවිලි ආදිය ගෙනැවිත් මා ඉදිරියෙහි තබමින්, මා සමඟ වචනයක් දෙකක් දොඩමින්, ගෙදර දොර කටයුතුවල ව්‍යාපෘත වූවාය. එද නම් වෙන දවස්වලට සමාන විය. පැය ස්වල්පයකින් සියල්ල වෙනස් වන්නේ යයි මට සිතා ගත නොහැකි ය. ඒ සිතිවිල්ල මතු වීමට මම ඉඩක් නොදුන්නෙමි. ඒ මොහොතෙහි වූ සැනසුම මම තරයේ වැළඳ ගතිමි. නොරිකො මා ළඟ වාඩි වී කතා බහ නොකළ නමුදු, ඈ අවට සිටින බව මම දනිමි. ඇගේ කට හඬ ද අඩි ශබ්දය ද මට වරින් වර ඇසේ.

"දෙවෙන්දෙරා සං ට යුකතාවක්[1] දෙන්න ද අඳින්න? එතකොට ඔය කලිසමයි කබායයි ඉස්තිරික්ක කරවන්න පුළුවන්. හොඳට ම පොඩි වෙලා," යි නොරිකො කාමරයට විත් කීවාය.

"මම මේස් කුට්ටමක් ගන්න ඕන. මෙච්චරයි මට මේස් කුට්ටමක් තියෙන්නේ," යි මම සිනාසෙමින්, මගේ ඉරිච්ච මේස් කුට්ටම පෙන්නුවෙමි. සපත්තු එළියෙහි තබා ගෙට ඇතුළු වූ විට, මගේ මේස් කුට්ටමේ හිල් තිබෙන බව දැක මට ලැජ්ජා සිතුණි.

"නොරිකො සං ගිහිල්ල දෙවෙන්දෙරා සංට පෙන්වන්න අර සංගෙංජාවල සාප්පුව," යි චියෙකො කීවාය.

"මේ යුකතාවයි ගෙතා[2] කුට්ටමයි දගෙන යමු. නැත්නම් වෙලා නැති වේවි ඇඳුම් ඉස්තිරික්ක කරව ගන්න," යි කියමින් නොරිකො යුකතාවක් ගෙනැවිත් දුන්නාය.

"ඔය ඇඳුම් ඇඳගෙන ගියොත් මිනිස්සු පුදුම වෙලා බලාවි," යි මම කීවෙමි.

"ඒකට කමක් නෑ. අපි දෙන්න අලුු සැමි යුවලක් කියල හිතාවි," යි නොරිකො සිනාසෙමින් කීවාය. ඈ කෝලයක් නැති ව එසේ කතා කිරීම ගැන මම පුදුම වීමි.

සංගෙංජයාවෙහි දී විසිතුරු බඩු විකුණන වෙළඳ හලකට ගොස්, ඇටවලින් සාදන ලද, අඟලකට වඩා කුඩා වෙස් මුහුණක් මිල දී ගත්තෙමි. එය ඊර්ෂ්‍යාව හා පළිගැනීම මූර්ති කොට දක්වන , නළු මුහුණක පිළිරුවක් විය.

"මේක නැති කරන්නේ නැති ව පරෙස්සමින් තියා ගන්න. නොරිකොගෙ හිත කවදා නමුත් වෙනස් වුණොත් මට ආපහු දෙන්න ඕන," යි මම කීවෙමි.

"මොකො ද මේ තරම් බයානක මූණක් තෝරුවෙ?"

"මගේ යටි හිත එහෙම තමයි. ඊර්ෂ්‍යාවෙනුයි නපුරුකම්නුයි පිරිල."

1. ග්‍රීෂ්ම ඍතුවෙහි පිරිමි ද ගැහැනු ද අඳින, කිමොනො වර්ගයක්.
2. උස අඩි ඇති ලී සෙරෙප්පු.

WWW.EXPRESSLANKA.TK 59

"මගේ හිත එහෙම නෑ. මං අරන් දෙනව මේ සෞම්‍ය ගෑනු මූණ. මේක නැති වුණු දට මමත් ඉවර යි කියල හිතා ගන්න."

සංගෙංජයා සිට විදුලි රියෙහි හෝ බසයෙහි නැග, විනාඩි පහළොවකින් පමණ සීබුයා මං සන්දියට ගිය හැකිය. අවසන් වරට "ලා පූපේ" කෝපි හලට ගොස් ස්වල්ප වේලාවක් ගත කරමු දැයි මම යෝජනා කෙළෙමි.

"දැන් අයියත් ආපහු ඇවිල්ලඇති. පරක්කු වෙනව නේද එහේ මෙහේ ගියොත්?"

"එහෙනම් මේ අපේ අන්තිම ගමන ද?" යි මම ඇසීමි.

"නෑ මං එනව ඉස්ටේසමට. තාත්ත කිව්ව දෙවෙන්දෙරාසං ඇරලන්න යනවයි කියල. ඒ නිසා මටත් එතැහැකි."

නොරිකොගේ පියා මා ඇරලන්ට දුම්රිය පොළ දක්වා යන්ට සිතුවේ ඇයි? ඔහුට අපේ සිත් ඉවකින් මෙන් දැනුණේ ද? කෙසේ වෙතත්, මා යන සඳ, නොරිකො පියා සමග සිටිනු දැකීම මට මහත් සැනසුමකි. එවිට ඈ තනිකර දමා යන බවක් මට නොහැඟේ. තනි වන්නේ මා පමණ ය.

එද මගේ රෑ කෑම පිළියෙළ කිරීම නොරිකො බාර ගන්ට ඇතැයි මම සිතුවෙමි. අප සාප්පුවට ගොස් ආවායින් පසු, බොහෝ වේලාවක් මම ඇය නුදුටුවෙමි. ඒ අතරතුර චියොකො මා සිටි කාමරයට විත් මා සමග කතා කළාය. ඈ ඡායාරූප ඇල්බම් පොතක් ගෙනැවිත් තමා විවාහ වූ අවස්ථාවේ දී ගත් පින්තූර මට පෙන්නුවාය.

"මම හරි අකමැත්තෙන් මේ මඟුල් ඇඳුම ඇන්දෙ," යි ඈ කීවාය.

"ඇයි? මඟුල් කිමොනොව බොහොම හැඩ නේ?"

"හැඩ වුණාට මහ මෝඩ ඇඳුමක්. බටහිර පිළිවෙළට අඳින එක මීට වඩා හොඳයි. මේ හිස් වැසුමෙ අදහස මොකක් ද කියල දන්නවද?"

ජපන් මනමාලියගේ කිමොනොව කෙතරම් අලංකාර වුව ද ඇගේ හිත සරසන ආකාරය ඇඳුමට එතරම් නොගැළපෙන බව මට ද නොයෙක් වර සිතිණි. මනමාලිය ද ගේෂ ස්ත්‍රිය මෙන් උසට කොන්ඩය බැඳ කුරු ගසා හිස සැරසුවා නම් කෙතරම් දැකුම්කලු වේ දැයි මම කල්පනා කෙළෙමි.

"තේරුම දන්නෙ නෑ ඒ වුනත් හිස් වැසුම නම් වැඩිය ලස්සණ නෑ තමයි."

"ගෑනුන්ට ඊර්ෂ්‍යාව, ක්‍රෝධය ආදිය වැඩි ලු. ඒව අං වගේ ලු. විවාහ වෙන කොට ඒව යටපත් කරගන්න ඕන. ඒව වහගත් බව පෙන්නන්නයි මේ විදියට අඳින්නෙ. මෝඩ කල්පනාවක් නේද?" යි ඈ ඇසුවාය.

"ඒක නම් එහෙම තමයි."

"හිදෙජි සං නම් මට කිව්ව බටහිර විදියට අඳින්නෙයි කියල. ඒ වුණත් අම්මල තාත්තලා කැමති වුණේ නෑ."

කුඩා කල ගන්නා ලද නොරිකොගේ පින්තූර දෙකක් තුනක් ඈ මට පෙන්නුවාය.

WWW.EXPRESSLANKA.TK 60

"නොරිකො සං දැන් බඳින්න ඕන කාලෙ නෙ ? මගේ වයසයි," යි ඈ සිනාසෙමින් කීවාය.

කුමක් හෙයින් ඈ එසේ කීවා දැයි මම කල්පනා කෙළෙමි. ඒ මා දෙස එල්ල කරන ලද ඇනුම් පදයක් වී ද? නොරිකො හා මා අතර කිසියම් ඇල්මක් පැන නැගී එන්නේ නම්, එය වහා මැඩ පවත්වා ගත යුතු යයි අඟවන්ට ඈ එයින් අදහස් කළා ද? කෙතරම් දුෂ්කර වුව ද නොරිකො කෙරෙන් වෙන් වීමට මා කළ තීරණය මැනවැයි මට සිතිණ. වියොකොගේ වචනවලින් මගේ මනැස ඉදිරියෙහි නැවත මතු වූයේ නොරිකො හා මා අතර වූ පරතරය යි.

කෑම කා අවසන් වී, මා පිටත් වීටම මොහොතකට පෙර, මා සිටි කාමරයෙහි කිසිවෙකු නුවූ අවස්ථාවක් සොයා, නොරිකො විත් මට ආචාර කොට, තම කට හඬ පිටතට නෑසෙන සේ "සයෝනරා"[1]යි කීවාය.

"මට ලියනවද?" යි මම ඇසීමි.

"ඒක බොහොම අමාරුයි" යි ඈ පිළිතුරු දුන්නාය.

මම නිහඬ ව ඇය දෙස බලා ගත් වන ම සිටියෙමි.

"එහෙනම් නොරිකො ගැන කිසිම ආරංචියක් මට දැන ගන්න ලැබෙන්නෙ නැද්ද?"

"අයියට ලියන්න."

"නොරිකො සංට?"

"ඉදල හිටල ලියන්න ගෙදරටයි මිදෙරියටයි, මාරුවෙන් මාරුවට. මම එතින් අස් වුණොත් දන්වන්නම්."

හිදෙජි හා වියෙකො අප සමග බස් පළ තෙක් ඇවිත්, මට සුබ ගමන් පතා ආපසු ගියහ. බසයට නැග ගිය අප තිදෙනා අතර වැඩි කතාවක් බහක් නොවීය. වරක් කොරිකොගේ පියා කිසිවක් දිගට කියාගෙන ගියේය. මට එය පැහැදිලි ව නොතේරුණි. නොරිකො එය පහසු වචනින් මට තේරුම් කර දුන්නාය.

"තාත්ත කියනව, ආයෙමත් දෙවෙන්දෙරා සං තෝකියෝවට ආවොත්, අපේ ගෙයි වැඩිපුර කාමරයක් හදල දෙනවයි කියල දෙවෙන්දෙරා සංට ඉන්න."

දුම්රියේ නළාව හැඬූ කළ මම ඇතුල් වීමි.

"දෙවෙන්දෙරා සං ගියාම පාලුයි." යි නකජිමා සං කීවේය.

ඔහු නොරිකො වෙනුවෙන් කතා කළා සේ විය. මම හොඳින් ඔහු දෙස බැලුවෙමි. ඔහුට මා හමු වී ඇත්තේ දෙවතාවක් පමණක් බව මට සිහි විය. නොරිකොගෙන් මා මුළුමනින් ම වෙන් වූ බව මට වැටහී ගියේ ඇගෙ මුහුණ අවසාන වරට නොපෙනී ගිය කල ය. එවැනි කාංසියක් මට ඊට පෙර කිසි වතාවක් දැනී නැත.

1. 'ආයුබෝවන්' යනු යි. වෙන් වී යන විට කරන ආචාරයක්.

7

කියෝතෝවෙහි මා අවුරුද්දක් සිටිය නමුත්, එහි වාසය මට හුරු නොවීය. පුරාතන ජපානය පිළිබඳ හැඟීමක් තවමත් එහි ශේෂ වී තිබෙන බව ඇත්තක් වන්ට පුළුවන. එහෙත් තෝකියෝවෙහි තරම් විවිධත්වයක් එහි දක්නට නැත. තෝකියෝවෙහි වර්තමාන ජපානය මෙන් පුරාතන ජපානය ද එකට එක ගැටී පවතී. අහසෙහි පියාසර කරන විශාල සියොතුන්ගේ හැඩය ගත් උස පන්සල් තෝකියෝවෙහි එතරම් දක්නට නොලැබේ. කියෝතොහි මෙන් තොකියෝවෙහි හැරෙන හැරෙන අත මයිකො[1] තරුණියො ගේෂාවෝ ද නොපෙනෙති. එහෙත් කියෝතො හා අවට පෙදෙස්වල, ආදි ජපන් ශිෂ්ටාචාරයෙන් සාමාන්‍ය ජීවිතය තුළට පිවිසී ඇත්තේ ඉතා ස්වල්පයක් යයි මට සිතේ. කියෝතො කෞතුක වස්තුවලින් පිරී තිබේ. එහෙත් එය පවතින්නේ හුදු කෞතුක වස්තු වශයෙන් යයි මට හැඟුණි.

---

1. ගේෂා ස්ත්‍රීන්වීමට, ආචාර විධි, කලා ශිල්ප ආදිය අභ්‍යාස කරන තරුණියෝ

WWW.EXPRESSLANKA.TK

මේ හැඟීම වැරදි විය හැකිය. එහෙත් මට දැනුණේ එසේ ය. මා "එදෙක්කො"[1] කෙනෙකු බවට පත් වූ නිසා ද මට එසේ දැනුණේ? මට කන්සධි[2] සුෂි ප්‍රිය නැත. ඒවා පැණි රහ වැඩිය. තොකියෝ වාසීන්ගේ ඇති විනීත ශිෂ්ට විලාසය කියෝතො වැසියන්ගේ නැතැයි මට සිතිණි. කියෝතො ස්ත්‍රීන්ගේ එතරම් ලාලිත්‍යයක් හා සියුමැලි බවක් නොපෙනේ. බොජුන් හල් හා වෙළඳ හල්වල වැඩ කරන සේවිකාවෝ එතරම් සිත් නොගනිති.

මා විසූ පන්සල පිරිසිඳු විවේකී තැනක් විය. එහි ප්‍රධාන පූජකයා, වැඩි කතාවක් බහක් නැති තැන්පත් කෙනෙක් විය. ඔහු නිතර ම තම ත්සුකුළු මේසය[3] ගාව වාඩි වී කිසියම් වැඩක යෙදී සිටියේය. ඔහුගේ භාර්යාව ඔහුට හාත්පසින් වෙනස් වූ ගති පැවතුම් ඇත්තියක් වූවාය. ඈ නිතර ලොකු හඬින් දෙඩමින්, කඩිසර ලෙස ඔබ මොබ ඇවිදිමින්, ගෙදර දොර වැඩ පළ කළාය. ඔවුන්ට ඉතා සුරතල් ළමයි දෙදෙනෙක් වූහ.

පන්සලේ තවත් පූජකයෙක් ද කියොතො විශ්ව විද්‍යාලයකට යන ශිෂ්‍යයෝ තිදෙනෙක් ද වූහ. ඒ පූජකයා සෑම ද ම සවස ශිෂ්‍යයන් තිදෙනා සමග සකෙ බොයි. ඔහු බැහැර ගියහොත් නිතර ම ආපසු පැමිණෙන්නේ සකෙ බෝතලයක් ද ප්‍රධාන පූජකයාගේ ළමයින් තිදෙනා සඳහා සෙල්ලම් බඩු හා අවුලුපත් ද රැගෙන ය. ඔහු මට ද සකෙ බීමට නොයෙක් වර ආරාධනා කෙළේය. එහෙත් මා ගෙයි නොසිට ඇවිදින්ට යන හෙයින්, මා ඔවුන්ට එකතු වූයේ කලාතුරකිනි. ඉඳහිට ඕකුසං[4] ද අපේ සමාගමට වැටී, අප සකෙ බොන අතර නොයෙකුත් විදියේ අතුරුපස සාද ගෙනැවිත් දෙයි. එවැනි අවස්ථාවලදී ඈ ද සකෙ ස්වල්පයක් බී, සෙස්සන් සමග ගී ගයමින් විනෝද වේ. සුරාවෙන් මත් වූ විට ඔවුහු විවිධ ක්‍රීඩා පවත්වති. එක් දිනයක් සියලු දෙනා ම එකතු වී, නෝ නැටුමක් අනුකරණය කළහ. යමමොතො ෂෝබුන් යන නමැති ශිෂ්‍යයා නෝ නැටුමේ ගායක පිරිස ආරූඪ කර ගන්නා කෘත්‍රිම ස්වරය ඉතා දක්ෂ ලෙස අනුකරණය කරමින්, නාට්‍යයේ පෙළ ගැයීය.

මෙබඳු විනෝදවලින් මා සතුටක් ලැබුවේ තාවකාලික වශයෙනි. සකෙ බිවු කල මගේ සිත මඳක් සැහැල්ලු වේ. ඉන්ද්‍රියන්ට අරමුණු වන රූක්ෂ ලොව, එවිට ස්වල්පයක් වුව ද මීදුම් පටලයකින් මෙන් වැසී ගොස් රළු බවෙන් තොර වේ. හඳපානෙහි ඇත පෙනෙන කඳු හෙල් මෙන්, මගේ ඇසට ගොදුරු වන්නේ මෘදු රේඛාවල් පමණි. මලානික වූ ඉන්ද්‍රියන්ට නිදහසේ ක්‍රියා කරන්ට ඉඩ දී මම මගේ මනසට පිවිසෙමි.

මා වඩා කැමති වූයේ තනියම ගොස් මා නාඳුනන මිනිසුන් අතර වාඩි වී තෝප්පු[5] හෝ යකිතොරි[6] නැතහොත් සෂිමි[7] කමින් සවස ගත

1. පරම්පරා දෙකක් තුනක් ම තෝකියෝ නගරයෙහි විසූ අයට කියන නමකි.
2. දකුණු ජපානය.
3. පහත් ලියන මේසය.
4. කෙනෙකුගේ භාර්යාව හඳුනන වචනය.
5. මැකරල් ඇට පිටියෙන් සාදන ලද, දීකිරිවලට සමාන කෑමක්.
6. කෝටුවල ගසා බදින ලද කුකුල් මස්.
7. අමුවෙන් සාදන ලද මාළු.

WWW.EXPRESSLANKA.TK 63

කිරීමට ය. එසේ කරන විට, මගේ හුදකලා සිතිවිලිවලින් ම වෙළී මට පැයක් හමාරක් සිටි හැකිය. මම කල්පනාව මෙහෙයා තෝකියෝවට යළිත් යම්-එනම් නොරිකොගේ තොකියෝවට .ඉඳහිට මගේ සිතිවිලිවලට බාධා කරමින් කෙනෙක් ප්‍රශ්න අසයි. සංවාදය හුරු පුරුදු ප්‍රශ්නොත්තර මාලාවකට පෙරළේ.

"ඉන්දියාවෙන් ද?"

"නෑ, සෙයිලෝන්වලින්."

"ආ සෙයිලොන් ? කෝච්චා තියෙන රට."

"ඔව්, ඔව්, කෝච්චාවලට කැමතිද?"

හරි කැමතියි. ජපනායට ඇවිත් හුඟක් කල් ද?"

"අවුරුද්දක් විතර ඇත."

"බොහොම හොඳට බාසාව පුළුවන්."

ඔහු මා සමග තවත් කතා බහ කරන්ට කැමතිය. එහෙත් මම එහුට අනුබල නොදෙමි. තම නමගම ලියා තිබෙන කාඩ් පතක් සාක්කුවෙන් ගෙන ඔහු මට දෙයි. මම එය සාක්කුවෙහි දමා ගනිමි. මගේ සාක්කු එවැනි කාඩ්වලින් පිරිලා ය. ඒවා සියල්ලක් ම ලියා තිබෙන්නේ ජපන් අකුරුවලිනි. මට එකක් වත් කියවිය නොහැකි ය. ඇතැම් කෙනෙක් පැන ගෙන, තම නම ගම නැවත වරක් රෝම අකුරෙන් කාඩ් පතෙහි ලියයි.

මා කියෝතොවට පැමිණි පසු කිසි ම සිතුවමක් ඇන්දේ නැත. මගේ තෙලි කූරු හා කපන ආයුධ සියල්ල පෙට්ටියෙහි අඩුක්කු කල සැටියට ම එහි තිබේ. ජීවිකාව සඳහා අවශ්‍ය වූ ඉංග්‍රිරිසි ඉගැන්වීම පමණ ය මා කෙළේ. මාගේ දවල් කාලය ඒ කටයුතුවලින් ගෙවී ගියේය. සෑහෙන තරම් ශිෂ්‍යයෝ මගෙන් ඉගෙනීමට සඳහා ආහ. මට මසකට යෙං පහළොස් දහක්[1] පමණ ලැබිණි. කාමරයට ගෙවූයේ යෙං දෙදහක් නිසා, මට මුදල් අතින් හිඟ පාඩුවක් නොවීය.

මගෙන් ඉංගිරිසි ඉගෙන ගැනීමට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් පමණක් නොව කාර්යාලවල වැඩ කරන අය ද පැමිණියහ. සියලු පාසැලක ම ඉංගිරිසි උගන්වනු ලබන හෙයින් ඔවුහු භාෂාව දැනගෙන සිටියහ. එහෙත් ඔවුන්ට කතා කළ නොහැකි ය. උච්චාරණය අතින් ද ඔවුහු දුර්වල වූහ. එහෙයින් ඔවුන් මා වෙතට ආවේ වැඩිපුර ම ඉංගිරිසි කතාව පුරුදු වීම සඳහා ය.

නොරිකොගෙන් මට ලියුමක් ලැබුණේ මසකට පමණ පසුවය.

"ඔබ පිටත් ව ගිය වේලේ කිසියම් තද දෙයක් මගේ පපුවට ඇතුල් වී එය හිර කරගෙන සිටින්නා සේ මට දැනුණා. තාත්තා නිතර ම ඔබ ගැන කතා කරනවා. කොහේ ගියත් මට සිහි වෙන්නේ ඔබමයි. දැන් මුළු තෝකියෝ ම ඔබ සම්බන්ධයෙන් හට ගන්නා සිහිවීම්වලින් වෙලිලා. මම

1. රුපියල් දෙසීයයි.

WWW.EXPRESSLANKA.TK

අවන් හලින් අස් වුනා. මුල පටන් එහි වැඩට කැමති ව සිටියෙ නෑ. මම ඊ වනතුරු අවන් හලේ වැඩ කරනවාට තාත්තා කැමතිනෑ. මම කාර්යාලයක වැඩක් සොයනවා. ඉදහිට මිස ලියුම් එවන්නට එපා. ඒත් මාව අමතක කරන්ට එපා"

මම සතියකට දෙවරක් නොරිකොට ලියුමක් ලීවෙමි. එහෙත්, වැඩිය ලියුම් එවන්ට එපා යි ඈ කී හෙයින්, ඒ ලියුම් එකතු -කොට. සති දෙකකට තුනකට වරක් තැපැල් කෙළෙමි. නොරිකොට ලියුම් ලිවීමෙන්, ඇය සමඟ කතා කරන කල මා ලැබූ ප්‍රීතිය නැවත ලදිමි. මා බැහැර ගිය විට ආපසු එන්නේ ඇගෙන් ලියුමක් ඇවිත් ඇද්දැයි බලා ගෙන ය. එහෙත් ඇගේ ලියුම් විරල විය.

"දෙවෙන්දෙරා සංට ඉතා හොඳ ආරංචියක් කියන්ටයි මේ ලියුම ලියන්නේ. මට කාර්යාලයක වැඩක් ලැබුණා. දැන් සතියක් විතර වෙනවා. මට තාම වැඩ හුරු මදි. ඒත් හැම දෙනා ම මට කරුණාවයි. මට උදවු කරනවා. සමහර දවස්වලට වැඩ කරමින් සිටින අතර, මට දෙවෙන්දෙරාසං සිහි වෙනවා. එවිට, කිසි වැඩක් නොකර මම ලබාගෙන සිටිනවා. මොකද නොරිකො සං, නාකි ගෑනියෙකුගෙ විලාසයක් දමා ගෙන බර කල්පනාවක යෙදිලා ඉන්නේ?" යි කාර්යාලයේ අය මට විහිළු කරනවා.

"මේ කාර්යාලයේ වැඩ කරන යුරෝපීය ජාතිකයෙක් නිතර තමාගේ ප්‍රියාවට ටෙලිපෝන් කරනවා. ඔහු ඇයට ආමන්ත්‍රණය කරන හඬින්, ඔබ මට "නොරිකො" යි කතා කරන හඬ සිහි වෙනවා.

"කරුණාකරල අයියට ලියුමක් ලියන්න. මට ලියනවා නම්, මාරුවෙන් මාරුවට කාර්යාලයටයි, ගෙදරටයි දමන්න."

කල් යාමේදී මගේ සිතේ තැවුල නිවී යාවි යයි මම සිතුවෙමි. එහෙත් සිදු වූයේ ඊට ඉදුරාම වෙනස් දෙයකි. දවසින් දවස මගේ සිතෙහි වූ සාංකාව වැඩි විය. පෙරටත් වඩා මම නොරිකොගේ සමාගම පැතුවෙමි. ඇය අමතක කර දැමීම නොහැකි බව මට එන්ට එන්ට ම පෙනෙන්ට විය. කොයි වෙලාවක වත් මගේ සිතෙහි සන්සුන් බවක් නොවීය.

ආලය යි කියන්නේ කායික වුවමනාවක් පිරිමසා ගන්නා තුරු සිතෙහි හට ගන්නා ආසාව නොවේ ද? එසේ නම් විශේෂ ස්ත්‍රියක් පැතීමෙක් වැඩක් නැත. කායික ආස්වාදය කවර ස්ත්‍රියකගෙන් වුවද ලබා ගත හැකි ය. මා නොරිකො පමණක් පැතුවේ, ඇය තරම් හොඳින් වෙන කිසි ම ස්ත්‍රියක ඇසුරු කිරීමට මට ඉඩක් නොලැබුණු නිසා වන්ට ඇත. හෘදයෙහි ඇවිලුණු රාග ගින්නෙන් හටගත් දුම් පටලින් මගේ දෑස් දැන් වැසී තිබේ. රාගය සංසිඳවුවහොත් මගේ දෑසට ප්‍රකෘති පෙනුම නැවත ලැබේ. මගේ ලෝකය දැන් පිරී තිබෙන්නේ නොරිකොගෙන් ය. එහෙත් එය, මා මවා ගත්, පටු කල්පනා ලොවකි. සැබෑ ලොව ඊට වඩා කෙතරම් පළල්ද? එහි වෙන ස්ත්‍රීහු

WWW.EXPRESSLANKA.TK 65

නොසිටිත් ද? මේ රටේ ස්ත්‍රීහු කෙතරම් දැකුම්කලු වෙත් ද? ඔවුහු කෙතරම් සිවුමැලි ද? මෙහි අබිසරු ලියො, පුරාතන නගර ශෝභිනීන් මෙන් අභිරූප වෙති. ඔවුහු මුදු මොළොක් වදන් තෙපලති.

මම රාගයේ මාර්ගයෙන් රාගයෙන් මිදෙන්ට මාන බැලීමි. රාගයෙන් මිදීමට එක් මගක් නම්, ඊට බුරුලක් නොපෙන්වා, ඉඳුරන් දමනය කිරීමය. අනික් මග නම්, රාගයට ඉඩ දී ඉඳුරන් පිනවීම ය. අධික රාගයෙහි ගැලී මෙන්, තෘෂ්ණාවේ වේගය සංසිඳෙයි. එසේ වූ කල උපේක්ෂාවෙන් යුතු ව ලොව දෙස බැලිය හැකිය. එවිට සෑම දෙයක ම සෑම කෙනෙකුගේ ම යථා ස්වරූපය පෙනේ.

සකෙ ස්වල්පයක් බී, කුසුම් පුරයෙයි[1] හැසිරෙන විට,විදී දෙපසෙහි පිහිටි ගෙවල කවුළුවලින් දිස් වන ගණිකාවෝ, කඩවසම් හැඩ රුවින් යුත් අඟනන් සේ පෙනෙති. ඇතැම්හු මා දැක කෝල වෙති. ඇතම්හු මා කෙරෙහි කුහුලක් දක්වති. ඔවුහු අමුත්තන් සමග මුදල් ගනුදෙනුවලට ඇතුළත් නොවෙති. ගෘහපතිනිය සමග එබඳු කටයුතු අවසන් වූ විට, ඔවුන් අමුත්තන් පිළිගන්නේ. සාක්කුවෙහි තිබෙන අවුලුපතක් ගෙන, එකියකට පිරිනැමූ විට, ඈ සතුටින් ඉල්පෙයි. එහෙත් කාසි තෑගි ගැනීමට ඔවුහු මැලි වෙති. හුදු ගනුදෙනුවල ආකාරය ගත් මෙවැනි සම්බන්ධකම් වලට මිතුරු ලීලාවක් ආරූඪ කිරීම සඳහා මම ඉඳහිට බීර ගෙන්වා ගෙන ඔවුන් සමග බොමි. මා නිතර ම ආපසු මගේ නිවසට යන්නේ සතුටකින් වත් කලකිරීමකින් වත් නො ව, ව්‍යර්ථ වූ ව්‍යායාමයකින් කාලය ගෙවූ කෙනෙකු සේ ය.

මට මමෙවාකා මුන ගැසුණේ මේ දවස්වලය. ඈ කුසුම් පුරයෙහිවිසූ ස්ත්‍රියක් නුවූවා ය. තමා ගේෂාවක් බව ඈ ඇඟ වූ නමුත් ඈ නියම ගේෂාවක් නුවූ බව මම දත්තෙමි. හොක්කයිදෙවට ගොස්, අයිනු[2] භාෂාව පිළිබඳ පර්යේෂණ පවත්වා, පසුව කියෝතො විශ්ව විද්‍යාලයෙහි උගන්වමින් සිටි ඕස්ත්‍රියානු ආචාර්යවරයෙක්, ගේෂා ගෘහයක් යයි තමා හැඳින් වූ තැනක නම ගම හා ටෙලිපෝන් නොම්මරය ද ඉංගිරිසියෙන් මුද්‍රණය කර තිබුණ කාඩ් පතක් මට දුන්නේය. කාඩ් පතෙහි අනිත් පැත්තෙහි, ඒ ගෙට යනආකාරය සටහන් කර තිබුණු සිතුවමක් විය. එය විදේශික භටයන් හෝ සංචාරකයන් සඳහා තන ලද ගණිකා නිවාසයක් වන්ට ඇතැයි මම සිතුවෙමි. නොයෙක් වාරයක් මම ටෙලිපෝන් පෙට්ටියක් ගාවින් ඔබ මොබ ඇවිද, අවසානයෙහි සිතට ධෛර්ය ගෙන, කාඩ් පතෙහි වූ නොම්මරය කරකැවීමි. මැදි වියෙහි ස්ත්‍රියකගේ කට හඬ මට ඇසිණි. මා ඉංගිරිසියෙන් කතා කළවිට ඈ ද ඉංගිරිසියෙන් ම පිළිතුරු දුන්නාය. වේලාවක් නියම කරගෙන, මම තක්සියක නැඟී රියදුරාට කාඩ්පත පෙන්වූයෙමි. ඔහු දෙතුන්

1. ගණිකා නිවාස පිහිටි පෙදෙස් සඳහන්කිරීමට යොදන වචනයකි.
2. උතුරු පෙදෙසෙහි වෙසෙන ආදි මනුෂ්‍ය වර්ගයක්. ඔවුන් කතා කරන්නේ වෙන බසකි. සිරිත් විරිත් ද වෙනස් ය.

වරක් මං සන්දිවල තක්සිය නතර කර වීදි එළියෙන් කාඩ්පත මැනවින්, පරීක්ෂා කොට, අවසානයෙහි ගොස්, පහනකින් යුත් තොරණයක් ඉදිරියෙහි රථය නැවැත්වූයේය. මා තක්සියෙන් බසිත් ම සේවිකාවක් මා පිළිගන්ට ආවාය. කුඩා වත්තක පිහිටි ගෘහයක් වෙතට ඈ මා කැඳවා ගෙන ගොස්, මාගේ පා වහන් උනා පසෙකින් තබා, ඔප් නගන ලද ලෑලි පොළොවෙන් යුත් මගක් ඔස්සේ මා ගෙන ගොස්, කඩදාසි දෙරපලුවක් තල්ලු කර, මට ඇතුල් වන්ට කීවාය. එය අලුත් තතමි පැදුරු බිම ලා සාදස ලද කුඩා කාමරයක් විය. එක් බිත්තියක එල්ලන ලද සිතුවමක් ද අනිත් පස බිත්තියෙහි ඇතුළට කපන ලද කවුළු පඩියෙහි මල් බඳුනක් ද මැද පහත් වට කුරු මේසයක් ද විය. බිම වාඩි වීමට හතරැස් කොට්ට කීපයක් ද තිබුණි. මුළු පරිසරයම පිරිසිදු, ළගන්නා පෙනුමක් දැරිය. ස්වල්ප වේලාවකින් සේවිකාව නැවතපැමිණ, ජපන් තේ දෙකක් ගෙනැවිත් මේසය මත තැබුවාය. අනතුරුව වැඩිමාල් ස්ත්‍රියක් පැමිණ මට ආචාර කර. මා සමග පිළිසඳර දෙඩුවාය.

"මෙහාට එන ගේෂාවො පිට රට අයට ටිකක් ලැජ්ජයි. මම ඔබට හොඳ යෙහෙළියක් හඳුන්වලා දෙන්නම්. එයාට සුළු තෑග්ගක් දෙන්න.," යි ඈ කීවාය.

ඉක්බිති ව, රතු කිමොනොවකින් හා කහ පාට ඕබි පටියකින් සැරසීගෙන, සිනා මුහුණකින් යුතු ව, සුකෝමල ඉරියව්වකින් කාමරයේ දෙර පසකට තල්ලු කර ඇතුල් වී පසඟ පිහිටුවා මට ආචාර කළ අබිසරු ලිය, ඇත්තෙන් ම රුවැති තරුණියක් විය.එහෙත් ඈ ගේෂාවක් නොව න බව මට එක වරට ම පසක් විය. ඈ තම කොන්ඩය කොටට කපා සිටියාය. ගේෂාවක මෙන් ඇගේ මුහුණ වත්සුණු වලින් තවරා තිබුණේ නැත.

"මේ මමෙවාකා, මේ දෙවෙන්දෙරා සං." කියා ගෘහපතිනිය අප හඳුන්වා දුන්නාය.

මමෙවාකා තරමක් දුරට ඉංගිරිසි කතා කළාය. ඈ විදේශිකයන් සමග නිතර ආශ්‍රය කරන ස්ත්‍රියක් විය යුතු යයි මම සිතුවෙමි. මෙහි එන ස්ත්‍රීන් විදේශිකයන්ට ලැජ්ජායි ගෘහපතිනිය කීවේ බොරුවක් නොවේ ද? ඇය ඔවුන් ගේෂාවන් යි හැඳින්වූයේ ජපානය ගැන කරුණු මැනවින් නොදත් විදේශිකයන් රැවටීමට වන්ට ඇතැයි මම සැක කෙළෙමි. කෙසේ වෙතත්, මමෙවාකා, ප්‍රිය සල්ලාප දෙඩීමෙහි හුරු බුහුටි, නොමනා ලෙස එඩිතර නුවූ, මඳ ලජ්ජා බයක් ද දැක්වූ ස්ත්‍රියක් වූවාය. ඈ දක්ෂ ලෙස ආලයේ ව්‍යාජයක් මවා පෑවාය. ඈ මඳ එළියෙන් යුත් වෙන ම කාමරයකට මා ගෙන ගියාය. මා සකෙ බොන්ට සතුටු දැයි අසා ඈ සේවිකාවකට හඬ ගෑසුවාය.

"මං බොන්නේ කෝපි," යි ඈ කීවාය.

ඈ සැහැල්ලු කිමොනොවක් ගෙනැවිත් මට අඳින්ට දුන්නාය. කුඩා පහන් කුඩුවලින් එළි කරන ලද, කළු ගල් කැටවලින් ද සුදු බොරලු වලින්ද

සැදූ මගක් ඔස්සේ, ගෙයින් පිට පිහිටි නාන කාමරයට මා ගෙන ගොස්, මට නෑමට උණු වතුර සකස් කොට දුන්නාය. ඇතැම් දවසක ඈ රේඩියෝවක් ගෙනැවිත්, අපේ කාමරයේ මෘදු සංගීතයෙන් පිරෙව්වාය.

මා පිටත් ව යන්ට සැරසෙන විට, මා නැවත එනතුරු තමා බලා සිටින බව ඈ කීවාය. තමාගේ සැබෑ නම යෝකො කොයිකො බව කියා, ඈ තම ඡායාරූපයක් ගෙනැවිත් මට දුන්නාය.

"අනිත් දවසෙ එන කොට, ඉස්සෙල්ලා මට ටෙලිෆෝන් කරන්න, මේ නොම්මරයට," යි කියා වෙන ම නොම්මරයක් මුද්‍රණය කර තිබුණු කාඩ් පතක් ඈ මට දුන්නාය.

"ඇයි, වෙන කොහේවත් ද ඉන්නෙ?" යි කරුණු පැහැදිලි ව තේරුම් ගත නොහැකි වූ මම ඇසීමි.

"ඔව්, අපි ඉන්නේ වෙන ම තැනක. මෙහාට හම්බ වෙන්න එනව විතරයි," යි ඈ කිව්වාය.

කිසියම් කටයුත්තක් සඳහා තමාට මුදල් වුවමනා බව කියා ඈ ඉඳහිට ඉඟියක් පායි. දිනක්, කරනැම් හලකට ගොස් තම හිස ගෙස් සරසවා ගත යුතු බව ඈ කීවාය. දිනක්, තම මව අසනීපයෙන් සිටින නිසා, නගසකිවලට ගොස් ඒමට සිදු වී තිබෙන බව ඈ සඳහන් කළාය. එවැනි වුවමනාවල් ගැන මා සමග කීම, ඇගේ ඇහැලි බවේ ලකුණක් යයි මම සිතුවෙමි. එහෙත් මා ඈට තෑග්ගත් දුන් විට, ඈ කෘතඥ ලීලාවකින් එය පිළිගත්තාය.

මා ඇයට කිසිවක් තෑගි කෙළේ සිය කැමැත්තෙන් වුව ද, පසු ව මම ඇය කෙරෙහි අල්ප මාත්‍රයක් උරණ වීමි. ඈ මට සැබවින් ඇහැලි නම්, ඇයි ඈ නොයෙක් වර එවැනි ඉඟි පා මගෙන් මුදල් ගන්නේ? මම ඇයගෙන් තොර වන්ට තැත් කෙළෙමි. එම ගෘහයෙහි දී ම මට වෙන එකියක් හමු විය හැකි ය. නිතර මමෙවාකා හමු වන්ට යාමෙන් මගේ වියදම් වැඩි වේ. ඈ ට වඩා කරුණාවන්ත තරුණියන් එහි ම සිටින්ට පුළුවන. මම සිරිත් පරිදි ඈට ම කෙලින් ටෙලිෆෝන් නොකර, පළමුවෙන් ටෙලිෆෝන් කළ ගෘහ පතිනියට කතා කෙළෙමි.

"මම අද එනව. මට කවුරු හරි හඳුන්වලා දෙන්න." යි මම කීවෙමි.

"කවුද කතා කරන්නේ? දෙවෙන්දෙරා සං නේද?" යි ඈ ඇසීය. මම පුදුම වීමි.

"මම අඳුනා ගත්තා ඔබේ කටහඬ," යි ඈ සිනාසෙමින් කීවාය. "බේ යෙහෙළිය මමෙවාකා සං නේද? ඈ ඉන්නවා බලාගෙන ඔබ එන කල්."

එදා මා ගිය විට, මමෙවාකා, ගෘහ පතිනිය සමග දෙඩමින් මා එන තුරු ගෙපිළෙහි බලාගෙන සිටියාය. ඈ මා කාමරයට කැඳවාගෙන ගොස්, කිසිවක් නොකියා, කනස්සලු විලාසයකින් මඳ වේලාවක් වාඩි වී සිටියාය.

"මම දැන් දේවාලයට ගිහිල්ලයි එන්නේ. මම දෙයියන්ට කිව්ව මගේ කරදර ගැන"

WWW.EXPRESSLANKA.TK 68

"ඇයි? මොනවද අමුතු කරදර?"

"දෙවෙන්දෙරා සං‍ට මාව ඕන නෑ කිව්ව හන්ද"

මා ඇගේ කීම විශ්වාස කෙළේ නැත. එහෙත් මට ඇය කෙරෙහි අනුකම්පාවක් ඇති විය. ඈ මට කවර වරදක් කළා ද? මා ඈට තෑගි දුන්නේ මගේම කැමැත්තෙන් ය. ඇගෙන් කිසිදු බලපෑමක් නොවීය. ඈ සියල්ල ම ගෘහ පතිනිය සමග කියන්ට ඇත.මා වෙන කෙනෙකු හමුවන්ට තැත් කිරීම ගැන මට ලජ්ජා සිතුණි. එබඳු කටයුතුවල දී වුව ද තිර ගුණයක් දැක්විය යුතුය.

"නෑ මම එහෙම ම කිව්වෙ නෑ." යි මම කීවෙමි. "මම හිතුව මමෙවාකා සං අද නැතුව ඇතැයි කියල. මම දවසක් ටෙලිපෝන් කරන කොට හිටියෙ නෑ.

"උදේ වරුවෙ කොයි වෙලාවට කතා කළත් මං ඉන්නවා. මීට පස්සේ නොවරදවා ම මට කතා කරන්න ඕන, " යි ඈ කීවාය.

එහෙත් ඈ මැවූ මායා දැල ටික ටික ඉරී ගියේ ය. මම ඊට ඇහිල්ලෙන් ඇන ඕනෑකමින් සිදුරු කෙළෙමි. ඈ බලන්ට යාමෙන් කවර සෙතක් දැයි මම සිතන්ට වීමි. මට වඩ වඩා සිහි වූයේ නොරිකො ය. මම නිතැතින් මමෙවාකා නොරිකො සමග සසඳා බැලීමි. මමෙවාකාගේ පිටත්තරය මොළොක් ය. එහෙත් අභ්‍යන්තරයෙහි ඈ දැඩිය. නොරිකො හාත්පසින් වෙනස් ය. පිටත්තරයෙහි ඇගේ නොනැමෙන ගතියක් ඇත. එහෙත් ඇගේ අභ්‍යන්තරය මෘදු ය.

දෙසතියකට පමණ පසු මම මමෙවාකා ට තෑග්ගක් යවන්ට සිතුවෙමි. එසේ කිරීමට සිතුවේ, ඈට අවසාන සැලකිල්ලක් වශයෙනි. එතැන් සිට ඇගෙන් මුළුමනින් ම තුරන් වීමට මම ඉටා ගතිමි. මම සාප්පුවකට ගොස්, ස්ත්‍රීන් පාවිච්චි කරන විදියේ කුඩා සිගරැට් කොපුවක් තේරුවෙමි. එය වඩා මිල නුවූව ද හැඩ රුවින් යුතු විය. එය ඇයට තැපැල් කර යවන මෙන් මම වෙළඳ හල්සේවකයාට කීවෙමි. මා මමෙවාකාගේ ලිපිනය ඔහුට දුන්නේ මදක් ලජ්ජාවෙනි. ඔහු කුමක් සිතා දැයි මම නොදනිමි. ඔහු ඒ ලිපිනය සටහන් කර ගන්නා විට, ඔහුගේ මුහුණෙහි සිනාවක සේයාවක් තිබිණි ද? ඇතැම් විට මමෙවාකා වෙසෙන්නේ කවුරුත් දන්නා කොට්ඨාසයක විට හැකිය. ඔහු මගේ නම ගම ද සටහන් කර ගත්තේය. මා කාගෙ කවුද කියා අනාවරණය කරන්ට සිදු වන බවක් මම නොසිතුවෙමි.

"යම් විදියකින් මේක, යවන තැනැත්තාට හම්බ නුණොත්, අපි ඔබට දන්වන්න එපාය?" යි ඔහු කීවේය.

මුදල් ගෙවා යන අතර,මම මදක් දුර දී, ආපසු හැරී, සිගරැට් කොපු විකුණන කවුන්ටරය දෙස බැලීමි. මගේ නම ගම ලියාගත් වෙළෙන්ද ද තවත් සේවක සේවිකාවෝද කිසියම් කසු කුසුවක යෙදී සිනාසෙමින් සිටියහ. ඔවුන් දෙඩුවේ මා ගැන වන්ට ඇතැයි මම සිතුවෙමි.

WWW.EXPRESSLANKA.TK 69

දෙතුන් දවසකට පසු මමෙවාකාගේන් මට ලියුමක් ලැබිණ. ඈ මගේ ලිපිනය දැන ගන්ට ඇත්තේ පාර්සලයෙහි සඳහන් වී තිබුණු නිසා යි මම සිතුවෙමි. ලියුම ඉංගිරිසියෙන් ලියා තිබුණි.

"ඔබ එවූ තෑග්ග ලැබී බොහොම සන්තෝස වුණා. මම නැති නොකර පාවිච්චි කරනවා. මම බොහෝ දවස් බලාගෙන සිටියා ඔබ එන තුරු. ඉක්මනින් නැවත මුණ ගැසෙන්ට බලාපොරොත්තු වෙනවා"

මා නැවත වරක් මමෙවාකා බලන්ට ගියේ ඒ අවසාන වතාව යයි අධිෂ්ඨාන කරගෙන ය. මා දුටු විගස ඈ මා එවූ තෑග්ග ගැන සඳහන් කළාය. එය තම ඔඩොක්කුවෙන් ඇද මට පෙන්නුවාය.

"එද මේක ආපු දවසෙ, මගේ යෙහෙළියො කිව්ව, අන්න මමෙවාකා සංට කවුද යාළුවෙක් හුඟක් වටිනා තෑග්ගක් එවල තියෙනවා කියල," යි ඈ සිනාසෙමින් කීවාය.

එහි ගැබ්වී තිබුණු ඇනුම්පදය මගේ සිත රිදවීය. මා කුමකට ද මැ බලන්ට එන්නේ? දැන් නම් එය හුදු ගනුදෙනුවක් මිස වෙන කිසිවක් නොවන බව මට පැහැදිලිය. එක් අතකින්, තෑග්ගක් ද දී නැවිත් සිටීමට වඩා, ආපු එක වඩා යෙහෙකැයි මට සිතුණි. ඈ දැන් තැත් කරන්නේ මගෙන් වඩ වඩා ගන්ට ය. මා ද ඈට එසේ කළ යුතු ය.

එද මා ආපිට යන්ට සැරසෙත් ම, අල්ලපු කාමරයෙහි දෙතුන් දෙනෙකු රළු හඬකින් දෙඩනු මට ඇසිණි. ඔවුන් අමෙරිකානු භටයන් විය යුතු යයි මම සිතීමි. මම මමෙවාකාගේ මුහුණ දෙස බැලීමි. එහි චකිත බවේ සේයාවක් වැටී මොහොතකින් අතුරුදහන් වී යනු මම දිටිමි. ඈ හොරැහින් තම අත් ඔරලෝසුව දෙස බැලුවාය.

"දැන් වෙලාව හරි නේ ද?" යි මම වහා ඇසීමි.

" නෑ. කවද ද ආයෙමත් එන්නේ?"යි ඈ ඇසුවාය.

"ටෙලිපෝන් කරන්නනම් " යි කියා මා පිටවී ගියේ තවත් එසේ කිරීමට අදහසක් නැති වය. ඈ දොර ගාවට මා කැටුව ගොස්, මගේ පා වහන් රාක්කයෙන් ගෙන මා ඉදිරියෙහි බිදුලේ තබා, මා එය දමාගෙන යන තුරු බලා සිටියේ නොඉවසිලි ගතියකින් යයි මට සිතුණි.

මම බොහෝ කාලයක් හුදකලා බවේ පිළිසරණය සොයමින් ජීවත් වීමි. මම ඉතා අමාරුවෙන් චිත්‍ර දෙකක් ඇඳ අවසන් කෙළෙමි. එහෙත් ඒවා ඇඳීමෙහිදී හෝ ඇඳ අවසන් කොට නැරඹීමෙහිදී හෝ මගේ සිතට ආස්වාදයක් නොවීය. නොරිකො වඩ වඩා ජීවමාන ලෙස මගේ මනැසට ගොදුරු වූවාය. මා නොයෙක් වර අවදි වූයේ ඇගේ කට හඬ ඇසීමෙන් යයි සිතාගෙන ය. මා සිටින්නේ වෙනම තැනක බව අවබෝධ වන්නේ ටික වේලාවකින් ය. මා වරක් දෙවකරක් ඈට ලියූ නමුත් ඇගෙන් ලියුමක් නොලැබිණි.

WWW.EXPRESSLANKA.TK 70

මුදු මොළොක් වචනයකින් වත් සංග්‍රහයක් නොලැබ මා ගත කළ නිසරු ජීවිතයෙහි ආදරයක පිළිරුවක් වත් ලැබුණේ මමෙවාකාගෙන් ය. මා ඇයගෙන් සෙවූයේ සැබෑ ආදරය නොව, ආදරයේ ව්‍යාජයකි. ඈ එබන්දක් මා ඉදිරියෙහි තබන්ට තැත් කළා ය. එය බිඳ දැම්මේ මා ය. ආදරයේ ප්‍රතිරූපය ආදරයට වඩා හොඳ ය. සැබෑ ආදරය, ජීවිතයේ පතුළට කිඳා බැස, එහි ඇති දුකින් තැවරෙයි. ආදරයේ ව්‍යාජය ජීවිතයේ මතු පිට පාවෙයි. එය ක්‍රිඩාවෙකි. එයින් ඇලුම් බැඳුම් හට ගන්නේ නැත. නළු නිළි දෙදෙනා, නළු වෙස් වළාගෙන නටන බව අවබෝධ කටයුතුය. එකෙකු අනෙකාගේ වේශය ගලවා, සැබෑ මුහුණ දෙස බලන්ට තැත් කිරීම වැරදිය. එසේ කිරීම, ඒ ක්‍රිඩාවේ නියෝගයන්ට විරුද්ධ ය.

බොහෝ කලකට පසු මා සවස ගෙදරින් බැහැර ගොස් ඇවිදින අතර, මමෙවාකා නැවත බලන්ට යාමට මට හදිසියෙන් සිත් විය. මම ඈට ටෙලිපෝන් කෙළෙමි. එහෙත් එද මමෙවාකා ගෙදර නැතැයි වෙන ස්ත්‍රියක් මට කීවාය. කොයි වේලාවට ආපසු එයි දැයි ඇසූ විට, රෑ වන තුරු නොඑන බව ඈ කීවාය. මා තුළ මහත් ඊර්ෂ්‍යාවක් හට ගත්තේ ය. එද රෑ ඇය ගත කරන්නේ කෙසේ දැයි මගේ මනසැට පෙනී ගියේය. ඊට ඊර්ෂ්‍යා ගන්ට මා මහා මෝඩයෙකු විය යුතුය. එද රෑ පමණක් නොව, සෑම රැයක් ම ඈ ගත කරන්නේ එම ලෙස නොවේ ද? මේ මා නොදැන සිටි කරුණක් ද? මා ටෙලිපෝන් කළ සෑම විටක ම මා එනතුරු බලා සිටින බව ඈ කීවාය. එහෙත් ඈ මට කීවේ, උදයට ටෙලිපෝන් කරන්නය. කියාය. ඈ පවත්වන්ට තැත් කළ මායාව බිඳ හෙළුවේ මා මිස වෙන කෙනෙක් නොවේ.

WWW.EXPRESSLANKA.TK 71



8

බොහෝ කළකට පසු නොරිකොගෙන් ලියුමක් ඇවිත් තිබුණු නිසා මම ඉතා නොඉවසිල්ලෙන් එය ඇර බැලීමි. සතියකට පමණ පෙර මම ඇට දෙස් කියා ලියුමක් යැවීමි. අඩු ගානේ මට ලියුමකින් වත් සංග්‍රහ කිරීම ඒ තරම් දුෂ්කර කාර්යයක් දැයි මම ඒ ලියුමෙහි ඇසීමි. මේ ලියුම ආවේ ඊට පිළිතුරක් වශයෙන් යයි මම සිතුවෙමි.

"ඔබට බොහෝ කලකට ලියුමක් එවන්ට බැරි වීම ගැන ඇත්තෙන්ම කනගාටුයි. මේ දවස්වල මට නොයෙකුත් දුක් කර දර පැමුණුණා. ලියන්ට බැරිවුණේ ඒ නිසායි. දෙවෙන්දෙරා සං, මගේ ඉතා ප්‍රිය වූ, මේ ලෝකයෙහි මට ඇත්තා වූ ඉතාම වටිනා වස්තුව වන මගේ පියා හදිසියෙන් මළා. එද මම කාර්යාලයෙන් ගෙදර එන කොට රෑ වෙලා. තාත්තට එතකොටත් සිහි නැති ව, බිම බාවලා සිටියා. අක්කයි, අක්කගේ දුවයි ඇවිත් සිටියා. තාත්තා පැය ගණනක් ලොකු හඬකින්, අමාරුවෙන් මෙන් හුස්ම ගනිමින් සිට, පසු ද උදේ තුනට මළා. ඔහුගේ නහයෙන් ලේ ගලමින් තිබුණා. මම තාත්තා එක්ක අන්තිම වරට කතා කෙළේ එද උදේ යි. තාත්තා දෙවෙන්දෙරා සං

ට ආදරෙයන් සිටියා. දෙවෙන්දෙරා සං ද තාත්තට ආදරෙයි. තාත්තා හොඳ කෙනෙක් නොවේද? ඔහු ගැන හොඳක් කියා මාව සනසන්න. ඉක්මන්ට ලියුමක් එවන්න. මම බලාගෙන ඉන්නවා."

මට එක වර ම සිහි වූයේ එද අන්තිම දවසෙහි ව්යොකො මට පෙන්වූ නකාජිමා සංගේ ඡායා රූපයයි.

"ඔතෝර්සංගෙ පින්තූරවලින් මෙච්චර යි ටිකක් වත් හොඳට ඇවිත් තියෙන්නෙ." යි කියා, මේසය මත දිග හැර තිබූ ඇල්බමය ඈ මා වෙතට ළං කළාය.

ඒ ඡායාරූපයෙහි ඔහු, වමත්ල මත බත් බඳුන තබා ගෙන එය කට ගාවට ළං කොට දකුණෙහි වූ හෂි කෝටුවලින් බත් ටිකක් කටට තල්ලු කරමින් සිටියේය. එවේලෙහි ඔහුගේ මුහුණෙහි වූයේ ජීවිත සටනින් හෙම්බත් වූවෙකුගේ මලානික පෙනුමකි.

"දෙවෙන්දෙරා සං ගියාම පාලුයි." යි මා දුම්රියට ඇතුල් වූ විට ඔහු කීවේ ද ඊය සමාන වූ පෙනුමකින් යුතු වය.

මම වහාම නොරිකොට ලීවෙමි.

"මළ ගිය ඇත්තන් ගැන අපි දුක් වෙන බව සැබෑවක්. ඒත් මළ ගිය ඇත්තෝ දුක් වෙන්නේ නෑ. ඒ අය වාසානාවන්තයි. තාත්තා හොඳ කෙනෙක් බව මම දන්නවා. තාත්තා ජීවත්ව ව සිටියද්දී, තාත්තාගේ සිත රිදවන විදියේ කිසිවක් නොරිකො සං කළේ නෑ. තාත්තා අකමැතියි කියා සිතූ සෑම දෙයින් ම නොරිකො සං වැළකුණා. එය කොයි තරම් ලොකු සැනසීමක් ද? ජීවත් ව සිටින අපට ඊට වඩා ලොකු සැනසීමක් බලාපොරොත්තු වෙන්න පුළුවන් ද? තාත්තා ගැන දුක් වෙන්න එපා. තාත්තා නැතිවීමෙන් අපට යි පාඩුව. එත් තාත්තාගේ දුක් කරදර කෙළවරයි. අපි දුක්වෙතොත් දුක් වෙන්නේ අප ගැනයි. මත්තටත් තාත්තා අකමැති දෙයක් නොරිකො සං කරන්නේ නැති බව මම දන්නවා. එයින් සතුටු වෙන්න."

මේ පුවත දැන ගෙන තෙමසකට පමණ පසු මම යළිත් තොකියෝ බලා පිටත්වීමට තීරණය කර ගතිමි. නොරිකො හමු නොවී සිටීමට මා ගත් වෑයම නිෂ්ඵල බව මට වැටහුණි. දිනෙන් දින මගේ සිතෙහි වැඩුණු සංකාව පහ වන හැඩක් නොපෙනිණි. කෙළවර දී කුමක් කරන්නට ද කියා මා තුළ පැහැදිලි අදහසක් නොවීය. නොරිකො නැවත දැකීමේ ආසාවෙන් පමණය, මා පෙළුණේ. නකජිමා සං මැරුණේ දෙසැම්බර මාසයේ අවසාන හරියෙහිදීය. වසන්තාරම්භයෙහි මම තෝකියෝවට යන්ට සිතා ගත්තෙමි.

එහෙත් තොකියෝවෙහි ලාබෙට කාමරයක් සොයා ගැනීම අපහසු බව මම දනිමි. සාමාන්‍යයෙන් විදේශිකයන් සඳහා තිබෙන කාමර මිල වැඩිය. ඕකතා සංගෙන් කාමරයක් ඉල්ලීමට ද මම අකමැති වීමි. එසේ කළ

හොත්, නොරිකො හමු වීමට නැවත අකුල් ඇති වේ. ජපනුන් වෙසෙන කාමර නම් ලාබෙට ගත හැකි වුවද දන්නා හඳුනන කෙනෙකුගේ මාර්ගයෙන් මිස එවැන්නක් පිළියෙළ කර ගැනීම අපහසු ය.

මා දෙතුන් මසකින් තෝකියෝවට එන බව කියා කාමරයක් ගැන සෝදිසියෙන් සිටින මෙන් මම නොරිකොට ලියා යැවීමි. ඒ ලියුමට ඉක්මනින් පිළිතුරක් ආවේය.

"ඔබ එන බව දැනගෙන බොහෝ සන්තෝස වුණා. කාමරයක් සෙවීම නම් අමාරුයි. මටත් වැඩි වෙලාවක් නෑ. මම අයියාටත් කීවා සොයන්ට කියා.

"මේවර ඔබ සමග කතා බහ කිරීමට වත් විවේකයක් ලැබේ ද කියා දන්නේ නෑ. මම උදේ සිට රෑ නවය දහය වන තුරු කාර්යාලයේ වැඩ කරනවා. ළඟක දී සිට, කාර්යාලයේ කටයුතු වැඩි වී තිබෙනවා.

"තත්තා මැරුණු පසු මගේ නෑදෑයෝ මා ගැන කරදරයෙන් සිටිනවා. ඒ ගොල්ලො මට විවාහයක් ගැන කතා කරනවා. ඔබ ඒ ගැන අසා සන්තෝස වේවි යි කියා අයියා කියනවා. මේ හැබෑද? ඔබ ඇත්තෙන්ම මගේ විවාහය ගැන සතුටු වෙනවද?

"මට ලියුම් එවන කොට කාර්යාලයට එවන්න එපා. ගෙදරට එව්වාට කමක් නෑ. ඊට හේතුව පස්සේ කියන්නම්."

කරුණු මෙසේ නම්, මා කුමටද තෝකියෝවට යන්නේ? මා යන්ට අදහස් කෙළේ නොරිකො හමු වීමට ය. ඇය සමග කාලය ගත කිරීමට ය. ඇයට ඒ සඳහා විවේකයක් නැත්නම්, මා එහි ගොස් කුමක් කරන්ට ද? විවාහය ගැන ඇගෙ අදහස් තිබේ නම්, මා ගොස් ඊට බාධා කිරීම නොවටී. එහෙයින් මට වත් ඇට වත් සෙතක් නොවන්නේ ය. ඇට විවාහයක් අවශ්‍ය ය. ගෙයක් දොරක් වුවමනාය. මා සමග විනෝද වීමෙන් ඇට තම ජීවිතයේ හොඳම අවධිය ගෙවිය නොහැකිය.

මම ඇගේ සුභ සිද්ධිය පතන්නේ නම්, ඇත්තෙන් ම ඇගේ විවාහයට මා සතුටු විය යුතුය. එහෙත් ඒ තරමට මගේ සිත මට හසුරුවා ගත නොහැකිය. මා තෝකියෝවෙහි සිටින විට ඇගේ විවාහ මංගලය සිදු වුවහොත්, ඒ මාගේ අවමඟුල සේ දැනෙනු නියත ය. මා ඇස් ඉදිරියෙහි ඇය වෙන කෙනෙකු වෙත පාවා දෙනු මට බලාගෙන සිටිය නොහැකි ය.

හිදෙජිගෙන් මට ලියුමක් ලැබුණේ ඊට නොබෝ දවසකට පසුය.

"මම මේ ලියන්නෙ, ඔබට හොඳ ආරංචි දෙකක් කියන්ටයි. ඔබ තෝකියෝවට එන බව නොරිකොගෙන් දැනගන්ටලැබුනා. අපේ පියාගේ අන්තිම කැමැත්ත වූයේ ඔබ වෙනුවෙන් යමක් කිරීමයි. මම පසුතැවිලි වෙන්නේ, ඔහුගේ කිසිම කැමැත්තක් ඉෂ්ට කිරීමට මට අවස්ථාවක් නොලැබුණු නිසා යි. ඒ හන්ද, ඔබ තෝකියෝ වෙහි නතර වී සිටින තුරු, පියා ගේ කාමරය ඔබට දෙන්ට අපි සිතා ගත්තා. චියෙකො සියල්ලක් ම සුද්ධ පවිත්‍ර කරාවි. නොරිකො ඔබට කෑම පිස දේවි.

WWW.EXPRESSLANKA.TK 74

"තවත් ආරංචියක් තිබෙනවා. නොරිකො සංට පෙම්වතෙක් ලැබුණා. එයා හොඳ කඩවසම් පුරුෂයෙක්. එයා නොරිකොට කැමතියි. නොරිකො ද එයාට කැමති හැඩයි. ඒ ගැන අපි බොහොම සතුටුයි."

ලියුමේ අවසාන කොටස කියවූ මට දැනුණේ මා සිටගෙන සිටි තැන පොළොව හදිසියෙන් කිඳා බසින්නා සේ ය. නොරිකොට පෙම්වතෙක් ? ඈ විවාහ වීම වෙන ම කාරණාවකි. එහෙත් ඇයට පෙම්වතෙක් සිටීම! "නොරිකො ද එයාට කැමති හැඩයි." ඈ කිසි කලක මට ආලය කෙලේ නැත. මට ඒ බව ඉවකින් මෙන් හැඟුණි. ඈ මට හුදෙක් කරුණාවෙන් සැලකුවා පමණි. මා සමග කතා බහ කිරීමට ඈ ප්‍රිය කළා ය. එහෙත් මම පිට කෙනෙක් වෙමි. අප දෙදෙනා අතර, සම්පූර්ණ අන්‍යෝන්‍ය අවබෝධයක් නොවීය. මා සිතන මතන සැටි ඈට නොතේරේ. ඇගේ සිත ක්‍රියා කරන සැටි මට රහසකි. ඇගේ බස මම නොදනිමි. මා කියන දේ ඈට නොවැටහේ.

එහෙත් නොරිකො මට ලියූ සැටියෙන් ද ඇගේ වෙනත් කෙරුම් කියුම්වලින් ද ඇගේ සිත තුළ මා කෙරෙහි ගැඹුරු ඇල්මක් සැඟවී තිබේ යයි අනුමාන කිරීමට ඉඩ තිබිණ. තමාගේ සිත කල් යාමේ දී වෙනස් වූයේ නම්, ඇයි ඈ මට ඒ බව නොදැන්වූයේ. ඇයි ඈ මට ඒ බව තම සහෝදරයාගේ මාර්ගයෙන් දන්වන්ට සිතුවේ? මට කෙලින් ම කියන්ට බැරි නිසා ද ඈ එසේ කෙළේ? අද දෙදෙනා අතර ගිවිසුමක් තිබුණා නොවේ ද? ඇගේ සිත වෙනස් වූයේ නම්, ඇයි මා එද දුන් සිහි වටනය මට ආපසු නො එවුවේ?

මම තෝකියෝවට නොයාමට සිතා ගත්තෙමි. එහෙත් මගේ අදහස හදිසියෙන් වෙනස් වූයේ කුමක් හෙයින් දැයි හිදෙජි සිතන්ට පුළුවන. ඔහු තුළ මා ගැන සැකයක් උපදින්ට ද ඉඩ තිබේ. එහෙයින් මට හදිසියෙන් අක්මාවෙහි ආබාධයක් සැදුණු බව ද දැන් ම ගමන් කිරීම හොඳ නැතැයි වෛද්‍යවරයා අවවාද කළ බව ද කියා මම හිදෙජිට ලියුමක් යැවීමි. මට සුව වුවහොත් දෙතුන් මසකින් එන බව ද මම කීවෙමි.

ඊ ළඟ දවස් කීපය, මා කෙබඳු සන්තාපයකින් ගත කෙළේ ද කියා මා හැර අන් කිසිවෙක් නොදනී. මට තෝකියෝවට ගිය නොහැකි ය. කියෝතොවල සිටිය නොහැකිය. ආපසු ගම රට බලා යාමට ද මම සිතුවෙමි. එහෙත් කොයිබ ගියත්, මට මේ ලොව එක සේ ය. මා වටා මිනිසුන් දහස් ගණන් සිටිය ද මම හුදකලාවෙන් පසු වෙමි. කිසිවෙකුගේ ආදරය හා සැලකිල්ල මට තුරුස්සයි. කිසිවෙකු මට ආදරය නොදක්වතොත් මැනවැයි මට සිතේ. එය වඩා ලොකු සැනසීමකි. දිවි නසා ගැනීමේ සිතුවිලි මා තුල උපන්නේ ය. මේ පරිසරයෙහි එය නින්දවක් ලෙස නොගැණේ. මෙහි ජීවිතය මෙන් ම මරණය ද රමණීය ය. දිවි නසා ගැනීම බයාදු නිවට

WWW.EXPRESSLANKA.TK 75

ක්‍රියාවක් නොවේ. දසයි ඔසමු තරම් හොඳට අන් කිසිවෙකු දිවි නසා ගැනීම වෙනුවෙන් තර්ක කරනු මා අසා නැත[1] නොරිකො මට ජීවිතයේ සෞන්දර්යය මෙන් මරණයේ සෞන්දර්යය ද පෙන්වා දුන්නාය. කෙනෙකු දිවි නසා ගන්නේ ජීවිතයේ සෞන්දර්යය රැක ගැනීමට ය. කෙනෙකුගේ ජීවිතයෙන් පොදු සෞන්දර්යය කිලිටි වේ නම්, ඒ පොදු සෞන්දර්යය කිලිටි කරමින් ජීවත් වීමට වඩා එය නිර්මල ව තිබෙන්ට ඉඩ දී තමා නැති වී යාම යෙහෙකි.

මම නොරිකො එවූ ලියුම් කීපයක් නැවත වරක් කියවා බැලීමි. මිතුරෙකුගේ ලැබෙන ලියුම්වලට සමාන වූ ඒවායේ, හුරතල් තොදොල් වචන එකකුදු නොවීය. ඉඳහිට පමණක්, ඇ යටපත් කරගෙන සිටින්ට තැත් කළ කිසිවක් හදිසියෙන් උඩට මතු වූ තැන් සේ පෙනුණු වාසගමක් දෙකක් විය. එහෙත් එබඳු තැන් විරල විය. ඒවා හැරුණු විට, හුදු මිතුරුකම ඉක්මවා ගිය හැඟීමක් සේ සැලකිය හැකි කිසිවක් එක ලියුමක වත් පවසා තිබුණේ නැත.

මා ඇයට නොදැනුවත් ව තෝකියෝවට යන්ට ද? මට අවසාන වරට වත් ඇය දැක ගත හැකි නම් ඒ ඇත. ඇ සවස කාර්යාලයේ වැඩ කටයුතු අවසන් කොට, තම පෙම්වතා සමග නිකුත් ව යනු මට බලා කත හැකිය. ඇගේ පෙම්වතා නිසැක ව ම කාර්යාලයෙහි වැඩ කරන කෙනෙකු විය යුතු ය. කාර්යාලයට ලියුම් එවන්ට එපා යි ඇ කිවේ ඒ නිසා වන්ට ඇත. මම දෙදෙනාට නොපෙනී ඔවුන් පිටි පස්සේ යන්නෙමි. ඔවුහු කෝපි හලකට ඇතුලත් වෙති. නැතහොත් බොජුන් හලකට යති. මා සමග යන විට මෙන් සියලු දෙනා ම ඇ දෙස හැරී නොබලති. තරුණයන් ද තරුණියන් ද ඇට සිනාසෙන්නේ නැත. ඇ පං පං ස්ත්‍රියක් යයි කිසිවෙක් නොසිතයි. මේසයක් ගාව මුහුණට මුහුණ දී වාඩි වී ඔවුන් දෙදෙනොට නොයෙක් දේ පහසුවෙන් දෙඩිය හැකි ය. හුදෙක් නිහඬ ව උනුන්ගේ මුහුණු දෙස බලා ගෙන සිටීමට ඔවුන්ට සිදු නොවේ. එක දේ දෙතුන් වරක් කියා තේරුම් කර දීම අවශ්‍ය නැත. ඔවුන්ට විහිළු තහළු හුවමාරු කළ හැකි ය. බස තේරෙන නිසා, කෙනෙක් අනෙකා කියන දේ වරදවා තේරුම් නොගනියි.

"අද බොහොම සීතලයි. ඒත් ඊයෙ පැව්ව නේ. මේ මාසෙ සාමාන්‍යයෙන් වහිනව ද? ජපානයේ කාලගුණය වහ වහා වෙනස් වන සුලුයි. ගම රටේ නම් මුළු අවුරුද්දේ ම පායනවා."

ඔවුන්ගේ කතා බහ මෙවැනි මාතෘකාවලට සීමා වන්නේ නැත. ඔවුන් දෙදෙනාට තම තමන් ගේ සිත ඉතා පහසුවෙන් තම තමන්ට විදහා දැක්විය හැකි ය.

---

1. ප්‍රසිද්ධ ලේඛකයෙක්. යුද්ධයෙන් පසු ජපානයේ රදළ ජීවිතය බිඳ වැටුණු සැටි ඔහුගේ 'ෂයෝ' (බහින හිරු) නමැති නව කතාවෙහි මනා සේ පිලිබිඹු වේ. ඔහු සිය දිවි නසා ගත්තේය.

නොරිකො හදිසියෙන් මා දුටුවොත් ඈ කුමක් කරාවි ද? ඈ මා නුදුටුවා සේ වෙන දෙසකට හැරේවි ද? නැතහොත් තම පෙම්වතාට මා හඳුන්වා දේවි ද? මා තමාගේ කවරෙක් යයි කියාවි ද? තමාගේ මිතුරෙක්ය කියා? එසේ කීවොත්, මා වැනි විදේශිකයෙකු ඈ හඳුනා ගත්තේ කෙසේ දැයි පෙම්වතා පුදුම වනු ඇත. මා තමාගේ පියා දැන සිටි කෙනෙකු වශයෙන් හඳුන්වා දුන්නොත් වඩා නොමැනවි ද? නැතහොත් තම සහෝදරයාගේ මිතුරෙක් ය කියා?

නොරිකො මට එවූ ලියුම් සියල්ලක් ම මම පුළුස්සා දැමුවෙමි. රෝම අකුරෙන් ඈ මට ලියා දුන් ජපන් සින්දු ද මම එම ගිනි ගොඩට හෙළුවෙමි. හිරගන[1] අකුරු ඉගෙන ගැනීම සඳහා ඈ මට ගෙනැවිත් දුන් ලී කැට මම කුණු කහල ගොඩට විසි කෙළෙමි. ඒ ලී කැටවලින් අප දෙදෙනා සෙල්ලමට වාසගම් සෑදූ හැටි මට මතක් විය.

"වතකුෂි-ඔ වසුරෙනයි දෙ කුදසයි,"[2] මම සෑදුවෙමි.

"ඉත්සුමදෙමො ඔමොයිදෂිමසු,"[3] යි ඈ පිළිතුරු වශයෙන් සෑදුවාය.

තෝකියෝ වෙහි දී ම ඇන්ද සිතුවම් දෙක තුන දෙස මම යළිත් බැලීමි. මා ඒවා ඇන්දේ නොරිකො මා ළඟ වාඩි වී බලාගෙන සිටිද්දීය. එහෙත් ඒවා දෙස බලන විට මට ලජ්ජා සිතිණි. නොරිකොගේ දෑසෙහි විස්මය හා ප්‍රශංසාව ද පිළිබිඹු වී තිබිණි. ඈ මා දෙස බැලුවේ "දෙවෙන්දෙරා සං අපූරු සිත්තරුවෙක් නේද," යි කියන්නො සේ ය. එහෙත් මා එසේ නොවන බව මම දනිමි. මා ව්‍යාජ කලාකරුවෙකු බව මට හොඳට පැහැදිලි ය. විචාරකයන් මා ගැන කී දේ සත්‍ය ය. නොදැනුවත් ව වුව ද මා මුල දී ඇන්දේ පිකාසෝ වැන්නක් අනුකරණය කිරීමෙන් නම්, දැන් මම දැනුවත්වම උතාමරො ආදීන් අනුකරණය කරමි. මා ඇඳි සිතුවම් අතර එකක් පමණක් මට විසි කරන්ට නොසිතුණි. ඈතෙකු ස්වරණතිලකා සොඩින් ඔසවා ඇය දෙස කරුණාවෙන් බලනු එහි නිරූපනණය වී තිබුණි. ජපන් ජීවිතය ඇසුරු කොට මා ඇඳි සිතුවම්වලට වඩා, අඩුගානේ විෂය අතින් වුව ද එහි අමුත්තක් ඇතැයි මම සිතීමි. මා එය කිම්කොට දිය යුතුය. ඈ අලි ඇතුන්ට කැමැති ය. එදා මා යොත්සුයාවට ගිය වේලේ ඈ මගේ සිතුවම් ගැන උනන්දුවක් දැක්වූ බව මට සිහි විය. මා කියෝතො අත් හැර යාමට පෙර ඒ සිතුවම ඇට තැපැල් කර යැවීමට මම සිතා ගත්තෙමි.

මා හිදෙජි ට ලියා සතියක් ගත වීමට පෙර නොරිකොගෙන් ලියුමක් ආවේ ය.

"අද මම හවස කාර්යාලයෙන් ගෙදර ආ විට, අයියා කිව්වා ඔබ තෝකියෝවට එන්නේ නැති වගක්. ඔබගේ අසනීපය ගැන මම බොහොම කරදරයෙන් සිටිනවා. හුඟක් අමාරු ද? දැන් ම එන්ට බැරි වේ විද? පසු

1. ව්‍යංජන අකුරු සමග කලවමේ පාවිච්චි කරන දේශීය හෝඩිය.
2. මා අමතක කරන්න එපා.
3. සැමදා සිහි කරනවා.

WWW.EXPRESSLANKA.TK 77

වත් එන හැකි ද? කොහෙත්ම එන්නේ නැද්ද? වෛද්‍යවරයා මොකො
කියන්නේ? වහා දන්වා ලියුමක් එවන්න.

"මම වඩා ලියුම් නොලියපු නිසා, ඔබ එක් කරුණක් වරදවා සිත
ගත්තා ද දන්නේ නෑ. නොබෝ දවසකින් තෝකියෝවෙහි දී හමු වී විස්ත
වශයෙන් සියල්ල ම කතා බහ කරගැනීමේ අදහසිනුයි මම ලිව්වෙ නැත්තෙ
ලියුම් මාර්ගයෙන් පැහැදිලි කරන්ට බැරි දේ බොහෝ තිබෙනවා.

"ඔබේ පැමිණීම බලාපොරොත්තුවෙන් මම වුවමනා දේ සියල්ල
ම පිළියෙළ කළා. අක්කයි මායි ව්යෙකො සං සමග එකතු වෙලා ඔබ සඳහ
අලුත් පුළුන් මෙට්ටයක් මහලා හමාර කළා විතරයි. පුළුවන් කමක්
තිබෙනවා නම්, එන්න."

මේ ලියුම දුටු විගස මට යළිත් සිතුණේ තෝකියෝවට යන්ට ය
එක් හේතුවක් නම්, මගේ පැමිණීමේ බලාපොරොත්තුවෙන් ඒ අය
නොයෙකුත් දේ පිළියෙළ කර තිබුණු නිසා, මා නොගොස් සිටීම නොවි
යයි හැඟුණු බැවිනි. අනික, නොරිකොගේ නියම සිත දැන ගැනීමේ
ආසාවෙන් මා තදබල ලෙස මැඩුණු බැවිනි.

මා පිළිතුරු වශයෙන් නොරිකොට යැවූ ලියුම ස්වල්පයක් මතකය
"මම තෝකියෝවට එන්ට අදහස් කෙලේ ඔබ දැක ගැනීමට යි. ඒත් ඔබ
මට ලියා එව්වෙ, මා එක්ක කතා බහ කිරීමට වත් ඔබට විවේකයක් නැත
කියා යි. ඔබට පෙම්වතෙක් ද ලැබුණු බව හිදෙජි සං මට දන්වා එවපු නිස
මම නොඑන්ට සිතුවා. ඒත් මගේ පැමිණීමේ බලාපොරොත්තුවෙන් ඔබ හැම
දෙනා ම කරදර වී තිබෙන බව මට පෙනෙනවා. ඒ නිසා, මේ ගමන කරන්ට
මම තීරණය කර ගත්තා. ඔබ නැත්නම්, ඒ තරම් විශාල තෝකියෝ නගරයෙ
මම කුමක් කරන්ටද? ඔබගෙන් තොරවූ තෝකියෝ නගරයක් ගැන මම
දන්නෙ නෑ. තෝකියොවේ වීදි මම ඔබ සමඟ ගිය වීදි යි තෝකියෝවේ
බෝජුන් හල් මම ඔබ සමග කෑම අනුභව කල බොජුන් හල්. තෝකියෝවේ
කෝපි සාලා, මම ඔබ සමග වැයුම් ගැයුම්වලට කන් දීගෙන පැය ගණන
ගත කළ කෝපි සාලා. ජපානයේ කෑම වර්ග, ඔබ සියතින් මට පිස දුන
කෑම වර්ගයි. ඒ නිසා, ඔබගෙන් තොරවූ තෝකියෝ නගරයක් වත
ජපානයක් වත් මම දන්නේ නෑ"

WWW.EXPRESSLANKA.TK 78

9

එදා සවස මා තෝකියෝවට පැමිණි වේලේ, හිදෙජි හා ඔහුගේ වැඩිමහල් සහෝදරිය මොමොකො ද ඇගේ දුව කිමිකො ද, නොරිකො සමඟ දුම්රිය පළට ඇවිත් සිටියහ. අපි තෝකියෝ දුම්රිය පළ සිට ෂිබුයා දක්වා විදුලි කෝච්චියෙහි නැගී ගියෙමු. නොරිකො මගේ සූට් කේස් පෙට්ටි දෙකෙන් කුඩා එක ඔසවා ගෙන යන්ට සැරසුණාය. මම ඇය වළක්වා සූට්කේස් පෙට්ටි දෙක ම දැතින් ගත්තෙමි. එවිට හිදෙජි මගේ අතින් ලොකු පෙට්ටිය ගත්තේය. නොරිකො තම දෑස ස්වල්පයක් පිසිනු මම දුටුවෙමි.

සෙනගගෙන් පිරුණු විදුලි කෝච්චියෙහි අපි වහලේ පටි අල්ලාගෙන නිශ්ශබ්ද ව ගමන් කෙළෙමු. මම වරක් දෙකක් නොරිකොගේ මුහුණ දෙස බැලීමි. එය දෙම්නසින් බර වී තිබුණි. කිමිකො මා ළඟින් සිටියාය. මා එද යොත්සුයාවට ගිය සඳෙහි ඈ ඇදුමෙන් පෙළී සිටි බව මට සිහි විය. මම ඇගේ උරහිස මත තබා "කිමිකො සංට දැන් සනීප ද?" යි ඇසීමි. ඈ ලජ්ජාවෙන් සිනාසුණා පමණි.

"මේ අවුරුද්දෙ තාම ඇඳුම හැදුණෙ නෑ. උෂ්ණ කාලෙට යි හැදෙන්නේ," යි මොමොකො කීවාය.

තෝකියෝ කොයි තරම් අමුතු ද! එහි විශේෂ සුවඳක් තිබේ. විදුලි කෝච්චියකට නැංගත්, සෙනග අතරින් ඇවිද්දත්, මට නිතර ඒ සුවඳ දැනේ. කියෝතොවල සිටි මුළු අවුරුද්ද තුළ දී මට එවැනි සුවඳක් දැනුණේ නැත. දැන් ඒ සුවඳින් මගේ ගත සිත පිබිදෙයි. බොහෝ කලකට නොදැනුණු විදියේ ප්‍රීති සුවයක් මා ඇතුළෙහි පැතිරී යයි.

තකජිමා සං සිටි කාමරය, පොළොවෙහි අලුත් තතමි පැදුරු ගසා ඉතා පිරිසිදු ලෙස මා සඳහා පිළියෙළ කොට තිබිණි. අඩි හතරක් පමණ දිග, පහත් මේසයක් එහි තබා තිබුණේ මට සිතුවම් ඇඳීම සඳහා වන්ට ඇතැයි මම සිතුවෙමි. කාමරයට පිවිසෙත්ම මගේ සිතට මහත් නිස්කාංසුවක් දැනිණි. මා අවුරුද්දක් පමණ ගත කෙළේ ලැගුම් පළක් වුව ද නැති කෙනෙකු මෙනි. මා කාමරයට පිවිසුණේ, තෙහෙට්ටු වී හෙම්බත් වී, හිස ඔසවාගෙන තබා ගැනීමට තරම් බැරි වූ විට ය. මා අවදි වූ වේලේ සිට මට එහි සිටීමට සිත් නොවීය. මා නිතර ම පෙළුණේ එවැනි නොසන්සුන් කමකිනි.

"ඉස්ටේසමට එන්න මට ඉඩක් ලැබුණෙ නෑ මේ ළමය හන්ද. ඒ වුණත් බලං හිටිය එන කල්," යි කියා චියෙකො මට ආචාර කළාය.

ඕසකාවල ප්‍රසිද්ධ කැවිලි වර්ගයක් වන ඔකොෂි පෙට්ටියක් මම තෑගි වශයෙන් ගෙන ආ බව කියා මේසය මත තැබුවෙමි.

"ඉස්සෙල්ල තාත්තට දීල හිටිමු ද? යමු තාත්ත බලල එන්න," යි නොරිකො කීවාය.

තෝකියෝ දුම්රිය පළට පැමිණි විගස ම මට සිහි වූයේ එද තකජිමා සං මා ඇරලන්ට ආ දවස ය. නොරිකොට ද සිහි වන්ට ඇත්තේ එම අවස්ථාව ය යි මම සිතුවෙමි.

නොරිකො තම කාමරයට මා කැඳවාගෙන ගියා ය. ඇගේ කාමරයට පැමිණෙන්නේ කෑම පිසීමට හා අනුභව කිරීමට පාවිච්චි කළ වෙනත් කාමරයක් හරහා ගිය විට ය. ලාච්චු රාක්කයක් මත ඡායාරූප දෙකක් විය. එකක් නොරිකොගේ මව ගේ ය. ඈ නොරිකොගේ සහෝදරිය මොමොකොට කෙතරම් සමාන දැයි මට වහා සිතුණි. අනික පියාගේ ය. ඡයාරූප දෙක ඉදිරියෙහි අළු පුරවන ලද කුඩා පිත්තල බඳුනක් විය. මම ඔකොෂි පෙට්ටිය ඡායාරූප ඉදිරියෙහි තබා, එහි වූ කුඩා ඉටිපන්දමක් ගෙන දල්වා, ඉටිපන්දමින් හඳුන් කූරු තුනක් පත්තු කර අළු බඳුනෙහි හිටෙව්වෙමි. අනතුරුව මම පසෙක තිබුණු කුඩා සීනුව දෙවරක් නාද කොට, ඇඳිලි බැඳගෙන ස්වල්ප වේලාවක් වැඳ සිටියෙමි.

"තාත්තා සන්තෝස වේවි. ඔකොෂිවලට හරි කැමතියි. අම්මලගෙ නෑදෑයො ඕසකාවලින් එන කොට හැම තිස්සේ ම ඔකොෂි ගේනව."

WWW.EXPRESSLANKA.TK 80

කෑම කන කාමරයේ පොළොවෙහි පැදුරු නොවී ය. එය ලෑලි ගසා සාද තිබුණි. මැද, කුඩා මේසයක් විය. එක් පසෙක ගෑස් ලිපවල් දෙකක් ද වතුර පයිප්පය ද විය.

"අපි කෑම කන කාමරේ හරි කුඩයි. මේ මේසෙ අකුළල පැත්තකින් තියන්න පුළුවන්. නැත්නම් දෙවෙන්දෙරා සංට කරදරයි එහාට මෙහාට යන්න," යි චියෙකො කීවාය.

නොරිකො දෙඩුවේ ඉතා ස්වල්පකි. ඈ වරින් වර අතට කඩදාසියක් ගෙන තම දෑස හා නාසය පිස දැමුවාය.

"නොරිකො සංට වැඩිය සනීප නෑ. හෙම්බිරිස්සාව වගේ." යි චියෙකො කීවාය.

"කොහොම ද නොරිකො සංගෙ විවාහෙ? ළඟදි සිද්ද වෙන්න යනව ද? " යි මම හිදෙජිගෙන් ඇසීමි. නොරිකො කෙනෙවිලි කිරීමේ අදහසින් මගේ සිත මුළුමනින් ම තොර වී යයි මට කිව නොහැකිය.

"ඉස්සෙල්ල කතාවක් තිබුණා. ඒක හරි ගියෙ නෑ. දැන් තියෙනවා ආයෙමත්..."

"ඕන නෑ ඕව ගැන කියන්න," යි .නොරිකො ඔහු වැළකුවාය.

පසු ද උදේ මා අවදි වූයේ නොරිගේ කටහඬ අසමින් ය. ඈ චියෙකො සමග කතා කරමින් සිටියාය. සැමද උදේට අවදි වනවාත් සමග මගේ හෘදයේ හටගන්නා තැවිල්ල ඒ හඬ ඇසීමෙන් නිවී සැනසී ගියේය. බොහෝ කාලයකින් එද පමණ ය මා සන්සුන් සිතකින් දෑස හැර ලොව දෙස බැලුවේ.

හිදෙජි උදේ පාන්දරින් ම කාර්යාලයක වැඩට යන හෙයින් මට ඔහු හමු නොවේ. නොරිකො ද උදේ අටට ගෙදරින් පිටත් ව යයි. මා මූණ කට සෝද්ද බත් කන්ට සූදානම් වන විට ගෙදර සිටින්නේ චියෙකො හා ඈගේ ළදැරිය වන යුකිකො පමණ ය. මා මේසය ගාව වාඩි වූ විට චියෙකො ඇවිත් මට බත් හා මිසොෂිරු[1] බෙද දී මා සමඟ පිළිසඳර දෙඩයි.

මා අවුරුද්දකට විතර උඩ දී එහි පැමිණි දවසෙහි චියෙකො වඩාගෙන සිටි අත දරුවා දැන් ඉතා හුරතල් ය, දඟ ය. මා කෑම කන විට ඈ පුටුවක් මත හිටගෙන, මේසයෙහි තිබෙන කෑම බඳුන් ආදිය පෙරළයි. නැතහොත් ආහාර වර්ග කටේ දමා ගනියි. මා සඳහා වෙන් කර තිබෙන කිරි පංගුව ඈ බොයි. නැතහොත් එය මේසය පුරා ඉහිරවයි. ඈ සීනි අහුරු දෑතට ගෙන කයි. එහෙත් චියොකා ඈට පොඩ්ඩක් වත් තරවටු නොකරයි. යුකිකො මේසය මත සීනි විසුරු විට, නැතහොත් කිරි ඉහිරූ විට, ඈ රෙදි කෑල්ලක් ගෙන මේසය පිස දමයි.

"යුකිකො චං! දඟ කාරය! ඉතින් හොඳට ඉන්න," යි ඈ යුකිකොට හුරතල් හඬින් යාප්පු වෙයි.

---

1. උදේට බත් කන අතර බීම සඳහා, මැ ඇට පාප්පවලින් සාදන හොද්දකි.

"මේ ළමයි හන්ද හරි කරදරයි දෙවෙන්දෙරා සං.ට. සමා වෙන්න," යි ඈ මට කීප වරක් කියයි.

"කමක් නෑ. පොඩි ළමයි ඔහොම තමයි කොහෙත්," යි මම කියමි. එහෙත් යූකිකොගේ දඟ මට සැබවින් ම හිරිහැරයක් විය. තම ළදැරියට හිතුවක්කාර ලෙස ක්‍රියා කරන්ට ඉඩ නොදී ස්වල්පයක් වත් හසුරුවන්ට තැත් කළහොත් මැනවැයි චියෙකොට කියන්ට මට නොයෙක් වර සිතිණි. සමහර විට මා කමින් සිටින අතර, යූකිකො තම කිලුටු අත මගේ බත් බඳුනට ඔබා, බත් අහුරක් ගෙන කටට දමා ගනියි, නැතහොත් මගේ මිසොෂිරු බඳුනට රාබු අච්චාරු පෙත්තක් හෙළයි. යූකිකො නිසා ගෙදර තිබුණු කෑම බීම බොහෝ නාස්ති වුණි. ඈ පිඟන් කෝප්ප බිම දමා බින්දය. ඇගේ දඟ වැඩි වූ විට චියෙකො කරන්නේ ඇය උස පුටුවක් මත වාඩි කර තැබීම ය. යූකිකො, වාඩි කරන ලද ආකාරයෙන් ම ස්වල්ප වේලාවක් නිශ්ශබ්ද ව සිටියි. ඉක්බිති ව ඇගේ දෑස කඳුළුවලින් පිරෙයි. හදිසියෙන් ඈ හයියෙන් හඬන්නට පටන් ගනියි.

චියෙකොගේ මුවින් "බකස්" ගා සිනාවක් පිට වෙයි. එහෙත් මට යූකිකො ගැන දුක සිතේ.

"යූකිකො චං, සම්පො ඉකිමහො?"[1] යි මම අසමි.

"චම්පො, චම්පො." යි කියා, යූකිකො, කඳුළු පිරි දෑසින් යුතු ව මා දෙස බලා, මගේ ඇහෙහි එල්ලෙයි. මම ඇය වඩාගෙන කඩ වීදියට ගෙන ගොස් අයිස් ක්‍රීම් අරන් දෙමි.

හවස පහට පමණ හිදෙජි ආපසු පැමිණෙයි. බොහෝ දිනවල එහු ගෙදර විත්, චියෙකො සමඟ කඩයට ගොස්, රෑ කෑමට වුවමනා කරන දේ ගෙන එයි. අපි සවස හයට පමණ කෑමට වාඩි වෙමු. ඇතැම් දවසක චියෙකො සකෙ උණු කර මේසය මත තබයි.

"හැම ද ම සෙක බොන්න හොඳ නෑ. හිදෙජි සං නිද ගන්නව. පාඩම් නොකර," යි ඈ සිනාසෙමින් විහිළුවට මෙන් කීවාය.

"මැයි මාසයේ මට විබාගයක් තියෙනව. එයින් සමත් වුණොත් මට පඩිය යෙං දෙදහක් වැඩිවෙනවා," හිදෙජි විස්තර කෙළේය.

උදේට මෙන් සවසට ද යූකිකො තම උස් පුටුව මත මේසය ගාව වාඩි වී, අප කන අතර නොයෙකුත් දඟ කරයි. මා සමඟ පිළිසඳර දෙඩන අතර, හිදෙජිට නොයෙක් විදියේ වැඩ කටයුතු කරන්නට සිදු වේ. යූකිකො පිඟන් කෝප්ප ඇද බිම දමන්ට තැත් කරනවිට ඔහු ඒවා ඇගෙන් ඈත් කරයි. ඈ මේසය මත යමක් ඉහිරූ විට, ඔහු රෙදි කෑල්ලක් ගෙන මේසය පිස දමයි. යූකිකො තම ඇඳුම්වල කිසිවක් වක්කර ගත් විට, ඔහු ළදැරිය

1. 'යූකිකො චං, ඇවිදින්නට යමු ද?' 'චං' යනු කුඩා ළමයින්ට ආමන්ත්‍රණය කරන විදියකි.

WWW.EXPRESSLANKA.TK 82

කාමරයට ගෙන ගොස් ඇගේ ඇඳුම් මාරු කරයි. හිදෙජි ගෙදර පැමිණි වේලේ සිට චියෙකො කෑම පිළියෙළ කිරීමෙහි නියුක්ත වන හෙයින් මෙවැනි කටයුතු සියල්ලක් ම හිදෙජිට බාර ය.

නොරිකො එන්නේ රෑ අටට පමණ ය. ඇතැම් දවසක ඈ නවය දහය වන තෙක් පමා වෙයි. කෑම කන අතර මා නිතර කල්පනා කරන්නේ නොරිකො පමා වන්නේ කුමක් හෙයින් ද කියා ය. රෑ හත හමාරෙන් පසු මගේ හිස, අධික ලෙස මත්පැන් බිවූ කලක මෙන්, රත් වී බමන්ට පටන් ගනියි. එය විකාර සිතුවිලිවලින් ආකීර්ණ වේ. නොරිකො තම පෙම්පතා සමග කොහේ දෝ යන්ට ඇත. ඈ පමා වන්නේ ඒ හෙයිනි. ඈ දැන් කෝපි සාලාවක වාඩි වී ඔහු සමග කතා බහ කරමින් සිටී. නැතහොත් ඈ ඕනෑකමින් කාර්යාලයෙහි පසු වේ. ඔහුගෙන් වෙන් වන්ට අකමැති හෙයින් ඈ වැඩ කරන ව්‍යාජයෙන් එහි නතර වේ. හිදෙජි තොරතෝංචියක් නැති ව කතා කරගෙන යයි. ඔහු කියන දේ මට සිතෙහි එක් අඩකින් යන්තම් වැටහේ. අනික් අඩෙහි ක්‍රියා කරන්නේ නොරිකො ගැන සිතිවිලි ය. නොදැනුවත් ව මම මගේ අත් ඔර්ලෝසුව දෙස බලමි.

"නොරිකො සං මොකො ද දන්නේ නෑ පරක්කු වෙන්න," යි චියෙකො මගේ සිතිවිලි දුටුවා සේ පවසයි.

මම ලජ්ජා වී, හිදෙජි දෙස හැරී ඉතා ඕනෑකමින් ඔහු සමග කතා බහේ යෙදෙමි. මා ඔරලෝසුව දෙස බැලුවේ වෙන කාරණාවක් නිසා යි අඟවන්ට මම වෑයම් කරමි. චියෙකො තේ වක්කර අපට දෙයි. ඒ, මා ඔවුන්ට තෑගි කළ ලංකාවේ තේ වගයකි. යූකිකො තේ ඉල්ලා අඬන්ට පටන් ගනී. "කෝචා, කෝචා," යි ඈ හඬයි.

"යූකිකො චං නෙන්නෙ,"[1] යි ඇය වඩා ගෙන චියෙකො කියයි. ඈ ළදැරිය ඇතුළට ගෙන ගොස් නිදි කරවා තබා නැවත එයි.

මගේ අභ්‍යන්තරය නිශ්චල වන්නේ, දොර ගාව නොරිකොගේ සිහින් කට හඬ ඇසුණු විට ය.

"තදෑ ඉමා,[2]" ඈ කියයි.

"ඔ කයිරි නසයි,"[3] යි හිදෙජි හා චියෙකො කියති.

නොරිකො ඇතුල් වී, තම කාර්යාලය ගැනදිග කතාවක් හිදෙජිට විස්තර කරයි.

"හදිසියෙන් පහට විතර, විදුලි පණිවුඩ කීපයක් ආවා. සතො සංට කලින් යන්න ඕන ය කියල, ලැස්ති වෙල යන්න හැදුව විතරයි. ඒ පාර නවත්තගත්ත. නමුත් කිසි පලක් නෑ ඒවට උත්තර ලියල අද රෑ. අද ලිව්වත්

---

1. නිදන්න (හුරතල් වචනයකි)
2. මම පැමුණුනා.
3. සන්තෝසයි ආවට. (welcome)

WWW.EXPRESSLANKA.TK 83

හෙට ලිව්වත් එකයි. ඊ වුණායින් පස්සෙ තැපැල් කරන්න බෑ නේ. අපරාදෙ අපිව නවත්ත ගත්තෙ. අපේ කොටසෙ ලොක්ක ඔහොම තමයි. නිකං අපිව තියා ගෙන මඩවනවා. අනිත් එක, ඒ ලියුම් අත්සන් කරන්න ඕන මැනේජර් නෙ? මැනේජර් නෑ. කොහොමටවත් ප්‍රයෝජනයක් නෑ. පසසේ අපි දෙන්නව එක්කරගෙන ගිහිල්ල කෝපි දීල සංග්‍රහ කළා''

කාර්යාලය ගැන නොරිකො හොඳක් කියන්නේ කලාතුරකිනි.

''අපේ කොටසෙ ලොක්කත් එක්ක නම් බේරෙන්න බෑ. හැම තිස්සෙම මට යි බණින්නේ, පොඩි වැරැද්දක් තිබුණත්. සතො සංගෙ වැඩත් මම කරල දෙනව. එයා ඉක්මනට ඉවර කරල ගෙදර යනව. ලොක්ක මට බණිනව මගේ වැඩ ඉක්මන් මදියි කියල. සතො සං හොඳ මනුස්සය වෙනව. මම තමයි. අන්තිමට නරක මනුස්සය.''

''ඇයි ඉතින් ඔය කන්තෝරුවෙන් අස් වෙන්නෙ නැත්තෙ? '' යි මම වරක් ඇසීමි. ''පුදුම කන්තෝරුවක් නෙ, ඊ නමය දහය වෙන කල් ගෑනුන්ගෙන් වැඩ ගන්න. අපේ රටේ නම්, නීතියෙන් තහනම් කරල තියෙනව, පැය අටකට වඩා වැඩ ගන්න. මෙහේ නීතියක් නැද්ද, හිදෙජි සං?''

''මෙහෙත්, තියෙනවා, නමුත් ජපන් මිනිසුන්ට අයිති කන්තෝරුවල ඔහොම තමයි. නීතියට අනුකූල ව නොවේ ක්‍රියා කරන්නෙ.''

''එහෙනම් නොරිකො සං යන්න අමෙරිකානුන්ගෙ කන්තෝරුවකට,'' යි මම කීවෙමි.

''මම වැඩ කරන්නෙ අමෙරිකානු කන්තෝරුවක. අපට හතර වෙන කල් විතරයි වැඩ, සෙනසුරාද යි ඉරිද යි දෙකේ ම නිවාඩු,'' යි හිදෙජි කීවේය.

''ඉතින් එහෙම කන්තෝරුවකට යන එක වඩා නරකය.?'' යි මම ඇසීමි.

''ඒකට මගේ ඉංගිරිසි දැනුම මදි,'' යි නොරිකො කීවාය.

''මම නොරිකො ව එක්ක ගියා දවසක් අපේ කන්තොරුවට. ලොක්ක එයාට කරුණාවෙන් කතා කරල, කිව්ව වැඩක් දෙනවයි කියල. ඉංගිරිසි ටික ටික පුරුදු වේවි යි කියල එයා කිව්ව. නුමුත් නොරිකො ගියෙ නෑ ඊට පස්සෙ.''

''දැන් වැඩ කරන කන්තෝරුවෙ ඇති කවුරු හරි, නොරිකො සං කැමති කෙනෙක්. ඒක තමයි අස් වෙන්න අකමැති. මොකොද කියන්නේ චියෙකො සං?''

මා මෙසේ කීවේ විහිළුවක ව්‍යාජයෙන් වුව ද ඇනුම් පදයක් කීමේ චේතනාවක් මා තුළ නොතිබිණැයි මම නොකියමි.

''තමන් කැමති කෙනෙක් ළඟ ඉන්න කොට කොයි වැඩක් වුණත් ප්‍රීතිදායක නේ,'' යි චියෙකො කීවාය.

WWW.EXPRESSLANKA.TK 84

නොරිකොගෙ මුහුණ මැලවුණි. ඈ පහත බලාගත් වන ම කෑම කෑවාය.

"අපි කාටත් ඉන්නව අපි කැමති අය. දෙවෙන්දෙරා සංටත් ගම රටේ නැතැයි, " ටික වේලාවකින් කීවාය.

"මම කැමති අය එහේ නෑ. මට කිසි කෙනෙක් ආදරේ නෑ." යි මම කීවෙමි.

"වෙන්න බෑ. දෙවෙන්දෙරා සං කරුණාවන්ත කෙනෙක්. කාටත් ආදරේ හිතෙනවත දෙවන්දෙරා සංට. අනුමානයක් නැතුව එහේ කවුරු හරි බලාගෙන ඇති," යි චියෙකො මට විහිළුකරන අදහසින් කීවාය.

"මේ ලෝකෙ මම කැමති ගෑනු දෙන්නෙක් ඉන්නව. ඒ දෙන්න තමයි මේ ලොකේ ඉන්න ඉතා ම ලස්සණ ගෑනු දෙන්න," යි හිදෙජි කීවේය.

"හිදෙජි සං කැමති ගෑනු දෙන්නෙක් ඉන්නව.? කවුද අනික් එක්කෙනා? චියෙකො සං තරහ වේවි," යි චියෙකො දෙස බලමින් මම කීවෙමි.

"ඒකට කමක් නෑ. මට තරහ නෑ, ඕන තරමක් හිටියත්," යි චියෙකො සිනාසෙමින් කීවාය.

"එක්කෙනෙක් චියෙකො, අනිත් එක්කෙනා යූකිකො," යි හිදෙජි කීවේය.

WWW.EXPRESSLANKA.TK 85



10

මා සති දෙකක් තුනක් මේ ආකාරයෙන් එහි ගත කරන්ට ඇත.මට ඒ කාලය දැනුණේ අවුරුදු ගණනාවක් සේ ය. මා බලාගෙන සිටියේ නොරිකොගෙන් කිසියම් වචනයක්, කිසියම් බැල්මක්, කිසියම් ඉඟියක් ලැබෙන තුරු ය. එහෙත් ඈ මට කිසි ම අමුතු කුළු පග කමක් නොපෙන්නුවාය. තමා අද ඊයේ දැන ඇඳින ගත් කෙනෙකු මෙන් ය, ඈ මට සැලකුවේ. ඈ ඉරිදා දවසක වුව ද මගේ කාමරය පෙර සේ අස් පස් කර දුන්නේ නැත. අප එකට කෑම කෑ දවස්වල වත් ඈ මගේ පතට කිසිවක් බෙදුවේ නැත. මගේ කෝප්පයට තේ ටිකක් වැක්කෙරුවේ නැත. ඈ ඉරිදා උදේ තම ඇඳුම් සේදූ නමුත්, මගේ ඇඳුමක් සෝදා දෙන්ට දැයි මගෙන් ඇසුවේ නැත. තමා සමග කොයිබ වත් යාමට ඈ මට ආරාධනා නොකළාය. ගෙදර දී වැඩිය මිතුරු ලීලාවකින් කතා බහ කිරීම අපහසු බව මට තේරිණි. එසේ නම්, ඇයි ඈ මට තම කාර්යාලයේ ටෙලිපෝන් නොම්මරය කියා නුදුන්නේ? තම කාර්යාලයේ වැඩ කරන අය කිසිවක් සැක කරන නිසා ද? ඈ ඒ තරම් බය වූයේ තමාගේ පෙම්වතෙකු ඇත්තෙන් ම කාර්යාලයෙහි සිටින නිසා ද?

අවුරුද්දකටත් එපිට කාලයෙහි ඇගේ සමාගමෙහි මා විඳි ආස්වාදය සිහියට නංවා ගැනීම සඳහා තෝකියෝහි ඇය සමග ගිය තැන් මම නැවත සොයා ගෙන ගියෙමි. මම අසකුසාවල උඩු වියන්වලින් සැරසුනු කඩ වීදි දිගේ ඇවිද්දෙමි. සුෂි හලකට ගොස් සුෂි කෑවෙමි. ගින්සාවෙහි හා ෂිම්බෂියෙහි අහු මුළුවල පිහිටි විසිතුරු කෝපි හල්වලට නැවත ගොස් සංගීතයට කන් දෙමින් නොරිකො සමග ඒ තැන්වල ගත කළ කාලය සිහි කෙළෙමි. එහෙත් මා විශේෂයෙන් ම සොයා ගෙන ගියේ අප දෙදෙනා සිරිතක් වශයෙන් නොයෙක් වර ගොස් බොහෝ වේලා ගත කළ "ලා පූපේ" නම් සාලාව ය. එහි පිහිටියේ ෂිබුයාහි බව මට හොඳින් මතක තිබුණු නමුත් හරියට කොයිබ දැයි මට නිච්චි නැත. මම වීදි හඳුනා ගැනීමෙහි දක්ෂයෙක් නොවෙමි. තෝකියෝ නගරයෙහි වීදි සොයාගැනීම මා වැන්නෙකුට පමණක් නොව, කාට වුව ද ඉතා ම අපහසු ය යි මම සිතමි. කෙනෙකු සටහනක් ඇඳ දුන්නොත් මිස, තැනක් සොයා ගත නොහැකි ය. කඩ සාප්පුවල නම්, විදිවල නම් ආදිය මට කියවිය නොහැකි හෙයින්, වඩාත් දුෂ්කර ය. එහෙයින් මා මං මුළා වී පැය ගණන් ඇවිදින වාරවල් අනන්තය. යන එන මිනිසුන්ගෙන් අසා ඔවුන්ට හිරිහැර කරන්ට ද මා අකමැති ය. මා කිසිවෙකුගෙන් තැනක් ඇසූ විට, ඔහු ඉතා උනන්දුවෙන් එය සොයා දෙන්නට වෑයම් කරයි. තමා නොදන්නා තැනක් නම්, ඔහු වෙන කෙනෙකුගෙන් අසා නැතහොත් මංසන්දිවල පිහිටි පොලිස් පළකින් විපරම්කොට එය දැන ගෙන මට විස්තර කර දෙයි. මට ඔහුගේ විස්තරය හොඳින් නොතේරුණොත් ඔහු මා සමග ගොස් මට තැන පෙන්වා දී යයි. කෙනෙකු මා සඳහා එතරම් වෙහෙස මහන්සි වූවිට, ඔහුට "බොහොම ස්තුතියි" පමණක් කියා යාම කෙළෙහි ගුණ සැලකීමක් වශයෙන් නොසෑහේ ය යි මට සිතේ. එහෙයින් මා කිසිවෙකුගෙන් පාරක් අසන්නේ බොහෝ අර ඇඳා බැරි තැන පමණ ය.

මා ගිය අවුරුද්දෙහි දැන සිටි ෂිබුයා නොවේ දැන් තිබෙන්නේ. එහි දැන් තෝකියු බුංකා කයිකං කියා විශාල ගොඩනැගිල්ලක් සාද තිබේ. විදුලි කෝච්චි පොළ සිට පොළාව යටින් මං හන්දිය එතර කර එගොඩින් මතු වීම සඳහා, කඩ සාප්පුවලින් යුත් උමඟක් එහි අලුතෙන් තනා ඇත. මේ සියල්ල නිසා, ෂිබුයාවෙහි කිසියම් තැනක් සොයා ගැනීම වඩාත් දුෂ්කර ය.

මා අඩු ගානේ පැයක් වත් ඔබ මොබ යන්ට ඇත. අධික සීතලය නිසා එළිමහනේ ඇවිදීම එතරම් ප්‍රීතිදායක නොවීය. මට "ලා පූපේ" සාලාව සොයා ගත නොහැකි විය. එය තිබුණේ කන්දක් උඩ බව මට හදිසියෙන් මතක් විය. මම කඳු බෑවුමේ පිහිටි වීදිය ඔස්සේ ගමන් ගත්තෙමි. ඒ දෙසට යන්ට යන්ට, පැරණි සලකුණු මට සිහි විය. මට ඉක්මණින්ම "ලාපූපෙ" සාලාව හමුවන බව මම දැන ගතිමි දකුණට හැරෙන අතුරු පාරකට මම පැමිණියෙමි. ඒ පාර ගියේකඳු ගැටයක් උඩට ය. දෙපසෙහි කෝපි සාලා හා අවන් හල් කීපයක් ද විය. දිග පොලුවල සවි කරන ලද දැන්වීම් පුවරු

WWW.EXPRESSLANKA.TK 87

අතින් ගත් මිනිස්සු හතර පස් දෙනෙක් හන්දියෙහි සෙමින් එහා මෙහා සක්මන් කරමින් සිටියහ. ඔවුහු වරින්වර අත් දික් කොට, යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන රූකඩ මෙන් ,ඒ මේ දෙස පිහිටි අවන් හල් පෙන්වති. මම කන්ද නැංගෙමි. "ලා පූපේ " යන නමින් යුත් සාලාවක් එහි නොවීය. ඒ පාර කෙළවර දක්වා මම ගොස් නැවත කන්ද පහළට බැස්සෙමි. මම වැරදි පාරක් ඔස්සේ ආවෙම් ද? "ලා පූපේ" තිබුනේ කන්ද මුදුනෙහි බව මට සිහි විය. එහෙත් මෙවැනි කඳු ගැට හා කඳු බෑවුමේ පිහිටි පාරවල් එමට ඇත. ඒ සියල්ලක් ම එක සමානය. මම නැවත කන්ද නැංගෙමි. "ලා පූපේ" තිබුණේ අහවල් තැන ය යි මට ඒ වේලේ නිශ්චය වශයෙන් කිව හැකි විය. එහෙත් එහි වූයේ වෙන ම හැඩහුරුකමක් දැරූ අලුත් ගොඩනැගිල්ලකි. "ලා පූපේ" සාලාවේ පෙනුම මට හොඳට මතක තිබුණි. එය මධ්‍යම කාලීන යුරෝපීය ශෛලියට සාදන ලද පැරණි ගොඩනැගිල්ලක් විය. එහෙත් මා ඉදිරියෙහි වූයේ අති නවීන ශෛලියෙන් තනන ලද ගෘහයෙකි. එය ද කෝපි සාලාවක් සේ පෙනිණි. එහි වීදුරු දොර ගාව, දැකුම්කලු යුවතියක් සිටගෙන අමුත්තන් පිළිගත්තාය. එහෙත් ඒ සාලාව "ලා පූපේ" නොවීය.

"ලා පූපේ" කියනකෝපි හල කොහේ ද තියෙන්නෙ" යි දැන්වීම් පුවරුවක් අල්වා ගෙන සිටි මිනිසෙකුගෙන් මම ඇසීමි.

ඔහු ඒ අලුත් ගොඩනැගිල්ල දෙසට අත දිගු කලේ ය.

"ඒක "ලා පූපේ" නොවේ. වෙන නමක් තියෙනව," යි මම කීවෙමි.

"පරණ "ලා පූපේ"දැන් නෑ. ඒ ගොඩනැගිල්ල කඩල අලුතෙන් හදල," යි ඔහු කීවේය.

මේ ආරංචිය අසා මගේ සිතෙහි මහත් කනස්සලක් ඇති විය. මා තෝකියෝවට ඇවිත් එහි ගිය අවුරුද්දේ තිබුණු දේ සෙවීම නිෂ්ඵල වෑයමක් බව මට පෙනිණි. ඒ සියල්ල, ලකුණක් වත් ඉතිරි නොවන පරිදි මැකී ගොස් ය. දැන් තිබෙන්නේ, ගිය අවුරුද්දෙහි වූ තොකියෝ නගරය නොවේ. කාලය නැමති සැඩ පහරින් අතීතය සෝදා ගෙන ගොස් ය. මා යළිත් ඒ දෙසට අත දිගු කළ ද, එල්ලී රැඳී සිටීමට සැමරුම් මාත්‍රයකුදු ශේෂ වී නැත. නොබෝ දවසකින් මම ද ඒ සැඩ පහරට ගොදුරු වෙමි.

පසු ද උදේ මා ස්වල්පයක් කලින් නැගිට්ටේ, නොරිකො සමග වචනයක් හුවමාරු කිරීමට ඉඩක් ලැබේ ද කියා බලන්ට ය. ඇගේ කාමරය, කෑම කන කාමරයට අල්ලපු කාමරය විය. ඈ තම පියාගේ ඡායාරූපය ඉදිරියෙහි හඳුන් කූරු දල්වමින් සිටි බව, අඩක් ඇර තිබුණු දෙරින් මට පෙනිණි. මා තේ කෝප්පයක් සාදා ගෙන බොන අතර, ඈ පැමිණියාය.

"මම ඊයෙ හැම තැන ම සෙව්ව "ලා පූපේ" සාලාව. ඒක කඩල දල අලුත් ගොඩනැගිල්ලක් හදල එතන," යි අනික් අයට නො ඇසෙන සේ මම කුඩා හඬින් කීවෙමි.

මේ ආරංචිය ඇසුණු විට, මගේ සිතෙහි මෙන් නොරිකොගේ සිතෙහි ද කනස්සල්ලක් ඇති වේ යයි මම සිතුවෙමි. එහෙත් ඈ කතා කෙළේ "ලා පූපේ" යනු කුමක්දැයි පවා නොදන්නා සේ ය.

"ආ එහෙම ද?" යි ඈ ඇසීය.

WWW.EXPRESSLANKA.TK 88

"දැන් තෝකියෝ එහෙම් පිටින් ම වෙනස් වෙලා," යි මම කීවෙමි. "ඔව් අලුත් ගොඩනැගිලි හුඟක් ඇවිල්ල නෙ?"

මගේ වචනවල සැඟවී ඇති වෙන තේරුමක් තමාට අවබෝධ නුවූවා සේ ඈ කතා කළාය.

නොරිකො කාර්යාලයට ගිය පසු මම චියෙකො සමග බොහෝ වේලා කතා කරමින් සිටියෙමි.

"හැබැවට ම, ඇයි නොරිකො සං වෙන වැඩක් සොයා ගන්නේ නැත්තෙ? ඔහොම නරක නෙ රෑ වෙන කල් හැමදා ම වැඩ කරන එක."

"ඔව්, ඒක නං ඇත්ත," යි චියෙකො කීවාය. "ඒත් වෙන කන්තෝරුවලට ගිහිල්ල ආයෙමත් පුරුදු වෙන කල් අමාරු නෙ? එයා හරි ලජ්ජාකාරි. නුමුත් එයාගෙ ඇඟ දුර්වලයි. ජනවාරි මාසෙ ආයෙමත් හැදුණ පපුවෙ අමාරුව."

"පපුවෙ අමාරුව?" යි මම ඇසීමි. නොරිකො අසනීපයෙන් සිටි බවක් මට දැන ගන්ට ලැබුණේ එවෙලෙහි ය.

"ඔව්, එයාට හැදුණ දැන් අවුරුද්දකට විතර ඉස්සර, පපුවෙ අමාරුවක්. තුන් මාසයක් ඉස්පිරිතාලෙ හිටිය. මේ පාරත් හැදුණෙ ඒක තමයි."

"එහෙනම් හොඳ නෑ කොහොමටත් වැඩ කරන්න."

"එක්ස් රේ ගත්ත. දැන් අමාරුවක් නැතෙයි කියල දොස්තර කියනව. ඒ වුණත් ඔය තරම් මහන්සි වෙන එක නම් හොඳ නෑ තමයි."

"මොකො ද ඉතින් කරන්න යන්නෙ? ඔහොම දිගට ම වැඩ කරගෙන යන්න ද කල්පනාව, ආයෙමත් ලෙඩ වෙන කල්?" යි මම ඇසීමි.

"කසාද බැන්දෙත් තමයි එයාට හොඳ. එතකොට ගෙදර හිටිය හැකි නෙ."

"මොකො ද නොරිකො සංගෙ කල්පනාව? කවුරු හරි ඉන්නවා ද?"

"දන්නෙ නෑ," යි කියා චියෙකො සිනාසුණාය. තමා එළිදරව් කරන්ට අකමැති වූ කිසිවක් ඈ දැනගෙන සිටිනවා ඇතැයි මම සැක කෙළෙමි. මම ඇගෙන් තවත් ආරංචි දැනගන්ට වෑයම් කෙළෙමි.

"කන්තෝරුවෙ ම කෙනෙක් බැන්දෙත් නොරිකොට වැඩ නවත්වන්න වේවි ද?"

"සමහර කන්තෝරුවල බැඳපු අයට රස්සාව දෙන්න කැමති නෑ. ඒත් සමහර කන්තෝරුවල අඹු සැමි දෙන්න ම එකට වැඩ කරනව. මේ කාලෙ එක් කෙනෙක් විතරක් වැඩ කරල ගෙදර වියදම සොයා ගන්න අමාරුයි."

"බැන්දයින් පස්සෙ වැඩ කෙරුවත්, එකම කන්තෝරුවෙ නම් වඩා පහසුයි නේ ද?" යි මම ඇසීමි.

එහෙත් චියෙකො මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම මග හැරියාය.

WWW.EXPRESSLANKA.TK 89



11

තෝකියෝවට ඒමෙන් මට සිදු වූයේ මගේ සන්තාපය වැඩි වීම පමණ ය. කියෝතෝවෙහි දී ද මගේ සිතට එක මොහොතක වත් සැනසිල්ලක් නොලැබුණු නමුත් මම කෙසේ හෝ ඉවසාගෙන් සිටියෙම් නම් මගේ දුක කෙමෙන් නිවී යන්ට තිබිණැයි මට සිතුණි. මෙ තෝකියෝවට ආවේ නොරිකො හමු නොවී විසිය නොහැකි නිසාය. එහෙත් මට හමුවූයේ මා කලින් දැනගෙන සිටි නොරිකො නොවේ. ඈ දැන් වෙන ම ස්ත්‍රියක් ය. මා ඇගේ සමීපයට ආ නමුත්, ඈ මා කෙරෙන් බොහෝ ඈත් බව මට අවබෝධ විය. ඇගේ සිත එතරම් වෙනස් වූයේ නම්, ඇයි ඈ මගේ ඒමට අනුබල දුන්නේ? හිදෙජිගේ ලියුම ලැබුණුවිට, මම තෝකියෝවට නොඒමට තීරණය කර ගතිමි. ඒතීරණය අනුව මට ක්‍රියා කරන්ට නුදුන්නේ ඈය. මම එ වේලේ නො ආවෙම් නම් මට කුමක් වේ දැයි මම නොදනිමි. එහෙත් කුමක් වෙතත් මට මෙබඳු දුකක් නම් විඳින්ට වන්නෙ නැත. මට දැන් සිදු වූයේ මහත් අකරතැබ්බයකි. මට මෙහි සිටිය නොහැකිය. ආපසු යාමට ද

මගක් නැත. තමා කළ වරදේ බරපතලකම නොරිකොට නොතේරෙනවා ඇත. තෝකියෝ වැනි විශාල නගරයක කෙනෙකු තනි වීම කෙතරම් භයානක දැයි නොරිකො නොදනී. කවර ලෙසකින් කාලය ගත කරන්ට ද කියා ය, මා නිතර කරදර වූයේ, එතරම් විවේකයක් මට කිසි කලක ලැබෙන්නේ නැත. දවසේ විසි හතර පැය මගේ වැඩ කටයුතු හමාර කිරීමට මදි වාගේය, මට කලින් නම් දැනුණේ. විවේකයෙන් කල් යැවීමට මට පුරුද්දක් නො තිබිණි. දැන් මේ කාලයෙන් ප්‍රයෝජනයක් ගත යුතු යයි මම සිතුවෙමි. එවිට මගේ සිත් තැවුල ද මට අමතක කළ හැකි ය.මම කොකුසයි බුංකා ෂිංකොකයි පුස්තකාලයට ගියෙමි. වරක් මිතුරෙක් මා එතනට ගෙන ගොස් පුස්තකාලය බාර තැනැත්තා මට හඳුන්වා දුන්නේ ය. දෙවෙනි වර පුස්තකාලය සොයාගෙන යාමට මට පැය දෙකක් පමණ ගත විය. අන්තිමට මා තැන සොයාගෙන පැමිණි විට, එහි සේවයෙහි යෙදී සිටි ස්ත්‍රීහු තිදෙනෙක් දවල් ආහාර කමින් සිටියහ. පළමු ද ගිය වේලේ මා ඔවුන් දුටුවේ නැත. ඔවුහු මා දැක මඳක් කලබල වූහ. ඔවුන් කෑම කන වේලේ මා පැමිණීම නොයුතු යයි මට සිතිණි. පුස්තකාලය බාර තැනැත්තා පළමු දින මට දුන් කාඩ්පත මම ඔවුන් ඉදිරියෙහි තැබුවෙමි. ඉංගිරිසි පොත් තිබෙන රාක්කය දෙසට ඔවුහු මා ගෙන ගියහ. එහි ජපානය ගැන ලියන ලද නොයෙකුත් වැදගත් පොත් තිබිණි. ඉංගිරිසියෙන් වුව ද ගෙංජි මොනොගතරිය කවද නුමුත් සම්පූර්ණයෙන් කියවිය යුතු යයි මගේ අධිෂ්ඨානයක්විය. එහෙත් මට එබඳු කටයුත්තක් සඳහා සිත එකඟ කරගත නොහැකි ය. අවුරුදු පනහකට පමණ උඩ දී පරිවර්තනය කරන ලද නාට්‍ය පොතක් මට හම්බ වීය. එහි ඇතුලත් නාට්‍යයන් අතර, මා දිනක් තෝයෝකො සාලාවෙහි දුටු නාට්‍යයක් ද විය. එය දුටු වේලේ මට එය හොඳින් අවබෝධ නොවීය. වළං සාදන්නෙකු, තම වළඳට අමුතු වර්ණයක් කැවීම සඳහා දැරූ ප්‍රයත්නය ඒ නාට්‍ය යෙන් කියවිණි. අවසානයෙහි තම උදුනට දර ගැනීමට වත් මුදල් සොයා ගත නොහැකි වූ ඔහු තම ගෙට ගිනි තබා වළඳ පිලිස්සූ සැටි එහි දැක්විණැයි මම සිතමි. ඉංගිරිසි පරිවර්තනයේ පිටු දෙකක් පමණ මම කියෙව්වෙමි. ස්වල්ප වේලාවකින් මම පොත පසෙකින් තබා, පසු ව ඇවිත් එය බැලීමට අදහස් කරගෙන, පුස්තකාලයෙන් පිට ව ගියෙමි.

බස් පොළේ දී, මා කලින් දැන සිටි අමෙරිකානු ස්ත්‍රියක් මට හමු විය. ඈ සෙසු අමෙරිකානු ස්ත්‍රීන් මෙන් නොව, මුදු මොළොක් කතාවෙන් යුතු රූමත් තරුණියක් වූවාය. ඇය මට පළමු වරට හමු වූයේ ඇගේ ස්වාමියා සමඟ ය. ඔහු අවලස්සණ මුහුණකින් යුත් දැවැන්ත පුරුෂයෙක් විය.

"පුස්තකාලයට ගියා ද?" යි ඈ මගෙන් ඇසුවා ය. "මම එතනට ගිහිල්ලා තමයි මේ ආපහු යන්නේ."

WWW.EXPRESSLANKA.TK 91

පුස්තකාලයෙහි ඇය සිටිනු මම නුදුටුවෙමි.

"හොඳ පොත් ටිකක් තියෙනව ඒකෙ නේ ද?" යි මම ඇසීමි.

"ඔව්, ජපානය ගැන ලියවෙල තියෙන ඉංගිරිසි පොත් බලන්න නම් මේ පුස්තකාලයට තමයි එන්නෙ ඕන."

මා කොයිබ යන්ට දැයි තීරණය කර නොතිබුණු හෙයින්, ඇය නැංග බසයට මම ද නැංගෙමි.

"මම කන්දවලට යනව පොත් සාප්පු බලන්න. හරි ම වටින පරණ පොත් හම්බ වෙනව එහේ," යි ඈ කීවාය.

"පරණ උකියො-එ සිතුවමුත් හම්බ වෙනව ලාබෙට නේ ද?"

මා ද කන්දවට ගොස් හො පොත් ටිකක් මිල දී ගත යුතු ය. එහෙත් මට දැන් පොත් කියවන්ට සිතක් නැත. මේ ස්ත්‍රිය කොයි තරම් වාසනාවන්ත ද! ඈට කිසි තැවුලක් නැත. ඇගේ සිත සන්සුන් ය. ඈ නිදැල්ලේ පුස්තකාලයට ගොස් පොත් කියවයි. පොත් සාප්පුවලට ගොස් දුර්ලභ පොත් ගනියි. මට එවැනි සෙතක් ලැබිය නොහැකි ය. මට කවද ද ආයෙමත් එසේ නිවී සැනසිල්ලේ කාලය ගත කරන්ට ලැබෙන්නෙ?

අමෙරිකානු ස්ත්‍රියගේ අතෙහි කුඩා අලුත් පොතක් විය.

"මේ පොත දැකල තියෙනවද? මට පුස්තකාලයෙන් හම්බ වුනා. අකුතගාවාගේ කතාවල අලුත් පරිවර්තනයක්."

පොත ගෙන මම බැලුවෙමි. එහි වූ සමහර කතා මා කියවා තිබුණු බව මට සිහි විය.

"අකුතගාවාගෙ කතා හරි ම අමුතු යි නේද?" යි මම කීවෙමි.

"මම අද කියෙව්වෙ මේකෙ තියෙන ජිගොකුහෙන් කියන කතාව. හරි ම භයංකරයි. අකුතගාවාට පුදුම විදියේ කල්පනා ශක්තියක් තියෙන්න ඇති."

ඒ නමට හුරු නමක් ඇති කතාවක් මා කියවා තිබුණු බවක් මට යන්තම් සිහිවිය.

"ඔව්, ඔව් මට මතකයි. ඒකෙ නේද එක ස්ත්‍රියක් තමාට අනියම් ආලයක් බැඳගෙන, තම පුරුෂයා මරන්ට ආපු තරුණයෙකුට, පුරුෂයා නිදන තැන පෙන්වනවා ය කියා, තමා එතන සිට, ඒ තරුණයාගේ කඩු පහරට ගොදුරු වෙලා මැරුම් කෑවේ?"

"නෑ. ඒ ජගොකුමොන් චිත්‍රපටියෙ කතාව නේ ඔය කියන්නෙ? ඒක කිකුචි කංගෙ නාට්‍යයකින් ගත් කතාවක්"

මගේ නොදැනුම්කම ගැන මට ලජ්ජා සිතිණි. මම තැන් තැන්වල ඇවිදිමින් නිකරුණේ කාලය ගත කරමි. මේ ස්ත්‍රිය ජපානය ගැන නොයෙකුත් දේ ඉගෙන ගනිමින් ප්‍රයෝජනවත් ලෙස දවස් ගෙවයි.

බසය කන්දවලට පැමිණි විට, ඈ මා දෙස ළගන්නා සිනාවක් හෙළා, මට අත වනා, බැස ගියාය. මම තවත් දුර එම බසයෙන් ගොස්, මා

WWW.EXPRESSLANKA.TK 92

නොදන්නා පෙදෙසක දී ගොඩ වී, කෝපි හලකට ගියෙමි. එහි වූ සේවිකාවන් තිදෙනා, උනුන් ගාවට ළංවී මා ගැන කිසිවක් කියනු මම දුටුවෙමි. අනතුරුව එක් තරුණියක්, වතුර වීදුරුවක් ගෙනැවිත් මගේ මේසය මත තබා, මට මේනු පත දුන්නාය. කෝපි ගෙනෙන මෙන් මම ඇයට අණ කෙළෙමි.

සාලාවේ ඇතුළෙහි පිටතට වඩා උණුසුම් විය. එහෙත් මා සිටි තැන මට අධික සීතලයක් දැනුණි. සේවිකාව මේ බව තේරුම් ගෙන දොර් ගැස් ලිප ගාව තිබුණු අසුනක වාඩි වෙන මෙන් මට ආරාදනා කළාය.

ඒ වේලාවෙහි කෝපි හලෙහි වැඩි දෙනෙක් නොවූහ. තරුණ යුවලක් කරට කර අත් දමාගෙන, ඉඳ හිට කොපි උගුරක් බොමින්, මුල්ලකවූ අසුනක වාඩිවී සිටියහ. තැටිවල මාර්ගයෙන් කෙරුනු හීන් සංගීත හඬක් සාලාවෙහි පාවෙමින් තිබුණි. එක් පසෙක, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අඳින කළු කබායකින් සැරසී, කළුකැප් තොප්පියක් ද හිසෙහි ලා ගත් තරුණයෙක් , මඳ එළියෙහි පොතක් කියවමින් සිටියේ ය. ඒ එළියෙන් ඔහුට කෙසේ අකුරු පෙණුණේ දැයි මම පුදුම වීමි. මම ද පුවත් පතක් කියවන්ට තැත් කෙළෙමි. එහෙත් නොබෝ වේලාවකින් මගේ දෑස රිදෙන්ට විය.

මා ඉතා හෙමිහිට, අගුරු උගුර බැගින් කෝපි බිවූ නමුත්, පැය බාගයක් ගත වන්ට පෙර මගේ කෝපි කෝප්පය හිස්විය. මී ළඟට මා කෙසේ කාලය ගෙවන්ට ද? තවත් කෝපි කෝප්පයක් ගෙනෙන්ට කිව්වොත්, සේවිකාවන් පුදුම වෙනවා ඇත. ඇරත්, මට තවත් කෝපි බීව නොහැකි ය. මගේ අත වෙවුලයි. මගේ පපුව ද නිතර ම වේගයෙන් ගැහෙයි. අධික ලෙස කෝපි බීම මගේ ශරීරයට ඔරොත්තු දෙන්නේ නැත. මේ කෝපි බොහෝම සැරයි. කොපමණ කිරි දැම්මත්, කසායක් වගේ තිත්තයි.

මම කෝච්චියක නැග පුළුවන් තරම් ඈත ගොස්, සවස් වන විට සංගෙජයාවට යාමට සිතා ගත්තෙමි. කවර අතකට යන එකක් වුව ද මම පළමුවෙන් එන කෝච්චියෙහි නගිමි. ආපසු එනවිට, කිසිවෙකුගෙන් මාර්ගය අසා මට එන හැකි ය.

මා කුමක ද විහිත් මෙවැනි දුකක් විඳින්නේ? තෝකියෝවේ කෝච්චිවල තෙරපී තෙරපී යාම කවර විනෝදයක්ද? මිනිස්සු තල්ලු කර කර නගිති, බසිති. තල්ලු වීගෙන, තල්ලු වීගෙන එක පැත්තකට ගොස් දර ගාව තද වුණු එක් ස්ත්‍රියකගේ දෑස කඳුළුවලින් පිරුණු සැටි මම දුටුවෙමි. ගෙදර හා වෙනත් තැන්වල දී මේ තරම් විනීත ලෙස හැසිරෙන ජපනුන්, ඇයි කොච්චිවලදී, බස්වලදී මෙසේ රකුසන් ලෙස හැසිරෙන්නේ? ලොකු පොට්ටනි අතින් ගෙන කෝච්චිවලට ඉතා අමාරුවෙන් ගොඩ වන කුඩු මැහැල්ලන්ට වුවද, පිරිමියෙක් නැගිට අසුනක් නොදෙයි. දෙකට නැවී, පටිවල එල්ලීමට තරම් වත් උස නැති ඒ මැහැල්ලන්ගේ මුහුණුවල නැතක්

WWW.EXPRESSLANKA.TK 93

කම්කටොලුවල ඉරි ඇඳී තිබේ..... මට හුස්ම ගන්ට වත් ඉඩක් නැත. පිටත කිසිවක් නොපෙනේ. කුමක් ද මා මේ යන ගමනේ අර්ථය?

"සිහි වා ෂිබුයා දෙ ගොසයිමසු- මළුදෙ අරිගතො ගොසයිමසු- තයිහෙං කොම්මෂිතා..."[1]

නියමුවාගේ හඬ කන්දෙස් කිරියාවකි. තදබද වූ බව සැබෑයි. කුමට ද ඒ ගැන පුන පුනා කියන්නෙ? ඇයි මේ තරම් සෙනග පටවන්නේ? මගියන්ගෙන් සමාව අයැදීමෙන් සියල්ල හරි යාවි ද? මීළඟට ෂිබුයා. එපමණයි. සැනසීමකට ඇත්තේ.

එද මා ආපසු සංගෙංජයාවට ගියේ සවස පහමාරට පමණ ය. ඉතා වෙහෙසට පත් ව සිටි හෙයින් මම කාමරයට ඇතුල් වී, මෙට්ටය බිම එලාගෙන, හාන්සි වූයෙමි. චියොකා කෑම පිසන අතර හිදෙජි සමග කතා කරනු මට ඇසිණ. ඉඳ හිට ඈ සුරතල් ස්වරයකින්,

"යුකිකො චං, හොඳ ළමයා නෙ. දඟ කරන්න එපා," යි කීවාය..

ස්වල්ප වේලාවකින් ඈ මට අඬ ගැසුවාය.

"දෙවෙන්දෙරා සං, කෑම කමුද"

අපි තිදෙනා කමින් සිටින අතර නොරිකො පැමිණියාය. ඇය වේලාසනින් ගෙදර ආ නිසා අපි කවුරුත් පුදුම වීමු.

"ආ, නොරිකො සං අද කලින්?" යි කියමින් චියෙකො නැගිට ඇය සඳහා අමුතුවෙන් එලවළු හා මාළු ලිපේ තැබුවාය.

අපි වෙන දට වඩා කලින් කා බී අවසන් වූයෙමු. වෙන ද අපි මේසය ගාව වාඩි වී, නොරිකො පැමිණෙන තෙක් රෑ බෝවෙන තුරු කතා බහ කරමින් සිටිමු. ඈ ආවායින් පසු චියෙකො නැවත තේ වක්කරයි. අපි තේ බොමින් තවත් පැයක් හමාරක් ගත කරමු. මා හිදෙජි සමග බර සාකච්ඡාවක යෙදී සිටින අතර, නොරිකො හා චියෙකො එකතු වී අප ගැන නොයෙකුත් දේ දොඩයි. විහිළු තහළු කියයි.

"සහෝදරයො දෙන්නෙක් වගේ ," යි නොරිකො කියනු මට ඇසේ.

"හැබෑවට ඔව්. හිදෙජි සංගෙ නහයත් උසයි නෙ? කන් දෙකත් ලොකුයි. ඇස් විතරයි ටිකක් වෙනස්. දෙවෙන්දෙරා සංගෙ මල්ලී වගෙයි,"යි චියෙකො කියයි.

ඈ කිසිවක් නොරිකොගේ කනට කොඳුරයි. දෙදෙනා ම සිනාසෙති.

"ඇයි හිනා වෙන්නෙ?" යි මම අසමි.

"චියෙකො සං කියනව, දෙවෙන්දෙරා සංගෙ මූණ දිහා කොච්චර වෙලා බලන් හිටියත් එපා වෙන්නෙ නෑ කියල," යි නොරිකො කියයි.

---

1. මී ළඟට ෂිබුයා නැවතුම් පළ, මහතුනි. අනේක වාරයක් ස්තුතියි. සමාවෙන්න බොහොම තද බද වුණා.

"බොරු කියනව, මූණිච්චාවට," යි මම ලජ්ජාවෙන් මිරිකෙමින් කියමි.

නෑ ඇත්තමයි, හැම තිසේසෙ ම වෙනස් වෙනව. විනාඩි දෙකක් එක වගේ නෑ. ජපනුන්ගේ මූණු පොඩ්ඩක් වත් වෙනස් වෙන්නේ නෑ. හැම තිස්සෙම එක වගේ," යි වියෙකො කියයි.

එද සවස අපි ගී ගැයීමු. මට සින්දුවක් කියන්ට යි නොරිකො අයැදුවාය. මා ගිය අවුරුද්දේ ගැයූ විට ඇ ඉතා කැමති වූ සින්දුවක් මට සිහි විය. "හරි දුක සින්දුවක්," යි වියොකා කීවාය. "සාන්ත හැඟීමක් ඇති කරවන විදියෙ තාලයක්."

අපි සියලු දෙනා ම එකට එය ගායනා කෙළෙමු. "ලංකාවේ සින්දු ඔක්කො ඔය වගේ ද?" යි වියෙකො ඇසුවාය.

"නෑ වෙන විදියෙ සින්දු තියෙනවා," යි මම සිනාසෙමින් පිළිතුරු දුනිමි.

"දෙවෙන්දෙරා සං කැමති දුක් සහිත තාලවලට නෙ."

"මම කැමතියි ජපන් ගැමි ගීවලට. කියන්න එකක්,"යි මම වියෙකොට ආරාදනා කෙළෙමි.

"ආනේ මට බෑ සින්දු කියන්න. ඔන්න හිදෙජි සංට කියන්න. එයාගේ කට හඬ හරි ලස්සණයි."

"කියන්න හිදෙජි සං," යි මම පෙරැත්ත කෙළෙමි. "කියන්න"ඉත්සුකි නො කොමොරි උතා"කියන දරු නැලවිල්ල. මං ඒකට හරි ආසයි."

"ඒකත් කනගාටු දයක සින්දුවක් නෙ? ඒකයි දෙවෙන්දෙරා සං කැමති." යි වියෙකො කීවාය.

හිදෙජි ඒ ගැමි ගීය ගායනා කෙළේ මා සාමාන්‍යයෙන් අසා පුරුදු නාසිකා හඬින් නො ව, උගුර යටින් උපදවන ලද මන්ද්‍ර ස්වරයකිනි. ඔහුගේ ලොකු කට හඬ ගේ පුරා පැතිරී යත් ම, අප සියලු දෙනා තුළ ම මහත් කාන්සියක් පහළ විය. දිනක් කියෝතෝ නගරයට ආසන්න ව පිහිටි, පුරාණ රාජධානියක් වූ නරා නගරයට මා ගොස්, පන්සල් හා දේවාල බලමින් ඇවිද්ද අතර, යුද්ධයෙහි දී එක් කකුලක් කැඩුණු භටයෙක්, සුදු ඇඳුමක් හැදගෙන, අතින් ගත් පියානෝ එකෝඩියනයක් වයමින්, ඒ ගීය ගැයූ සිටි මට සිහි විය. යන එන අය, ඔහුගේ උරහිසින් එල්ලුණු පිං පෙට්ටියට යෙං දහයේ කාසියක් දමා ගියෝය.

මම දුප්පත් හිඟන කෙනෙක්,
යන්තමින් දෙවේලෙ යැපෙන,
ඒ අය නම් පෝසත් අය,
පළඳින හොඳ සිනිඳු ඇඳුම්.

WWW.EXPRESSLANKA.TK 95

මළවුන්ගේ අවුරුදු ද
තමයි මගේ අන්තිම ද.
අවුරුදුද ගෙවී යත්ම
මම මෙතනින් තුරන් වෙනව.

ඉක්මනින් ම නැවත එතොත්
මළවුන්ගේ අවුරුදු ද,
මටත් නැවත එන්ට ඇහැකි
මළ ගිය ඇත්තන් කැටුව ම.

මම මැරුණයි කියල කවුද
ඔය හැටි දුක් වෙන්ට ඉන්නෙ?
පිටි පස්සේ කඳු ගැටයේ
රැහැයියො නම් ඔහෙ හඬාවි.

මගේ හුස්ම ගිය දකට
පාර අයිනෙ වළ දමාවි,
යන එය අය සොහොන උඩට
මලක් වීසි කරල යාවි.

මොන මලක් ද විසි කරන්නෙ?
සුබකි මලක් විසි කරන්නෙ.
කවුද දිය බිඳක් ඉහින්නෙ?
අහසෙ දෙයියො දිය ඉහින්නෙ.

"අද වතුර උණු කරල තියෙනවා. දෙවෙන්දෙරා සං නානව නම් ඉස්සෙල්ලා නාන්න,"යි චියෙකො කීවාය.

"එපා, මං අද නාන්නෙ නෑ. සීතල වැඩියි"

"සීතල කොට එපාය නාන්න. නැවම සීතල අඩු වෙනව. නොරිකො සං නානවය.?"

"පස්සෙ,"යි නොරිකො කීවාය.

හිදෙජි හා චියෙකො ද නා තම කාමරයට ගියහ. නොරිකො සහ මම එතෙක් වේලා සින්දු කියමින් කෑම කන කාමරයෙහි සිටියෙමු. ඈ ගිය අවුරුද්දේ මගේ නිවසට ගෙන ආ සින්දු පොත එද එළියට ගත්තාය. අපි පරණ සින්දු කීපයක් ගැයීමු.

හිදෙජි සහ චියෙකො නින්දට ගිය හෙයින්, මම ද නැගිට මගේ කාමරය දෙසට ගියෙමි. නාන කාමරය පිහිටියේ මගේ කාමරයට ඉදිරි පසින් ය.

"වතුර තාම උණු ද කියල බලන්න ඕනෑ," යි කියමින් නොරිකො නාන කාමරය දෙසට ගියාය.

දොර ළඟ දී මම ඇය අතින් ඇල්ලුවෙමි. මම ඇගේ දෑස දෙස බලාගෙන මඳ වේලාවක් සිටියෙමි.

"මාව මරන එක මීට වැඩිය හොඳයි.

මාව මරන්න."යි මම ඇට කීවෙමි.

"දැන් ඉස්සර වගේ නෙවේ."යි ඇ කීවාය.

ඇ මගේ අත ගසා දැම්මාය.

ඒ වචනවලින් මගේ මුළු සිරුර ම දැවී ගියේය.

"හැබැවට, එහෙම ද? මට ඒක තේරුණා. ඇයි එහෙම නම් මට එන්නෙයි කිව්වෙ?"

ඇ තම කාමරය තුළට පිවිසුණාය.මම ද මගේ කාමරයට ගොස්, ඇ ගිය අවුරුද්දේ මට සිහිවටනයක් වශයෙන් දුන් වෙස් මුහුණ මගේ සාක්කුවෙන් ගෙන, ඇගේ කාමරයේ දොරපසකට තල්ලු කර, ඇදුම් රාක්කය මත තැබුවෙමි. ඊ ළඟට මම මගේ කාමරයට ගොස් දොර වසා ගත්තෙමි. මට කිසිවක් ගැන සිතන්ට වුවමනා නොවීය. මට වුවමනා කෙළේ සුව නින්දෙන් නිදන්ට ය- මේ ලොව සියල්ල අමතක කොට නිවී හැනහිල්ලේ සැතපෙන්ට ය- තවත් අවදි නොවන්ට-මේ වේදනාවට තවත් ගොදුරු නොවන්ට. අධික ලෙස වෙහෙසවූ කලක මෙන්, අත් පාවල රිදුම කෙමෙන් අඩු වී ගෙන යනු දැනී දැනී මට නින්ද වැටේ නම්....මගේ ලාච්චුවෙහි නිදන බෙහෙත් ගුළි බෝතලයක් තිබිණි. ගත වූ කාලය තුළ දී අපමණ වරක් රෑ නොනිදා පහන් කිරීමෙන් ගත සිතට වූ පීඩාව ඉවසිය නොහැකි වූ හෙයින් මා ඒ බෙහෙත් පාවිච්චි කරන්ට පටන් ගෙන තිබුණි. බෝතලයෙන් බාගයක් පමණ ඉතිරි වී තිබිණි. වතුර උගුරක්වත් නොබී බෝතලය හිස් වන තෙක් මා ඒ ගුළි ගිලගෙන යන්ට ඇත. අනතුරුව මෙට්ටය බිම එලාගෙන මම වැතිර ගතිමි. පළමුවෙන් නින්ද ගියේ මගේ කයට ය. එක් එක් අවයවය, එකකට පසු අනික, නිදන්ට වදිනු මගේ සිතට දැනිණි. එතෙක් වේලා මගේ සිත අවදියෙන් මේ සියල්ල කෙමෙන් සිදු වනු බලාසිටියේ ය. මම නැගී සිටින්ට තැත් කෙළෙමි. එහෙත් මගේ අවයව ක්‍රියාත්මක නැත. අවයවයන්ට පටහැණි ව ක්‍රියා කරන්ට යෑමෙන් කුමණ ඵලයක් ද? අවයවයන්ට ඉඩ දීම ඊට වඩා සැපතකි. තවත් අවදි වන්ට මම බලාපොරොත්තු නොවෙමි. එකෙණෙහි මගේ සිතෙහි වියේ දුකකක් හට ගැනුණි. ඈත ගම රටෙහි සිටින මගේ නෑදෑ මිත්‍රයෝ හදිසියෙන් මගේ සිහියට ආහ. මට ඔවුන් තවත් දකින්ට නොලැබේ. ඇයි මා නිදන බෙහෙත් ගිලගෙන ගිලගෙන ගියේ? එහෙත් පසුතැවිලි වීමට වුව ද මට ශක්තියක් නැත. මගේ සිත ද සිරුරේ අවයවයන් පසු පස්සේ ගමන් කරයි. නොබෝ වේලාවකින් සියලු ඕනෑ එපා කම්වලින් තොර වූ එක ම නිෂ්ක්‍රිය ගතියකට පත් වේ.

පසු ද උදේ, කිසිවෙකු මගේ ඇඟ තදින් සොලවා, මගේ කනට ලොකු හඩකින් යමක් කියනු මට දැනිණි.

"දෙවෙන්දෙරා සං, මෙන්න පත්තරේ, නැගිටින්න, මෙන්න පත්තරේ." අමාරුවෙන් දෑස හැර බැලූවිට මට පෙනුණේ නොරිකොය. ඈ මා ළගින් උදේ පත්තරය දමා, මගේ අතෙහි ලියුමක් තැබුවාය. තිදි මතෙන් ම මම ලියුම කොට්ටේ යටට දමුවෙමි. ඈ දෙර වසාගෙන ගියාය.

එවෙලේ ම මට නැවත නින්ද ගියේය. මා අවදි වූ විට, උණ ගැනී සිට සුව ලැබූ කලක මෙන්, මගේ අත පයේ දුර්වල ගතියක් මට දැනිණි. එය අප්‍රසන්න හැඟීමක් නොවීය. එය තියුණු වේදිතයන්ගෙන් තොර වූ උපේක්ෂා සහගත හැඟීමකට සමාන වූවකි.

නොරිකො දුන් ලියුම මම කොට්ටේ යටින්ගෙන කියවා බැලීමි.

"ඊයේ මුළු රෑ ම මම අවදියෙන් සිටියා. ඔබටත් නින්ද යන්ට නැතැයි මම සිතනවා. ඔබ මගේ වෙස් මුහුණ ආපසු දුන් නමුත්, මම ඔබේ වෙස් මුහුණ ආපසු දුන්නේ නෑ.

"මම ඔබට තෝකියෝවට එන්ට කීවේ, ඔබ සමග නොයෙකුත් දේ කතා කර ගැනීමටයි. ඒත් ඊට අවස්ථාවක් අපට ලැබුණේ නෑ. ඊයෙ මම සිතාගෙන සිටියේ හමුවන පිළිවෙළක් යොද ගන්ටයි. ඔබ මට කී වචන අසා මම බය වුණා.

"තාත්තා මළ ද සිට මම ඉටා ගත්තෙ, සාමාන විවාහයක් කරගෙන ජීවත් වෙන්ටයි. ඔබ සමග ඇති කර ගන්නා සම්බන්ධකම් විවාහයකින් කෙළවර වෙන්ට බැරි බව මම දන්නවා. මගේ නෑදෑයන් ද විරුද්ධ වන බව නිසැකයි. මම මැරුණු දට, නකජිමා සොහොනට ඇතුල් වෙන්ට කැමතියි, තාත්තත් අම්මත් සමග. දැන් මට විවාහ යෝජනාවක් තිබෙනව. එයා මම වැඩ කරන කාර්‍යාලයේ කෙනෙක්. මම එයා කෙරෙහි අමුතුවෙන් පැහැදිලා නෑ. ඒ වුණත් ඒ යෝජනාව පිළිගන්නයි මම අදහස් කරන්නෙ.

"ඔබ තෝකියෝ නගරයේ ගත කරන කාලය හැකි තාක් ප්‍රීතිමත් කිරීමටමට පුළුවන් දේ කරන්ට සතුටුයි."

ඒ ලියුම කියවීමෙන් මා තුළ අමුතු දුකක් හෝ ප්‍රීතියක් හෝ ඇති නොවීය. මගේ සිත, කිසිවක් තියුණු ලෙස අවබෝධ නොවන ගතියකින්- එක්තරා ජඩ බවකින් දැවටී තිබිණි. ඒ මා බිවු බෙහෙත්වල ප්‍රතිඵලය වන්ට ඇතැයි මම සිතුවෙමි. කිසිවක් ගැන තියුණු වේදනාවක් නොවිඳ, මෙවැනි ජඩ බවකින් ම ජීවිතය ගත කළ හැකිනම් කොයිතරම් සැපතක් ද?

එද දවල් කාලයෙහි, මම නොරිකොට පිළිතුරක් ලියා, ඇගේ ඇඳුම් රාක්කය මත තැබුවෙමි. එය කෙටි ලියුමක් විය:

"ඔබේ සිත මට දැන් තේරෙනවා. ඒත් ඔබේ දර්ශනය නම් මට පිළිගන්ට බෑ. මළවුන් සඳහා ජීවතුන් පුද කිරීම අපේ දර්ශනයේ උගත්වන

දෙයක් නොවේ. තව දවස් දෙකකින් තුනකින් මගේ අනාගතය ගැන මම කිසිවක් තීරණය කර ගන්නවා. ඔබේ ජීවිතය වාසනාවන්ත වේවා යි මම පතනවා."

ඊළඟ දවස් කීපය තුළ දී, කෙරුණු කියවුණු සියල්ලක් පිළිබඳ ව මන්ද අවබෝධයකින් යුතු ව, ඇසූ දුටු දේ සීනෙකින් මෙන් අසමින් දකිමින්, ප්‍රශ්නවලට පිලිතුරු දෙමින්, විහිළුවලට සිනාසෙමින්, මම උදේ සවස ගත කෙළෙමි. මගේ බුද්ධිය තියුණු වන බවක් දැනුණු විට, එය නැවත මොට්ට කර ගැනීම සඳහා මම බෙහෙත් ගුලි ගිල්ලෙමි. එය, සකෙ බීමට වඩා හොඳ යයි මට සිතිණි. සකෙ බීපු විට සිතට ප්‍රීතියක් හා සැහැල්ලුවක් දැනේ. එහෙත් එය කෙළවර වන්නේ මහත් වේදනාවකින් හා බර ගතියකින් ය. බෙහෙත් ගුලි ගිලීමෙන් ලැබුණු සැපත ඊට වඩා ස්ථාවර එකක් විය.

WWW.EXPRESSLANKA.TK 99

12

හත් අට මසකට උඩ දී මිය ගිය තම පියාගේ සොහොන බැලීමට නකජිමා පවුල නියම කරගෙන තිබුනු දිනය ඊළඟ සතියෙහි ඉරිද විය. ඉරිද වන තුරු නතර වීමේ අදහසින් මොමොකො ද සිය දියනිය කැටුව සිකුරාද සවස පැමිණියාය.

එද රෑ සියලු දෙනා සමග කෑම කමින් සිටි වේලේ, මට තද නිදිමතක් දැනුණි. මා හිස ඔසවාගෙන සිටියේ ඉතා අමාරුවෙන් ය. කතා බහට ද සහභාගි වූයේ සිහිනයකින් මෙනි.

"දෙවෙන්දෙරා සං අපිත් එක්ක එනව නෙ, තාත්තගෙ සොහොන බලන්න?" යි නොරිකො ඇසුවාය.

"ඔව්. මම නොවරදවා ම එනව. මං යන්න ඕන," යි මම කීවෙමි.

"හුඟක් දුරද?"

"දුරයි. පැය දෙකක් තුනක් විතර යනව. තමබොච් කියන සොහොන් බිම."

මට නිදිමත දැනුණේ මා සකෙ ටිකක් බිවූ නිසා වන්ට ඇත. එහෙත් වෙන ද මෙන් නොව, මම උගුරකට දෙකකට වඩා නොබීවෙමි. මම බොහෝ

ඉක්මනින් මත් වීමි. මොමොකො ද සකෙ සකසුකි දෙකක් පමණ බොනු මම දුටුවෙමි.

මා කිම්කොට තෑගි කරන්ට අදහස් කළ චිත්‍රය මට සිහි විය. මා නැගිට ගොස් මගේ කාමරයෙන් එය ගෙනැවිත් ඇට දුන්නෙමි.

"මේකෙ තේරුම කියන්න," යි ඇ මගෙන් අයැදුවාය.

"ඕකෙ තේරුමක් නෑ. ඇතෙක් ඇඳල තියෙන හන්දයි මම කිම්කොසංට දෙන්න හිතුවෙ."

"ඒ වුණත් මොකො ද ඇතා කරන්නේ? මේ තැනැත්තිව මරන්න හදනව නේ ද?"

"නෑ. උස්සනව විතරයි. මරන්නෙ නෑ. ඔන්න මේකයි කතාව. ඉස්සර කාලෙ ඉන්දියාවෙ හිටිය, හොඳ පිරිසිදු කුලයකට අයිති බ්‍රාහ්මණයෙක්. බ්‍රාහ්මණයො බෙහොම කුලය ගැන ආඩම්බරයි. එයා විද්‍යාලයක ප්‍රධාන ගුරුවරයෙක්. එයාට ගෝලයො හුඟක් හිටිය. මේ බ්‍රාහ්මණයාට ගෑනු රුස්සන්නෙ නෑ, එයා ගෑනියෙක් දුටුවොත්, කාලකන්නියක් දුටුවයි කියල, හත් වරක් කිරි පැනින් නාගන්නවා. අහළ පහළ ගමක හිටිය, ස්වර්ණතිලකා කියල පහත් කුලයක තරුණියක්. ඇ කොපමණ ලස්සණ ද කීවොත් ඇ දුටු අය සිහිසන් නැතුව යනව. ඇට විවාහ යෝජනා කීපයක් ආ නමුත්, ඇ තමාගේ කුලයේ කිසි කෙනෙකුට කැමති වුනේ නෑ. දවසක් බ්‍රාහ්මණයා ඇව දුටුව. වහාම බ්‍රාහ්මණයාටත් ඇ පිළිබඳ සිත් ඇති වුණා. බ්‍රාහ්මණයාට කිසි වැඩක් කර ගන්න බැරි වෙනව, ඇය විවාහ කර ගන්නා තුරු. එහෙත් ඇ පහත් කුළයක තරුණියක් නිසා, බ්‍රාහ්මණයාගේ නෑදෑ මිත්‍රයෝ සියලු දෙනා ම එයාගේ අදහසට විරුද්ධ වුණා. බ්‍රාහ්මණයා ස්වර්ණතිලකා ගැන හිත හිතා ගෙදරට වෙලා හිටිය,ගෝලයින්ට උගන්නන්නෙත් නැතුව, අන්තිමට සියලු ම විරුද්ධකම් අතරේ, බ්‍රාහ්මණයා ස්වර්ණතිලකා සමග විවාහ වුණා. විවාහ වුණායින් පස්සෙත් බ්‍රාහ්මණයා තම කටයුතු අතපසු කළා. එයා කැමති වුණේ නෑ ස්වර්ණතිලකාව තනියෙන් දල යන්න. ඒ නිසා එයා ගෙදරට වෙලා හිටිය. ගෝලයො මුලදිත් ස්වර්ණතිලකාට කැමති නෑ. මෙහෙම වුණාම ඒ ගොල්ලො හිතා ගත්තා, ස්වර්තිලකව මරා දන්න.ඒ ගොල්ලො ඇතෙකුට රා පොවල ස්වර්ණතිලකා සිටි දිහාවට යැවුව. ඒත් ඇතා, ස්වර්ණතිලකාව දැකල, ඇව සොඬින් උස්සල, කිසිම පීඩාවක් නොකර හෙමින් හෙමින් බිමින් තිබ්බ. ඒක තමයි ඔය සිතුවමේ ඇඳල තියෙන්න. එත් අන්තිමට ගෝලයෝ බ්‍රාහ්මණය නැති වේලාවක් බලලා, ස්වර්ණතිලකා හිටපු ගෙට ගිනි තියල ඇව පුළුස්සල දැම්ම."

හිස ඔසවාගෙන සිටිය නොහැකි හෙයින් මම කාමරයට ගොස් ගුදිරිය එලාගෙන වැතිර ගත්තෙමි. වහා ම මට නින්ද ගියේය.

මා අවදි වූ විට, මා වටේ හතර පස් දෙනෙකු නැඹුරු වී සිටින බව මම දුටිමි. කවුළුවෙන් ඉර එළිය මගේ මුහුණට වැටුණි. මා ළඟ, බිම වාඩි වී සිටි, මැදි වියෙහි තරබාරු පිරිමියෙක්, මගේ නාඩිය අල්ලාගෙන සිටියේය.

WWW.EXPRESSLANKA.TK 101

"බය වෙන්න එපා. ආයෙමත් පැය දෙකකින් මම ඇවිත් බෙහෙත් විදින්නම්," යි ඔහු කියනු මට ඇසිණි.

මම දෑස හැර හොඳින් ඔහු දෙස බැලීමි. ඔහු තම කර වටේ එල්ලුණු නළාව ගෙන, එය හකුළා පෙට්ටියක තැබුවේ ය.

"නින්ද යන්නේ නැද්ද රෑට?" යි මා අවදි වූ බව දුටු ඔහු ඇසුවේ ය.

"රෑට හොඳට නින්ද යන්නෙ නැති හන්ද තමයි බෙහෙත් අරගෙන තියෙන්න."

වියෙකොගේ මන්ද්‍ර ස්වරය මම හඳුනා ගත්තෙමි. මා මඳක් කන් දී ගෙන සිටි නමුත්, නොරිකොගේ කට හඬ මට නෑසුණි. ඈ වැඩට යන්ට ඇතැයි මම සිතුවෙමි.

විගසින් මට නැවත නින්ද ගියේය. ඒ වර මා අවදි වන විට, නොරිකො මා ළඟින් දන ගසාගෙන වාඩි වී සිටියාය. ඈ නේබුරු[1] දෙඩම් බිකක් මගේ කටට දැමුවාය.

"දෙවෙන්දෙරා සං කන්න මේ දෙඩම්. නේබුරු. නේබුරුවලට කැමති නේ?"

සිසිල් දෙඩම් ඉස්ම මගේ උගුරෙන් පහළට බේරී බඩ දක්වා බසින විට මට අමුතු සුවයක් දැනිණි.

"මම අක්කත් එක්ක මේ ගැන කිව්ව. අක්ක අනුකම්පාවෙන් අහගෙන හිටිය. අක්කත් එක්ක කතා කරන්න." යි ඈ රහසින් කීවාය.

අනතුරුව මොමොකො කාමරයට පිවිසුණාය.

"හෙට යන්න පුළුවන් ද සොහොන් පළට?"යි ඈ සිනා මුහුණකින් යුතු ව හඬ නගා ඇසුවාය.

"පුළුවන්. දැන් මට අමාරුවක් නෑ." යි කියා මම නැගිට්ටෙමි. මා ඇවිද්දේ මඳක් වැනි වැනි ය.

"එන්න කැවිලි කන්න. පැණි රහ කන්න දෙන්නයි කියල දෙස්තර කිව්ව," යි කෑම කන කාමරයෙහි සිටි වියෙකො කීවාය.

"දැන් කීය ද වෙලාව?"

"දෙකහමාරට විතර ඇති."

"නොරිකො සං කොහොම ද කලින් ආවෙ.?"

"අපි ටෙලිපෝන් කරල කිව්ව."

"කො 'හිදෙජි සං?"

"බෙහෙත් සාලාවට ගියා දෙස්තර එක්ක, දෙවෙන්දෙරා සංට බෙහෙත් ගේන්න. තිත්ත බෙහෙත් බොන්න වේවි. හොඳ වැඩේ." යි වියෙකො කීවාය.

---

1. ඉදුනු විට කහපාට වන දොඩම් වර්ගයක්.

WWW.EXPRESSLANKA.TK 102

"මේක දෙන්නෙ නෑ තවත්. හංගනවා." යි කිමිකො තම අතෙහි වූ කිසිවක් මට පෙන්වමින් කීවාය. ඒ මගේ නිදන බෙහෙත් කුප්පිය බව මම හඳුනා ගතිමි.

පසු ද උදේ සියලු දෙනා ම තමබොචි සොහොන් පළට යන්ට පිටත් වූහ. මම ද පවුලේ කෙනෙකු මෙන් නඩයට එකතු වීමි. මට තාමත් දැනුණේ අඩ නින්දකින් හෝ සිහිනයකින් ක්‍රියා කරන්නාක් මෙනි. ගමන ඉතා දීර්ඝවූ බව මට මතකය. ට්‍රෑම් රථයෙහි නැඟ විදුලි කෝච්චි පළ ගාවට ගොස්, අනතුරුව විදුලි කෝච්චියෙහි නැග අප පැයක් පමණ යන්ට ඇත. කෝච්චියෙහි දී මම නිදු ගත්තෙමි. කෝච්චියෙන් බැස නැවත බසයක නැග විනාඩි දහයක් පමණ ගිය විට අපි තමබොචියට පැමිණියෙමු. බසයෙන් බැස සොහොන් බිම හරහා අපට විනාඩි දහයක් පහළොවක් පමණ ඇවිදින්ට සිදු විය. මඟ දෙපස වූ සකුරා ගස් වල මල් පිපි තිබුණි.ඒ තරම් දුරට, අහසෙහි එලා තිබෙන දැලක් සේ එක දිගට පෙනෙන සකුරා මල් මා කොහේ දී වත් දැක නැත. අනිත්‍යය සිහි කරවීම සඳහා ද සොහොන් බිම්වල සකුරා ගස් වවන්නේ? නැතහොත් මරණය ද ජීවිතය මෙන් සුන්දර දෙයක් නිසා ද?

සොහොන් බිමට ඇතුල් වන තැන තිබූ මල් වෙළඳ හලකින් එක් එක් කෙනා මල් ඉති හා හඳුන් කූරු ද වතුර බඳුනක් ද බැගින් රැගෙන ගියේය. නකජිමා සංගේ සොහොන ගලින් බැඳ තිබුණේ නැත. එහි වූයේ ගොඩ ගසන ලද පස්පොළොව පමණි. අවට, මළ ගිය ඇත්තන් හඳුන්වන ප්‍රෙතනාම[1] කොටන ලද ගල් පුවරුවලින් යුත් සොහොන් පළවල් රාශියක් විය.

නකජිමා සංගේ සොහොන් පළ මත අපි මල් හිටවා, වතුර වක්කර, අනතුරුව හඳුන් කූරු ද හිටවා දල්වා, ඇඳිලි බැඳ වැන්දෙමු.

"මට සල්ලි හම්බවුණු දවසක තාත්තාගේ සොහොන හොඳට බඳින්න ඕන." යි හිදෙජි කීවේය.

නකජිමා සං සිහි වී මා තුළන් කියුණු වේදනාවක් පැන නැංගේ ය. ඔහු ජීවත් ව සිටියේ නම් මගේ තත්වය වෙනස් වන්ට නොතිබුණි ද? තම පියාගේ නැමැත්ත ය යි නොරිකො සිතාගනෙ සිටින දේ තමාගේ මති මාත්‍රයක් මිස පියාගේ කැමැත්ත බව කවරෙක් දනී ද? නකජිමා සං මා ගැන නිතර ම කරුණාවෙන් සිතුවේ ය. ඔහු මා ගැන අනුකම්පා නොකරාවි ය යි කිසිවෙකුට කිව හැකි ද?

එහෙත් නොරිකො තම පියාගේ සිත මට වඩා හොඳින් දනියි. ඔවුන් දෙදෙනාගේ සිත් මෙලොව දී එකට ඇඳූ රන් දමේ එක් කෙලවරක් අතින්

---

1. කෙනෙක් මළවිට පූජකයා විසින් ඔහුට අමුතු නමක් දෙනු ලැබේ.

අල්වාගෙන නකජිමා සං පරලොව ගියා වනැයි මට සිතිණි. නකජිමා සංගේ සොහොන ඉදිරියෙහි ඇදිලි බැඳගෙන සිටි වේලෙහි මා සිතින් පොරොන්දු වූයේ, කෙසේ හෝ ඔහුගේ ප්‍රියාදර දියණියට අයහපතක් නොව අන්දමට, ඇගේ වාසනාවට හානියක් නොපැමිණෙන පරිදි ක්‍රියා කරන්ට ය. එහෙත් එසේ කිරීමට ඉතා ම හොඳ ක්‍රමය කුමක් දැයි මට තීරණය කර ගත නොහැකි විය. මා ඇය හැර ද යා යුතු ද? එසේ කළ හොත් ඇගේ වාසනාව නිශ්චය වශයෙන් සැලසේ ද? නැතහොත් අපි දෙදෙනාම කාලකන්නි බවට පත් වන්නෙමුද? ඇය ක්‍රියා කරන්නේ තමාගේ සැබෑ සිත අනුව නොව, පියාගේ සිත පිලිබඳ තමා තුළ වූ හැඟීමක් අනුව ය. අඳුරු වූ අනාගත මාර්ගය අපට මොහොතකට වත් පෙන්වා දෙන මෙන් මම නකජිමා සංගේ මළ ගිය ආත්මයෙන් අයැදීමි.

WWW.EXPRESSLANKA.TK 104



13

එදා සිට මා ක්‍රියා කෙළේ කිසියම් බාහිර බල වේගයකින් දුවවනු ලැබූ යන්ත්‍රයක් මෙන් මිස, සිය කැමැත්ත අනුව හැසිරෙන පුද්ගලයෙකු සේ නොවේ.

"මොමොකො සං එක්ක කතා කරන්න," යි නොරිකො යළිත් මට කීවාය. "ටෙලිපෝන් කරල වෙලාවක් නියම කරගන්න."

ඈ මට මොමොකොගේ ටෙලිපෝන් නොම්මරය කියා දුන්නාය.

මොමොකො හමු වීමට නියම කර ගත් දවසෙහි මම ඒ බව චියෙකොට කීවෙමි. මා මොමොකො හමු වන්නේ කුමකට ද කියා වත් ඇය මගෙන් ඇසුවේ නැත. අප අතර කිසිවක් කතා බහ නුවූ නමුත්, ඈ සියල්ල දැන සිටියා යි මම පිළිගත්තෙමි.

මොමොකො මා හමු වන්ට යොත්සුයාවෙහි ට්‍රෑම් නැවතුම් පොළ ගාවට ආවාය.

"අපි එළියෙදි කතා කරමු. ගෙදර වයසක උදවිය දෙගොල්ලක්ම ඉන්නව නෙ. ඒ අයට තේරෙන්නෙ නෑ." යි ඈ කීවාය.

රජ මාලිගාව වටේ ට දිවූ පැරණි ප්‍රාකාරය උඩ ඇවිදිමින් අපි කතා කෙළෙමු. බාගයක් ගොඩ කරන ලද දිය අගල ඇතැම් තැනක ක්‍රීඩා භූමියකට හරවා තිබුණි. ප්‍රාකාරය මත දිගට ම හිටවා තිබුණු මත්සු ගස් යට සිටි අපට, අගලෙහි එක් පසෙක පිපී තිබුණු සකුරා මලින් යුත් ගස් පේළියක් ඈත සිට පෙනිණි.

"නොරිකො බොහොම ලා හිතක් ඇති කෙනෙක්. දෙමවුපියො නැති වුණාම ඔහොම තමයි. තාත්ත අන්තරා වුණායින් පස්සේ ඈ තවත් තනි වුණා."

"මා දන්නව, තාත්තා ආන්තරා වීම නිසා එයාට වෙච්ච පාඩුව, දැන් එයාට තමාගේ හිත වත් තේරුම් ගන්න බෑ වගෙයි පෙනෙන්නේ."

"මම එයාගේ අක්ක හන්ද මම දන්නවා එයාගේ හිත. මම තමයි අම්ම කෙනෙක් වගේ එයාට හිටියෙ. නමුත් කල්පනා කරන්න තියෙන්න, නොරිකොට පුළුවන් වෙයි ද කියල දෙවෙන්දෙරා සංගෙ වැඩපල බලා ගන්න, නන්නාඳුනන මිනිස්සු අතරෙ නොරිකොට පුළුවන්ද කියල දෙවෙන්දෙරා සංට අත් උදව්වට හිටින්න. එයාට රට හුරු නෑ, කෑම බීම පුරුදු නෑ. කතා බහ තේරෙන්නේ නෑ."

සැබැවින් ම අපට මුහුණ පාන්ට සිදු වන මෙවැනි එදිනෙද ප්‍රශ්න ගැන මම එතෙක් කල්පනා නොකෙළෙමි. ඇය මා හා විවාහ වී කවර රටක ජීවත්වන්ට ද කියා වත්මම නොසිතුවෙමි. මා ආවේ එංගලන්තයෙහි සිතුවම් විකුණා හම්බ කරගත් සල්ලිවලිනි. මට වුවමනා නම්, පුවත් පත් කාර්යාලයක හෝ ආණ්ඩුවේ ප්‍රවෘත්ති පාලන කාර්‍යාලයෙහි ප්‍රචාරක චිත්‍ර අඳින්නෙකු ලෙස රස්සාවක් සොයා ගත හැකැයි මම සිතුවෙමි. නිර්මාණාත්මක වැඩක් කරන්ට මට ඉඩ නොලැබෙන බව නම් මම දනිමි. එහෙත් ගම රටට ගිය පසු දිවි පෙවෙත රැක ගන්නේ කවර මගකින් ද යනු මම තීරණය නොකෙළෙමි. එතැන් සිට මගේ කලාව මෙන් ම පුද්ගලික වාසනාව ද නැති ව යන හෙයින්, මම ඒ ප්‍රශ්නයට මුහුණ දී නොබැලුවෙමි.

"කල් යන කොට ඒවා පුරුදු වෙනව නෙ, කවුරු වුණත්? අපි දෙන්නට බැරි වෙයිද ඔය විදියෙ ප්‍රශ්න විසඳ ගන්න?"

සාකච්ඡාව නිට්ටාවකට ගෙන ගිය නොහැකි විය. මම ද විස්තර ගැන දෙඩවන්ට මැලි වීමි. අපි ළඟපාත තිබුණු බොජුන් හලකට ගොස් කෝපි බොමින් වෙන දේ ගැන කතා කෙළෙමු.

නොබෝ දවසකට පසු නොරිකො හා මොමොකා ද හිදෙජි ද එකට හමු වී කතා බහ කළහ. මට ඒ බව දැන ගන්ට ලැබුනේ චියෙකොගෙන්ය.

"අද හිදෙජි සං එන්නෙ නෑ රෑ කෑමට," යි ඈ මට කෑමට ආරාධනා කරමින් කීවාය.

"කොහෙවත් ගමනක් ගිහිල්ල ද?"

WWW.EXPRESSLANKA.TK 106

"මොමොකො සං ව හම්බ වෙන්න ඕනය කිව්ව නොරිකො සංගෙන් මොනවද අහන්න තියෙනවයි කියල."

සාකච්ඡාව මා ගැන බව මම දැන ගත්තෙමි.

"අපේ කාරණාව වෙන්න ඇති," යි මම කීවෙමි.

"කොහොම ද කියන්න බෑ. ඔය අක්ක නගාල අයියල එකතු වෙලා කරන කටයුතු ගැන මං මුකුත් දන්නෙ නෑ. ම අහන්න යන්නෙත් නෑ, මට කිව්වොත් මිසක්."

මම වියෙකොගේ මුහුණ දෙස බැලීමි. ඇය කියන්නේ ඇත්තක් ද කියා දැක ගැනීමට ය, මා එය පිරික්සුවේ. හිදෙජි හා වියෙකො අතර මේ ගැන කිසිවක් කතා බහ නුවූයේ ය යි ඇදහීම මඳක් දුෂ්කරවිය. ඔවුන් දෙදෙනා ඉතා ඇහැලි ව විසූ යුවලක් ලෙසය මට පෙනුණේ. නොයෙක් ද නින්දට ගොස් කාමරයෙහි දී ඔවුන් බොහෝ වේලා රහස් හඬින් කතා කරමින් සිටිනු මට ඇසී තිබේ.

හිදෙජි හා නොරිකො ආපසු පැමිණියේ රෑ දහයට පමණ. මට හිදෙජි හමු වූයේ නැත. ඔහු කෙලින් ම තම කාමරයට පිවිස නිද ගත්තේය.

"දෙවන්දෙරාසං තේ කෝප්පයක් බොනවද?" යි නොරිකො ඇසුවාය.

අප කෑම කම කාමරයෙහි වාඩි වී තේ බොන අතර එද සවස වූ සාකච්ඡාව ගැන නොරිකො මා සමග කීවාය.

"අක්කා නම් අනුකම්පාවෙන් කතා කළා. අයිය වැඩිය කැමැත්තක් පෙන්නුවෙ නෑ. ඒ වුණත් දෙන්න ම කිව්වෙ, ආයෙමත් කල්පනා කරල බලන්නය කියලයි. අර ඉස්සෙල්ල මා ගැන අහපු තැනැත්තගේ යෝජනාව ගැනත් ටිකක් හිතල බලන්නය කිව්ව."

මොමොකො මා සමග කතා කළ ද සිට මගේ සිතු තුළ අමුතු විදියක සැක සංකා ඇති වන්නට විය. අපට අනාගතයෙහි දී විසඳන්ට වන, එදිනෙද ජීවිතයෙන් පැන නගින ගැටළු කෙරෙහි මගේ සිත පළමුවෙන් යොමු කෙළේ මොමොකො ය. මා සැබවින් ම නොරිකොට ආදරය නම්, මට කුමක් වෙතත්, ඇය වාසනාවන්ත වනු දැකීම මගේ පරමාර්ථය කර ගත යුතු ය. සිය රැටියෙකු සමග විවාහ වුවහොත් ඈ වඩා වාසනාවන්ත නොවන්නී දැයි මම කල්පනා කෙළෙමි. මේ සමාජයේ, මේ ශිෂ්ටත්වයේ පසු බිමින් ඇය ඉවත් කළහොත් ඇගේ පෞද්ගලිකත්වය නොනැසේ ද කියා මාතුල බියක් හටගත්තේය. ජීවත්ව සිටින්නාවූද මිය ගොස් පරලොව වෙසෙන්නා වූ ද ඇගේ නෑදෑ පරපුරෙන් ඇය වෙන් කළොත් ඈ නොරිකො වශයෙන් පවතී ද නැතහොත් වෙන කෙනෙකු බව පෙරළේ ද? ඇගේ චරිතය ගොතා ඇත්තේ මේ සමාජයේ සිතුම් පැතුම් නැමති නූල් පොටවලිනි. ඒවා කපා හැරියොත් ගෙත්තම නොලිහේ ද?

"ඒ තැනැත්තා නොරිකො සංට ඇත්තෙන් ම කැමති ද?"

"කැමැති ඇති. මං දන්නෙ නෑ. ඔය වැඩේ සිද්ද වුණේ මෙහෙමයි. ජනවාරි මාසෙ මම ලෙඩ වෙලා තුන් හතර දවසක් ගෙදර හිටිය. ඒ දවස්වල ම එයත් නිවාඩු අරන් තියෙනවා. ඒක අහම්බෙන් වෙච්ච දෙයක්. නුමුත් අපි ආපහු කන්තෝරුවට ගියාම, අනිත් අය විහිළු කරන්න පටන් ගත්ත, එක දවස්වල ම නිවාඩු ගත්තෙ මොකක් හරි සම්බන්ධකමක් තියෙන නිසයි කියල. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන, එයා මට කතා කළා. කලිනුත් මට කතා කරන්න කැමැත්තෙන් හිටියලු. ඒත් ලජ්ජා නිසා නිකං හිටල තියෙනවා."

"අක්ක කොහොම ද එයාව අඳුනන්නෙ?"

"දවසක් මෙහාට ආවා. මොමොකො සං හම්බවෙන්නත් ගියා."

"එහෙනම් බඳින්න ම හිතාගෙන හිටල තියෙනව?"

"ඔව්. මම හිතුවෙ එයාගෙ යෝජනාව පිළිගන්නයි. වැඩිය ම මට මේ විදියට ජීවත් වෙන්න බෑ, තවත් කල්. දෙවෙන්දෙරා සං දන්නෙ නෑ. කිව්වට කවුරුවත් විස්වාස කරන්නෙ නෑ. මගේ මේ ජීවිතේ කොයි තරම් අමාරු ද කියල. මං විතරයි දන්නෙ. චියෙකො සං..."

"චියෙකො සං?" යි මම පුදුමයෙන් ඇසීමි.

"චියෙකො සං පිටින් ඔහොම පෙනුණට මොකො ද, මට බොහොම වෙනස් කම් කරනව. දෙවෙන්දෙරා සං ආවට පස්සෙ නම් හොඳයි. නුමුත් ඊට ඉස්සර...මම සමහර දවස්වල හවසට ගෙදර එනකොට කෑමවත් නෑ. ඒ ගොල්ලො කාල කාමරේ ඇතුළට වෙලා ඉන්නවා. මගෙන් නිකන්වත් අහන්නෙ නෑ, කාල ද කියල ආවෙ. කන්තෝරුවෙන් රෑ වෙලා ආවම බඩ ගින්නෙයි නිදා ගන්න වෙන්නෙ."

"හැබෑවට ම? විස්වාස කරන්න බෑ තමයි."

"මම අක්කටවත් කියන්නෙ නෑ. අක්ක වුණත් විස්වාස කරන්නෙ නැති හැඩයි. තාත්තා මැරුණෙ හිත තරක් වෙලයි. මං විතරයි ඒව දන්නෙ.... මොකොටද දැන් ඕවා ගැන කතා කරන්නෙ?"

නොරිකො, දුකින් පෙළුණු තම මුහුණ ඔසවා මා දෙස බලා සිනාසෙන්ට තැත් කළා ය.

"හිදෙජි සං දන්නෙ නැද්ද ඕව ගැන?" යි මම ඇසීමි.

"එයා දන්නව. එත්ත් මුකුත් නොදන්නවා වගේ ඉන්නව. එයාට නංගිලාව අක්කලව ඕන නෑ. එයා චියෙකො සං කියන හැම දේ ම විස්වාස කරනවා."

මම කිසිවක් කියා ගත නොහැකි ව නිශ්ශබ්ද ව සිටියෙමි. චියෙකොගේ චරිතයේ මේ අංශය ගැන මම ස්වල්පයක් වත් සැක නොකෙළෙමි. නොරිකො ඇය වරදවා තේරුම් ගන්නවා ඇතැයි කියා මට සිතුණි.

"මේක අයියගේ ගේ වුණාට මම වියෙකො සං.ට ගෙවනව මාසෙකට යෙං හාර දහක්. මට පඩියෙන් ඉතුරු වෙන්නෙ යෙං දෙදහයි. උදේට හුඟක් දවස්වල මට හම්බ වෙන්නෙ නිකං බත් විතරයි, රාබු අච්චාරු හරි එහෙම මොකක් හරි එක්ක කන්න. පංගුවක් දවස්වලට මට මිසොෂිරු ටිකක් වත් ඉතුරු කන්නේ නෑ. ඉස්සර මට කෑම පෙට්ටියක් හදල දෙනව, කන්තෝරු ගෙනියන්න. ඒත් මං ඒක පස්සෙ එපයි කිව්ව. මට ලජ්ජයි ඒක ගෙනිහිල්ල කන්තෝරුවෙදි කන්න. ඒව කොහොම වුනත් කමක් නෑ. මට මනුස්සයෙකුට වගේ කතා බහ වත් කරනවා නම්. මං සවස එන කොට, එයා කාමරේට වෙලා පොතක් කියවනව. මං ආචාර කරාම, වචනයක් වත් දෙඩන්නේ නෑ.උදේට මං යන කොට, හැම තිස්සෙම කියලයි යන්නේ. ඒත් එයා නෑහුණා වාගේ ඉන්නව. අයියත් නෑ වචනයක් වත් දෙඩන්නේ මාත් එක්ක."

"අර යෝජනාවට අයිය කැමති ද?" යි මම ඇසීමි.

"ඔව් දෙන්නම කැමතියි. මගෙන් නිදහස් වෙන්න ඕන හන්ද කියලයි මං හිතන්නේ"

"මමත් මේ කාරණාව ගැන හුඟක් කල්පනා කළා. අයියත් කැමති නම්, නොරිකො සං මේ රටේ කෙනෙක් එක්ක විවාහ වුණොත් වඩා හොඳ ය කියලයි මට පෙනෙන්නෙ. නෑදෑයින්ගේ දැනමුතුකම්වලට විරුද්ධව මාත් එක්ක ගිහිල්ල මොන සෙතක් වෙයි ද කියලයි මං කල්පනා කරන්නෙ. ඔය කියන එක්කෙනාගේ යෝජනාව පිළි ගන්න."

"මම එයාට බැරිය කියල දැන් කොච්චර කල් ද?"

"කවද ද බැරිය කිව්වෙ?"

"මගෙන් උත්තරයක් ලැබෙන තුරු එයා හුඟක් කල් බලන් හිටිය. එද රෑ දෙවෙන්දෙරා සං මට දුන්න ලියුම කියවල, පස්සෙන් ද මම එයාට බැරිය කිව්ව."

ඇය එබඳු විනිශ්චයකට එළඹීමෙන් මං කෙළේ නුවණට හුරු වැඩක් දැයි මා තුළ සැයක් උපන්නේ ය.

"මම විවාහ වෙලාවත් වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවන් වන විදියකට මගේ අනාගතය සකස් කර ගන්න ඕන. මොමොකො සං කිව්වෙ, කවර මාර්ගයක් හරි තෝරගෙන, බය නැතුව ඒ මාර්ගය ඔස්සෙ ගමන් කරන්නෙයි කියල. නමුත් මා ගැන මට එතරම් විස්වාසයක් නෑ. . මම හැබවින් ම ආදරය වුණු දෙන්නයි ඉන්නෙ. එක් කෙනෙක්, මගේ යෙහෙළිය එක්ක හදිසියෙන් විවාහ වුණු ඒ තරුණයා. අනික් තැනැත්ත දෙවෙන්දෙරා සං. මට අරයව නැති වුණේ මගේ හිත මට ම නොතේරුණු නිසයි. දැන් වුණත් මට තීරණයකට පැමිණීමේ ශක්තියක්නෑ."

"මේක ඉතින් ගැටළු සහිත අවස්ථාවක් නෙ. මේක ගැන තීරණයකට පැමිණෙන්න බැරි වීම පුදුමයක් නොවේ," යි මම කීවෙමි.

WWW.EXPRESSLANKA.TK 109

ගිනි නිවන හමුදාවක නළාවේ හඬක් අහස් කුස පසාරු කරගෙන ඈතසිට කෙමෙන් වැඩි වී අප දෙසට ආවේ ය.

තොරිකො දෑස පියාගෙන, දෙ අත්ලෙන් කන් වසා ගත්තාය.

"කොහේ ද ළඟක කින්නක්," යි ඈ කීවාය.

ඇගේ ඇඟ ගැහෙන්ට විය.

"ළඟක නෙවේ. කඩ වීදියෙ වෙන්න ඇති," යි ඈ අස්වැසීමට මම කීවෙමි.

නළාවේ හඬ අඩු වී ගෙන ගියේය.

"අන්න යනව වෙන අතක," යි මම වහා කීවෙමි.

තොරිකො මඳ වේලාවක් ගල් ගැසුණාක් මෙන් සිටියාය.

"තෝකියෝ නගරයේ හැම තිස්සෙ ම ඇහෙන ඔය හඬට ඔච්චර බය වෙනවද? ඕන හැටි පුරුදු ඇති නෙ," යි මම පුදුමයෙන් ඇසීමි.

"කොච්චර ඇහුවත් පුරුදු වෙන්නෙ නෑ. යුද්ද කාලෙදි ඒ හඬ අපට ගෙන දුන්න දුක අමතක කරන්න අමාරුයි. මෙච්චර ළඟින් ම ඇහෙන කොට මට බය හිතෙනව."

"රෑ හන්දයි ඔච්චර ළඟින් වගේ ඇහෙන්නෙ."

"හය මාසයක් තිස්සේ රැයි දවාලුයි නැතුව, ඒ හඬ ඇහුණම අපි පොළොව යටට දුවපු හැටි. යොත්සුයාවල තිබුණු තාත්තාගෙ ගෙවල් පහ ම පිලිස්සුණා. අපේ ගෙදර උඩට ගිනි බෝම්බ වැටුණු වෙලාවෙ, ගෙදර තිබුනු බඩු පුළුවන් තරමත් බිං ගේ ඇතුලට ගෙන ගොහිල්ල දමාල, මම විතරක් තනියම දුවල ගියා. තාත්තා ඒ පෙදෙස සමූපකාර ආරක්ෂක සමාගමේ නායකයා. ඒ නිසා තාත්තට කොහේ වත් යන්න බෑ පළාත් අත් හැර අයියටත් යන්න බෑ. එයාටත් ආරක්ෂක හමුදාවෙ වැඩ තිබුණ නිසා. මම දුවල දුවල ගිහිල්ල, වාසනාවකට, පාර දිගේ යන්නේ නැතුව, පැත්තක තිබුණු කඳු ගැටයක් වගේ තැනකට නැංගා, හැමෝම දුවන්නේ පාර දිගේ ම යි. පාර දිගේ දුවල හතර මං හන්දියකට ආවම, හතර පැත්තෙන් එන ගින්නෙත් හැම දෙනා ම පිලිස්සිල යනව. ඒ දවස්වල හතර මං හන්දිවල මළ කුණු ගොඩ ගහල, මේ උසට, ඔක්කෝම එක ගොඩේ වැටිල මැරෙනව. මං හිටපු තැන උස නිසා, දුම් පිරිල, මට හුස්ම ගන්න බැරුව ගියා. මම පොළොවෙ වළක් හාරල අතින්, ඒ වළට මූණ තියාගෙන, එහෙම හිටිය දුම අඩුවෙන කල්. උදේ මම ගේ හොයාගෙන ආපහු යන කොට, මුකුත් ඉතුරු වෙල තිබුණෙ නෑ. තාත්තයි අයියයි පොළොව හාර හාර හිටිය, මං බිං ගෙයි ඇතෙයි කියල හිතාගෙන . අපි එතනින් ගියා නකනොවල නෑදෑයෙකුගෙ ගෙදරට, ඒ ගේත් පිලිස්සුණා. තාත්ත ගාව තිබුණු සල්ලිත් ඔක්කො ම පිලිස්සුණෙ එදයි.

"ඊට පස්සෙ අපට හොඳ කාලයක් ආවෙ ම නෑ. තාත්ත ආයෙමත් කසාද බැන්ද. තාත්තව බලාගන්න කෙනෙක් නැති නිසා අයියල කිව්ව

WWW.EXPRESSLANKA.TK 110

බඳින්නය කියල. ඒත් ඒ විවාහෙ හරි ගියේ නෑ. ඈ තාත්තටයි අපටයි බොහොම වෙනස් කම් කළා. තාත්තා අවුරුද්දකින් විතර දික්කසාද වුනා.

"ඉතින් දැන් තේරෙනවා නේ මං විවාහ වෙලා වත් වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න කැමැත්තෙන් ඉන්නෙ මොකොද කියල?"

රෑ මැදියම වන තුරුඅප දෙදෙනා මෙවැනි දේ ගැන කතා කරමින් සිටින්ට ඇත.

"හිදෙජ් සංල මොනව හිතයි ද දන්නෙ නෑ, මෙච්චර රෑ වෙනකල් කතා කර කර ඉන්න කොට," යි මම කීවෙමි.

"කමක් නෑ. අයිය කිව්ව, අපට කතා කර ගන්න තියෙන දෙයක් මෙහේදි කතා කර ගෙන, තීරණයක් කරන්නෙයි කියල. මං කිව්ව අපට කතා බහ කර ගන්න තැනක් නැතෙයි කියල."

"ඒ වුණත් වියෙකො සං දන්නෙ නැතෙ? එයා මොනවා හිතයි ද?"

"ඇයි වියෙකො සං දන්නෙ නැත්තෙ? අයිය එයාට ඔක්කොම කියනව."

"අද කතා වුනේ මෙකක් ගැන ද කියල වත් දන්නෙ නෑ කිව්ව."

නොරිකො සිනාසුණාය.

වියෙකොංස එහෙම තමයි. මුකුත් දන්නෙ නැතුව වගේ ඉන්නවා. ඒ වුණත් අයිය ඔක්කොම කරන්නෙ එයා කියන හැටියට."

WWW.EXPRESSLANKA.TK 111



14

නො රිකො පිළිබඳ කිසිවක් හිදෙජි මා සමග දෙඩුවේ නැත. ඔහු පෙර පුරුදු මිතුරු විලාසය ම මා කෙරෙහි පෑවේය. එහෙත් ඔහු මෙසේ හැසුරුණේ අමුතු ප්‍රයත්නයකින් දැයි මම නොයෙක් වර කල්පනා කෙළෙමි. මම ඔහුගේ මුහුණ දෙස ඕනෑ කමින් බැලීමි. පෙර වූ ප්‍රකෘති ගතියෙන් නොව, සිතා මතා වෑයමින් ආරූඪ කර ගත් මිත්‍ර ලීලාවක් හා ආචාර ශීලයක් ඔහු මා කෙරෙහි දක්වන්ට තැත් කරන්නේ දැයි මම ඉඳ හිට සැක කෙළෙමි. නොරිකො පිළිබඳ ව ඔහු සමග නොදෙඩා මොමොකො සමග පමණක් දෙඩීමෙන් මා කෙළේ වරදක් යයි මට සිතිණි.

එහෙත් හිදෙජි මා කෙරෙහි අමනාප වී සිටිතියි තරයේ ඇදහීමට සාධක නැති බව කල් යෑමේ දී මට පෙනිණි. වෙනසකට තිබුණේ, හිදෙජි හා චියෙකො වෙන ද මෙත් කෑම කෑමෙන් පසු මා සමග කතා කරමින් නොසිට, කලින් ම සිය කාමරයට වැදීම ය. නොරිකො කලින් පැමිණි දට මම ඇය සමග කතා කරමින්, පැයක් හමාරක් කෑම කන කාමරයෙහි නතර වෙමි.

WWW.EXPRESSLANKA.TK

"මගේ විබාගෙත් ළඟයි. පාඩම් කරන්න තියෙනවා," යි හිදෙජි කීවේ, තමාගේ අලුත් ගති පැවතුම්වලට හේතුවක් දැක්වීම සඳහා යි මම සිතුවෙමි.

වියෙකො සමග ද වැඩිපුර කතා කිරීමට මට පෙර මෙන් ඉඩ නොලැබිණ. වෙනදු වාගේ ඈ සිරිතක් වශයෙන් මා සමග උදේට බත් කෑමට වාඩි වූයේ නැත. මා කෑමට යන විට ඈ සිය කාමරය තුළට වැදී රේඩියෝව දමාගෙන සිටී. ඇය එළියට ආවේ, යුකිකො චං මට කරදර කරන බව දැනුණොත් පමණි. මා උදේට කෑවේ බිත්තරයක් හා කර කරපු පාන් ය ඈ මා සඳහා බිත්තරයක් බැඳ මේසය මත වසා තබයි. මා පාන් කර කරගෙන කා, පසු ව තේ වක්කර ගෙන බොමි.

"හිදෙජි සං මොකො ද කියන්නේ අපේ කටයුත්ත ගැන?" යි වියෙකො සමග කතා කිරීමට අවස්ථාවක් ලැබුණු දිනයක මම ඇසීමි. "එයා විරුද්ධ ද?"

"නෑ. හිදෙජි සං විරුද්ධ නෑ. නොරිකො සං තීරණය කර ගත්තොත්, එයා මුකුත් කියන එකක් නෑ," යි ඈ පිළිතුරු වශයෙන් කීවාය. "දෙවෙන්දෙරා සං කතා කෙරුවොත් නරක ද හිදෙජි සං එක්ක?"

මා කවදු නුමුත් ඔහු සමග කතා කළ යුතු බව මට ද දැනිණි. එහෙත් මා කුමක් කියන්ට ද? කිසි ම තීරණයකට නොපැමිණ ඔහු සමග කතා කළ නොහැකි ය. මා ඔහු සමග කතා කළොත් අනාගත වැඩ පිළිවෙළක් ගැන පැහැදිලි ව කිව යුතු ය. නොරිකො ඒ පිළිබඳ ව කිසිවක් නොකියයි. මා ද ඇයගෙන් අසන්නේ නැත. අනාගතය ගැන සඳහන් කරන්ට වූ සෑම අවස්ථාවකදීම අපි දෙදෙනා ම කනස්සල්ලට පත් වෙමු. මගේ සිතට බොහෝ කලකට පසු පිවිසී තිබුණු සන්සුන් ගතිය රැක ගන්ට මම වෑයම් කෙළෙමි. ස්වල්ප දවසක් වත් මට මෙසේ විසිය හැකි නම්, මට කිසියම් වැඩක් කළ හැකි ය. මා මෙතෙක් අපතේ යැවූ කාලය ගැන මම පසුතැවිලි වීමි.

මම අනාගතයට ඉබේම සකස් වෙන්ට ඉඩ දී, වැඩ කරන්නට පටන් ගත්තෙමි. සිතුවම් ඇඳීමට මා නැවත උනන්දු වූයේ හිරොකාවා නම් චිත්‍රකරුවා භාරතයේ සංචාරයක ගොස් ආපසු පැමිණි විට පැවැත් වූ ප්‍රදර්ශනය බලන්ට යෑමෙන් ය. ඔහු කැටයම් චිත්‍ර සඳහා භාරතීය ශෛලියක් හා භාරතීය මාතෘකා ද පාවිච්චි කරන්ට පටන් ගෙන තිබුණි. ප්‍රදර්ශනයෙහි දී ඔහු මට හමු විය. භාරතය පිළිබඳ ඔහුගේ උද්‍යෝගය නිසා ද ජපානය පිළිබඳ ව මගේ උනන්දුව නිසා ද අපි දෙදෙන ඉක්මනින් කුළුපග වීමු. ඔහු මා විසින් අඳින ලද සමහර සිතුවම් දැක ඒවා ගැන සතුටු විය. අපි දෙදෙනා එකතු වී ප්‍රදර්ශනයක් පිළිවෙළ කෙළෙමු. චූඕ කෝරොන් මන්දිරයෙහි පවත්වන ලද මේ ප්‍රදර්ශනය ගැන පහත කියවෙන විවේචනය "අසහි ෂිම්බුං" පුවත් පතෙහි පළ විය.

"හිරොකාවා හා දෙවෙන්දෙරා යන චිත්‍ර කරුවන් විසින් අඳින ලද උකියො-එ සිතියම් වල ප්‍රදර්ශනය කලා රසිකයන් උනන්දු කරවන සුලු ය.

WWW.EXPRESSLANKA.TK 113

එක ම මාධ්‍යම පාවිච්චි කරන මේ කලාකරුවන් දෙදෙනාගේ ශෛලිය එකිනෙකට වෙනස් ය. තෙමසකට පමණ පෙර පවත්වන ලද ප්‍රදර්ශනයක දී හිරොකාවා කෙරෙහි භාරතීය චිත්‍ර කලාව බලපා තිබුණු සැටි පැහැදිලි ව පෙනිණි. එහෙත් උකියො-එ කලාව පෝෂණය කිරීමට ශක්තියක් ඇති සිතුවම් මෙහි නැතැයි සිතමි. ඔහුගේ හොඳ ම කෘති මෝගල් චිත්‍රවලට සමාන ය.

"දෙවෙන්දෙරාගේ සිතුවම් කෙරෙහි මම පැහැදුණෙමි. භාරතීය සිත්තරුවෙකු මේ මාධ්‍යයෙන් මේ තරම් දක්ෂ ලෙස අඳින්ට වීම සතුටට කරුණකි. ඔහුගේ ඉතා ම හොඳ නිර්මාණ, තනි කළු රේඛාවලින් අඳින ලද චිත්‍ර යයි සිතමි. සාමාන්‍යයෙන් උකියො ඒ චිත්‍රවල නැති විදියේ කෝමලතාවක් ඔහුගේ රේඛාවල තිබේ. එහෙත් ඔහු විස්තර අඳින්නේ රේඛාවලින් ය. ඔහු වර්ණ පාවිච්චි කර තිබෙන චිත්‍රවල වර්ණ අවශ්‍ය දැයි සිතේ. දෙවෙන්දෙරාගේ කෘති සිහි කරවන්නේ, වර්ණ චිත්‍ර සම්ප්‍රදයට පෙර වූ තොයොනොබු, කියොනොබු ආදී සිත්තරුවන්ගේ ශෛලිය ය."

මේ විස්තර ය මම පරිවර්තනය කොට, ලක්දිව පුවත් පත්වලට යැවීමි. කවද නමුත්, වැඩි කාලයක් යාමට පෙර මා සිය රට බලා පිටත් විය යුතුය. ප්‍රචාරක චිත්‍ර ඇඳීමට වුව ද මට රස්සාවක් ලබා ගත හැකිනම් මැන වැ යි මට සිතුණි. ජපානයේ වාසය කිරීමට මට ලැබුණු අවසර පත්‍රය ද තව දෙතුන් මසකින් අවලංගු වේ. මම එය දෙවරක් ම අලුත් කරවා ගතිමි. තව වරක් අලුත් කරවා ගැනීමට මට හැකි වේ ද යනු සැක සහිත ය.

ඉඳ හිට මම නොරිකො පිට දී හමු වීමි. එසේ හමු වූ බවක් ගෙදර ඇත්තන්ට ඇහවීමට ඈ මැලි වූ හෙයින්අප ආපසු ආවේ ද වෙන වෙන ම ය. ඇගේ කාර්යාලය කලින් වැසූ දිනවල අපි සිනෙමා හලකට ගියෙමු. නැතහොත් තේ පැන් සාලාවකට ගොස් කතා කරමින් පැයක් හමාරක් ගත කෙළෙමු. ගිය අවුරුද්දේ වැයූ ගී ම ය, ඒවායේ තවමත් වැයෙමින් තිබුණේ. මම අතීතය සිහි කරමින්, වර්තමානයේ සුවය වින්දෙමි. ඈ ඇතැම් විටක කියූ දේ මේ සුවයට බාධාවක් මෙන් විය.

"චියෙකො සං ර්යෙ උදේ ඇහුව, අපි තීරණයකට පැමුණුණා ද කියල." මම මඳක් කැළඹුණෙමි. කිසිවක් නිශ්චය නොකිරීමෙන් මා ඔවුන් කෙරෙහි කරන්නේ වරදක් බව මට සිහි විය.

"ඉතින් මොකො ද කියන්නේ? දෙවෙන්දෙරා සං පිළිවෙළක් කළොත් මම එනව."

"ඒ බව කිව්ව ද චියෙකො සංට?"

"නෑ. මං කිව්ව අපි මුකුත් තීරණය කර ගත්තේ නෑ කියල."

ඇතැම් ඉරිද දවසක, හිදෙජි හා චියෙකො, ළමයාත් රැගෙන, නෑදෑයින් බලන්ට යති. එවැනි දිනවල, නොරිකො මා ළඟ වාඩි වී, මා සිතුවම් අඳිනු බලාගෙන සිටියි. ඈ මගේ ඇඳුම් සෝද කාමරය සුද්ධ කොට, දවල් ආහාර පිස දෙයි.

WWW.EXPRESSLANKA.TK 114

"ඕකුසාවා මතක් වෙනව නෙ?" යි මම අසමි.

"දෙවෙන්දෙරා සංගෙ ගම රටට ගියා ම අපට පුළුවන් ද මේ විදියට ජීවත් වෙන්න?" යි ඈ අසයි.

"මොකො ද බැරි?"

මා මෙසේ කියන්නේ, සිතෙහි හටගත් සැකයක් හා ඒ සමග ම ඇති වන වේදනාවක් ද මැඩ ගෙන ය.

"එහේ තියෙන කෑම වර්ග හදන්න මං දන්නෙ නෑ."

"ඉක්මනින් ඉගෙන ගන්න බැරිය?"

"මට සාරි අඳින හැටි කියා දෙන්න ඕන. එහේ දී කිමෝනො අඳින්න ම බැරිද?"

"ටිකක් රස්නෙ වැඩියි. ඒ වුණත් හැන්දෑවට එහෙම යුකතා අඳින්න පුළුවන්."

"මම දැන් හිටන්, හේමන්ත ඇඳුම් තවත් ගන්න නෑ. ග්‍රීෂ්ම ඍතුවට හරියන ඇඳුම් පමණක් අරගෙන එකතු කරනවා."

ඈ මඳ වේලාවක් කල්පනාකාරී ස්වභාවයකින් සිටියි.

"නමුත් දෙවෙන්දෙරා සංට මෙහෙම ඉන්න බෑනේ, එහේ ගියා ම? හැම දම රස්සාවට යන්න වේවි නේ? එතකොට මම තනියම. යාළුවො මාව මරාවී ද අර කතාවෙ කියන හැටියට? මමත් වෙන රටක කෙනෙක් නෙ?"

මම සිනාසෙමි.

"මගේ රටේ මිනිස්සු ඒ තරම් නරක ය කියල ද හිතුනේ? මං ඒ කිව්වෙ කතාවක් නෙ ඇත්ත සිද්ධියක් ය?"

අනිවාර්ය අවසානයක් කරා කාලය දවසින් දවස ගමන් කෙළේය. පුවත් පතක කර්තෘ ධුරයට ළඟ දී පත්ව සිටි මගේ මිතුරෙකුගෙන් මට ලියුමක් ලැබිණ. මගේ ප්‍රදර්ශනය ගැන පළ වූ ලිපිය දුටු ඔහු තම පුවත් පතෙහි රස්සාවකට එන මෙන් මට ආරාධනා කෙළේ ය. සතියකට වරක් පළ වන සාහිත්‍යය හා කලාවන් පිළිබඳ අතිරේකයට සිතුවම් ඇඳීම මට පැවරෙන බව ඔහු කීවේය. සෑහෙන පඩියක් මට පිරිනැමිය හැකි බව ද ඔහු සඳහන් කෙළේය.

"ඇයි මාව තනි කරල යන්නෙ? තාත්තත් මාව දාල ගියා. දැන් දෙවෙන්දෙරා සං මාව දාල යනව. මට ඔය පාර කිසි ම කෙනෙක්. නැතුව යනව."

මගේ අභ්‍යන්තරය දැවී ගියේය.

"එහෙම කියන්න එපා, නොරිකො සං. මෙහෙම ඉඳල වැඩක් නෑ නේ. මං ගියොත් අපේ අනාගතය ගැන මොකක් හරි පිළිවෙළක් කරන්න පුළුවන් නේ?"

ඇගේ දෑස මගේ මුහුණ මත ඒ මේ අත දිවුවේ ය. දැලකින් මාළුවෙකු අල්වන්ට තැත් කරන්නා සේ ඈ තම දෑසට මගේ දෑස හසු කරන්ට තැත්

කළාය. මා මුහුණ පසෙකට හැරවූ විට, ඇ එය අතින් ගෙන තමා වෙතට හරවා ගත්තේය.

"ඇයි, මෙහේ රස්සාවක් හොයා ගන්න බැරිද? රස්සාවක් නැත්නම් මම හම්බ කරන්නම්."

මම සිනාසීමි.

"මම රස්සාවක් නැති මිනිහෙක් නම්, නොරිකො සංගෙ නෑදෑයො මට මේ තරම් වත් සලකාවි ද?"

අවසාන දවස් කීපය තුළ දී, අපි දෙදෙනා හැසුරුණේ අතීතය සොයාගෙන ගොස් එය සුරැකිව තබා ගන්ට කරන ලද රහස් ගිවිසුමකින් මෙනි. අපි ජීවිතයේ මතුපිට පාවෙමින් ඒ නොගැඹුරු සුවයෙන් තෘප්තවන්ට කෙළෙමු. පතුළෙහි වූ බොර දිය නොකලතා සිටින් ට අපි පරෙස්සම් වීමු. එහෙත් ඇතැම් විට නොදැනුවත් ව ම බොර දිය මතු විය.

"දෙවෙන්දෙරා සං යන්න ඉස්සෙල්ල මට ඉල්ලීමක් කරන්න තියෙනවා."

"ඒ මොකක්ද ?" යි මා ඇසුවේ ස්වල්ප චකිතයක් ඇති ව ය.

"අපි ඉස්සෙල්ල ම ගිය "යෙ ලයි ෂ්‍යාං" තේ පැන් හලටයි, "කොකුසයි" රංග ශාලාවටයි මාව ආයෙමත් ගෙනියන්න ඕන."

"ආ. ඒක ද?" යි මම ඇසීමි.

"ලබන සෙනසුරාද විතරයි නෙ අපට තියෙන්නෙ? සෙනසුරාද යමු. සෙනසුරාද හිටන් "කොකුසයි" රංග සාලාවේ ග්‍රීෂ්ම සෘතු රූගුම පටන් ගන්නව.

සැහැල්ලු සිතකින් යුතු ව අපි දෙදෙනා ග්‍රීෂ්ම සෘතු රූගුම නැරඹුවෙමු. දෑස ඉදිරියෙහි නොකැඩී මැවුණු විවිධ වේදිකා සැරසිලිවලින් මා වින්දේ තියුණු චමත්කාරයකි.

"ඇත්තෙන් ම ජපන් මිනිස්සු නම් හරි ම හපන්," යි මම නොරිකොට කීවෙමි.

"දෙවෙන්දෙරා සං චිත්‍ර කරුවෙක් හන්ද හොඳයි නේ මෙහෙම ඒව බලන එක?" යි ඇ පැවසුවාය.

නැටුම අවසන් වී අපි ආපසු යන විට, නොරිකො නිශ්ශබ්ද වූවාය. පෙර පැවති සැහැල්ලු ගතිය ඇගෙන් තුරන් වූවා සේ මට පෙනිණි.

"මට අද හම්බ වුණා මාත් එක්ක ඉස්කෝලෙ ගිය යෙහෙළියක්. ඇ ඉක්මනට විවාහ වෙන්න යනව. දැන් මාත් එක්ක එකට හිටපු අය ඔක්කෝම විවාහ වෙලා. මියෙකො සං තව හය මාසෙකින් මව් කෙනෙක් වෙන්න යනව ලු."

නොරිකෝගේ අනාගතය පිළිබඳ වග කිව යුත්තා මම ය යන සිතිවිල්ල, තියුණු වේදනාවකුත් සමගම මා තුළ ජනිත විය. මම කිසිවක් නොකීවෙමි. ඇගේ සිතෙහි වූ ශෝකය මට දැනිණි.

WWW.EXPRESSLANKA.TK 116

සවස අප ගෙදර පැමිණි විට,හිදෙජි ලා කලින් ම කෑම කා බැහැර ගොස් සිටියහ.

"අපි ඇවිදින්න යමු ද?" යි මම නොරිකොගෙන් ඇසීමි.

"බෑ. මට කොහේවත් යන්න හිත නෑ," යි ඈ පිළිතුරු දුන්නාය.

අපි කෑම කන්ට වාඩි වීමු. ඈ කටක් දෙකක් කා නතර කළාය.

"මත්තට අපි මොකො ද කරන්න ඉන්නෙ?" යි ඈ ඇසුවා ය.

"මං දන්නේ නෑ. මං ගියායින් පස්සෙ, ආයෙමත් හොඳට කල්පනා කරල බලන්න. මං ඉන්න කල් අමාරු නේ තීරණය කරන්න එහේ ගිහිල්ල අපට වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවන් වේවිද?"

"දැන් ඔහොම කිව්වට මොකො ද, ඉස්සර නම් ඔහොම නෙවේ කතා කෙළේ," රොස්වූ විලාසයක් දක්වමින් ඈ කීවාය.

"මම කල්පනා කරන්නේ නොරිකො සංගෙ වාසනාව ගැනයි. ඒකයි මං එහෙම ඇහුවෙ. මං ගැන විතරක් හිතනව නම්, මට ඔය තරම් අමාරු නෑ තීරණය කරන්න"

ඈ සිය කාමරයට ගොස්, පියාගේ ඡායාරූපය ඉදිරියෙහි හඳුන් කූරු දැල් වූවාය.

"මගෙ යාළුවො ඔක්කොම කොහොම හරි තම තමන්ගේ වාසනාව හදා ගන්නව. මට විතරයි බැරි. තාත්තා හිටියා නම් මට මෙහෙම වෙන්නෙ නෑ."

"එන්න අපි ටිකක් එළියට යන්න. එතකොට නිවිහැනහිල්ලෙ කතා කරන්න බැරිය?" යි මම කීවෙමි.

"දෙවෙන්දෙරා සං යන්න. මං අද තනියම ඉන්න කැමතියි. තාත්තත් එක්ක."

ඈ තම කාමරයේ දොර වසා ගත්තා ය. මා ගෙයින් පිටත ගොස් ආපසු පැමිණි විට ද ඈ ඇතුළෙහි වූවාය. ස්වල්ප වේලාවකින් හිදෙජිලා ආවාහුය.

"කෝ නොරිකො සං? තාම ආවෙ නැද්ද? යි චියෙකො ඇසුවාය.

"ඇවිල්ල ඉන්නව කාමරේ ඇතුළේ," යි මම කීවෙමි.

"මං කැවිලි වගයක් ගෙනාව. කන්න."

එන ගමන් ගත් කැවිලි වගයක් චියෙකො මේසය මත තැබුවාය. නොරිකො දොර හැර එළියට ආවාය.

"මගේ හිස කකියනව. අද උදේ හිටන් හරියට වැඩ," යි ඈ කීවාය.

චියෙකො ඈ දෙස පරීක්ෂාකාරී ව දෙතුන් වරක් බැලුවාය.

ඊ ළඟ ද නොරිකො කාර්යාලයට ගිය පසු චියෙකො මගෙන් ඈ ගැන ප්‍රශ්න කළාය.

"මොකො ද නොරිකො සං කියන්නෙ."

"තාම තීරණයකට පැමිණිල නෑ. හිත දෙගිඩියාවෙ." යි මම කීවෙමි.

"නොරිකො සංගෙ හිත බොහොම ගැටළුයි. කිසි කෙනෙකුට තේරුම් ගන්න අමාරුයි. දෙවෙන්දෙරා සං හරි ම දුකක් විඳින්නෙ," යි ඈ කීවාය.

නොරිකො මුළුමනින් ම දෝෂයට භාජනය වීම වැරදි බව මම දනිමි. මම ස්ථිර අධිෂ්ඨානයක් දැක්වූයෙමි නම් ඇට ද තම සිත හද ගැනීමට එයින් පහසුවක් වනු නිසැකි ය. එහෙත් මම ඒ බව චියෙකොට නොඇඟවීමි.

"නොරිකො සංටත් බොහොම අමාරු ප්‍රශ්නයකට තෝ මුහුණ පාන්න සිදු වෙලාතියෙන්නෙ," යි මම කීවෙමි.

මා පිටත් ව යන දට පළමු දා අපි දෙදෙනා අවසාන වරට අසකුසාවලට යන්ට සිතා ගත්තෙමු.

"චියෙකො සංට කියන්න, අන්තිම දවස හන්ද අපි පිටතදී කෑම කනවයි කියල," කී කාර්යාලයට යාමට පෙර නොරිකො මට කීවාය.

ග්‍රීෂ්ම ඍතුවෙහි දී අසකුසාව වෙන ඍතුවලදීටත් වඩා විවිධ වර්ණයෙන් පිරී ඇත. පිරිමිහු ද ගැහැනු ද ළමයි ද යුකතා ඇඳගෙන, ලී සෙරෙප්පු දමාගෙන, කඩ වීදිවල ඇවිදිති. උඩු වියන්වලින් එල්ලෙන පහන් කූඩු වෙන දටත් වඩා විශාල සේ පෙනේ.

අපි දෙදෙනා නිශ්ශබ්දව කන්නොන් දේවාලටය යන වීදිය දිගේ ගමන් කෙළෙමු. නිතැතින් ම අපේ දෙපා ඇදුණේ ඒ දෙස ටය. අපි කන්නොන් දෙවියන්ට ඇදිලි බැඳ වැන්දෙමු.

"කන්නොන් දෙවියො මිනිසුන්ට අනුකම්පා කරනවා. කන්නොන් දෙවියො අපට මහක් පෙන්නාවි." යි නොරිකො කීවාය.

දෙවියන්ට වැඳීමෙන් පසු ඇ යෙං දහයේ කාසියක් පසෙකින් වාඩි වීසිටි පූජකයාට දී ඔහුගෙන් ඕ-මිකුජි[1] පත්‍රයක් ඉල්ලුවා ය. පූජකයා තමා ඉදිරියෙහි තිබුණු පෙට්ටියක් සොලවා, එයින් පටියක් ඇද එහි වූ ඉල්ක්කම බලා, වෙනම ලාච්චු රාක්කයක් ඇද එයින් කඩදසි වැටියක් ගෙන නොරිකොට දුන්නේ ය. ඇ එය දිග හැර බැලුවාය.

"ඕක කියවන්න, මටත් ඇහෙන්න" යි මම කීවෙමි.

"දෙවෙන්දෙරා සංට තේරෙන එකක් නෑ මේ බාසාව. මම අදහස කියා දෙන්නම්. ඔබ හිතන දේ ඉෂ්ට වේවි. ලෙඩින් සිටින තැනැත්තා ඉක්මනින් සුව වන්නේ නැති නමුත්, අවසාන වශයෙන් සුවය ලබාවි. නැති වෙච්ච වස්තුව ලැබේවි."

ඇ මා දෙස හැරී බලා, නැවත විස්තර කර දුන්නාය.

"ඔබ පතන තැනැත්තාගේ හිත මඳක් වැනි වැනී තිබෙනවා. එහෙත් එය වැඩි කල් නොගොස් ස්ථිර වේවි. ඔබේ පැතුම කල් ගිය නමුත් ඉෂ්ට වේවි. දැන් සිටින ගෙයින් වෙන ගෙයකට යාම හොඳයි. සිතා ගෙන සිටින ගමන ගියාට කමක්නෑ."

"හැබෑ ද හිත වැනි වැනී තියෙනවා කියන්නේ?" යි ඇ ඇසුවාය.

ඔද්දල් වූ තුවාලයක් මෙන් මගේ සිත නැවත කකියන්ට විය. අනිත්ම දවසෙහි වුව ද එබඳු වේදනාවකින් තොර ව සිටින්ට ය මා වෑයම් කෙළේ.

1. අන්වැකියක් මුද්‍රණය කර තිබෙන කඩදසියක්.

WWW.EXPRESSLANKA.TK 118

"එහෙම වුණත්, හිත ආයෙමත් ස්ථිර වෙනවයි කියල තෝ තියෙන්නේ?" යි විහිළුවක ව්‍යාජයෙන් මම කීවෙමි.

අපි පළමු වතාවේ අසකුසාවෙහි දී ගිය සුෂි හලට අවසාන වරට ද ගියෙමු.

"දෙවෙන්දෙරා සං‍ගේ ගම රටට මාත් ගියාම, අපි කොහොම ද සුෂි කන්නෙ?" යි ඈ ඇසුවාය.

"ඇයි අපට ගෙදර හදගෙන කෑ හැකි නෙ," යි මම පිළිතුරු දුනිමි.

"ඉංගිරිසි දන්නව නම්, ඒ රටේ බාසාව නොදැන ගත්තත් පුළුවන් ද එහෙ කටයුතු කර ගන්න?"

"ඉංගිරිසි දැනගෙන හිටියොත් මුලදී පුළුවනි පිරිමහ ගන්න. ඒ වුණත් පස්සෙ රටේ බාසාවත් ඉගෙන ගන්න වේවි."

"මට කවදාවත් පුළුවන් වෙන එකක් නෑ. ඔය බාසාවල් ඉගෙන ගන්න."

"එහේ ඉන්න කොට ඉබේම පුරුදු වේවි."

"මම එන සුමානෙ හිටන් යනව රෑ ඉස්කෝලෙකට, ඉංගිරිසි ඉගෙන ගන්න."

"කොහේ ද රෑ ඉස්කෝලෙ?"

"රොප්පොංගිවල තියෙනව. මම විස්තරත් අහගත්ත යාළුවෙකුගෙන්."

මා මෙන් ඈද සිහින් ලෝකයක් මවාගෙන එහි වෙසෙන්ට තැත් කරන්නී දැයි මම කල්පනා කෙළෙමි.

"මුලදී උදවු කරන්න ඕන, කඩේට ගිහිල්ල බඩු ගන්න එහෙම. පුරුදු වුණායින් පස්සෙ මං කරදර කරන්නේ නෑ."

"දෙවෙන්දෙරා සංට ජපන් බාසාව ඔය තරම් හොඳට පුළුවන් නම්, ඇයි මට ඒ රටේ බාසාව බැරි වෙන්න හේතුව? බාසා දෙක සමාන වෙන්න ඕන."

"මං හිතුව එහේදී. දෙවෙන්දෙරා සං වැඩට ගියාම, මට පාලු හින්ද, මොනව හරි ඉගෙන ගන්න. තූර්ය භාණ්ඩයක් හරි, නැත්නම් ඒ රටේ තියෙන කලාවක්."

අප කා බී අවසන් වූ පසු, මා දෙර ගාව කවුන්ටරයට ගොස් සල්ලි ගෙවන වේලාවේ, ඇගේ කම්මුල දිගේ කඳුළු බින්දුවක් රූරා බසිනු මම දුටුවෙමි. මා ඇගේ මුහුණ දෙසට හැරී බැලූ විගස, ඈ තම ලේන්සුව ගෙන එය පිස දැම්මාය.

WWW.EXPRESSLANKA.TK 119



15

මා ආපසු පැමිණ හය හත් මසක් තරම් ගත වන්ටඇත. මා සිතුවාටත් වඩා, අලුත් රස්සාවෙන් මට විවේකය ලැබිණි. මම අත්තිඩියේ ගෙයක් කුලියට ගෙන දැන් මෙහි වාසය කරමි. මා වැඩට යන්නේ දවල් දෙළහෙන් පසු ය. ඇතම් දවසක මා යන්නේ ම නැත. උදේ වරුවෙහි මම සිතුවම් අඳිමින් පසු කරමි.

මා දැන් සිතුවම් අඳින්නේ උකියො-එ ශෛලියෙන් නොව, පෙර සේ නිදහස් ව ය. පුවත් පත් කතුවරයා වූ මගේ මිතුරාගේ පෙරැත්ත නිසා මම ප්‍රදර්ශනයක් ද පැවැත්වීමි. එය බලන්ට බොහෝ සෙනග පැමිණියහ. මෙය මෙසේ සිදු වූයේ, මා වැඩ කල පුවත් පතෙන් මට බොහෝ ප්‍රචාරය ලැබුණු නිසා යයි මම සිතමි. අනිත් පුවත් පත්වල පළ වූ විවේචන ද වෙනදට වඩා ප්‍රශංසාත්මක විය. මගේ සිතුවම් කෙරෙහි පෙර නුවූ විරූ පැහැදීමක් රසිකයන් තුළ ඇති වී තිබෙන බව පෙනේ. මේ පැහැදීම මගේ කලාව දියුණු වූ බවට ලකුණක් දැයි මම නොදනිමි. මගේ ම මාධ්‍යයක් මා සොයා ගන්ට හැකි වී ද?

එහෙත් මේ කිසිවක් මගේ සිතට තියුණු හැඟීමක් නොපිවිසේ. මේ සියල්ල කුමට දැයි මට සිතේ. මම ප්‍රීති ප්‍රමෝදයක් කිසි විටෙක ස්පර්ශ නොකරමි. එබඳු ආස්වාදයක් විඳීමේ ශක්තිය මා කෙරෙන් මුළුමනින් ම තුරන් වී ගොස් ද?

මේ සමාජයෙන් මට පිළිගැනීම වඩ වඩා ලැබෙත් ම මා ඊට අයිති නැතැයි මට තව තව සිතේ. කෙනෙකු උත්පත්තියෙන් ම කිසියම් සමාජයකට අයිති යයි කෙසේ කිව හැකි ද? මෙහි මා එරෙන ප්‍රමාණයෙන් ම මම නොරිකොගෙන් දුරු නොවෙමි ද?

නොරිකොගෙන් ආරංචියක් නොලැබ සතියක් ගත වුවහොත් මට මහත් කාන්සියක් දැනේ. මට සිතුවමක් ඇඳීමට හෝ වෙන කිසිවක් කිරීමට සිතක් පහළ නොවේ. එවිට මම ඇට ලියුම් කීපයක් ලියමි. ඇට නොපමා ව මෙහි ඒමට සැරසෙන මෙන් මම ඉල්ලමි. ඇ මෙහි පැමිණි විට අප වාසය කරන පිළිවෙළ ගැන මම කල්පනා කරමි. මම මිතුරන් වෙත ගොස් ඔවුන්ගේ දැනමුතුකම් අසමි. ඇට මෙහි විත් කෙසේ ජීවත් විය හැකි දැයි සමහරු අසති. ඇතැම්හු මට අනුබල දෙති. එහෙත් කිසිවෙක්, මා විසින් කළ යුත්තේ කුමක්දැයි ස්ථිර වශයෙන් නොපවසයි. ඔවුහු දෙපැත්ත ම පෙන්වා දෙනු මිස, කිසි ම තීරණයකට වග කීමක් බාර නොගනිති. මා බොහෝ විට ආපසු එන්නේ ඔවුන් කෙරෙහි කලකිරීලා ය.

කොරිකො මෙහි ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් මා නොයෙකුත් කටයුතු අරඹන නමුත්, ඒ කිසිවක් තිට්ටාවට නොකරමි. මැඩ ගත කොහැකි වූ කිසියම් බාධාවක් මා ඉදිරියෙහි පැන නඟී. මා අවට වූ ජීවිතය වෙනස් කළ නොහැකි සත්‍යයක් සේ මට දැනේ. මා එයින් ගැලවී යන්ට තැත් කරන්නේ කොයිබට ද? ඒ සත්‍යය පිළි ගැනීම වඩා නුවණට හුරු නොවේ ද?

එහෙත් මා අවට වූ මේ ජීවිතය එක ම සත්‍යය ලෙස මා පිළිගත යුත්තේ කවර හෙයින් ද? මට මෙය වෙනස් කොට වෙන ම පරිසරයක් සාද ගැනීමේ ශක්තිය තිබේ. එබන්දක් විය නොහැකි යි මට දැන් සිතෙන්නේ මෙහි පෙනෙන ස්ථාවර භාවය නිසා ය. මේ වටපිටාව ද ඉබේ ම ඇති වූවක් සේ මට පෙනෙන නමුත්, එය ද මා විසින් සාද ගන්නා ලද්දකි. මම ඊට පුරුදු වී සිටිමි. එය වෙනස් විය නොහැක්කක් සේ මට පෙනෙන්නේ අමුතු දේක නුහුරු බව නිසා වන්ට පුළුවන. එහෙත් මෙය බාහිර බල වේගයක් විසින් හදිසියෙන් වෙනස් කරනු ලැබුවහොත් මම අමුතු වටපිටාව අනුව කෙසේ හෝ හැඩ නොගැසෙන්නෙම්ද?

එසේ වුවහොත් මීට වඩා මැනවි. ඉරණම විසින් වෙනසක් ඇති කළහොත් මම ඊට නැවෙමි. දුර නොදකින මනුෂ්‍යයා එතරම් වග කීමක් කෙසේ කරට ගන්ටද? මගේ වටාපිටාව මා විසින් තනවම සාදගන්නා

WWW.EXPRESSLANKA.TK 121

ලද්දක් නොවේ. මට ඉරණම ද සහකාර විය. ඉරණම මට මේ වත් සහකාර වේ ද?

මම හඳහන බලවා ගතිමි. මා නක්ෂත්‍රය විශ්වාස නොකරන හෙයින් මට හඳහනක් නොතිබේ. දෙමවුපියන්ගෙන් මා උපන් වේලාව අසා එය සාද ගන්ට මට සිදු විය. උපන් වේලාව ඇසූ විට මගේ දෙමවුපියෝ පුදුම වූහ. මා එබඳු දේට සිනාසෙන හෙයින් කුමක් සිදු වන්නේ දැයි ඔවුන්ට තේරුම් ගත නොහැකි විය. නක්ෂත්‍රකාරයා පළමුවෙන් ම කීවේ අවුරුදු තුනක කාලය සිට මගේ සිත මහත් දුකකින් පෙළෙන බව ය. එය ඇසීම මට සැනසුමක් විය. එහෙත්, මගේ සිතෙහි කවදටත් කිසියම් පීඩාවක් නොතිබිණි දැයි මම කල්පනා කෙළෙමි. කවර පීඩාවක් වුව ද මෙතරම් තියුණු නුවූ බව නම් මට මතකය. මගේ ග්‍රහයන් පිහිටා තිබෙන සැටියට මට විවාහ වෙන්ට සිදු වන බව ඔහු කීවේය. මේ කියමන ගැන මම පුදුම වීමි. මා විවාහ වී නැති බව ඔහු දන්නේ කෙසේ ද? මා දැන් ස්වල්පයක් ප්‍රසිද්ධ හෙයින් ඔහු මා ගැන අසා ඇද්ද? එහෙත් ඔහු වටපිට කරුණු දන්නා උගතෙක් නොවීය. ඔහු දෙහිවල වෙසෙන සුළු නක්ෂත්‍රකරුවෙක් විය. ඔහු රස්සාව වශයෙන් කෙළේ වෙදකම ය. මා ඔහු ගාවට එක්ක ගියේ ඔහු ගැන මහත් විශ්වාසයකින් සිටි මගේ මිතුරෙක් තමා ගැන නක්ෂත්‍රකරුවා කී බොහෝ දේ හරිගිය බව මිතුරා මට කීවේය. මේ විෂය ගැන මගේ අවිශ්වාසය ද මගේ මිතුරා දැන සිටියේය. ඔහු මා ඒ නක්ෂත්‍රකරුවා වෙතට ගෙන ගියේ, නක්ෂත්‍රය ගැන මගේ අවිශ්වාසය මඳක් දුරට වත් පහ කිරීමට යයි මට හැඟුණි.

"ඔන්න, හැබෑ ද කියල බලා ගන්න, මම කිව්වෙ නෑ මුකුත් ඔයා ගැන," යි ඔහු කීවේය.

මම විවාහය ගැන විස්තර ඇසීමි. එය තව තෙමසක් ගත වන්ට පෙර සිදු විය යුතු යයි නක්ෂත්‍රකරුවා කීවේය. එහෙත් ඒ විවාහය සාර්ථක නොවන බව ද ඔහු පැවසුවේය. මට දරු සම්පත් ඇති විය නොහැකි බව ග්‍රහයන්ගේ පිහිටීමෙන් ඔහු ඔප්පු කෙළේ ය. මා බලාපොරොත්තු වූ විදියේ විස්තරයක් ඔහු ට කිව නොහැකි විය. මට ඉක්මනින් විදේශයට යන්ට සිදු වන බව ඔහු කිවේය.

"එහෙම යන එක හොඳ ද? " යි මම ඇසීමි.

"හොඳ නේන්නම්? මහත්තයට මේ රටට වඩා විදේශය තමයි හොඳ."

මම නක්ෂත්‍රකරුවා දෙස බැලීමි. ඔහු දුප්පතෙක් විය. අනාගතය දැන ගත හැකි නම්, කෙනෙකුට රජ විය නොහැකි ද? ඔහු මගෙන් අය කෙලේ රුපියල් පහක් ය. අනාගතය දැන ගැනීමට මෙය කෙතරම් ලාබ දැයි මට සිතිණි.

WWW.EXPRESSLANKA.TK 122

නොරිකොගෙන් මට ඉද හිට චෝදනාත්මක ලියුමක් ලැබෙයි.

"ඔබේ හිත තේරුම් ගැනීම අමාරුයි. කිසි ම දෙයක් පිළියෙළ නොකර, ඔබ අහනව මම එන්නේ කවදෘ ද කියා. මම කොහොම ද එහෙ ම එන්නෙ? ඔබ මෙහේ ඇවිත් පළමුවෙන් ම මා සමග විවාහ වෙන්න ඕන. නැත්නම් මම ඔහේ ආ විට මා සමහ විවාහ වෙන බව අයියාට ලියා පොරොන්දු වෙන්න ඕන. අයියාට විස්තර කියන්නත් ඕන. ඔබ සමහර විට අහනවා මේ නරකාදියෙන් මා තවත් නරකාදියකට හෙළන්නේ කොහොම ද කියා. නුමුත් ඒ වාගේ ප්‍රශ්ණ කලින් තීන්දු කර ගත්තා නම් වඩා හොඳ නොවේ ද?"

එහෙත් නොබෝ දවසකින් තවත් ලියුමක් එයි. "මම කලබල වෙලා එදෘ ඔබට සැර පරුස ලියුමක් ලියුවා. ඊට සමා වෙන්න. ඇත්ත වශයෙන් මගේ සිතත් දෙගෙඩියාවේ ක්‍රියා කරනවා. ඔබ මෙන් මම ද අනාගතය සකස් කර ගැනීමට දක්ෂ නැත. ඔබට මෙහේ ඇවිත් මා සමග ජීවත් වෙන්න බැරි ද? ඉතාමත් ම හොඳ විදිය ඒක ය කියා අක්කත් කියනවා. මම කවදෘ නමුත්, අම්මයි තාත්තයි වාසය කරන තකජිමා සොහොනට ඇතුල් වෙන්න කැමති යි."

මා මෙන් ඈ ද සිතින් මවා ගත් අනාගතයක වෙසේ. "එදෘ පත්තරේ බෝනික්කො සෑදිම ඉගැන්වීම සඳහා ඔබේ රටට ගොහින් ආපසු පැමිණ තරුණියන් දෙදෙනෙකුගේ පින්තූරය පළ වී තිබුණා. ඒ අය කොයි තරම් වාසනාවන්ත ද? ඔබට ඒ දෙදෙනා හම්බ වුණේ නැද්ද? මම ඒ ගොල්ලන්ගෙ කන්තෝරුවට ටෙලිපෝන් කළා. එවේලේ ඒ ගොල්ලො හිටියෙ නෑ. මම ඒ ගොල්ලන් හම්බ වෙන්න කැමතියි. හම්බ වෙලා, ඔබේ රට ගැන විස්තර දැන ගන්න ආසයි."

ඇතැම් දවසක, යාළු මිත්‍රයන් සඳහා මම ගෙදර දී කෑම පිළියෙළ කරමි. මගේ මිතුරන්ගේ භාර්යාවෝ ද ඔවුන් හඳුනන වෙනත් ස්ත්‍රීහු ද පැමිණෙති. ජපානයෙන් ගෙන ආ කඩදසි පහන් කූඩුව මම කාලයෙහි දල්වමි. කඩදසි යෙන් පෙරී මෘදු මොලොක් බවට පෙරළෙන පහන් එළිය හාත්පස විහිදෙත්ම, මා ඕකුසාවාහි දී මුලින් ම විසූ කාමරය මගේ මනැස ඉදිරියෙහි නැගී එයි. අවට සෙවනැලි අතරින්, නොරිකො මතු වී එනු මට පෙනේ. ඈ මගේ යහළුවන්ට ආචාර කරමින්, ඔවුන්ට කෑම බීම පිරිනමයි. ඇය දෙස බලා සිටින මම, එක මොහොතකට වුව ද නැවත ප්‍රීති ප්‍රාමෝද්‍යයය ස්පර්ශ කරමි. ඈ ඔබමොබ ඇවිද විගසින් සෙවනැලි අතර අතුරුදහන් වෙයි.

මම අවට බලමි. මෙහි තතමි පැදුරු නැත. අපි සියලු දෙනාම වාඩිවී සිටින්නේ පුටුවලය. තමා බිම වාඩි වීම ප්‍රිය කරන බව ද පුටුවලට අකමැති

WWW.EXPRESSLANKA.TK 123

බව ද නොරිකො වරක් කියූ බව මට සිහි වේ. මධු තොල් ගැසීමට දිදුල වැනි කුඩා චිත් මෙහි නැත. අප බොන්නේ ලොකු වීදුරු වල එක උගුරට ය. මෙහි දී නොරිකොගේ ආචාර ශීලය ශෝභන වීමට ඉඩ නැත. එය හාස්‍ය ජනක ද වන්ට පුළුවන.

මා නොකා නොබී සිතිවිලි ද මෙහි පැටලී සිටින බව දකින එක් ස්ත්‍රියක් මී චිතක් ගෙන මට පිරිනමයි. ඈ කජු අහුරක් අතින් ගෙන මගේ අල්ලෙහි තමයි. මම සහජයෙන් මේ අයට අයිති නොවෙම් ද? තම ඇහැලිකම ඔවුන් දක්වන්නේ තමන්ට ඇබ්බහි වූ ආචාර විධියකින්ය. ඔවුහු මා පිලිගනිති. මා ද ඔවුන් පිළිගත යුතු ය. මා අවට වූ සත්‍යය මා වැළඳ ගතහොත්, මීට වඩා තිර සැනසුමක් මට විඳිය නොහැකි ද?

pinimuva
WWW.EXPRESSLANKA.TK 124